# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report
# 2023



## විදේශ කටයුතු අමාත්‍යාංශය
## வெளிநாட்டு அலுவல்கள் அமைச்சு
## Ministry of Foreign Affairs

# විදේශ කටයුතු අමාත්‍යාංශය
# வெளிநாட்டு அலுவல்கள் அமைச்சு
# MINISTRY OF FOREIGN AFFAIRS

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report
# 2023

**වැය ශීර්ෂ අංක: 112**
**செலவினத் தலைப்பு இல. : 112**
**Expenditure Head No.: 112**


**ජනරජ ගොඩනැඟිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව**
**குடியரசு கட்டிடம், கொழும்பு 1, இலங்கை**
**Republic Building, Colombo 1, Sri Lanka**

011-2325373/375 0112333450/ 2446091 / 2430220 cypher@mfa.gov.lk www.mfa.gov.lk

## පටුන


1 වැනි පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ....................................................................................................1

1.1 හැඳින්වීම ....................................................................................................1

1.2 දැක්ම සහ මෙහෙවර ....................................................................................................3

1.3 රාජකාරීන් හා කර්තව්‍යයන් ....................................................................................................4

1.4 ආයතනික ව්‍යුහය....................................................................................................7

1.5 විදේශදූත මණ්ඩල / දූත කාර්යාල ජාලය ....................................................................................................8

1.6 අංශවල ව්‍යුහය....................................................................................................9

2 වැනි පරිච්ඡේදය - ප්‍රගතිය සහ අනාගත දැක්ම ....................................................................................................10

2.1 ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශය....................................................................................................10

2.2 ශ්‍රී ලංකාවේ කලාපීය සහ බහුපාර්ශ්වික කටයුතු....................................................................................................16

2.3 අභියෝගවලට මුහුණ දීම ....................................................................................................16

2.4 කාර්ය සාධන දළ විශ්ලේෂණය :අංශ ඒ හා සම්බන්ධ විෂය පථයන් සමඟ ....................................................................................................17

2.4.1 ආර්ථික කටයුතු අංශය ....................................................................................................17

2.4.2 මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ සහ පුහුණු අංශය ....................................................................................................20

2.4.3 ජාත්‍යන්තර ආරක්ෂක සහ ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ අංශය....................................................................................................21

2.4.4 සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය....................................................................................................23

2.4.5 කාර්ය සාධන සමාලෝචනය සහ ක්‍රියාත්මක කිරීම සහ හදිසි ප්‍රතිචාර ඒකකය....................................................................................................24

2.4.6 මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය....................................................................................................25

2.4.7 දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානය පිළිබඳ අංශය (SAARC) ....................................................................................................27

2.4.8 එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය ....................................................................................................29

2.5. කාර්සාධන සමාලෝචනය: දේශපාලන කටයුතු අංශ ....................................................................................................32

2.5.1 අප්‍රිකානු කටයුතු අංශය....................................................................................................32

2.5.2 නැගෙනහිර ආසියානු අංශය ....................................................................................................33

2.5.3 ලතින් ඇමරිකානු සහ කැරිබියන් අංශය ....................................................................................................35

2.5.4 මැද පෙරදිග අංශය ....................................................................................................37

2.5.5 යුරෝපා සහ උතුරු ඇමරිකානු අංශය....................................................................................................38

2.5.6 දකුණු ආසියානු අංශය ....................................................................................................49

2.5.7 අග්නිදිග සහ මධ්‍යම ආසියානු අංශය....................................................................................................50

2.6. කාර්ය සාධන දළ විශ්ලේෂණය: මෙහෙයුම් අංශ ....................................................................................................58

2.6.1 කොන්සියුලර් කටයුතු අංශය ....................................................................................................58

2.6.2 සාමාන්‍ය පරිපාලන අංශය....................................................................................................61

2.6.3 මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය ....................................................................................................63

2.6.4 අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය ....................................................................................................65

2.6.5 නීති අංශය ....................................................................................................66

2.6.6 විදේශීය වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය ....................................................70
2.6.7 සන්ධාන අංශය ....................................................71
2.7 2023 වසරේ සුවිශේෂී අවස්ථා....................................................73
3 වැනි පරිච්ඡේදය: මූල්‍ය කාර්ය සාධනය ....................................................80
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ....................................................80
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ....................................................81
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය....................................................82
3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්....................................................83
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ....................................................84
3.6. ප්‍රතිපාදන වෙන්කිරීම් භාවිතයේ කාර්ය සාධනය....................................................84
3.7 මු.රෙ. 208 (F.R 208) ප්‍රකාරව අමාත්‍යාංශයට වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම....................................................85
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය ....................................................87
3.9 2023 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය....................................................87
3.10 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ....................................................88
4 වැනි පරිච්ඡේදය: ප්‍රධාන කාර්ය සාධන දර්ශක....................................................100
4.1 අමාත්‍යාංශයේ සමස්ත ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සාක්ෂාත් කර ගැනීම ....................................................100
4.2. ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම: අංශ ඒ හා සම්බන්ධ විෂය පථයන් සමඟ ....................................................102
4.3 ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම: දේශපාලන කටයුතු අංශ ....................................................112
4.4 ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම: මෙහෙයුම් අංශ ....................................................127
5 වැනි පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය....................................................140
6 වැනි පරිච්ඡේදය - අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ....................................................142
6.1. සේවක මණ්ඩල කළමනාකරණය....................................................142
6.2. මානව සම්පත් සංවර්ධනය....................................................143
7 වැනි පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ....................................................148

# 1 වැනි පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

2023 වසර ශ්‍රී ලංකාවට මෙන්ම ලෝකයටම සුවිශේෂී වසරක් විය. එය 2022 දී මුහුණ දුන් අභියෝගවලට පසුව, පැහැදිලි ගමන් පථයක් ඔස්සේ වර්ධනය කරා ගමන් කරන ආර්ථිකයේ ස්ථාවරත්වය සනිටුහන් කළේය. ප්‍රධාන භූ දේශපාලනික සහ භූ ආර්ථික පරිවර්තනයන් ගෝලීය වශයෙන් අඛණ්ඩව සිදු විය. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ නියමුවා ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශය පරිණාමනය වන ජාතික හා ජාත්‍යන්තර වර්ධනයන් සම්බන්ධයෙන් රජයේ ප්‍රමුඛතාවලට අනුකූලව කටයුතු මෙහෙයවන ලදී. ශ්‍රී ලංකාවේ සුබසිද්ධිය වෙනුවෙන් පෙනී සිටීම සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමද සියලු ජාතීන් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වාගෙන යාමද ඇතුළු අපගේ මූලික කර්තව්‍යයන් සමඟින්, 2023 දී අමාත්‍යාංශයේ ප්‍රධාන අවධානය යොමු වූයේ රටෙහි ආදායම් අවස්ථා ඉහළ නැංවීමය. එහිදී වෙළඳ ප්‍රසාරණය, අගය එකතු කිරීම, අපනයන නිෂ්පාදන සහ වෙළඳපල විවිධාංගීකරණය කිරීම, සංචාරක ප්‍රවර්ධනය සහ ආයෝජන ප්‍රවර්ධනය හරහා ගෝලීය ආර්ථිකය සමඟ වඩාත් ඒකාබද්ධ වීමේ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික කටයුතු කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්විය. බටහිර රටවල අපගේ සාම්ප්‍රදායික හවුල්කරුවන් අභිබවා අසල්වැසි, නැඟෙනහිර ආසියානු සහ ආසියාන් කලාපයේ ඉහළම අනාගත වර්ධනයක් පුරෝකථනය කරන රටවලට ප්‍රමුඛත්වය දෙමින්ද සබඳතාවන් අප්‍රිකානු කලාපය තෙක් පතුරුවමින් වෙළෙඳ සබඳතා පුළුල් කිරීමේ උත්සාහයක අමාත්‍යාංශය නිරත විය.

2023 ජාත්‍යන්තර කටයුතු වලදී, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාව තුළ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස සිය ප්‍රතිරූපය වැඩිදියුණු කර ගත් අතර රටවල් සහ සංවිධාන සමඟ සබඳතා ශක්තිමත් කරගන්නා ලදී. බහුපාර්ශවීක ආයතන හා අන්තර්ජාතික මූල්‍ය ආයතන සමඟ නීත්‍යානුකූලභාවය සහ නියෝජනයන් සිදු කිරීමේ අවස්ථා වර්ධනය කරගනිමින් තිරසාර දේශගුණික විපර්යාස අනුවර්තනයවීම, බලශක්ති හුවමාරු කිරීම්, ස්වෛරී ණය සහන හසුරුවමින් ගෝලීය ඩිජිටල්කරණය හා තාක්ෂණික න්‍යායන් සම්බන්ධ කරමින් දකුණු අර්ධ ගෝලීය භූ කලාපයේ කැපී පෙනෙන ස්ථාවරත්වයක් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකි වී ඇත. 2023 දී පැවති 19 වන නොබැඳි ජාතීන්ගේ සමුළුවේදී, “ද්වි රාජ්‍ය විසඳුම” ක්‍රියාවට නංවමින් වසර පහක් තුලදී ස්වාධීන පලස්තීන රාජ්‍යයක් නිර්මාණය කරන ලෙස අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ඉල්ලා සිටියේය. එහිදී වහාම ක්‍රියාත්මක වූ සටන් විරාමයකට ඊශ්‍රායලයේ ආරක්ෂාවද තහවුරු කරමින් එළඹිය යුතු බව අතිගරු ජනාධිපතිවරයා අවධාරණය කලේය.

ශ්‍රී ලංකාව විදේශයන් සමඟ පවතින මිත්‍ර සබඳතා වැඩි දියුණු කර ගනිමින් නව සබඳතා ස්ථාපිත කිරීමට කටයුතු කළේය. ඉන්දියාව, චීනය, ජපානය සහ ඉරානය වැනි සාම්ප්‍රදායික හවුල්කරුවන් මෙන්ම බටහිර රටවල් සමඟ ඉහළ මට්ටමේ සම්බන්ධතා 2023 වසරේදී ඇති කරගන්නා ලදී. නිදසුනක් වශයෙන්, ප්‍රංශ ජනාධිපතිවරයෙකු විසින් ප්‍රථම වරට ශ්‍රී ලංකාවට සිදුකරන ලද චාරිකාව 2023 දී සිදු විය. කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වයේ (RCEP) සාමාජිකත්වය ලබා ගැනීමට අයදුම්පතක් යොමු කිරීම වැනි කලාපීය සහයෝගීතාව වැඩි දියුණු කිරීම ඇතුළුව අග්නිදිග ආසියාව සහ අප්‍රිකාව සමඟ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීමට ද ශ්‍රී ලංකාව කටයුතු කරන ලදී.

2023 ඔක්තෝම්බර් මාසයේදී, සාමය, ස්ථාවරත්වය, ආරක්ෂණය සහ ආරක්ෂාව මෙන්ම නාවික නිදහස සහ ඉන්දියන් සාගරයේ නීල ආර්ථිකය කෙරෙහි ඇති උනන්දුව සැලකිල්ලට ගනිමින් "කලාපීය සහයෝගිතාව ශක්තිමත් කිරීම: ඉන්දියානු සාගර අනන්‍යතාවය ශක්තිමත් කිරීම" යන තේමාව යටතේ ශ්‍රී ලංකාව ඉන්දියන් සාගර වටද්දර සංගමයේ (IORA) මුලසුන ගත්තේය. IORA සිය සාමාජික රටවල් 23 සහ සංවාද පාර්ශවකරුවන් 10 සමඟ සාගරයේ තිරසාර සහ ආරක්ෂිත භාවිතය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරයි. IORA සභාපති ලෙස ශ්‍රී ලංකාව සාගරය ආශ්‍රිත මිනිස්, ඖෂධ සහ විනාශකාරී අවි ආයුධ ජාවාරම් වැනි ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධවලට එරෙහිව සටන් කිරීම මෙන්ම සැමගේ සමෘද්ධිය සඳහා නීල ආර්ථික සංකල්පය ප්‍රවර්ධනය කරමින් සමුද්‍රීය ආරක්ෂණය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරයි.

මීට අමතරව, ජාතික සමගිය සහ සංහිඳියාව පිළිබඳ රජයේ මුලපිරීම් සඳහා අමාත්‍යාංශය අඛණ්ඩව සහය දෙමින් සංහිඳියා යාන්ත්‍රණවලට අදාළ පහසුකම් සැලසීම සහ මානව හිමිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ස්වේච්ඡාවෙන් කරන ලද කැපවීම් ක්‍රියාවට නංවමින් එමගින් රටේ ජනතාවට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරයි. එමගින් ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා අපගේ සැබෑ උත්සාහයන් කෙරෙහි ඔවුන් විශ්වාසය තබනු ඇත. මීට අමතරව, විදේශීය පාර්ශවයන් ප්‍රකාශ කරන ශ්‍රී ලංකාව තුළ සිදු වූ බව කියන ජන සංහාරය සම්බන්ධ ව්‍යාජ චෝදනාවලටද අමාත්‍යාංශය ප්‍රබල ප්‍රතිප්‍රකාශ ලබා දීමට කටයුතු කළේය.

අමාත්‍යාංශයේ ජනතාවට වඩාත් සමීප වූ අංශය ලෙස කොන්සියුලර් කටයුතු අංශය සාමාන්‍ය ජනතාව වෙත සපයනු ලබන සිය සේවාවන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කළේය. ලේඛන සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම, වඩාත් කාර්යක්ෂම සහ බාධාවකින් තොරව සේවා සැපයීම, නව කොන්සියුලර් සේවා සපයන ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම සහ බත්තරමුල්ල ප්‍රදේශයේ කොන්සියුලර් සේවා ප්‍රධාන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට කටයුතු කිරීම ඊට ඇතුළත් විය.

2023 දී අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා විදේශ සේවයට නව නිලධාරීන් 20 දෙනෙකු බඳවා ගැනීම ඇතුළුව එහි මානව සම්පත් වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය ද ආරම්භ කරන ලදී. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් ලෙස පත් කරන ලද වෘත්තීය විදේශ සේවා නිලධාරීන් සංඛ්‍යාව ද වර්ෂය තුළ සැලකිය යුතු ලෙස වැඩි විය.

ඵලදායි මූල්‍ය සහ පරිපාලන කළමනාකරණය සහතික කරන අතරම, මූල්‍ය සීමාවන් තුළ අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පුළුල් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය. මධ්‍යම ආසියානු කලාපය ඇතුළුව ශ්‍රී ලංකාව අඩු රාජ්‍යතාන්ත්‍රික නියෝජනයක් පෙන්වන ලෝකයේ ප්‍රදේශවල නව දූත මණ්ඩල පිහිටුවීමේ ක්‍රියාවලීන් ආරම්භ කරන ලදී.

2023 දී, අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ සංචාරක විභවය සහ සංස්කෘතික හා ආගමික විවිධත්වය ඉස්මතු කරමින්, කොළඹ පිහිටි තානාපති කාර්යාල හා මහකොමසාරිස් කාර්යාලයන්හි සේවයේ නියුතු විදේශීය රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව සඳහා විශේෂ වැඩසටහන් කිහිපයක් ද සංවිධානය කරන ලදී.

**1.2 දැක්ම සහ මෙහෙවර**

## දැක්ම

ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම.

## මෙහෙවර

ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම

## 1.3 රාජකාරීන් හා කර්තව්‍යයන්

1 කොටස: වගන්තිය (I) - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍ර අංක: 2289/43 - 2022 ජූලි 22

| රාජකාරි සහ කර්තව්‍යයන් | II වැනි තීරුව (දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා) | III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ ප්‍රඥප්ති |
|---|---|---|
| 1. විදේශ කටයුතු විෂය සම්බන්ධයෙන් සහ රජය විසින් ක්‍රියාත්මක කරන ජාතික ප්‍රතිපත්ති මත පදනම්ව II තීරුවේ ලැයිස්තුගත කර ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා විෂය පථයට අයත් විෂයයන් පිළිබඳ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම, ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය සහ ඇගයීම. | 1. විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල | 1. 1981 අංක: 4 දරන කොන්සියුලර් කාර්යයන් පිළිබඳ පනත. |
| 2. අමාත්‍යාංශයේ විෂය පථය යටතේ එන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ ජනතා හිතකාමී ලෙස සැපයීම. | 2. ජාතික සාගර කටයුතු කමිටු ලේකම් කාර්යාලය | 2. 1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනත |
| 3. නවීන කළමනාකරණ ශිල්පීය ක්‍රම සහ තාක්ෂණය භාවිතා කරමින් සියලුම පද්ධති සහ ක්‍රියා පටිපාටි ප්‍රතිසංස්කරණය කිරීම සහ එමඟින් දූෂණය හා නාස්තිය තුරන් කරමින් අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු වන බව සහතික කිරීම. | 3. ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය | 3. 2000 අංක 45 දරන ශ්‍රී ලංකා උපායමාර්ගික අධ්‍යයන ආයතන පනත. |
| 4. ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව සහයෝගීතාවය පුළුල් කරමින් විදේශ රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාම මගින් විදේශයන්හි ශ්‍රී ලංකාව පිළිබඳ යහපත් ප්‍රතිරූපය ස්ථාවර කිරීම. | | 4. I සහ II තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති විෂයයන්ට අදාළ සහ වෙනත් කිසිදු අමාත්‍යවරයෙකුගේ විෂය පථය යටතට ගෙන නොමැති අනෙකුත් සියලුම නීති සම්පාදනය |
| 5. ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව ජාත්‍යන්තර සහයෝගීතාව පුළුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම, සම්බන්ධීකරණය සහ රජයට | | |

අවශ්‍ය උපදෙස් ලබාදීම.

6. ශ්‍රී ලංකාවේ යහපත් ප්‍රතිරූපයට බලපාන අහිතකර ප්‍රචාර මැඩලීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ස්ථාවර කිරීම සඳහා සුදුසු ලෙස ප්‍රතිචාර දැක්වීම.

7. දේශපාලන, ආර්ථික, පාරිසරික, සාමාජීය සහ සංස්කෘතික සහයෝගීතාවය පිළිබඳ ජාත්‍යන්තර සහ කලාපීය සංගම් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීම.

8. විදේශ රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වා ගැනීම සහ සන්ධාන, ගිවිසුම් සහ සම්මුතීන් සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම.

9. රාජ්‍යතාන්ත්‍රික මුක්තිය සහ වරප්‍රසාද ලබාදීම.

10. බාහිර වෙළඳාම, ආයෝජන, සංචාරක, රැකියා සහ බාහිර මූල්‍ය සම්බන්ධතා ප්‍රවර්ධනය සඳහා අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත අවශ්‍ය සහය ලබා දීම.

11. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව සහ සමුද්‍රීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විදේශ සබඳතා තහවුරු කිරීම.

12. විදේශ රටවල පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනයට අදාළව අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

13. කොන්සියුලර් සේවා සැපයීම.

14. ශ්‍රී ලංකා විදේශ සේවයේ සහ එතෙර රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලට අනුයුක්තව සිටින පිරිස් පරිපාලනය කිරීම සහ ඔවුන්ගේ වෘත්තීය

කුසලතා ඉහළ නැංවීමට පියවර ගැනීම.

15. භූ-දේශපාලනික ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ශ්‍රී ලංකාවේ යහපතට හිතකර ලෙස එවැනි ප්‍රවණතා කළමනාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු උපාය මාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.

16. II තීරුවේ සඳහන් සියලුම ආයතන සහ එම ආයතන වෙත පවරා ඇති සියලුම විෂයයන් සම්බන්ධ කරුණු අධීක්ෂණය කිරීම.

17. II තීරුවේ ලැයිස්තුගත කර ඇති සියලුම ආයතන අධීක්ෂණය.

## 1.4 ආයතනික ව්‍යුහය



## 1.5 විදේශදූත මණ්ඩල / දූත කාර්යාල ජාලය



## 1.6 අංශවල ව්‍යුහය



අමාත්‍යාංශයේ අංශවල ව්‍යුහය
අංශ ඒ හා සම්බන්ධ විෂය පථයන් සමඟ
දේශපාලන කටයුතු අංශ
මෙහෙයුම් අංශ
ආර්ථික කටයුතු අංශය
මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ හා පුහුණු අංශය
ජාත්‍යන්තර ආරක්ෂක සහයෝගිතා අංශය
සාගර කටයුතු, පරිසරය සහ දේශගුණික විපර්යාස අංශය
කාර්යය සාධන සමාලෝචන සහ ක්‍රියාත්මක කිරීම් අංශය සහ හදිසි ප්‍රතිචාර ඒකකය
මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය
සාර්ක් අංශය
එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය
අප්‍රිකානු කටයුතු අංශය
නැගෙනහිර ආසියානු අංශය
ලතින් අමෙරිකානු සහ කැරිබියානු අංශය
මැද පෙරදිග අංශය
යුරෝපය සහ උතුරු අමෙරිකානු අංශය
දකුණු ආසියානු අංශය
අග්නිදිග ආසියානු සහ මධ්‍යම ආසියානු අංශය
ගිණුම් හා මූල්‍ය අංශය
කොන්සියුලර් කටයුතු අංශය
සාමාන්‍ය පරිපාලන අංශය
මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය
අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය
නීති අංශය
විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය
සංධාන අංශය

## 2 වැනි පරිච්ඡේදය - ප්‍රගතිය සහ අනාගත දැක්ම

විදේශ කටයුතු අමාත්‍යාංශය 2023 වසර තුළදී ඵලදායී සහ සාර්ථක ජයග්‍රහණ අත්පත් කර ගන්නා ලදි. අතීත ජයග්‍රහණ මත පදනම්ව විවිධ අභියෝග ජය ගැනීම, ඒවාට මුහුණදීමේ හැකියාව සහ අධිෂ්ඨානය අමාත්‍යාංශය ප්‍රදර්ශනය කර ඇත. ලොව පුරා ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික පැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් වසර පුරා විවිධ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. අමාත්‍යාංශය ප්‍රධාන හවුල්කරුවන් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනගාගනිමින්, කලාපීය සහ ගෝලීය අභියෝග කෙරෙහි අවධානය යොමු කරමින් වෙළඳාම් සහ ආයෝජන කටයුතු ප්‍රවර්ධනය කිරීමට පියවර ගන්නා ලදි. ශ්‍රී ලංකාවේ ආර්ථිකය නංවාලීමට සහ එහි වර්ධනය සඳහා නව අවස්ථා නිර්මාණය කිරීමට ඉවහල්වන හවුල්කාරිත්වයන් සඳහා අමාත්‍යාංශය පහසුකම් සලසා ඇත. මීට අමතරව, අමාත්‍යාංශය ශ්‍රී ලාංකේය උරුමයන්හි වටිනාකම ලොව පුරා ප්‍රචලිත කිරීමට කටයුතු කර ඇති අතර අනෙකුත් රටවල් සමඟ මානව සබඳතා වර්ධනය කිරීමටද කටයුතු කර ඇත. 23 වැනි IORA සමුළුවෙහි සත්කාරකත්වය දැරීම ඇතුළු බහුපාර්ශ්වික සහ කලාපීය සංසද සඳහා දැක්වූ සක්‍රීය සහභාගීත්වය, අන්‍යෝන්‍ය උනන්දුවක් දක්වන විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගෝලීය සංවාදයන්ට සහ සහයෝගීතාවයන්ට දායකවීම තවත් වැදගත් ජයග්‍රහණයකි.

අනාගතය කෙරෙහි අවධානය යොමු කරන විට, අමාත්‍යාංශයේ අනාගත දැක්ම ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික පැවැත්ම වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. ප්‍රධාන කලාප සහ අගනගරවල ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික නියෝජනය පුළුල් කරමින් රාජ්‍යතාන්ත්‍රික සබඳතා තවදුරටත් ශක්තිමත් කරනු ඇත. වත්මන් ඩිජිටල් යුගයට අනුකූලව, අමාත්‍යාංශය සිය සබැඳි පැවැත්ම සහ ගෝලීය ප්‍රජාව සමඟ සබඳතා වැඩි දියුණු කිරීමට මෙන්ම රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා ඩිජිටල් වේදිකාවන් යොදාගනු ඇත. විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය කිරීමට දරන ප්‍රයත්නයන් ප්‍රමුඛ වූ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වනු ඇත. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, සංචාරක ව්‍යාපාරය සහ උරුමයන් ගෝලීය ප්‍රජාවන් අතර ප්‍රචලිත කිරීම කෙරෙහි ද අමාත්‍යාංශය අවධානය යොමු කරනු ඇත. එපමණක් නොව, දේශගුණික විපර්යාස පිළිබඳ අවධානය යොමු කිරීමට සහ තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රවර්ධනය කිරීමටද අමාත්‍යාංශය ගෝලීය ප්‍රයත්නවල නිරත වනු ඇත. විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින් සඳහා කොන්සියුලර් සේවා වැඩිදියුණු කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇති අතර ඒවායේ කාර්යක්ෂමතාව සහ ප්‍රවේශ්‍යතාව ඉහළ නැංවීම කෙරෙහිද අමාත්‍යාංශය අවධානය යොමු කරයි. ශ්‍රී ලංකාවේ සහ එහි ජනතාවගේ අභිවෘද්ධිය සඳහා තම අරමුණු සහ පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට අමාත්‍යාංශය අඛණ්ඩව කැපවීමෙන් කටයුතු කරනු ඇත.

### 2.1. ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශය

සමාලෝචිත කාල සීමාව තුළ, අතිගරු ජනාධිපති, ගරු අගමැති, ගරු විදේශ කටයුතු අමාත්‍ය, ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය සහ විදේශ කටයුතු ලේකම් ඇතුළු ශ්‍රී ලංකාවේ විවිධ ඉහළ පෙළේ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් ඔවුන්ගේ විදෙස් පාර්ශවකරුවන් සහ නියෝජිතයන් සමඟ ශ්‍රී ලාංකේය ජාතික ප්‍රමුඛතාවයන් පෙරදැරිව කටයුතු සිදු කරන ලදි. මෙම කාලය තුළ සිදු කරන ලද කැපී පෙනෙන සංචාර අතර ජනාධිපතිතුමා එක්සත් රාජධානියේ III වන චාල්ස් රජුගේ රාජාභිෂේක උත්සවයට සහභාගී වීම මෙන්ම ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව, කියුබාව, ජර්මනිය සහ මාලදිවයින යන රටවල සිදුකළ සංචාර ඇතුළත් වේ. ඩුබායි හි පැවති දේශගුණ විපර්යාසයන් පිළිබඳව පාර්ශවයන් අතර වූ 28 වැනි සමුළුව (COP 28) සඳහා අතිගරු ජනාධිපතිතුමා සහභාගී විය. ප්‍රංශ ජනරජයේ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන්ගේ ශ්‍රී ලංකා සංචාරය ශ්‍රී ලංකාව සහ ප්‍රංශය අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළ අතර එය ප්‍රංශ ජනාධිපතිවරයෙකුගේ පළමු ශ්‍රී ලාංකික සංචාරය විය.

එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම් උත්සවයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා තායිලන්ත සංචාරයක නිරත විය. බංග්ලාදේශය, මාලදිවයින, නේපාලය යන රටවල විදේශ අමාත්‍යවරුන් සහ පොදුරාජ්‍ය

මණ්ඩලීය මහලේකම්වරයා ඇතුළු ඉහළ පෙළේ විදේශීය ප්‍රභූවරුන් කිහිප දෙනෙකු 75 වැනි නිදහස් සැමරුම් උත්සවයට සහභාගී වීමට ශ්‍රී ලංකා රජය විසින් කරන ලද නිල ආරාධනා මත පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියහ. අප්‍රිකානු කලාපයේ දූත මණ්ඩල ප්‍රධානීන් 17 දෙනෙකුගේ, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ව්‍යාපාරික නායකයින්ගේ සහභාගීත්වයෙන් 2023 පෙබරවාරි 3 වන දින පැවති ව්‍යාපාරික සංසදය අතරතුරදී ශ්‍රී ලංකාවේ 'Look Africa ප්‍රතිපත්තිය' හඳුන්වා දෙන ලදි.

ආර්ථික අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාව ගත් ක්‍රියාමාර්ග සඳහා ජාත්‍යන්තර ප්‍රජාව ලබාදුන් සහයෝගය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහ නැවත සවිබල ගැන්වීමට දායක විය. විදේශ කටයුතු අමාත්‍යවරයා, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සහ විදේශ කටයුතු ලේකම්වරිය විසින් විවිධ රටවල සිදු කරන ලද නිල සංචාර ශ්‍රී ලංකාව සහ විදේශ ජාතීන් අතර සහයෝගීතාවය සඳහා නව මානයන් විවෘත කරන ලදී. පහත දැක්වෙන වගු, I සහ II, සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සහ බාහිර වශයෙන් සිදුවූ ඉහළ මට්ටමේ සංචාර පිළිබඳ විස්තර නිරූපණය කෙරේ.

*වගුව I - ඉහළ මට්ටමේ සංචාර - අභ්‍යන්තර*

**රාජ්‍ය නායකවරුන්/ ආණ්ඩු ප්‍රධානීන්**

| | | |
|---|---|---|
| 1. | මාලදිවයින් ජනරජයේ ජනාධිපති ඊබ්‍රාහිම් මොහොමඩ් සෝලි මහතා ශ්‍රී ලංකාවේදී සිදුකල පුද්ගලික සංචාරය | 2022 දෙසැම්බර් 29 සිට 2023 ජනවාරි 02 දක්වා |
| 2. | ජාත්‍යන්තර බෝරා ප්‍රජාවේ අධ්‍යාත්මික නායක ආචාර්ය සයිඩ්නා මුෆද්දල් සයිෆුදීන් සහේබ් මහතා ආරාධිත රාජ්‍ය අමුත්තෙකු ලෙස සිදුකල සංචාරය | 2023 මාර්තු 01 සිට 17 දක්වා |
| 3. | ප්‍රංශ ජනරජයේ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් මහතා සිදුකල සංචාරය (මාර්ගස්ථ) | 2023 ජූලි 28 සිට 29 දක්වා |
| 4. | ජාත්‍යන්තර බෝරා ප්‍රජාවේ අධ්‍යාත්මික නායක ආචාර්ය සයිඩ්නා මුෆද්දල් සයිෆුදීන් සහේබ් මහතා ආරාධිත රාජ්‍ය අමුත්තෙකු ලෙස සිදුකල සංචාරය | 2023 නොවැම්බර් 5 සිට 20 දක්වා |

**විදේශ අමාත්‍යවරු**

| | | |
|---|---|---|
| 1. | බංග්ලාදේශයේ විදේශ අමාත්‍ය ආචාර්ය ඒ.කේ. අබ්දුල් මොමන් මහතා | 2023 පෙබරවාරි 02 සිට 05 දක්වා |
| 2. | ජපානයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු ටකෙයි ෂුන්සුකේ මහතා | 2023 පෙබරවාරි 02 සිට 04 දක්වා |
| 3. | මාලදිවයිනේ විදේශ කටයුතු අමාත්‍ය ගරු අබ්දුල්ලා ෂාහිඩ් මහතා | 2023 පෙබරවාරි 01 සිට 05 දක්වා |
| 4. | නේපාල විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය ගරු බිමලා රායි පෝඩෙල් මහතා | 2023 පෙබරවාරි 02 සිට 05 දක්වා |
| 5. | පකිස්ථානයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු හිනා රබ්බානි කාර් මහතා | 2023 පෙබරවාරි 03 සිට 04 දක්වා |
| 6. | චීනයේ විදේශ කටයුතු උප අමාත්‍ය ගරු ජුන් වෙයිදොන් මහතා | 2023 මැයි 29 සිට ජුනි 01 දක්වා |
| 7. | මාලදිවයිනේ විදේශ කටයුතු අමාත්‍ය ගරු අබ්දුල්ලා ෂාහිඩ් මහතා | 2023 ජුනි 07 |
| 8. | ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු හයුෂි යොෂිමසා මහතාගේ සංචාරය | 2023 ජුනි 28 සිට 29 දක්වා |

| | | |
|---|---|---|
| 9. | මැලේසියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු සැම්බ් බින් අබ්දුල් කදීර් මහතාගේ සංචාරය | 2023 ඔක්තෝම්බර් 08 සිට 12 දක්වා |
| 10. | බංග්ලාදේශ ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය ඒ.කේ. අබ්දුල් මොමන් මහතා | 2023 ඔක්තෝම්බර් 11 සිට 12 දක්වා |
| 11. | ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය ගරු එස්. ජයශංකර් මහතා | 2023 ඔක්තෝම්බර් 11 සිට 12 දක්වා |
| 12. | මොරිෂස්හි විදේශ කටයුතු අමාත්‍ය ගරු මනීෂ් ගෝබින් මහතා | 2023 ඔක්තෝම්බර් 11 සිට 12 දක්වා |
| 13. | දකුණු අප්‍රිකාවේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අමාත්‍ය ගරු නලේඩි පන්ඩර් මහතා | 2023 ඔක්තෝම්බර් 11 සිට 12 දක්වා |
| 14. | ටැන්සානියාවේ නීල ආර්ථිකය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු සුලෙයිමාන් මැසවුන්ඩ් මක්කානේ මහතා | 2023 ඔක්තෝම්බර් 11 සිට 12 දක්වා |

**පාර්ලිමේන්තු කථානායකවරුන්ගේ සහ අනෙකුත් අමාත්‍යවරුන්ගේ සංචාර**

| | | |
|---|---|---|
| 1. | භූතානයේ අධ්‍යාපන සහ නිපුණතා සංවර්ධන අමාත්‍ය ගරු ජායි බිර් රායි මහතා | 2023 පෙබරවාරි 02 සිට 07 දක්වා |
| 2. | ඉන්දීය විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වී. මුරලිදරන් මහතා | 2023 පෙබරවාරි 02 සිට 05 දක්වා |
| 3. | පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් ගරු පැට්‍රීෂියා ස්කොට්ලන්ඩ් මහත්මිය | 2023 පෙබරවාරි 01 සිට 05 දක්වා |
| 4. | ධීවර, සත්ව පාලන සහ පශු සම්පත් අමාත්‍යාංශයේ සහ තොරතුරු හා විකාශන අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය එල්. මුරුගන් මහතා | 2023 පෙබරවාරි 09 සිට 11 දක්වා |
| 5. | ආර්මේනියාවේ අගමැති ආර්යයා, ගරු ඇනා කෝසල හකෝබයාන් මහත්මියගේ පුද්ගලික සංචාරය | 2023 අප්‍රේල් 06 |
| 6. | මාලදිවයින් රජයේ ධීවර, ජලජ සම්පත් සහ කෘෂිකර්ම අමාත්‍ය ආචාර්ය ගරු එම්. හසන් මහතා | 2023 ජූනි 04 සිට 08 දක්වා |
| 7. | ආසියානු කටයුතු පිළිබඳ ඊජිප්තු සහකාර විදේශ අමාත්‍ය ගරු එම්. අයිමාම් කමල් මහතා | 2023 ජූලි 17 සිට 20 දක්වා |
| 8. | ඉන්දියාවේ විදේශ කටයුතු ලේකම්ගේ සංචාරය | 2023 ජූලි 10 සිට 11 දක්වා |
| 9. | බිම්ස්ටෙක් මහලේකම්වරයාගේ සංචාරය | 2023 ජූලි 23 සිට 27 දක්වා |
| 10. | සහකාර විදේශ අමාත්‍ය ගරු ටිම් වොට්ස් මහතා | 2023 ඔක්තෝබර් 11 සිට 12 දක්වා |
| 11. | ටැන්සානියාවේ නීල ආර්ථිකය සහ ධීවර අමාත්‍ය ගරු සුලෙයිමාන් මැසවුන්ඩ් මක්කානේ මහතා | 2023 ඔක්තෝබර් 11 සිට 12 දක්වා |
| 12. | විදේශ කටයුතු උප අමාත්‍ය ගරු ශිහාසක් පුනන්ග්කෙට්කෙව් මහතා | 2023 ඔක්තෝබර් 11 සිට 12 දක්වා |
| 13. | එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආර්ථික සහ වෙළඳ කටයුතු පිළිබඳ සහකාර අමාත්‍ය ගරු සයීඩ් මුබාරක් මහතා | 2023 ඔක්තෝබර් 11 සිට 12 දක්වා |
| 14. | යේමනයේ නියෝජ්‍ය විදේශ අමාත්‍ය ගරු අවුසාන් අබ්දුල්ලා මහතා | 2023 ඔක්තෝබර් 11 සිට 12 දක්වා |

| | | |
|---|---|---|
| 15. | ජපානයේ විදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු උප අමාත්‍ය ගරු මසාහිරෝ කොමුරා මහතා | 2023 ඔක්තෝබර් 11 සිට 12 දක්වා |
| 16. | සෞදි අරාබි රාජධානියේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු වලීඩ් එස්කෙර්ජි මහතා | 2023 ඔක්තෝබර් 11 සිට 12 දක්වා |
| 17. | එක්සත් රාජධානියේ ඉන්දු පැසිෆික් අමාත්‍ය ගරු ඈන් මාරි ට්‍රෙවෙලියන් මහත්මිය | 2023 ඔක්තෝබර් 11 සිට 12 දක්වා |
| 18. | ඉන්දියාවේ ගරු මුදල් අමාත්‍ය ආචාර්ය නිර්මලා සීතාරම් මහත්මිය | 2023 නොවැම්බර් 01 සිට 03 දක්වා |
| 19. | චීනයේ රාජ්‍ය උපදේශක ගරු ශෙන් යීකින් මහතා | 2023 නොවැම්බර් 18 සිට 21 දක්වා |
| 20. | රුසියානු ආරක්ෂක කවුන්සිලයේ ලේකම් ගරු නිකොලායි පත්රෂෙව් මහතා | 2023 නොවැම්බර් 28 |

**වෙනත් විදේශීය සම්භාවනීය අමුත්තන්**

| | | |
|---|---|---|
| 1. | කොරියානු ජනරජයේ ජනාධිපති විශේෂ නියෝජිත (දේශපාලන කටයුතු පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ ලේකම්) ගරු ලී ජින්-බොක් මහතාගේ සංචාරය | 2023 මාර්තු 22 |
| 2. | හිටපු විධායක අධ්‍යක්ෂ/UNEP එරික් සෝල්හයිම් මහතාගේ සංචාරය | 2023 මාර්තු 26 සිට 30 දක්වා |
| 3. | CTBTO හි විධායක ලේකම් ආචාර්ය රොබට් ෆ්ලොයිඩ් මහතා | 2023 ජූනි 31 සිට 05 දක්වා |
| 4. | චීනයේ යුනාන් පළාතේ ආණ්ඩුකාරවරයාගේ සංචාරය | 2023 මැයි 16 සිට 20 දක්වා |
| 5. | ශ්‍රී ලංකාවේ ඊශ්‍රායල තානාපතිවරයාගේ සංචාරය (නවදිල්ලි නුවර) | 2023 ජූනි 02 සිට 06 දක්වා |
| 6. | තායිලන්ත විදේශ ලේකම් සරුන් චාරෝන්සුවන් මහතාගේ සංචාරය | 2023 අගෝස්තු 26 සිට 29 දක්වා |
| 7. | IORA හි මහලේකම් ආචාර්ය සල්මන් අල් ෆාරිසි මහතා | 2023 ඔක්තෝබර් 08 සිට 12 දක්වා |

**සම්මන්ත්‍රණ සහ අනෙකුත් සිදුවීම්**

| | | |
|---|---|---|
| 1. | 75 වන නිදහස් දින සංවත්සරය සහ අදාළ සිදුවීම් | 2023 පෙබරවාරි 01 සිට 15 දක්වා |
| 2. | සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ IORA ක්‍රියාකාරී කණ්ඩායමේ 03 වන රැස්වීම | 2023 මාර්තු 01 |
| 3. | න්‍යෂ්ටික ව්‍යාප්තිය සහ නිරායුධකරණය පිළිබඳ 14 වැනි ආසියාන් කලාපීය සංසද අන්තර් සැසි රැස්වීම | 2023 මැයි 14 |
| 4. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ IFTAR රාත්‍රී භෝජන සංග්‍රහය | 2023 අප්‍රේල් 03 |
| 5. | ජාත්‍යන්තර සමගිය - 2023 | 2023 ජූනි 02 |
| 6. | විදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙසක් උත්සවය - 2023 | 2023 මැයි 30 |
| 7. | ශ්‍රී ලංකා -මාලදිවයින් ඒකාබද්ධ කොමිසම | 2023 ජූනි 07 |

| | | |
|---|---|---|
| 8. | IORA අමාත්‍ය සමුළුව | 2023 ඔක්තෝබර් 8 සිට 12 දක්වා |

*වගුව II- ඉහළ මට්ටමේ සංචාර- බාහිර*

**අතිගරු ජනාධිපතිතුමා**

| | | |
|---|---|---|
| 1. | එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර තුන්වන චාල්ස් රජුගේ රාජාභිෂේකය සඳහා ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ සංචාරය | 2023 මැයි 04-08 |
| 2. | අතිගරු ජනාධිපතිතුමාගේ ජපාන, මැලේසියා, සිංගප්පූරු සංචාර | 2023 මැයි 22-23 සිංගප්පූරුව<br>2023 මැයි 24 - 25 ජපානය<br>2023 මැයි 26 - 27 මැලේසියාව |
| 3. | එක්සත් රාජධානියේ 2023 IDU සංසදය සහ 2023 නව ගෝලීය මූල්‍ය ගිවිසුම සඳහා වන සමුළුව සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ සංචාරය | 2023 ජූනි 17-21 ලන්ඩන්, එක්සත් රාජධානිය<br>2023 ජූනි 21 - 25 පැරිස්, ප්‍රංශය |
| 4. | අතිගරු ජනාධිපතිතුමාගේ ඉන්දීය නිල සංචාරය | 2023 ජූලි 20-21 |
| 5. | අතිගරු ජනාධිපතිතුමාගේ සිංගප්පූරු නිල සංචාරය | 2023 අගෝස්තු 21-22 |
| 6. | කියුබාවේ රාජ්‍ය නායක සමුළුවට සහ 77 කණ්ඩායමට, "වර්තමාන සංවර්ධන අභියෝග: විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදනයේ කාර්යභාරය" යන මැයෙන් චීනයේ පැවති රාජ්‍ය නායක සමුළුවට සහභාගී වීමට අතිගරු ජනාධිපතිතුමා කියුබාවට සහ චීනයට සංචාරය කරන ලදී. | 2023 සැප්තැම්බර් 13-16 |
| 7. | 78 වන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමට සහභාගී වීමට අතිගරු ජනාධිපතිතුමා නිව්යෝර්ක් බලා පිටත්ව ගියේය. | 2023 සැප්තැම්බර් 16-21 |
| 8. | අතිගරු ජනාධිපතිතුමාගේ ලන්ඩන් සංචාරය | 2023 සැප්තැම්බර් 21-22 |
| 9. | බර්ලින් ගෝලීය සංවාදයට සහභාගී වීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ජර්මන් සංචාරය | 2023 සැප්තැම්බර් 27-30 |
| 10. | අතිගරු ජනාධිපතිතුමාගේ චීන සංචාරය | 2023 ඔක්තෝබර් 15-21 |
| 11. | අතිගරු ජනාධිපතිතුමාගේ මාලදිවයින් සංචාරය | 2023 නොවැම්බර් 15-18 |
| 12. | COP 28 සමුළුවට සහභාගී වීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ඩුබායි සංචාරය | 2023 නොවැම්බර් 30 - දෙසැම්බර් 04 |

**ගරු අග්‍රාමාත්‍යතුමා**

| | | |
|---|---|---|
| 1. | එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම් උත්සවයට සහභාගී වීම සඳහා ගරු අග්‍රාමාත්‍යවරයාගේ තායිලන්තයේ නිල සංචාරය | 2023 මැයි 31- ජූනි 03 |

**ගරු විදේශ කටයුතු අමාත්‍ය**

| | | |
|---|---|---|
| 1. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සෞදි අරාබි නිල සංචාරය | 2023 ජනවාරි 21 - 23 |
| 2. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ඉන්දියාවේ, කේරළ නිල සංචාරය | 2023 පෙබරවාරි 10 - 13 |
| 3. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ඉන්දීය නිල සංචාරය | 2023 මාර්තු 02 - 04 |
| 4. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ එක්සත් රාජධානියේ, ලන්ඩන් නිල සංචාරය | 2023 මාර්තු 12 - 16 |
| 5. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ දකුණු අප්‍රිකානු නිල සංචාරය | 2023 මාර්තු 22-25 |
| 6. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ දකුණු කොරියානු නිල සංචාරය | 2023 අප්‍රේල් 02 - 05 |
| 7. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ස්වීඩනයේ, ස්ටොක්හෝම් නිල සංචාරය | 2023 මැයි 12 - 13 |
| 8. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ චීන නිල සංචාරය | 2023 ජූනි 24 - 30 |
| 9. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ජකර්තා සහ තායිලන්ත නිල සංචාරය | 2023 ජූලි 13-19 |
| 10. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ඉරාන නිල සංචාරය | 2023 අගෝස්තු 04-07 |
| 11. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ 78 වන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමට සහභාගී වීමට වොෂින්ටන් සහ නිව්යෝර්ක් වෙත නිල සංචාරය | 2023 සැප්තැම්බර් 18-26 |
| 12. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ චීන නිල සංචාරය | 2023 ඔක්තෝබර් 20-24 |
| 13. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ මුරුසි නිල සංචාරය | 2023 නොවැම්බර් 16-18 |
| 14. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි නිල සංචාරය | 2023 නොවැම්බර් 30 - දෙසැම්බර් 4 |
| 15. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ දෝහා කටාර් නිල සංචාරය | 2023 දෙසැම්බර් 10-11 |
| 16. | ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නේපාලයේ කත්මන්ඩු නිල සංචාරය | 2023 දෙසැම්බර් 21-22 |

**ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා**

| | | |
|---|---|---|
| 1. | ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගේ බංග්ලාදේශ නිල සංචාරය | 2023 මැයි 12 - 13 |
| 2. | ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගේ සෞදි අරාබි නිල සංචාරය | 2023 මැයි 21 - 24 |
| 3. | ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගේ පෝලන්ත නිල සංචාරය | 2023 ජූනි 13-20 |
| 4. | ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගේ චීන නිල සංචාරය | 2023 අගෝස්තු 16-19 |
| 5. | ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉන්දුනීසියානු නිල සංචාරය | 2023 ඔක්තෝබර් 10-11 |

**2.2 ශ්‍රී ලංකාවේ කලාපීය සහ බහුපාර්ශ්වික කටයුතු**

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළදී, ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංවිධානයේ (IORA) කලාපීය මට්ටමින් රැස්වීම් සහ සම්මන්ත්‍රණ කිහිපයකට ශ්‍රී ලංකාව සත්කාරකත්වය දැරීම සහ සහභාගී වීම සිදු කළේය. 2023 ඔක්තෝබර් 11 වැනි දින කොළඹදී පැවති එහි 23 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකාව විසින් IORA හි සභාපතිත්වය භාර ගන්නා ලදී.

2023 මාර්තු මාසයේදී තායිලන්තයේ බැංකොක් නුවරදී පැවති බිම්ස්ටෙක් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ (SOM) 23 වැනි සැසිවාරයට සහ 19 වැනි බිම්ස්ටෙක් අමාත්‍ය මණ්ඩල රැස්වීමට (MM) සහභාගී වීමෙන් මෙම කලාපීය සංවිධානය සඳහා ශ්‍රී ලංකාව දක්වන කැපවීම තවදුරටත් අවධාරණය කලේය.

2023 මැයි මාසයේදී කොරියානු ජනරජයේ පැවති ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) පාලක මණ්ඩලයේ වාර්ෂික රැස්වීමට විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සහභාගීත්වය ශ්‍රී ලංකාව කලාපීය කටයුතු කෙරෙහි දක්වන උනන්දුව තවදුරටත් විදහා දැක්වීය. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) 78 වැනි සැසිවාරයට රාජ්‍ය නායක මට්ටමින් වූ ශ්‍රී ලංකාවේ සහභාගීත්වය එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ බහුපාර්ශ්වික සබඳතා සඳහා ශ්‍රී ලංකාව දක්වන කැපවීම ප්‍රදර්ශනය විය. මානව හිමිකම් සහ ප්‍රතිසන්ධාන ගැටළු විසඳීම සඳහා ශ්‍රී ලංකාවද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සමඟ අඛණ්ඩව සම්බන්ධ විය. ශ්‍රී ලංකාව මානව හිමිකම් කවුන්සිලයේ (HRC) 52, 53 සහ 54 වැනි සැසිවාරවලට සහභාගි විය. ප්‍රතිසන්ධාන ප්‍රයත්නවල කොටසක් ලෙස, විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අධිකරණ අමාත්‍යවරයා දකුණු අප්‍රිකාවේ සිදුකළ අධ්‍යයන සංචාර, සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසමේ (TRC) දකුණු අප්‍රිකානු ආකෘතිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා සිදු කරන ලදී.

සිවිල් සමාජය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ පුළුල් උපදේශන සහිතව සකස් කරන ලද විශ්ව කාලාන්තර සමාලෝචනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික වාර්තාව විශ්ව කාලාන්තර සමාලෝචනයේ (UPR) 4 වැනි චක්‍රයට සහභාගි වෙමින් මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ, 1996 ඔක්තෝබර් 24 දින අත්සන් කරන ලද විස්තීරණ න්‍යෂ්ටික පරීක්ෂණ තහනම් කිරීමේ ගිවිසුම (CTBT) ලොව පුරා න්‍යෂ්ටික පිපිරීම් තහනම් කිරීමට ශ්‍රී ලංකාවේ කැපවීම පෙන්නුම් කරන වැදගත් සන්ධිස්ථානයක් විය.

**2.3 අභියෝගවලට මුහුණ දීම**

රාජ්‍ය වියදම් අඩුකිරීමේ ජාතික ප්‍රයත්නයට දායක වෙමින් විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හැට එක (61) ම ඔවුන්ගේ මානව සම්පත් අවම වශයෙන් යොදාගෙන සිය රාජකාරි කාර්යක්ෂමව ඉටු කර ඇත.

කොළඹ, යාපනය, මාතර, මහනුවර, ත්‍රිකුණාමලය, කුරුණෑගල යන ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල හරහා මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හරහා මහජනතාවට කොන්සියුලර් සේවාවන් ලබා දීමෙන් අමාත්‍යාංශය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කර ඇත. කොන්සියුලර් අංශයේ තිරසාර ඩිජිටල්කරණ මුලපිරීම් මගින් 2023 අගෝස්තු මාසයේ සිට අ.පො.ස සා/පෙළ සහ උ/පෙළ සහතික සඳහා මාර්ගගත සත්‍යාපන පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙම e-DAS ක්‍රමය මගින් අයදුම්කරුවන්ට ඔවුන්ගේ අ.පො.ස සා/පෙළ සහ උ/පෙළ සහතික සත්‍යාපනය සඳහා කොළඹ කොන්සියුලර් අංශයට පැමිණීම අවශ්‍ය නොවේ.

මූල්‍ය අර්බුදය හේතුවෙන් රට බරපතල වෛද්‍ය උපකරණ හා ඖෂධ හිඟයකට ලක්ව තිබූ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඉන්සියුලින්, මන්දපෝෂණ ඖෂධ සහ අනෙකුත් අත්‍යවශ්‍ය ඖෂධ ඇතුළු විවිධ රටවලින් අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම සඳහා අමාත්‍යාංශයේ හදිසි ප්‍රතිචාර අංශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. මීට අමතරව, තුර්කියේ භූමිකම්පාවෙන් විපතට පත් වූවන්ට සහ මියන්මාරයේ සුළි කුණාටුවෙන් විපතට පත් වූවන්ට විදේශ මානුෂීය ආධාර ලෙස ලංකා තේ සහ ඇඟලුම් පරිත්‍යාගද මෙම ඒකකය සංවිධානය කළේය.

2023 වර්ශයේ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පුද්ගල ජාවාරම් (TIP) වාර්තාවේ ශ්‍රී ලංකාවේ ස්ථානය දෙවන ස්ථරයේම (Tier 2) පවත්වා ගැනීමට මහත් පරිශ්‍රමයක් දරණ ලදී.

සමස්තයක් වශයෙන්, මෙම වාර්තාව 2023 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා අමාත්‍යාංශයේ කාර්ය සාධනය සමාලෝචනය කරන අතර, එක් එක් අංශය විසින් විදේශයන්හි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල, රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන, කොළඹ පදනම් කරගත් විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කරන ලද කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කරයි.

### 2.4 කාර්ය සාධන දළ විශ්ලේෂණය :අංශ ඒ හා සම්බන්ධ විෂය පථයන් සමඟ

### 2.4.1 ආර්ථික කටයුතු අංශය

ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීමට අදාළ ක්‍රියාකාරකම් ආර්ථික කටයුතු අංශයට ප්‍රධාන වශයෙන් පැවරී ඇත. එය එතෙර ශ්‍රී ලංකාවේ ආර්ථික අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපාය මාර්ගික සහය සහ මගපෙන්වීම සපයන අතරම, විදේශ දූත මණ්ඩල සහ ශ්‍රී ලංකාවේ රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන අතර සම්බන්ධීකරණ කාර්යභාරය ඉටු කරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යයක් වන ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහන යටතේ දූත මණ්ඩල සඳහා ආර්ථික ඉලක්ක පැවරීම ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මුදල් අමාත්‍යාංශය සහ එහි අනුබද්ධ ආයතන වන (බාහිර සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව ආදිය), වාණිජ දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, වාණිජ මණ්ඩල, ඒකාබද්ධ ඇඟලුම් සංගමය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), කොළඹ කොටස් හුවමාරුව (CSE) ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කෙරේ.

### 2.4.1.1. ආර්ථික කටයුතු (ද්විපාර්ශ්වික)

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සම්බන්ධවී කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල බාහිර සම්පත් දෙපාර්මේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමග සම්බන්ධ වී කටයුතු කරන ලදී. එසේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ක්‍රියාවලිය සඳහා සහාය ලබාගැනීමට පැරිස් සමාජයේ සාමාජික රටවල් හා ඉන්දියාව සමඟ වැදගත් සමුළු පවත්වනු ලැබූ අතර චීනයේ සහයෝගය ලබාගැනීමටද කටයුතු කරන ලදී. රටේ හදිසි අවශ්‍යතා වන ඉන්ධන, තිරිඟු පිටි, ඖෂධ, පොහොර, රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ රේඛීය අමාත්‍යාංශ සහ අදාළ විදේශ දූත මණ්ඩල සමඟ මෙම අංශය කටයුතු කළේය. ජාතික වෙළඳ සාකච්ඡා කමිටුවේ (NTNC) සාමාජිකයෙකු ලෙස, ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාවට නැංවීම, ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, ඉන්දියාව, බංග්ලාදේශය සහ ඉන්දුනීසියාව ඇතුළු රටවල් සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ වරණීය වෙළෙඳ ගිවිසුම් සඳහා සාකච්ඡා නැවත ආරම්භ කිරීම සහ කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය වෙත ප්‍රවේශ වීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. "Look Africa ප්‍රතිපත්තිය" සමඟ පෙළගැසෙමින්, 2023 පෙබරවාරි සහ මාර්තු මාසවලදී ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සහ ව්‍යාපාරික නායකයින්ගේ සහභාගීත්වයෙන් පැවති ව්‍යාපාරික සංසදයක් අංශය විසින් සංවිධානය කරන ලදී. වෙළඳ ප්‍රදර්ශන සහ අනෙකුත් ව්‍යාපාරික කටයුතුවලට සහභාගී වීම සඳහා ශ්‍රී ලාංකික ව්‍යාපාරවලට වීසා බලපත්‍ර පහසුකම් සපයන ලදී. සෞදි අරාබියට සහ රුමේනියාවට ඉදිකිරීම් අංශයේ රැකියා සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයන්හි නියෝජිත සංචාර සංවිධානය කරන ලද අතර පාකිස්ථානයේ සිට ව්‍යාපාරික නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණීමට පහසුකම් සැලසීය. "විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ දූත මණ්ඩලවල සංචාරක පුනර්ජීවන කාර්යභාරය" පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. සංචාරක කර්මාන්තයේ වර්ධනයන් පිළිබඳව අදාළ අගනගරවල මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීමට සහ ශ්‍රී ලංකාව පිළිබඳ අහිතකර ප්‍රචාරණයට විසඳුම් සෙවීමට දූත මණ්ඩල මෙහෙයවන ලදී. රේඛීය

ආයතන සමඟ සම්බන්ධීකරණයෙන්, ආයෝජන සහ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගගත රැස්වීම් සංවිධානය කරන ලද අතර දූත මණ්ඩල/ කාර්යාල මගින් සිදුකරන ප්‍රවර්ධන කටයුතු සඳහා ආර්ථික රාජ්‍යතාන්ත්‍රික අයවැයෙන් අරමුදල් වෙන් කරන ලදී.

### 2.4.1.2. ආර්ථික කටයුතු (බහුපාර්ශ්වික)

මෙම අංශය ශ්‍රී ලංකාවේ ඉන්දියානු සාගර ආශ්‍රිත රටවල සංවිධානයේ (IORA) කේන්ද්‍රස්ථානය වේ. 2023 දී, අදාළ රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණයෙන් IORA ආශ්‍රිත රැස්වීම්/වැඩමුළු/පුහුණු වැඩසටහන් 30කට සහභාගීවූ අතර පහසුකම්ද සලසා දී ඇත. 2023 ඔක්තෝබර් 9 සිට 11 දක්වා කොළඹ පැවති 23 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සහ 25 වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු රැස්වීමේදී ශ්‍රී ලංකාව වසර දෙකක කාලයක් සඳහා (2023 - 2025) IORA හි සභාපතිත්වය භාර ගත්තේය. මෙම අංශය IORA සම්බන්ධ රැස්වීම් 17කට ක්‍රියාකාරීව සම්බන්ධ වෙමින් ඒවායින් අපේක්ෂිත අරමුණු ඉහළ නැංවීමට දායකත්වය ලබා දෙන ලදී.

IORA හි සභාපතිවරයා ලෙස ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සංවාද පාර්ශවකරුවන් අතර 25 වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ IORA කමිටු (CSO) අන්තර් ක්‍රියාකාරී සංවාදය සහ 23 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීම (COM) ශ්‍රී ලංකා රජය විසින් 2023 ඔක්තෝබර් 9-11 දක්වා කොළඹදී පවත්වන ලදී. 2023 සැප්තැම්බර් 27 වැනි දින පැවති ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු රැස්වීමේ මූල්‍ය පිළිබඳ IORA අනු කමිටුව (SCF), 29 වැනි ඉන්දියානු සාගර ආශ්‍රිත ව්‍යාපාර සංසදය (IORB Business Forum) සහ 2023 මැයි 11 වැනි දින පැවති 3 වැනි ආයතනික විධිවිධාන සහ නියැලීම් පුළුල් කිරීමේ රැස්වීම (IABE) සඳහා ශ්‍රී ලංකාව විසින් මාර්ගගත සත්කාරකත්වය සපයන ලදී. ඉහත IORA රැස්වීම් සූදානම් කිරීමේ සහ වැදගත් කරුණු සැකසීමේ ප්‍රධාන කාර්යභාරය මෙම අංශය විසින් ඉටු කරන ලදී.

මෙම අංශය ශ්‍රී ලංකාවේ බිම්ස්ටෙක් සංවිධාන කේන්ද්‍රස්ථානය ද වේ. 2023 පෙබරවාරි 15 වන දින භූතානයේ පැවති බිම්ස්ටෙක් ප්‍රශ්න විචාරාත්මක තරඟාවලිය සඳහා සහභාගී වූ ශ්‍රී ලාංකික සිසුන් විසින් එහි ශූරතාවය දිනා ගන්නා ලදී. විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදන සඳහා ප්‍රමුඛ රට ලෙස ශ්‍රී ලංකාව 2023 ජූනි 21 වන දින තාක්ෂණය පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ පළමු රැස්වීම සඳහා සත්කාරකත්වය ලබා දුන් අතර, හිමාල විද්‍යා කවුන්සිලය පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ දෙවන රැස්වීම 2023 ජූලි 26 වැනි දින මාර්ගගතව පවත්වන ලදී. මහජන සෞඛ්‍ය සඳහා ප්‍රමුඛ රට ලෙස ලංකාව, සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් 2023 ජූලි 26-27 දිනවල මහජන සෞඛ්‍ය පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ (EGPH) පළමු රැස්වීමට සත්කාරකත්වය ලබා දුන්නේය.

ශ්‍රී ලංකාව මානව සම්පත් සංවර්ධන අංශය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර සාමාජික රටවල් සමඟ බෙදාගැනීම සඳහා බිම්ස්ටෙක් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා බිම්ස්ටෙක් මූලික රැස්වීම් සහ ආංශික රැස්වීම් කිහිපයකට ශ්‍රී ලංකාවේ නියෝජිතයන් සහභාගී විය.

ශ්‍රී ලංකාව 2023 අප්‍රේල් 10 වැනි දින කොළඹ සැලසුම් සභාවේ සභාපතිත්වය භාර ගන්නා ලදී. ශ්‍රී ලංකාව 2023 සැප්තැම්බර් 06 වැනි දින මොරටුව විශ්වවිද්‍යාලය සහ කොළඹ සැලසුම් ලේකම් කාර්යාලය සමඟ එක්ව තිරසාර හරිත නගර: හරිත අවකාශය වැඩි කිරීම පිළිබඳ වැඩමුළුවක් පැවැත්විය.

2023 පෙබරවාරි 14 සිට 15 දක්වා රෝමයේදී පැවති කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ (IFAD) පාලක මණ්ඩලයේ 46 වැනි සැසිවාරය සඳහා මුදල් රාජ්‍ය අමාත්‍යවරයාගේ සහභාගිත්වය සඳහා මෙම අංශය දායකත්වය ලබා දෙන ලදි. 2023 ඔක්තෝබර් 5 සිට 6 දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා හි පැවති සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවාදයේ 2 වැනි සැසිවාරයට ශ්‍රී ලංකාව සහභාගී විය. මෙම අංශය සංක්‍රමණ සහ සංවර්ධනය සඳහා වූ ගෝලීය සංයුක්තයට (GFMD) සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධ විය.

මෙම අංශය අප්‍රිකා-ආසියානු ග්‍රාම සංවර්ධන සංවිධානයට (AARDO) සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් අදාළ

රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධ වී ඇති අතර එහිදී රාජ්‍ය නිලධාරීන් 45 දෙනෙකු ආසියානු සංවර්ධන බැංකුවේ (ADB), ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහ ලෝක බැංකුවේ පුහුණු අවස්ථා ලබාගෙන ඇත.

### 2.4.1.3. තාක්ෂණික සහයෝගීතාව

මෙම අංශය විසින් ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාව, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA), කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) සහ කොළඹ සැලසුම් ලේකම් කාර්යාලය වැනි ජාත්‍යන්තර සංවිධානවල ශ්‍රී ලංකාවේ නිශ්චිත රාජකාරිවල යෙදී සිටින සේවකයින් සඳහා කෙටි කාලීන ප්‍රවේශ වීසා 210 ක්, දිගු කාලීන ප්‍රවේශ වීසා 89 ක් සහ නේවාසික වීසා බලපත්‍ර 51 ක් සත්‍යාපනය කර නිර්දේශ කර ඇත. මුදල් අමාත්‍යාංශය යටතේ පවතින තිරසාර සංවර්ධන කවුන්සිලය ඇතුළු රේඛීය අමාත්‍යාංශ විසින් සංවිධානය කරනු ලබන ශ්‍රී ලංකාවේ වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගිවන්නන්ට වීසා පහසුකම් සලසා ඇත.

ශ්‍රී ලංකන් ගුවන් සේවය, රාජ්‍ය ඖෂධ සංස්ථාව, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් යනාදී අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවලින් ලැබුණු ප්‍රසම්පාදන දැන්වීම් 126 ක් සඳහා මෙම අංශය පහසුකම් සලසා දී ඇති අතර ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රචාරණයක් ලබා දෙන ලෙසත් දූත මණ්ඩල/කාර්යාල වෙබ් අඩවිය/සමාජ මාධ්‍ය යාවත්කාලීන කිරීමටත් විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපදෙස් දෙන ලදී. රජයේ ආයතන, ව්‍යවසායකයින් යනාදී සහය අවශ්‍ය අයට වීසා පහසුකම් සලසන ලදී.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා ජාත්‍යන්තර සමාගම් සත්‍යාපනය කිරීමට ද මෙම අංශය පහසුකම් සලසා ඇත.

### 2.4.1.4. රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේ ශක්‍යතා සංවර්ධනය පිළිබඳ තාක්ෂණික සහයෝගිතා වැඩමුළුව

විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශයේ තාක්ෂණික සහයෝගිතා සහ විශේෂ ව්‍යාපෘති ඒකකය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කාර්යාලයන්ට අනුබද්ධව සේවය කරන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා සයිබර් ආරක්ෂාව සහ සයිබර් අවකාශය පිළිබඳ වැඩමුළුවක් 2023 පෙබරවාරි 25 වැනි දින සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුව ආර්ථික කටයුතු අංශය විසින් අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ආරම්භ කරන ලද ශක්‍යතා සංවර්ධන වැඩසටහන් මාලාවේ දෙවැන්න විය. රජයේ සහ පෞද්ගලික අංශයේ මෙන්ම ජාතික පරිගණක හදිසි සූදානම් කණ්ඩායම (CERT), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) සයිබර් අපරාධ සහ මුදල් විශුද්ධිකරණ අංශයේ සම්පත් විශේෂඥයින්, බ්‍රැන්ඩික්ස් හි ඩිජිටල් පරිවර්තනය, මෙටා, ඒකාබද්ධ සන්නිවේදන පර්යේෂණ සහ උපදේශන සඳහා වන මධ්‍යස්ථානය (CICRA) යන ආයතනවල සම්පත් දායකයින් විසින් සයිබර් ආරක්ෂණය සහ සයිබර් අවකාශ වැඩමුළුව පවත්වන ලදී. ස්වාධීන නීති විශාරදයින් දෙදෙනෙකු ද වැඩමුළුවේදී අදාළ නීති රාමු පිළිබඳ සිය විශේෂඥ දැනුම බෙදාහදා ගත්හ.

මෙම වැඩමුළුව මඟින් දත්ත රහස්‍යතාව, සමාජ මාධ්‍ය ආරක්ෂාව සහ අමාත්‍යාංශයේ සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල එදිනෙදා වැඩ කටයුතු සම්බන්ධ ගෝලීය සහ දේශීය සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ දැනුම ලබා දෙන ලදී.

### 2.4.1.5. ඉන්දීය රජයේ ප්‍රතිපාදන ආධාර සහිත විශේෂ ව්‍යාපෘති

අනලතිව්, ඩෙල්ෆ් සහ නයිනතිව් යන ප්‍රදේශවල කාර්යක්ෂම ඩීසල් නිෂ්පාදනයක් සමඟින් සුළං, සූර්ය බලය සහ බැටරි ගබඩා කිරීම සඳහා යාපනයට ඔබ්බෙන් පිහිටි දූපත් තුනක දෙමුහුන් බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ජෛවමිතික හඳුනාගැනීම සඳහා පදනම් හැඳුනුම්පත හඳුන්වාදීම සහ පවත්වාගෙන යාමට පද්ධති

අනුකලනය සඳහා ශ්‍රී ලංකාවට විශේෂ වූ ඩිජිටල් අනන්‍යතා (SL-UDI) වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රමඛ පෙලේ ව්‍යාපෘතීන් විය. ලංසු කැඳවමින් ටෙන්ඩර් නිවේදන ඉන්දියාවේදී කිහිප වතාවක් ප්‍රකාශයට පත් කළ නමුත් ඉදිරිපත් වූ ඉන්දියානු සමාගම් නිර්ණායක සපුරා නොමැති බැවින් අලුතින් ලංසු කැඳවීමට අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය විය.

### 2.4.2. මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ සහ පුහුණු අංශය

මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ සහ පුහුණු (HRD, R & T) අංශය අමාත්‍යාංශයේ සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සහ පුහුණු අවශ්‍යතා සපුරාලීම සහතික කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

එහි මූලික වගකීම්වලට අමතරව, මෙම අංශය, අමාත්‍යාංශයේ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ (LKI) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේ (BIDTI) කේන්ද්‍රස්ථානය ලෙසද කටයුතු කරයි. රාජ්‍ය තාන්ත්‍රික කටයුතු, විදේශ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා වැනි විවිධ ක්ෂේත්‍රවල නිලධාරීන්ගේ කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීමට මෙම ආයතන ඔවුන්ට විශේෂ පුහුණුවක් සහ අධ්‍යාපනයක් ලබා දීමට උපකාරී වේ. මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ සහ පුහුණු අංශය නිලධාරීන්ගේ නිශ්චිත අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සකස් කරන ලද පුහුණු වැඩසටහන් සහ වැඩමුළු සංවර්ධනය කිරීම සඳහා මෙම ආයතන සමඟ සමීපව කටයුතු කරයි. සමාලෝචිත කාල සීමාව තුළ අංශයේ විෂය පථයට අනුකූලව අංශය විසින් ලබා ඇති ප්‍රගතිය පහත පරිදි වේ.

**ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ උසස්වීම් පිළිබඳ ගැටළු:** රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) සමඟ සම්බන්ධීකරණය කර ශ්‍රී.ලං.වි.සේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් අපේක්ෂකයින් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ මාර්ගෝපදේශය සහ දැන්වීම සකස් කරන ලදී.

**ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවා ව්‍යවස්ථාවේ සංශෝධන:** රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) සමඟ සම්බන්ධීකරණය කර ශ්‍රී.ලං.වි.සේ සේවා ව්‍යවස්ථාවේ පළමු සංශෝධනය ප්‍රකාශයට පත් කිරීම සහ 2 වන සංශෝධනය අවසන් කිරීමට කටයුතු සම්පාදනය කිරීම.

**වාර්තා සහ ප්‍රකාශන:** 2023/2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා විදේශ රාජ්‍ය තාන්ත්‍රික සහ කොන්සියුලර් නියෝජන නාමාවලිය සකස් කරන ලදී. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව ඉල්ලා සිටින වාර්තා අමාත්‍යාංශයේ අදාළ අංශ සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කර එම කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**බඳවා ගැනීම් සහ ස්ථාන මාරුවීම්:** 2021 අප්‍රේල් 9 දිනැති අංක 2223 ගැසට් නිවේදනයට අනුකූලව ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින් එකසිය පහළොස් දෙනෙකුගෙන් (115) යුතු කණ්ඩායමකින් ශ්‍රී.ලං.වි.සේ අලුතින් ඇතුළත් වූවන් හතළිස් (40) දෙනෙකු තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්විය.
ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් හය (6) දෙනෙකු සඳහා තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය- ශක්‍යතා ගොඩනැගීමේ පුහුණු වැඩසටහන පැවැත්වීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වන පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ විදේශ භාෂා පරීක්ෂණය පැවැත්වීමට සහ ප්‍රතිඵල බෙදා හැරීමට කටයුතු සම්පාදනය කරන ලදී.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල කළමනාකරණ සේවා නිලධාරී අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා වන තරඟ විභාගය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහසුකම් සපයන ලදී.

2023 අගෝස්තු මස 20 වැනි දින පවත්වන ලද 'ශ්‍රී ලංකා දූත මණ්ඩලවල /කාර්යාලවල තනතුරු - 2021(2023) මගින් සියරට පේරුව (Home Based) පුද්ගලික සහකාර පුරප්පාඩු පිරවීම සඳහා වන සීමිත තරඟ විභාගය සඳහා පහසුකම් සලස්වන ලදී.

2025 දී ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගය පිළිබඳ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා ලදී.

**ශක්‍යතා සංවර්ධන වැඩසටහන්:** සලකා බලනු ලබන කාල සීමාව තුළ අමාත්‍යාංශයේ ශ්‍රී.ලං.වි.සේ නිළධාරීන් සඳහා ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ශක්‍යතා ඉහළ නැංවීම සඳහා විදේශීය පුහුණු වැඩසටහන් 21ක් සඳහා මෙම අංශය පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය සිදු කරන ලදී. අලුතින් පත් කරන ලද දූත මණ්ඩල ප්‍රධානීන් නව දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් (9) සඳහා දිශානති වැඩසටහනක් පවත්වන ලදී. මෙම අංශය විසින් අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 13ක් ද පවත්වන ලදී. 2023 අප්‍රේල් 1 වන දින නයිජීරියානු ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයට පැමිණි නියෝජිත පිරිස සඳහා "ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය" පිළිබඳ කෙටි සැසියක් පවත්වන ලද අතර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ සම්බන්ධීකරණයෙන් ඒකාබද්ධ ශක්‍යතා ගොඩනැගීමේ ප්‍රවේශය යටතේ අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් හතළිස් හත් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් (47) පුහුණු කිරීමට කටයුතු කරන ලදී.

### 2.4.3. ජාත්‍යන්තර ආරක්ෂක සහ ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ අංශය

**දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානයට (LTTE) අදාළ කරුණු:** යුරෝපා සංගමය LTTE සංවිධානය අඛණ්ඩව තහනම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා දුන් අතර අදාළ දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය කරන ලදී. 2023 ජූලි මාසයේදී LTTE සංවිධානය තහනම් කිරීම යුරෝපා සංගමය නිවේදනය කළේය. මෙම අංශය විසින් 2023 මාර්තු සහ සැප්තැම්බර් මාසවලදී පිළිවෙළින් යුරෝපා සංගමය වෙත පළමු සහ දෙවන ද්විවාර්ෂික ඉදිරිපත් කිරීම් සකස් කරන ලදී. මෙම අංශය කැනඩාවේ LTTE සංවිධානය තහනම් කිරීමට සහාය දැක්වීම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත. මෙම අංශය කැනේඩියානු බලධාරීන් විසින් එල්ල කළ ජන සංහාර චෝදනාවලට එරෙහිව කරුණු දැක්වීම් සම්බන්ධීකරණය කර ඉදිරිපත් කිරීම් සකස් කළේය. අවධානය යොමු කළ යුතු සිද්ධීන් සහ වර්ධනයන් හඳුනා ගැනීම සඳහා සැලකිය යුතු දින සහ සිදුවීම් වලදී LTTE සංවිධානයට අදාළ විදේශයන්හි ක්‍රියාකාරකම් අධීක්ෂණය මෙම අංශය විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**ද්විපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතාව පුළුල් කිරීම:** පිලිපීනය, ඉන්දුනීසියාව, පාකිස්තානය, බංග්ලාදේශය සහ ඉරාකය සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට කටයුතු කර ඇත. ශ්‍රී ලංකාව සහ පිලිපීනය අතර අවබෝධතා ගිවිසුමට දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ආරක්ෂක අමාත්‍යාංශයේ (MOD) නියෝජිත පිරිසකගේ යෝජිත මැනිලා සංචාරයකදී අත්සන් කිරීමට නියමිතය. ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා වෙමින් පවතින අතර, ඉන්දුනීසියානු පාර්ශ්වයෙන් ලැබුණු සංශෝධිත අවබෝධතා ගිවිසුම සඳහා නිරීක්ෂණ ආරක්ෂක අමාත්‍යාංශයෙන් (MOD) ඉල්ලා ඇත. ජාත්‍යන්තර ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ පාකිස්තානය අතර ඇති අවබෝධතා ගිවිසුම පිළිබඳ අදාළ ශ්‍රී ලංකා බලධාරීන්ගේ නිරීක්ෂණ මෙම අංශය විසින් පාකිස්තාන බලධාරීන්ගේ එකඟතාව ලබා ගැනීම සඳහා කොළඹ පිහිටි පාකිස්තාන මහ කොමසාරිස් කාර්යාලය වෙත යොමු කර ඇත. සමුද්‍රීය සහයෝගීතාව සහ තොරතුරු හුවමාරුව වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය සහ පාකිස්තානයේ සමුද්‍රීය ආරක්ෂක ඒජන්සිය අතර අවබෝධතා ගිවිසුමට අදාළ නිරීක්ෂණ දකුණු ආසියානු අංශය වෙත ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාව සහ බංගලාදේශය අතර "ජාත්‍යන්තර ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සහ ජාත්‍යන්තර අපරාධ සහ බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීම" පිළිබඳ අවබෝධතා ගිවිසුමක් බංගලාදේශ පාර්ශවයේ

නිරීක්ෂණ සඳහා යොමු කරන ලදී. ශ්‍රී ලංකාව සහ ඉරාකය අතර යෝජිත අවබෝධතා ගිවිසුම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබාගෙන ඇත. අදාළ දේශපාලන අංශවල ඉල්ලීම අනුව, මෙම අංශය විසින් ශ්‍රී ලංකාව සහ පලස්තීනය, ශ්‍රී ලංකාව සහ මාලදිවයින සහ ශ්‍රී ලංකාව සහ ඉතියෝපියාව අතර ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම් පිළිබඳ තොරතුරු /නිරීක්‍ෂණ සපයන ලදී.

**දේශීය ආරක්ෂක, ආරක්ෂණ සහ නීති නියෝජිතායතනවල ශක්‍යතා සංවර්ධනය:** සන්නද්ධ හමුදා, ආරක්‍ෂක අමාත්‍යාංශ නිලධාරීන් සඳහා වෙනත් රජයන් සහ ජාත්‍යන්තර සංවිධාන (උදා: මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය) විසින් පිරිනමනු ලබන ශක්‍යතා සංවර්ධන වැඩසටහන් සඳහාද මෙම අංශය සම්බන්ධීකරණ කටයුතු කරන ලදී. මීට අමතරව, ඵලදායී පුනරුත්ථාපනය සහ සමාජානුයෝජන ක්‍රමෝපායන් බහුවිධ සහයෝගීතාවය තුලින් දියුණු කිරීම සඳහා යහපත් භාවිතයන් සහ දැනුම බෙදා ගැනීම අරමුණු කරමින්, ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ දකුණු ආසියානු ජාලය (SAN-PVE) යටතේ පුනරුත්ථාපනය සහ නැවත සමාජානුයෝජනය කිරීම පිළිබඳ පළමු තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම සංවිධානය කිරීම මෙම අංශය මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කරයි.

**ප්‍රචණ්ඩ අන්තවාදී ප්‍රයත්න වැලැක්වීම/මැඩපැවැත්වීම:** ප්‍රචණ්ඩ අන්තවාදය මැඩපැවැත්වීම සහ වැළැක්වීම සඳහා අදාළ ආයතන අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය අඛණ්ඩව සහයෝගය ලබා දුන්නේය. ගෝලීය ප්‍රජා සහභාගීත්වය සහ අභියෝගයන්ට මුහුණ දීම සඳහා වන අරමුදලේ (GCERF- ප්‍රචණ්ඩ අන්තවාදය වැලැක්වීම සඳහා කැප වූ ගෝලීය අරමුදලකි) වේගවත් අරමුදල් යාන්ත්‍රණය යටතේ ශ්‍රී ලංකාව සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීමට සහ අරමුදල් ඒකාබද්ධ කිරීමට සහ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ දකුණු ආසියා කලාපීය වෘත්තිකයන්ගේ ජාලය යටතේ ශ්‍රී ලංකා පාර්ශවකරුවන් සහ අනෙකුත් පාර්ශව දෙකක් අතර සම්බන්ධීකරණය කරන ලදී. ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ දකුණු ආසියා කලාපීය වෘත්තිකයන්ගේ ජාලයේ යෝජනා ක්‍රියාවට නැංවීම සඳහා එම ආයතනය සමඟ ශ්‍රී ලංකාවේ විෂය පථය සහ සම්බන්ධ කිරීම පිළිබඳ 'අමාත්‍ය මණ්ඩල සටහනක්' සම්පාදනය කිරීම සඳහා කටයුතු කර ඇත.

මැලේසියාවේ සහ ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී තර්ජන සහ ප්‍රචණ්ඩ අන්තවාදය මුලිනුපුටා දැමීම මගින් ආරක්ෂාව ශක්තිමත් කිරීමට අග්නිදිග ආසියා කලාපීය ත්‍රස්තවාදය වැළැක්වීමේ මධ්‍යස්ථානය (SEARCCT) සහ ශ්‍රී ලංකා රජය (GoSL) අතර සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා උනන්දුව ප්‍රකාශ කිරීම සම්බන්ධීකරණය කිරීමට මෙම අංශය කටයුතු කරයි.

**ත්‍රස්තවාදී මූල්‍යකරණයට එරෙහිව කටයුතු කිරීම:** UNSCR 1373 ප්‍රකාශයට පත් කිරීම සඳහා 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ නම් කරන ලද පුද්ගලයින් සහ ආයතන ලැයිස්තුව සමාලෝචනය කිරීම සඳහා ජාතික බුද්ධි ප්‍රධානියා විසින් කැඳවන ලද නිලධාරීන්ගේ කමිටුවේ නියෝජ්‍ය නීති උපදේශක සමඟ එක්ව කටයුතු කරන ලදි. නව ලැයිස්තුව 2023 ජූනි 8 වන දින ගැසට් කරන ලද අතර, 2012 අංක 2 හි එක්සත් ජාතීන්ගේ රෙගුලාසි අංක 2 හි 4(2) (b) යටතේ ඒකාබද්ධ ලැයිස්තුවේ පසු සංශෝධන 2023 සැප්තැම්බර් 4 වන දින ගැසට් කරන ලදී.

**ජාතික ආරක්ෂාවට/ප්‍රතිරූපයට ඇති තර්ජන පිළිබඳ අවධානය යොමු කිරීම:** කොටි හිතවාදීන්ගේ ප්‍රකාශ, සිදුවීම්, සමාජ මාධ්‍ය සහ දේශපාලන ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරමින් ශ්‍රී ලංකාව පිළිබඳ අසත්‍ය ප්‍රචාරවලට එරෙහිව සටන් කිරීම සඳහා සහ ප්‍රතිවිරෝධතා සඳහා නිර්දේශ සහ ආදාන සැපයීම සඳහා අදාළ දේශපාලන අංශ සහ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය කරමින් සිටී.

**සංචාර:** නිව් යෝර්ක්හි පැවති 'සාමාජික රාජ්‍ය ත්‍රස්ත විරෝධී නියෝජිතායතන ප්‍රධානීන්ගේ (HLC) තුන්වන එක්සත් ජාතීන්ගේ ඉහළ මට්ටමේ සමුළුව', සහ 2023 ජූනි 19-23 දක්වා සහ 2023 ඔක්තෝබර් 25-26 දක්වා තායිලන්තයේ බැංකොක් නුවරදී පැවති 'ජාතික ත්‍රස්ත-විරෝධී ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ නව

තාක්ෂණයන් ත්‍රස්තවාදී අරමුණු සඳහා භාවිතා කිරීමට එරෙහිව මෙහෙයුම් ප්‍රතිචාර දැක්වීම' පිළිබඳ වැඩමුළුව ඇතුළු ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළුවලට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා පහසුකම් සපයන ලදී.

### 2.4.4. සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය

සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස සම්බන්ධ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ සහජීවනය සහතික කිරීම සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශයට පැවරී ඇත. එය අදාළ රජයේ අමාත්‍යාංශ සහ රේඛීය ආයතන සමඟ රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කරනු ලබයි. එසේම, එය සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් කටයුතු කරන විවිධ ජාත්‍යන්තර, කලාපීය සහ උප කලාපීය සංවිධාන තුළ ශ්‍රී ලංකාවේ කාර්යභාරය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියා කරයි. එසේ කිරීමෙන්, මෙම සංවිධානවල අරමුණු ශක්තිමත් කිරීම සහ සම්බන්ධීකරණය තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සහ එමඟින් රටේ අභිලාෂයන් ඉහළ නැංවීම මෙම අංශයේ අරමුණයි.

සියලු පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කරමින් අන්තර්ක්‍රියාකාරී සංවාද, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වේදිකාවක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේදී විදේශ රටවල්, සංවිධාන සහ අනෙකුත් අදාළ ආයතන සමඟ ශ්‍රී ලංකාවේ සමස්ත අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි කරන ව්‍යාපෘති සහ මුලපිරීම් මෙම අංශය සම්බන්ධීකරණය කරයි.

නීල ආර්ථික සංකල්පය යටතේ ශ්‍රී ලංකාව සහ සීෂෙල්ස් අතර පවතින අවබෝධතා ගිවිසුම, එක්සත් රාජධානියේ රජය සමඟ සාගර හා දේශ සහයෝගීතා වැඩසටහන (OCPP) පිළිබඳ අවබෝධතා ගිවිසුම හා කාබන් ණයකරණය පිළිබඳ සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකාව සහ දකුණු කොරියාව අතර අවබෝධතා ගිවිසුම නැවත පණ ගැන්වීමට මෙම අංශය කටයුතු කරන ලදි. බහුපාර්ශ්වික රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලදී, සමුද්‍රීය ආරක්ෂාව සහ ආරක්ෂණය පිළිබඳ IORA ක්‍රියාකාරී කණ්ඩායමේ 3 වැනි රැස්වීම සාර්ථකව පවත්වන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 - 2026 කාර්යය සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්මක් ලෙස සංශෝධනය විය. පොදුරාජ්‍ය මණ්ඩලීය කඩොලාන පරිසර පද්ධති ජීවනෝපාය ක්‍රියාකාරී කණ්ඩායම (MELAG) සඳහා ද අංශය සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. කඩොලාන පරිසර පද්ධතිය මත සහ කඩොලාන වාසස්ථාන සංරක්ෂණය කිරීම මත ප්‍රජාවට ප්‍රතිඵල-අභිමුඛ ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා සාමාජික රාජ්‍යයන් සමඟින් ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරන ලදී. හරිත මූල්‍ය සංකල්පය යටතේ සිංගප්පූරුවේ ගෝලීය හරිත වර්ධන ආයතනය (GGGI), සහ කොරියානු ජනරජය සමඟ ගිවිසුම් අත්සන් කිරීම ඇතුළු අවබෝධතා ගිවිසුම් සඳහා එළඹෙන ලදී. අනෙකුත් කැපී පෙනෙන ජයග්‍රහණ අතරට එක්සත් ජනපදය පදනම් කරගත් ජාත්‍යන්තර රාජ්‍ය සංවිධානයක් වන සාගර අවදානම් සහ ප්‍රත්‍යාස්තතික ක්‍රියාකාරකම් සංධානය (ORRAA) සමඟ හවුල්කාරිත්වයක් ගොඩ නැගීමට හැකි වීමයි. තවද, සමුද්‍ර අවකාශීය සැලසුම් (MSP) හා සම්බන්ධිත රේඛීය ආයතන හරහා MSP ආශ්‍රිත ධාරිතාව ගොඩනැගීම සඳහා ORRAA වෙතින් සහය ලබා ගැනීමට උත්සාහ කරමින් සිටියි. රේඛීය ආයතන සම්බන්ධ කිරීම සහ ආරම්භ කරන ලද ඔවුන්ගේ ක්‍රියාකාරකම්/ව්‍යාපෘති අධීක්ෂණය කිරීම හරහා දේශගුණය සඳහා කඩොලාන සන්ධානය (MAC) වැනි මුල පිරීම් හරහා රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා බහුවිධ ප්‍රවේශයක් ඇති කරන ලදී. තවද, දෙවුන්දර තුඩුව ආශ්‍රිතව යෝජිත නාවික ගමනාගමනය කළමනාකරණය පිළිබඳ මාර්ග පද්ධතිය වෙනස් කිරීමට විරුද්ධව කටයුතු කිරීමට සිදුකල උත්සාහය සාර්ථක ප්‍රතිඵල අත්කර දෙන්නක් විය. සමුද්‍රීය කටයුතු අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සහ වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය ශක්තිමත් කිරීම සඳහා වරාය, නාවික හා ගුවන් සේවා ලේකම්/අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් අන්තර් ආයතනික කාර්ය සාධක බලකාය පිහිටුවීමට පියවර ගන්නා ලදී. මෙම අංශය විසින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමු සම්මුතියේ (UNFCCC-COP28) පාර්ශවයන්ගේ 28 වැනි සමුළුව සාර්ථකව සම්බන්ධීකරණය කරන ලද අතර එහිදී ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස මූලාරම්භයන් 03 ක් දියත් කරන ලදී. එනම් දේශගුණික යුක්ති සංසදය දියත් කිරීම, ලෝකය මුහුණ දෙන ත්‍රිත්ව අර්බුදයන් වන දේශගුණය,

ස්වභාවධර්මය සහ දූෂණය විසඳීම සඳහා නිවර්තන කලාපයේ ආයෝජනය කිරීම සහ ජාත්‍යන්තර දේශගුණික විපර්යාස විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාවේ ඉදිකිරීම සම්බන්ධ COP20 ප්‍රතිඥාව ලබාදීමය. ඕස්ට්‍රේලියාව සමඟ පැවැති සාගර නීතිය සහ උපායශීලී සමුද්‍ර සංවාදය ඇතුළු වැඩසටහන් හා සංවාදයන් මඟින් ජාත්‍යන්තර සහයෝගීතාවය ලබාගැනීමට කටයුතු කරන ලදී.

### 2.4.5. කාර්ය සාධන සමාලෝචනය සහ ක්‍රියාත්මක කිරීම සහ හදිසි ප්‍රතිචාර ඒකකය

2023 ජනවාරි මස ආරම්භ කරන ලද කාර්ය සාධන සමාලෝචන සහ ක්‍රියාත්මක කිරීමේ අංශය, (i) අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසුවිපරම් කිරීම (ii) අමාත්‍යාංශයේ වාර්ෂික සහ ත්‍රෛමාසික ප්‍රගති වාර්තා සකස් කිරීම සහ ඉන් අනතුරුව හඳුනාගත් ඉලක්ක සපුරා ගැනීම අධීක්ෂණය හා ඇගයීම සඳහා විදේශ කටයුතු ලේකම්වරියට සහාය වීම (iii) විදේශ රටවල් සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම (iv) පාර්ලිමේන්තු විදේශ කටයුතු උපදේශක කමිටු රැස්වීම, COPA සහ අනෙකුත් අදාළ විගණන සහ මූල්‍ය රැස්වීම් සම්බන්ධීකරණය කිරීම (v) හදිසි ප්‍රතිචාර ඒකකයේ කාර්යයන් සඳහා දායකත්වය ලබා දීම සිදු කරයි. මීට අමතරව, ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (KRAs) යටතේ විදේශ ලේකම්ගේ කාර්ය සාධන සැලැස්ම පිළිබඳ විශේෂ ත්‍රෛමාසික ප්‍රගති වාර්තා මෙන්ම ජනාධිපතිවරයාගේ රාජාසන කතාව පිළිබඳ පසු විපරමට අදාළ කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කර ඒවා ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීම ද මෙම අංශය සිදු කරන ලදී.

ඒ අනුව, සමාලෝචිත කාල සීමාව තුළ අංශය විසින් ලබා ඇති ප්‍රගතිය පහත පරිදි වේ.

**අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම:** අමාත්‍යාංශයේ 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එය අදාළ ආයතන වෙත යොමු කරන ලදී.

**අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව:** 2022 වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. එසේම, අමාත්‍යාංශයේ අංශ 23 ක් සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල 61 ක් සම්බන්ධීකරණය කරමින්, 2023 ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ කාර්තුමය ප්‍රගති වාර්තා 4 වන කාර්තුව දක්වා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

**ලේකම්වරුන්ගේ කාර්ය සාධන ගිවිසුම:** අමාත්‍යාංශයේ අංශ 23ක් සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල 61ක් සමඟ සම්බන්ධීකරණයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ විදේශ ලේකම්වරියගේ කාර්ය සාධන ගිවිසුම සඳහා ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රවල (KRAs) වාර්ෂික කාර්ය සාධන සැලැස්ම සකස් කර කාර්තුමය ප්‍රගතිය වාර්තා 4 වන කාර්තුව දක්වා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත වාර්තා කර ඇත.

**විදේශ රටවල් සමඟ අත්සන් කරන ලද ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ අනෙකුත් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම:** රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණයෙන් විදේශ රටවල් සමඟ අත්සන් කර ඇති/පොරොත්තු ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ අනෙකුත් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කිරීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල සහ අමාත්‍යාංශයේ අංශ සමඟ එක්ව ඩිජිටල් වේදිකාවක් සකස් කර ඇත.

**හදිසි ප්‍රතිචාර ඒකකය:** සියලුම ආකාරයේ හදිසි ප්‍රතිචාර ක්‍රියාකාරකම් හැසිරවීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය 2023 ජනවාරි මාසයේදී හදිසි ප්‍රතිචාර ඒකකයක් පිහිටුවන ලදී. ඒ අනුව, මෙම ඒකකය එවැනි හදිසි මෙහෙයුම් කටයුතු වලදී ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (ආරක්ෂක අමාත්‍යාංශය) සහ ලංකා තේ මණ්ඩලය, ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකන් ගුවන් සේවය, මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල වැනි රාජ්‍ය ආයතන කිහිපයක් සමඟ සහයෝගයෙන් කටයුතු

කළේය.

රටේ පවතින මූල්‍ය බාධාවන් සහ අත්‍යාවශ්‍ය වෛද්‍ය සැපයුම් හිඟය හේතුවෙන් සෞඛ්‍ය බලධාරීන් විසින් වාර්තා කරන ලද හිඟය අවම කර ගැනීමට හදිසි අවශ්‍ය ඖෂධ (ඇමරිකානු ඩොලර් මිලියන 40 ක් පමණ වටිනා), වෛද්‍ය සැපයුම් සහ ඖෂධ ද්‍රව්‍ය තොග දාහතක් සඳහා විදේශ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධානවලින්, විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් සහ පරිත්‍යාගශීලීන් විසින් ලබාදුන් භාණ්ඩ තොග සඳහා පහසුකම් සලසා ඇත.

ඒ අනුව, සමාලෝචිත කාලසීමාව තුළ, ඉන්සියුලින්, මන්දපෝෂණ ඖෂධ සහ අනෙකුත් අත්‍යවශ්‍ය ඖෂධ, පොලිප්‍රොපිලීන්, වීදුරු විනිවිදක, ඖෂධ නිෂ්පාදන සහ අනෙකුත් අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාගැනීම සඳහා කැනඩාව, බ්‍රසීලය, ප්‍රංශය, ඉන්දියාව, ඉතාලිය, ජපානය, මැලේසියාව, පේරු, දකුණු කොරියාව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල් සමඟ සම්බන්ධීකරණය කරන ලදී. ඉහත පරිත්‍යාග අතර ඇමෙරිකානු ඩොලර් මිලියන 37කට අධික වටිනාකමකින් යුත් තොග දොළහක් දැනටමත් ලැබී ඇති අතර ඒවා සෞඛ්‍ය බලධාරීන් වෙත භාර දී ඇත. සෙසු තොග තවමත් ලැබීමට ඇත. එසේම, මෙම ඒකකය ප්‍රධාන හදිසි අවස්ථා / විපත් වලදී ශ්‍රී ලංකා රජයෙන් විවිධ විදේශ රටවලට සිදු කරන පරිත්‍යාග සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණයත් සිදු කරයි. ඒ අනුව, මෙම ඒකකය විසින් තුර්කියේ භූමිකම්පාවෙන් විපතට පත් වූවන් සඳහා ලංකා තේ කිලෝග්‍රෑම් 1500 ක් සහ ඇඟලුම් ටොන් 4.6 ක් සහ මියන්මාරයට බලපෑ සුළි කුණාටුවෙන් විපතට පත් වූවන් සඳහා ලංකා තේ කිලෝග්‍රෑම් 690 ක් මානුෂීය ආධාර ලෙස ලබා දීමට අවශ්‍ය සහාය සහ සම්බන්ධීකරණය කටයුතු සිදු කර ඇත.

### 2.4.6. මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය

මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය (PD) අමාත්‍යාංශයේ සියලුම මාධ්‍ය සහ මහජන සන්නිවේදන කටයුතු හා ගරු විදේශ කටයුතු අමාත්‍ය, ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, විදේශ කටයුතු ලේකම්, අමාත්‍යාංශයේ අංශ සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කාර්යාල ආදියෙහි මාධ්‍ය සහ මහජන සන්නිවේදන කටයුතු සිදු කරයි. මෙම ක්‍රියාකාරකම් විදේශ ප්‍රතිපත්ති ඇතුළුව ශ්‍රී ලංකා රජයේ වැදගත් රැස්වීම්, සිදුවීම්, සාකච්ඡා, ප්‍රතිපත්තිමය තීරණවලට අදාළ වේ.

මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය අමාත්‍යාංශය/ශ්‍රී ලංකාව සම්බන්ධ දේශීය/විදේශීය මාධ්‍ය සහ වෙබ් ප්‍රවෘත්ති පිළිබඳ නිරීක්ෂණය කරයි. ඒ සම්බන්ධයෙන් ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා, විදේශ කටයුතු ලේකම්වරිය සහ අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් සහ සියලුම දූත මණ්ඩල/ කාර්යාල දැනුවත් කරයි. අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට අහිතකර ප්‍රවෘත්තිවල දෛනික යාවත්කාලීන කිරීම් විදේශ ලේකම්වරියගේ අවධානයට යොමු කරනු ලබන අතර අවශ්‍ය යැයි හැඟෙන විට පිළිතුරු නිවේදන නිකුත් කරනු ලැබේ. මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය සති අන්ත සහ නිවාඩු දින ඇතුළුව සියලුම ලිඛිත සහ වාචික මාධ්‍ය විමසුම් වලට ප්‍රතිචාර දක්වයි.

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ අමාත්‍යාංශ මාධ්‍ය නිවේදන 251 ක්, දූත මණ්ඩල මාධ්‍ය නිවේදන 719 ක් සහ දැන්වීම් 158 ක් කොළඹ සිටින විදේශ වාර්තාකරුවන්ට මෙන්ම දේශීය මුද්‍රිත, අන්තර්ජාල සහ විද්‍යුත් මාධ්‍ය වෙත බෙදා හරින ලදී.

ට්විටර් (ට්විටර් පණිවිඩ සහ ට්විටර් නැවත පළ කිරීම් 1058), ෆේස්බුක් (පළ කිරීම් 168), ඉන්ස්ටග්‍රෑම් (පළ කිරීම් 149) සහ යූ ටියුබ් (පළ කිරීම් 09) හරහා මහජන සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය දිනපතා සමාජ මාධ්‍ය ජාලා සමඟ සම්බන්ධ විය. විදේශීය චිත්‍රපට කණ්ඩායම් පනස් දෙකක් (52) ශ්‍රී ලංකාවට පැමිණීම සඳහාද පහසුකම් සලසා දී ඇත.

මෙම අංශය ශ්‍රී ලංකාව පදනම් කරගත් දේශීය හා විදේශීය මාධ්‍ය සමඟ සම්බන්ධීකරණය කරන ලදී. එය ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය ප්‍රතීතන 42 ක් සහ ශ්‍රී ලංකාව පදනම් කරගත් විදේශීය මාධ්‍යවේදීන් සඳහා නේවාසික වීසා බලපත්‍ර 03 ක් සඳහා පහසුකම් සැලසීය.

මෙම අංශය විසින් ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත ප්‍රතිපත්ති ප්‍රකාශන පිළිබඳ තොරතුරු සහ වෙළඳාම, ආයෝජන ප්‍රවර්ධන, සංචාරක ප්‍රවර්ධන සහ වෙනස් වන ආර්ථික තත්ත්වයන් හා ශ්‍රී ලංකා රජයේ ආයතනවල අදාළ ප්‍රධාන වර්ධනයන් පිළිබඳ දෛනික යාවත්කාලීන කිරීම් ලබා දෙන ලදී.

ආරාධිත විදේශීය සම්භාවනීය අමුත්තන් සම්බන්ධ නිල සිදුවීම් / රැස්වීම් සඳහා ප්‍රචාරණ සහ මාධ්‍ය ආවරණය ලබා දෙමින් 75 වන නිදහස් දිනයේදීද ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කළේය.

ශාස්ත්‍රීය වාද්‍ය වෘන්ද සන්ධ්‍යාව - 'ජාත්‍යන්තර සුසංයෝගය' (2023 ජුනි 02) සහ ඇල්ල ඔඩිසි (2023 ජූලි 1-3) - ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා නුවරඑළිය සහ ඇල්ල අතර වයිස්රෝයි ස්පෙෂල් දුම්රියේ චාරිකාවක් සංවිධානය කිරීමට මෙම අංශය සහාය විය. මෙම සංචාරය අතරතුර විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා අත් පත්‍රිකාවක් ද මෙම අංශය විසින් නිර්මාණය කරන ලදී.

මෙම අංශය IORA -ශ්‍රී ලංකා සබඳතා සඳහා සක්‍රීය මාධ්‍ය ආවරණය සැපයූ අතර 2023 ඔක්තෝබර් 9-11 දක්වා පැවති 23 වැනි IORA අමාත්‍ය මණ්ඩල රැස්වීම සහ 25 වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු රැස්වීම සඳහා මාධ්‍ය ආවරණය සංවිධානය කළේය. එම අංශය 2023 ඔක්තෝබර් 11 වැනි දින IORA හි සභාපති, උප සභාපති සහ හිටපු සභාපති යන ත්‍රිත්වයේ ප්‍රධානත්වයෙන් IORA රැස්වීම්වල අවසානය සනිටුහන් කල ඒකාබද්ධ මාධ්‍ය හමුවක් ද සංවිධානය කළේය.

2023 නොවැම්බර් 20 සහ 2023 දෙසැම්බර් 19 යන දිනයන්හිදී අමාත්‍යාංශයේ පැවති දීපාවලි සහ නත්තල් සැමරුම් මෙම අංශය විසින් ආවරණය කරන ලදී.

අංශය විසින් පහත සඳහන් කටයුතු ද සම්බන්ධීකරණය කරන ලදී.

I. විදේශ කටයුතු අමාත්‍යවරයා සහ විදේශ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ITN හි හෝප් වැඩසටහන ඇතුළුව රූපවාහිනී වැඩසටහන් සහ සම්මුඛ සාකච්ඡා වලට සහභාගී වීම.
II. චැනල් නිවුස් ඒෂියා (CNA) ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාව.
III. TV 1 හි "නැගිටිමු ශ්‍රී ලංකා" සහ අද දෙරණ හි "නීතියට ඉඩක්" වැඩසටහන් සඳහා අමාත්‍යාංශයේ සහභාගීත්වය.
IV. 2023 සැප්තැම්බර් 05 දින විදේශ කටයුතු ලේකම් සහ ලංකාවේ ප්‍රංශය තානාපති සමඟ ITN හි Bonsoir සම්මුඛ සාකච්ඡාව.
V. අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ ITN එතරින් මෙතරට වාර්තා වැඩසටහනේ 2 වන අදියර.
VI. රූපවාහිනියේ “Connect Sri Lanka” වැඩසටහන.
VII. 2023 නොවැම්බර් 16-18 දක්වා ඉහළ මට්ටමේ වියට්නාම නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණීම (මාධ්‍ය සම්බන්ධීකරණය)

මෙම අංශය පහත පරිදි මාධ්‍ය හමු සංවිධානය කළේය.

I. 2023 ජූලි 29 වන දින ශ්‍රී ලංකාවේ සහ ජපානයේ විදේශ අමාත්‍යවරුන්ගේ ඒකාබද්ධ මාධ්‍ය හමුව.
II. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා 2023 ජූලි 10 වැනි දින කොළඹ පදනම් වූ විදේශ වාර්තාකරුවන්ගේ සංගමය සමඟ මාධ්‍ය අන්තර්ක්‍රියා රැස්වීම.
III. 2023 ජූලි 08 වැනි දින ඉන්දීය කාන්තා පුවත්පත් බලකාය (IWPC) නියෝජිත පිරිස සමඟ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ මාධ්‍ය අන්තර්ක්‍රියා රැස්වීම.

IV. 2023 සැප්තැම්බර් 14 වැනි දින IORA රැස්වීම් පිළිබඳව ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සහ විදේශ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් කොළඹදී පැවති මාධ්‍ය හමුව.

### 2.4.7. දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානය පිළිබඳ අංශය (SAARC)

COVID-19 වසංගතය සහ 2021 අගෝස්තු මාසයේදී ඇෆ්ගනිස්ථානයේ තලේබාන් ආණ්ඩු වෙනස් කිරීම සම්බන්ධයෙන් සාමාජික රටවල් අතර එකඟතාවයක් නොමැතිකම හමුවේ පසු ගිය වසර දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය (SAARC) සඳහා අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් විය. එවැනි පසුබෑමක් තිබියදීත්, 2023 ඔක්තෝබර් 25 දින 15 වැනි මහලේකම්වරයා ලෙස පත් වීමට තිබූ ඇෆ්ගන් නියෝජනය වෙනුවට සාර්ක්හි මීළඟ මහලේකම්වරයා ලෙස බංග්ලාදේශයේ අතිගරු එම් ඩී ගොලම් සර්වාර් මහතා පත් කිරීමට ඒකමතිකව තීරණය කිරීමත් සමඟ සාර්ක් ක්‍රියාවලිය අස්ථාවර තත්ත්වයකට පත් වීමෙන් තොරව ඉදිරියට ගෙන යාම සඳහා සාමාජික රටවල් කැපවිය. මේ අනුව, සාර්ක් තාක්ෂණික හා ප්‍රතිපත්ති මට්ටමේ රැස්වීම් නැවත ආරම්භ වූ අතර, පසුගිය වසරේ රැස්වීම් දාහතරක් (14) පවත්වන ලදි, ඉන් හතක් (07) ශ්‍රී ලංකාවේ පැවැත්විණි. සමීප කලාපීය ආර්ථික ඒකාබද්ධතාවයට අදාළව පවත්වන ලද වැදගත් රැස්වීම්වලින් එකක් වන තීරුබදු නොවන බාධක (NTBS)/Para-Tariff Barriers (PTBs) අඩු කිරීම/ඉවත් කිරීම පිළිබඳ කලාපීය ආර්ථික ඒකාබද්ධතා අධ්‍යයනය (II අදියර) පිළිබඳ SAARC-ADB පස්වන විශේෂ රැස්වීම සාමාජික රටවල නියෝජිතයින් 42 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම වසරේ (2023) ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ පැවැත්විණි. මෑතකදී පවත්වන ලද තවත් වැදගත් සිදුවීමක් වූයේ SAARC රාජ්‍යයන් අතර වෙළෙඳාම පහසු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන මෙම වසරේ (2023) සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේදී පැවැත් වූ සාමාජික රටවල ඉලක්කම් 8 කින් යුත් HS තීරුබදු රේඛා පිළිබඳ SAARC-ADB අධ්‍යයනය පිළිබඳ පළමු වැඩමුළුවයි. අන්තර් කලාපීය වෙළඳාම සහ ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වසරේ (2023) අගෝස්තු මාසයේදී මාලදිවයිනේ පවත්වන ලද SAARC කලාපීය බහුවිධ ප්‍රවාහන අධ්‍යයනය යාවත්කාලීන කිරීම පිළිබඳ වැඩමුළුව සඳහා ශ්‍රී ලංකාව සහභාගී විය. එසේම, 2023 අප්‍රේල් මාසයේ සිට ශ්‍රී ලංකාවේ පාලක මණ්ඩල රැස්වීම් හතරක් (04) පවත්වා ඇති අතර, තවත් සාර්ක් කලාපීය මධ්‍යස්ථාන සහ විශේෂිත ආයතන දෙකක රැස්වීම් 2023 වසරේ පවත්වා ඇත. ඒ අනුව, සාර්ක් සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වන ශ්‍රී ලංකාව අනෙකුත් සාමාජික රටවලට වඩා සාර්ක් ක්‍රියාකාරකම් සඳහා සත්කාරකත්වය දක්වන බව පෙනී යයි. SAARC අංශය විසින් හසුරුවන කාර්යය භාරයන් අතර නවතා දමා ඇති මාතර නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාපෘතියට විසඳුම් සෙවීමට උත්සාහ කිරීමද ඇතුළත් වන අතර, ඒ සඳහා විසඳුම් සෙවීමේදී අදාළ පාර්ශ්වකරුවන් සමඟ සක්‍රියව සම්බන්ධ විය. ඒ අනුව ශ්‍රී ලංකා චිත්‍රපට සංස්ථාවට අයත් ගොඩනැගිල්ල සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ස්ථිර ලෙස පැවැත්වීමට සහ අර්ධ වශයෙන් ඉදිකරන ලද නාවිමන පරිශ්‍රය රුහුණු විශ්වවිද්‍යාලය වෙත පැවරීම ඇතුළු නිර්දේශ කිහිපයක් සඳහා ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයකට සංස්කෘතික, අධ්‍යාපන හා විදේශ කටයුතු අමාත්‍යවරුන් 03 දෙනා විසින් අත්සන් තබන ලදී. තවද, ශ්‍රී ලංකාව ඇතුළු සාර්ක් සාමාජික රටවල සාර්ක් හස්ත කර්මාන්ත සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම මගින් එම අංශය සාර්ක් ව්‍යාපෘතියට පණ පෙවීය. පසුව, ජාතික ශිල්ප කවුන්සිලයේ (NCC) ව්‍යාපෘති යෝජනාව ඉදිරි ක්‍රියාමාර්ග සඳහා SAARC සංවර්ධන අරමුදල (SDF) වෙත ඉදිරිපත් කරන ලදී. පසුගිය කාලයේදී සාර්ක් රටවලට සිදුවූ සංචාර ඉහළ යාමට දායක වූ සාර්ක් වීසා නිදහස් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ පාර්ලිමේන්තුව සහ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් කරන ලද ඉල්ලීමට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ඔවුන්ගේ සමීපතමයන්ට සහ අනෙකුත් නිලධාරීන් ආගමන විගමන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ලිපි නිකුත් කිරීමද අංශය විසින් සිදු කරන ලදී. ඒ අනුව නියමිත කාලය තුළ සාර්ක් වීසා 114ක් සඳහා එවැනි ලිපි හැත්තෑවක් (70) නිකුත් කර ඇත. මෙම අංශය විසින් වැඩසටහන් කමිටුව 2024 පළමු කාර්තුවේදී පැවැත්වීමට අපේක්ෂා කරන අතර, සාර්ක් ක්‍රියාවලිය ප්‍රගතියක් ලබයි.

**දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (සාර්ක්) ලේකම් කාර්යාලය හරහා ශ්‍රී ලංකාව සහ සාර්ක් සාමාජික රටවල් අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම:** 2023 අගෝස්තු 7-8 දක්වා සාර්ක් ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරීන්ගේ (CVOs) සංසදයේ මාර්ගගත රැස්වීම සඳහා සම්බන්ධීකරණය කිරීම; 2023 ඔක්තෝබර් 9 සිට

11 දක්වා බංග්ලාදේශයේ ඩකා හි පැවති සාර්ක් ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරීන්ගේ (CVOs) සංසදයේ අටවැනි රැස්වීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් නාමයෝජනා සම්බන්ධීකරණය කිරීම සඳහා වූ ප්‍රයත්නයන් සඳහා දායකත්වය ලබා දෙන ලදි. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරමින්, සාර්ක් වසංගත රෝග පිළිබඳ ජාතික කේන්ද්‍රස්ථානය වන සාර්ක් ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරීන්ගේ (CVOs) සංසදය, SAARC රසායනාගාර අධ්‍යක්ෂවරුන්ගේ සංසදය (SLDF) සහ රසායනාගාර තාක්ෂණික උපදේශක කණ්ඩායම (Lab-TAG) සඳහා වන ජාතික කේන්ද්‍රස්ථානයේ සාමාජිකයින්ගේ යාවත්කාලීන තොරතුරු, ලේකම් කාර්යාලයේ කෘෂිකර්ම සහ ග්‍රාම සංවර්ධන අංශය විසින් ඉල්ලා ඇති පරිදි යවන ලදී. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලැබුණු SAARC එන්නත් බැංකුව සහ SAARC ජාන බැංකුව පිහිටුවීමේ ගිවිසුමේ කෙටුම්පත පිළිබඳ අදහස් යැවීම සම්බන්ධීකරණය කර ඇත.

2023 ජපාන - නැගෙනහිර ආසියා ශිෂ්‍ය හා තරුණ හුවමාරු ජාලය (JENESYS) ස්ථාපිත කිරීමට යෝජනා කරමින් කත්මන්ඩු හි ජපාන තානාපති කාර්යාලයේ යෝජනාව සඳහා ශ්‍රී ලංකා රජය සාර්ක් ලේකම් කාර්යාලයට එකඟතා යැවීම සම්බන්ධීකරණය කරන ලදි. ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කෙටුම්පත් කරන ලද දකුණු ආසියානු සුදුසුකම් විමර්ශන රාමුව (SAQRF) අනුමත කිරීමට නීතිමය නිරීක්ෂණ යැවීම ද සම්බන්ධීකරණය කරන ලදි. 2023 වසර සඳහා සාර්ක් ලේකම් කාර්යාලය සඳහා රජයේ වාර්ෂික කොටස් දායකත්වය ගෙවීම අවසන් කිරීමට පහසුකම් සලසා ඇත.

සාර්ක් නිදහස් වීසා යෝජනා ක්‍රමය (SVES) යටතේ වීසා නිර්දේශ කිරීම: 2023 දෙසැම්බර් 31 වන විට, පාර්ලිමේන්තුව/අමාත්‍යාංශ විසින් කරන ලද ඉල්ලීම් මත, සාර්ක් අංශය විසින් වීසා නිකුත් කිරීම සඳහා නිර්දේශ ලිපි 70 ක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට පහත පරිදි නිකුත් කරන ලදී:

- අමාත්‍යවරුන්/පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ යැපෙන්නන් (A කාණ්ඩය යටතේ) - 84
- අමාත්‍යාංශවල නිලධාරීන් සහ යැපෙන්නන් (A කාණ්ඩය යටතේ) –30

සාර්ක් නිදහස් වීසා යෝජනා ක්‍රමයේ B කාණ්ඩය යටතේ සෞඛ්‍ය හදිසි අවස්ථා වලදී ගමන් කිරීමට අවශ්‍ය වෛද්‍යවරුන් සහ හෙදියන් එක් කිරීමට ඉන්දියාවේ යෝජනාව (සාර්ක් ලේකම් කාර්යාලය විසින් බෙදා හරිනු ලැබේ) ක්‍රියාත්මක වෙමින් පවතින අතර සාමාජික රටවල එකඟතාවය අපේක්ෂා කරයි. ශ්‍රී ලංකාව අනෙකුත් සෞඛ්‍ය කාණ්ඩ ඇතුළත් කිරීමට යෝජනා කර ඇත.

### 2.4.7.1. ශ්‍රී ලංකාව සහ සාර්ක් කලාපීය මධ්‍යස්ථාන අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම:

**ශ්‍රී ලංකාවේ කොළඹ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය** (SCC): 2023 මාර්තු 31 වැනි දින සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය අවසන් වීමෙන් පසුව, මෙම අංශය විසින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සාර්ක් ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය වෙත නව අධ්‍යක්ෂවරයා පත් කිරීමට පහසුකම් සලසා ඇත. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂවරයා සහ සාර්ක් අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අතර හමුවක් 2023 අප්‍රේල් 10 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශයේදී සිදු විය. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය (SCC) විසින් සංවිධානය කරන ලද දෘෂ්‍ය කලා විශ්වවිද්‍යාලයේ පැවති සංස්කෘතික සැමරුම, ජාතික චිත්‍රපට සහයෝගිතා ප්‍රදර්ශනයේ දී පැවැති චිත්‍රපට දිනය - 2023 (3 වන කාර්තුව) ජාතික චිත්‍රපට සංස්ථාවේ තරංගනී රඟහලේදී "Haldaa" නම් බංග්ලාදේශ චිත්‍රපටය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සමඟ Royal Asiatic Society of Sri Lanka එක්ව සංවිධානය කරන ලද “Word Heritage Sites and the United Nations Sustainable Development” යන විශේෂ දේශනය, “Captivating Canvasses of the The Vibrant Colors” සාර්ක් සිතුවම් ප්‍රදර්ශනය, තරංගනී රඟහලේදී "Wind of Karma" නමින් භූතාන චිත්‍රපට ප්‍රදර්ශනයක් ප්‍රදර්ශනය කිරීම සහ අමාත්‍යාංශය 2023 නොවැම්බර් 28 සිට 29 දක්වා කොළඹ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් සාර්ක් සංස්කෘතික මාධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ (GB) දහතුන්වන රැස්වීම මාර්ගගතව පවත්වන ලදී.

**බංග්ලාදේශයේ ඩකා හි SAARC කෘෂිකාර්මික මධ්‍යස්ථානය** (SAC): කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් SAC හි 15 වන පාලක මණ්ඩල (GB) රැස්වීම 2023 නොවැම්බර් 15-16 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්වීමට අංශය පහසුකම් සලසා ඇත. ඉහත රැස්වීම සඳහා ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්.ඒ.ආර්.ටී. වික්‍රමආරච්චි මහතා සහභාගී විය. ඔවුන් 2023 ඔක්තෝම්බර් 27 වැනි දින ශ්‍රී ලංකාවේ මහනුවරදී පැවති දකුණු ආසියාවේ දේශගුණික ස්මාර්ට් කෘෂිකර්මාන්තය සඳහා වූ සම්මේලනය (C-SUSSeS) පිළිබඳ ව්‍යාපෘතියේ ප්‍රතිපත්ති වට මේස රැස්වීමේ සමාරම්භක සැසියට සහභාගී විය.

**ඉන්දියාවේ ගුජරාට් හි සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය** (SDMC): "COVID– 19 සිට සමාජ-ආර්ථික ප්‍රතිසාධනය සඳහා ප්‍රවේශයන්" පිළිබඳ නේවාසික වැඩමුළුව සඳහා ශ්‍රී ලංකාව සහභාගී විය. එය සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (SDMC) විසින් 2023 මාර්තු 1 සිට 4 දක්වා ඉන්දියාවේ ගාන්ධිනගර් හි සංවිධානය කරන ලද අතර එය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ COVID-19 මුහුණ දෙන අභියෝග ජය ගැනීම, ප්‍රකෘතිමත් වීමේ රාමුවක් සංවර්ධනය කිරීම සහ සාමාන්‍ය තත්ත්වයට පැමිණීමේ උපාය මාර්ගයක් කෙරෙහි ය. SDMC විසින් සංවිධානය කරන ලද "ඒකාබද්ධ ගංවතුර අවදානම් කළමනාකරණය" යන මාතෘකාව යටතේ 2023 දෙසැම්බර් 8-11 දක්වා වූ මාර්ගගත වැඩමුළුව සඳහා ශ්‍රී ලංකා රජයේ සහභාගීත්වය සම්බන්ධීකරණය කරන ලදී.

**පකිස්ථානයේ ඉස්ලාමාබාද් හි SAARC බලශක්ති මධ්‍යස්ථානය** (SEC): බලශක්ති නියාමකයින්ගේ (විදුලිය) සාර්ක් විශේෂඥ කවුන්සිලයේ පස්වන රැස්වීම සඳහා නොවැම්බර් 14 සිට 15 දක්වා පකිස්ථානයේ ඉස්ලාමාබාද්හි දී විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් සහභාගීවිය. සාර්ක් සහ ජාත්‍යන්තර පුනර්ජනනීය බලශක්ති නියෝජිතායතනය (IRENA) අතර අවබෝධතා ගිවිසුම (MoU) කෙටුම්පත සඳහා ශ්‍රී ලංකා රජයේ එකඟතාව ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

SAARC බලශක්ති මධ්‍යස්ථානයේ (SEC) පාලක මණ්ඩලයේ (GB) දහසයවන රැස්වීම 2023 දෙසැම්බර් 07-08 දක්වා කොළඹදී, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහයෝගයෙන් පැවැත්වීමට පහසුකම් සලසා ඇත.

**නේපාලයේ කත්මණ්ඩු හි සාර්ක් ක්ෂය රෝග සහ HIV/AIDS මධ්‍යස්ථානය** (STAC): 2023 ජනවාරි 22-23 දක්වා සහයෝගීතාවයෙන් පැවැත් වූ STAC හි පාලක මණ්ඩලයේ (GB) තිස්-එක්වන රැස්වීම සඳහා ශ්‍රී ලංකා රජයේ සහභාගීත්වය සම්බන්ධීකරණය කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශය සහ 2023 වසර සඳහා STAC සඳහා රජයේ වාර්ෂික කොටස් දායකත්වය ගෙවීම අවසන් කිරීම සඳහා පහසුකම් සලසා ඇත.

### 2.4.8. එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය

නිව්යෝර්ක් සහ ජිනීවා හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ නිත්‍ය දූත මණ්ඩලය සහ වියානා, පැරිස්, හේග්, රෝමය, නයිරෝබි සහ බැංකොක් හි එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන වෙත අනියුක්ත කරන ලද තානාපති කාර්යාල/ නිත්‍ය නියෝජිත කණ්ඩායම්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි අනුබද්ධ ආයතන සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධ වීම මෙම අංශයේ විෂය පථය යටතේ පවතී.

**එක්සත් ජාතීන්ගේ 78 වැනි මහා මණ්ඩල රැස්වීම, නිව්යෝර්ක්***:* අතිගරු ජනාධිපතිවරයා සැප්තැම්බර් 21 වැනි දින 78 වැනි මහා මණ්ඩල රැස්වීම ඇමතු අතර 2023.09.19 වැනි දින තිරසාර සංවර්ධන ඉලක්ක සමුළුවේදීද, 2023.09.20 දින සංවර්ධනය සඳහා මූල්‍යකරණය පිළිබඳ ඉහළ මට්ටමේ සංවාදයේදී ද 2023.09.20 දින එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ දේශගුණ අභිලාෂ සමුළුවේදී ද විශේෂ ප්‍රකාශ සිදු කළේය. ඔහු Carnegie Endowment සහ Sasakawa පදනම විසින් සංවිධානය කරන ලද "සාගර ජාතීන්" සංවාදයේ සහ ශ්‍රී ලංකාවේ ආර්ථික අවස්ථා පිළිබඳ ජාත්‍යන්තර අවබෝධය සඳහා වූ ව්‍යාපාරික කවුන්සිල සංසදයේ ප්‍රධාන කථිකයෙකු වූ අතර ද්විපාර්ශ්වික රැස්වීම් 13 කට ද සහභාගී විය.

විසංගත වැළැක්වීම, සූදානම සහ ප්‍රතිචාර දැක්වීම, අනාගතය පිළිබඳ සමුළුව සඳහා සූදානම් කිරීමේ අමාත්‍ය මණ්ඩල රැස්වීම, ගෝලීය සංවර්ධන මුලපිරීමේ සහයෝගීතා ප්‍රතිඵල පිළිබඳ ඉහළ මට්ටමේ රැස්වීම, 18 වැනි ACD අමාත්‍ය මණ්ඩල රැස්වීම, G77 හා සම්බන්ධ 47 වැනි විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ ඉහළ මට්ටමේ රැස්වීම, න්‍යෂ්ටික අවි සම්පූර්ණයෙන් තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනයේ ඉහළ පෙළේ රැස්වීම ආදි අවස්ථාවල දී විදේශ කටයුතු අමාත්‍යවරයා ප්‍රකාශ නිකුත් කරන ලදි. එතුමා පොදුරාජ්‍ය මණ්ඩලීය විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ රැස්වීමට ද සහභාගී විය. ගරු අමාත්‍යවරයා න්‍යෂ්ටික අවි තහනම් කිරීමේ ගිවිසුමට ප්‍රවේශ වීමේ ලේඛනය අත්සන් කළ අතර, 2023 ජූලි 25 වැනි දින ශ්‍රී ලංකාව විසින් එය අනුමත කිරීමෙන් අනතුරුව, විස්තීරණ න්‍යෂ්ටික-පරීක්ෂණ තහනම් ගිවිසුම (CTBT) පිළිබඳ මාධ්‍ය සාකච්ඡාවකට සහභාගී වූ අතර එහිදී ද්විපාර්ශ්වික රැස්වීම් 14ක් පවත්වා ඇත.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරිය CTBT බලාත්මක වීමට පහසුකම් සැලසීම පිළිබඳ 13 වැනි සමුළුවේදී ප්‍රකාශයක් සිදු කළාය. ගරු ජනාධිපතිතුමන්, විදේශ කටයුතු අමාත්‍යවරයා සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරිය විසින් UNGA සංවිධානයට සමගාමීව ඔවුන්ගේ පාර්ශවකරුවන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූ අතර අනෙකුත් නියෝජිත කණ්ඩායම්වල පාර්ශවකරුවන් සහ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන නිලධාරීන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක් පැවැත්විය.

**සංහිඳියාව සහ මානව අයිතිවාසිකම්:** එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් රටේ සංහිඳියාව සහ මානව හිමිකම් වර්ධනයන් පිළිබඳව අඛණ්ඩව යාවත්කාලීන කරන ලද අතර එමඟින් ඔවුන්ට අදාළ රාජ්‍යයන් දැනුවත් කිරීමට හැකි විය. ශ්‍රී ලංකාව මානව හිමිකම් කවුන්සිලයේ (HRC) 52, 53 සහ 54 සැසිවාරවලට සහභාගි විය. සෑම සැසියකදීම, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රකාශය ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් කවුන්සිලයේ 51/1 යෝජනාව ප්‍රතික්ෂේප කළේ ය.

ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යවරයා විසින් දකුණු අප්‍රිකාවේ සත්‍ය, සමගිය සහ සංහිඳයාව කොමිසමේ දකුණු අප්‍රිකානු ආකෘතිය සම්බන්ධයෙන් අධ්‍යයන චාරිකාවක නිරත විය. ශ්‍රී ලංකාවේ සත්‍ය, සමගිය හා සංහිඳයාව සඳහා වූ යෝජිත කොමිෂන් සභාව සහ අතුරු ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සත්‍ය, සමගිය හා සංහිඳයාව සඳහා වූ කොමිෂන් සභාව පිළිබඳ පනත් කෙටුම්පත 2024 ජනවාරි 1 වැනි දින ගැසට් කරන ලදී.

අදාළ රජයේ පාර්ශ්වකරුවන් සහ සිවිල් සමාජය සමඟ කරන ලද පුළුල් උපදේශනයෙන් පසුව ශ්‍රී ලංකාව සිය 4 වැනි ජාතික විශ්ව කාලාන්තර සමාලෝචන වාර්තාව ඉදිරිපත් කරන ලදි. ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම 2023 පෙබරවාරි මාසයේදී ජිනීවාහිදී සාර්ථක සමාලෝචනයක් පැවැත්විය.

අදාළ පාර්ශ්වකරුවන් සමඟ කළ පුළුල් උපදේශනවලින් පසුව ශ්‍රී ලංකාව සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ 6 වැනි කාලාන්තර සමාලෝචනයට සහභාගි විය.

පුළුල් උපදේශනයන්ගෙන් පසුව, ශ්‍රී ලංකාව කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ කමිටුවේ 9 වන වාර වාර්තාවේ ගැටළු ලැයිස්තුවට සිය ප්‍රතිචාර සහ බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ සම්මුතිය යටතේ පළමු කාලාන්තර සමාලෝචන වාර්තාව කමිටුව වෙත ඉදිරිපත් කළේය.

**තිරසාර සංවර්ධන ඉලක්ක:** UNESCAP හි තිරසාර සංවර්ධනය පිළිබඳ 10 වැනි ආසියා ශාන්තිකර සංසදය (ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා ස්වේච්ඡා ජාතික සැසියේ මුලසුන දැරූ අතර තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධව පවත්වන ලද UNESCAP ඇතුළුව, එක්සත් ජාතීන්ගේ රැස්වීම්/ සම්මන්ත්‍රණ කිහිපයකදී GOSL නියෝජනයන් සඳහා මෙම අංශය පහසුකම් සලසා ඇත.), UNESCAP හි 79 වැනි සැසිවාරය (ශ්‍රී ලංකාව- උප සභාපති), දකුණු-දකුණු සහයෝගීතාවයේ 21 වැනි සැසියේ (ශ්‍රී ලංකාව- සභාපති), UN SDG සමුළුව 2023, SDGs පිළිබඳව UNGA හි 78 වැනි සැසිවාරයට සමගාමීව පවත්වන ලද දේශපාලන සංසදයේ ඉහළ මට්ටමේ

කමිටුව, සංවර්ධනය සඳහා මූල්‍යකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ (ECOSOC) සංසදය (ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා විද්වත් සාකච්ඡාවකට සහභාගී විය), 07 වැනි ආසියානු පැසිෆික් ජනගහන සමුළුව, 03 වැනි ආසියානු – පැසිෆික් බලශක්ති සංසදය (ශ්‍රී ලංකාව- උප සභාපති) සහ UNESCAP හි සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, දරිද්‍රතාවය අඩු කිරීම සහ මූල්‍යකරණය පිළිබඳ කමිටුවේ 04 වැනි සැසිවාරය මගින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ශ්‍රී ලංකාව උත්සහ කරන ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සහයෝගය ලබා දීම සඳහා, බහුපාර්ශ්වික සංසදවලදී, විශේෂයෙන් 2023 දී UNGA හි 78 වැනි සැසිවාරයේ 02 වැනි කමිටුවේ දී තිරසාර සංවර්ධන ඉලක්කයන්හි විවිධ පැතිවලට අදාළව සම්මත කරන ලද යෝජනා 19ක් සඳහා ශ්‍රී ලංකාව අනුග්‍රහය / ඡන්දය ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල දායකත්වය 2022 දී එක්සත් ජාතීන්ගේ කණ්ඩායම හා GoSL අතර අත්සන් කරන ලද සමස්ත එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව (UNSDCF) යටතේ පවතින අතර UNSDCF ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ රැස්වීම්වලට මෙම අංශය සහභාගී වේ. ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම යනු ගරු අගමැතිතුමන් සහ ගරු අගමැතිතුමන්ගේ ලේකම් විසින් තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ජාතික ප්‍රගතිය සහ අභියෝග පිළිබඳව සාකච්ඡා කිරීමට සහ සමාලෝචනය කිරීමට ඇති ඉහළම මට්ටමේ අවස්ථාව වන අතර මෙම අංශය මෙම රැස්වීම්වලට සහභාගීත්වය සපයයි.

**නිරායුධකරණය:** විස්තීරණ න්‍යෂ්ටික පරීක්ෂණ තහනම් ගිවිසුම් සංවිධානයේ (CTBTO) විධායක ලේකම් ආචාර්ය රොබට් ෆ්ලොයිඩ් මහතා 2023 මැයි 31 සිට ජූනි 5 දක්වා ශ්‍රී ලංකාවේ සාර්ථක සංචාරයක් නිමා කළේය. ශ්‍රී ලංකාව CTBT අනුමත කර 2025 දී ඒකාබද්ධ ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගන්නා ලදි.

**විද්‍යාව හා තාක්ෂණයේ බහුපාර්ශ්වික නියැලීම:** අතිගරු ජනාධිපතිතුමන් විසින් කියුබාවේ හවානා නුවර පැවති ‘වත්මන් සංවර්ධන අභියෝග: විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනයේ භූමිකාව’ යන තේමාව යටතේ ජී 77 සහ චීන සමුළුවේ රාජ්‍ය නායකයින් සහ රජය අමතන ලදි. ශ්‍රී ලංකාව සහ කියුබාව අතර දේශපාලන, ආර්ථික සහ සංවර්ධන සහයෝගීතාව තවදුරටත් තර කර ගැනීම සඳහා 2023 සැප්තැම්බර් 14 වැනි දින කියුබානු ජනාධිපතිවරයා සමඟ ජනාධිපතිතුමන් ද්වි පාර්ශවීය සාකච්ඡා පවත්වන ලදි. ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවති එක්සත් ජාතීන්ගේ සයිබර් අපරාධ සම්මුතිය පිළිබඳව විස්තර කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ තාවකාලික කමිටුවට සහ 76 වැනි ලෝක සෞඛ්‍ය සමුළුවට ශ්‍රී ලංකාව සහභාගී විය.

**සමාජ-ආර්ථික ක්ෂේත්‍රයේ බහුපාර්ශ්වික නියැලීම**: ආර්ථික හා සමාජීය කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංවර්ධනය සඳහා මූල්‍යකරණය පිළිබඳ සංසදයට සහ බදු කාරණා සම්බන්ධයෙන් නිව්යෝර්ක් හි පැවති ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ විශේෂඥ කමිටුවට සහ තිරසාර සංවර්ධනය පිළිබඳ 10 වැනි ආසියා ශාන්තිකර සමුළුවට ශ්‍රී ලංකාව සහභාගී විය. බැංකොක්හි පැවති බැංකොක් කොමිෂන් සභාවේ 79 වන සැසිවාරය සහ ආසියා සහ පැසිෆික් කළාප සඳහා ආර්ථික හා සමාජ කොමිසම විසින් සංවිධානය කරන ලද බැංකොක් හි ස්ථිර නියෝජිතයින් සහ අනෙකුත් නියෝජිතයින් සඳහා 406 වැනි උපදේශක කමිටුව සඳහා ද ශ්‍රී ලංකාව සහභාගි විය.

ගරු ජනපතිතුමන් විසින් නව ගෝලීය මූල්‍ය ගිවිසුමක් සඳහා වූ සමුළුවට සමගාමීව 2023 ජූනි 22 වන දින පැරිසියේදී එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ඕඩ්රි අසූලේ මහතා හමු විය.

2023 එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුමට අදාළ කටයුතු නිව්යෝර්ක්, පැරිස්, බැංකොක් සහ ජිනීවා හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය කරමින් මෙම අංශය විසින් සිදු කර ඇත.

**අපේක්ෂකත්ව:** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල විවිධ තනතුරු සඳහා වෙනත් රාජ්‍යයන් විසින් යෝජනා කරන ලද අපේක්ෂකත්වයන්ට සහය දක්වමින් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ මිත්‍ර සබඳතා පවත්වා ගැනීමට ශ්‍රී ලංකාව දරන උත්සාහයන් සඳහා මෙම අංශය අඛණ්ඩව සම්බන්ධීකරණය කටයුතු සිදු කර ඇත.
සියලු සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව *සඳහා* 2023 ජූනි 27 වැනි දින නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පැවති මැතිවරණයේදී සහ 2023 නොවැම්බර් 15 වන දින පැරිසියේ පැවති අන්තර් රාජ්‍ය සංවිධානයේ 42 වන මහා සම්මේලනයේ දී 2023-2027 කාල රාමුව සඳහා එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ විධායක මණ්ඩලයට ශ්‍රී ලංකාව තේරී පත් විය.

**අක්ත පත්‍ර***:* 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිකුත් කර ඇති අක්ත පත්‍ර සංඛ්‍යාව 60 කි.

**වීසා***:* 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලබා දුන් වීසා ප්‍රමාණය 220 කි.

## 2.5. කාර්සාධන සමාලෝචනය: දේශපාලන කටයුතු අංශ

### 2.5.1. අප්‍රිකානු කටයුතු අංශය

කලාපයේ රටවල් 54ක් සමඟ ද්විපාර්ශ්වික සබඳතා සම්බන්ධීකරණය කිරීමේ වගකීම අප්‍රිකානු කටයුතු අංශය සතුය. මෙම අංශය මගින් ඊජිප්තුව, ඉතියෝපියාව, කෙන්යාව, සීෂෙල්ස් සහ දකුණු අප්‍රිකාව යන රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩල 5ක් හරහා අප්‍රිකානු සංගමයට හා සම්බන්ධ කටයුතු සඳහා දායක වේ.

**ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා අප්‍රිකානු නියෝජිතවරුන් සමඟ සිදු කළ රැස්වීම:** අප්‍රිකානු කටයුතු අංශය 75 වැනි නිදහස් දින සැමරුම් උත්සවයට සමගාමීව සිදුකල සැසිවාර සඳහා පහසුකම් සපයන ලදී. අප්‍රිකානු මහද්වීපයේ මහ කොමසාරිස්වරු, තානාපතිවරු, වැඩබලන තානාපතිවරු සහ නියෝජිතයෝ මේ සඳහා සහභාගි විය.

**දකුණු අප්‍රිකාවේ සහ මොරිෂස් හි ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරය**: 2023 මාර්තු සහ 2023 නොවැම්බර් මාසවලදී දකුණු අප්‍රිකාවේ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරය සඳහා පහසුකම් සපයා දෙන ලදී.
අතිගරු ජනාධිපතිවරයා සහ අප්‍රිකානු රටවල ඔහුගේ නියෝජිතයන් සමඟ (උදා: රුවන්ඩා, ඝානාව සහ කෙන්යාව) පවත්වනු ලැබූ රැස්වීම සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී.

**විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අනෙකුත් ඉහළ පෙළේ නිලධාරීන් සමඟ වූ රැස්වීම්:** 2023 දී, අප්‍රිකානු කටයුතු අංශය විසින්, එනම් ඊජිප්තුව, ඇන්ගෝලා, ජිබූටි, සුඩානය, මලාවි, කෝට් ඩි අයිවරි, ටැන්සානියාව, උගන්ඩාව, සිම්බාබ්වේ, සීෂෙල්ස් වැනි රටවල ගරු තානාපතිවරුන් / අප්‍රිකානු රටවල මහ කොමසාරිස්වරුන් සමඟ විදේශ කටයුතු අමාත්‍යවරයා, විදේශ කටයුතු ලේකම් සහ අප්‍රිකානු කටයුතු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පැවැත් වූ රැස්වීම සඳහා දායකත්වය ලබා දෙන ලදි. .

මොරොක්කෝ මහ බැංකු අධිපතිවරයාගේ ශ්‍රී ලංකාවේ සංචාරයට (ඔක්තෝබර් 2023) හා රුවන්ඩා ආණ්ඩුකාරවරයාගේ (නොවැම්බර් 2023) ඌව පළාත් සංචාරය සඳහා මෙම අංශය පහසුකම් සලසන ලදි. ඝානාවේ කථානායකවරයා (සැප්තැම්බර් 2023), කෙන්යාවේ නාවික හමුදා නියෝජිත කණ්ඩායම (ඔක්තෝබර් 2023) සහ ඝානාවේ ජනාධිපතිවරයාගේ විශේෂ නියෝජිත (දෙසැම්බර් 2023) යන අයගේ සංචාරයන්හි දී ද පහසුකම් සැළසීමට දායක වී ඇත.

**ද්විපාර්ශ්වික සබඳතා:** ශ්‍රී ලංකාව සහ ඊජිප්තුව අතර දේශපාලන උපදේශන තුන්වන සැසිවාරය කොළඹදී (ජූලි 2023) පැවැත්විණි. ශ්‍රී ලංකාව සහ ඊජිප්තුව අතර 3 වැනි ඒකාබද්ධ ආර්ථික (2024 පළමු කාර්තුවේ දී) කොමිසම පැවැත්වීමට පියවර ගන්නා ලදී. ශ්‍රී ලංකාව සහ ඊජිප්තුව අතර 66 වසරක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සැමරීම සඳහා මුද්දරයක් නිකුත් කරන ලදී (දෙසැම්බර් 2023).

**අප්‍රිකානු මහද්වීපයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පුළුල් කිරීම**: කොමරෝස්, සාඕ ටෝමේ සහ ප්‍රින්සිපි සමඟ විධිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර චැඩ්, මධ්‍යම අප්‍රිකානු කලාපය, කැමරූන්, සමක ගිනියා, කේප් වෙර්ද් සහ නයිජර් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීම සඳහා අදාළ රජයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යමින් පවතී.

### 2.5.2. නැගෙනහිර ආසියානු අංශය

සමාලෝචන කාලසීමාව තුළ, නැගෙනහිර ආසියා අංශය විසින් ඕස්ට්‍රේලියාව, චීනය, ජපානය සහ දකුණු කොරියාව සහ ඔවුන්ගේ සමගාමී ප්‍රතීතන රටවල නේවාසික දූත මණ්ඩල හරහා අදාළ රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට කොන්සියුලර් සහාය සහ කම්කරු සුබසාධනය ලබා දෙමින් කලාපයේ රටවල් සමඟ දේශපාලන, ආර්ථික, සමාජ-සංස්කෘතික සහ මානව සබඳතා ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

**චීනය:** චීනයේ බීජිං හි පැවති ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වන 3 වන එක් තීරයක් එක් මාවතක් සංසදයේ (BRF) "සොබාදහම සඳහා සහජීවනය සඳහා හරිත සේද මාවත" යන ඉහළ පෙළේ සංසදය ඇමතීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ චීන සංචාරය සම්බන්ධීකරණය කරන ලදී. මෙම සංචාරයේදී ගරු ජනාධිපතිතුමා, ගරු චීන ජනාධිපති ෂී ජින් පින්ග්, සහ උප අගමැති ගරු ඩින්ග් සුයිසියැන්ග් යන මහත්වරුන් සමඟ ද්වි පාර්ශවීය සාකච්ඡා සිදු කරන ලදී. 3 වන එක් තීරයක් එක් මාවතක් රැස්වීමට සමගාමීව, ගරු ජනාධිපතිතුමා ඉන්දුනීසියාව, වියට්නාමය සහ පාකිස්ථානය යන රටවල රාජ්‍ය නායකයින් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූ අතර, ආයෝජන, වෙළඳ සහ සංචාරක සංසදයක් අමතමින්, චීන ආයෝජකයින් සහ අනාගත ආයෝජකයින් කිහිප දෙනෙකු සමඟ සාකච්ඡා සිදු කරන ලදි. 7 වැනි චීන-දකුණු ආසියානු ප්‍රදර්ශනයට සහ 27 වැනි චීන කුන්මිං ආනයන හා අපනයන ප්‍රදර්ශනයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ගරු අගමැතිතුමන්ගේ සංචාරය සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදි. කුන්මිං හි 7 වැනි චීන-දකුණු ආසියානු ප්‍රදර්ශනයට සමගාමීව ගරු අග්‍රාමාත්‍යවරයා විසින් චීනයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු වං යී මැතිතුමා සමඟ ද්වි පාර්ශවීය සාකච්ඡා සිදු කරන ලදි. චීනයේ රාජ්‍ය උපදේශක සහ විදේශ කටයුතු අමාත්‍ය ගරු ක්වින් ගංග් මැතිතුමාගේ ආරාධනයෙන් ටියැංජින් හි ලෝක ආර්ථික සමුළුවට සහභාගි වූ විදේශ කටයුතු අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමාගේ චීන සංචාරය සම්බන්ධීකරණය කිරීම ද සිදු කරන ලදි.

**ජපානය:** 2023 මැයි 25 සිට 26 දක්වා පැවති Nikkei Future Asia සමුළුවට සහභාගී වීම සඳහා ගරු ජනාධිපතිතුමා ජපානයේ ටෝකියෝ හි කළ සංචාරය සම්බන්ධීකරණය කළේය. මෙම සංචාරයේදී ගරු ජනාධිපතිතුමා ජපානයේ ගරු අග්‍රාමාත්‍ය ෆුමියෝ කිශිඩා මහතා සමඟ සමුළුවක් පැවැත්වූ අතර ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු යොෂිමාසා හයාෂි මහතා හමු විය. ජපානයේ හිටපු විදේශ කටයුතු අමාත්‍ය ගරු යොෂිමාසා හයාෂි මහතාගේ 2023 ජූලි 28-29 දක්වා සිදුවූ ශ්‍රී ලංකා නිල සංචාරය සම්බන්ධීකරණය කළ අතර ගරු ජනාධිපති, අග්‍රාමාත්‍ය, සහ විදේශ කටයුතු අමත්‍යවරයා සමඟ සාකච්ඡා පැවැත්වීමට පහසුකම් සැළසීය.

**ඕස්ට්‍රේලියාව**: ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතාට, 2023 පෙබරවාරි මාසයේ ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් හිදී පැවති 8th Bali Process සමුළුවට සහභාගී වීමට පහසුකම් සැපයීම.

**කොරියාව:** දකුණු කොරියාවේ රැකියා සහ කම්කරු අමාත්‍ය ලී ජන්ග් ෂික් මහතා 2023 සැප්තැම්බර් 15 සිට 17 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර සංචාරය අතරතුර ගරු ලී මැතිතුමා, ගරු අග්‍රාමාත්‍යවරයා, ගරු

විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශවීය සාකච්ඡා පැවැත්විය. ශ්‍රී ලාංකිකයන් සඳහා කොරියානු වීසා ලබා දීම කඩිනම් කිරීම සඳහා මෙම අංශය විසින් කොළඹ පිහිටි කොරියානු දූත මණ්ඩලය වෙත අවධානය යොමු කරන ලදි.

**නවසීලන්තය:** නවසීලන්තයේ සංක්‍රමණ ප්‍රතිපත්ති සංවර්ධන ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපල විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් සැකසීම.

### 2.5.2.1. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

**චීනය සමඟ අවබෝධතා ගිවිසුම්:**

01. චීනයේ රේගු සාමාන්‍ය පරිපාලනය සහ ශ්‍රී ලංකා ධීවර අමාත්‍යාංශය අතර ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට නියමිත මසුන් ඇල්ලීමේ ජලජ නිෂ්පාදන සඳහා පරීක්ෂා කිරීම, නිරෝධායනය සහ පශු වෛද්‍ය, සනීපාරක්ෂක අවශ්‍යතා පිළිබඳ ධීවර සන්ධානය.
02. චීනයේ රේගු සාමාන්‍ය පරිපාලනය සහ ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය අතර ශ්‍රී ලංකාවේ සිට චීනයට ලංකා කුරුඳු අපනයනය කිරීම සඳහා වන ශාක සනීපාරක්ෂක අවශ්‍යතා පිළිබඳ අවබෝධතා ගිවිසුම
03. චීනයේ ජාතික සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ මුදල්, ආර්ථික, ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අතර එක් තීරයක්, එක් මාවතක් මුලපිරීම පිළිබඳ සහයෝගීතා සැලැස්ම ඒකාබද්ධව කඩිනම් කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම
04. චීනයේ ජාතික සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අතර සහයෝගිතාව සඳහා වූ අවබෝධතා ගිවිසුම
05. හරිත හා අඩු කාබන් සංවර්ධනය පිළිබඳ සහයෝගීතාව සම්බන්ධයෙන් චීනයේ ජාතික සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ මුදල්, ආර්ථික, ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම.

**ඕස්ට්‍රේලියාව සමඟ අවබෝධතා ගිවිසුම්:**

01.රේගු කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහය සඳහා ඕස්ට්‍රේලියානු දේශසීමා බලකාය සහ ශ්‍රී ලංකා රේගුව අතර අවබෝධතා ගිවිසුම.
02.ඕස්ට්‍රේලියානු රජය සහ ශ්‍රී ලංකාව අතර ක්‍රීඩා සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

**ජපානය සමඟ අවබෝධතා ගිවිසුම්:** ජපානයේ එහිමේ ප්‍රාන්තය සහ ශ්‍රී ලංකාවේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය අතර කෘෂිකර්ම සහ අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳ සහයෝගිතා ගිවිසුම.

**කොරියානු ජනරජය සමඟ අවබෝධතා ගිවිසුම්:** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ Saemaul පදනම අතර අවබෝධතා ගිවිසුම.

**නවසීලන්තය සමඟ අවබෝධතා ගිවිසුම්:** නවසීලන්ත රජය විසින් අරමුදල් සපයන ජාත්‍යන්තර සංක්‍රමණ ප්‍රතිපත්ති සංවර්ධන මධ්‍යස්ථානය (ICMPD) විසින් කළමනාකරණය කරනු ලබන සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම.

**රාජ්‍ය තාන්ත්‍රික උපදේශන:** ශ්‍රී ලංකාව සහ චීනය 2023 මැයි 30 වැනි දින කොළඹදී 12 වැනි රාජ්‍ය තාන්ත්‍රික උපදේශන වටය සාර්ථකව අවසන් කරන ලදී. මෙම උපදේශනයන් ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අරුණි විජේවර්ධන මහත්මියගේ සහ මහජන චීන සමූහාණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍ය සුන් වෙයිදොන් මහතාගේ සම සභාපතිත්වයෙන් පවත්වන ලදී.

ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව 2023 ජූලි 11 වැනි දින කොළඹදී 04 වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සාකච්ඡා වටය සාර්ථකව අවසන් කරන ලදී. අතිරේක ලේකම්/ද්විපාර්ශ්වික (නැගෙනහිර) යසෝජා ගුණසේකර මහත්මිය සහ ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු සහ වෙළෙඳ දෙපාර්තමේන්තුවේ උතුරු හා දකුණු ආසියානු අංශයේ පළමු සහකාර ලේකම් ගැරී කෝවන් මහතා එක් එක් පාර්ශවයේ නියෝජිත පිරිසට නායකත්වය දුන්හ.

### 2.5.3. ලතින් ඇමරිකානු සහ කැරිබියන් අංශය

මෙක්සිකෝ, බෙලීස්, කොස්ටාරිකා, එල් සැල්වදෝරය, ගෝතමාලා, හොන්ඩුරාස්, නිකරගුවා, පැනමා, ඇන්ටිගුවා, බාබඩු, බහමාස්, බාබඩෝස්, කියුබා, ඩොමිනිකා, ඩොමිනිකන් ජනරජය, හයිටි, ජැමෙයිකා, ශාන්ත කිට්ස් සහ නෙවිස්, ශාන්ත ලුසියා, ශාන්ත වින්සේන්ට් සහ ග්‍රෙනාඩින්ස්, ට්‍රිනිඩෑඩ් සහ ටොබාගෝ, ආර්ජන්ටිනා, බොලිවියා, බ්‍රසිල්, චිලී, කොලොම්බියා, ඉක්වදෝරය, ගයනාව, පැරගුවේ, පේරු, සුරිනාම්, උරුගුවේ සහ වෙනිසියුලාව ආදිය ඇතුලත් මධ්‍යම, දකුණු ඇමරිකාව සහ කැරිබියන් රටවල් 33 ක් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා සම්බන්ධීකරණය කිරීමේ වගකීම ලතින් ඇමරිකානු සහ කැරිබියන් අංශය සතුය.

මෙම අංශය එක්සත් ජනපදයේ (වොෂින්ටන්, නිව් යෝර්ක්), කියුබාව (හවානා) සහ බ්‍රසීලයේ (බ්‍රසීලියාව) පිහිටි ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හතරක් හරහා මෙම රටවල දේශපාලන හා සමාජ-ආර්ථික වර්ධනයන් නිරීක්ෂණය කරයි.

ලතින් ඇමරිකාවේ සහ කැරිබියන් කලාපයේ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික නියෝජනය කළමනාකරණය කරනු ලබන්නේ බ්‍රසීලයේ බ්‍රසීලියා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ කියුබාවේ හවානා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසිනි.

ඉහළ මට්ටමේ නිල සංචාර සහ වාර්ෂික හවුල්කාරිත්ව සංවාද ඇතුළු විවිධ යාන්ත්‍රණ, වැඩසටහන් සහ කර්තව්‍යයන් හරහා ඉහත සඳහන් රටවල් සමඟ ශ්‍රී ලංකාවේ සබඳතාව ප්‍රවර්ධනය කර ශක්තිමත් කරයි. ද්විපාර්ශ්වික කරුණු සම්බන්ධව කොළඹ පිහිටි ලතින් ඇමරිකානු රටවල දූත මණ්ඩල සමඟ සන්නිවේදන කේන්ද්‍රස්ථානය ලෙස මෙම අංශය කටයුතු කරයි. මෙම අංශය ශ්‍රී ලංකා රජයේ රේඛීය ආයතන, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කොළඹ පිහිටි රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය කරයි.

**ලතින් ඇමරිකාවේ සහ කැරිබියන් දූපත් වල ප්‍රගතිය සහ අනාගත දැක්ම 2023:** බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය දකුණු ඇමරිකාවේ සමගාමීව පිළිගත් රටවල් වන ආර්ජන්ටිනාව, කොලොම්බියාව, චිලී, ගයනාව, සුරිනම්, පැරගුවේ, පේරු සහ උරුගුවේ යන රටවල් සමඟ සම්බන්ධ වී ඇත. බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකාවේ ජාතික වාණිජ මණ්ඩලය සහ Goias ප්‍රාන්තයේ වාණිජ, කර්මාන්ත සහ සේවා සංගමය අතර අවබෝධතා ගිවිසුමක් 2023 පෙබරවාරි 1 වන දින අත්සන් කරන ලද අතර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහාය ඇතිව තානාපති කාර්යාලය EXPO Tourism Goias 2023 හිදී ශ්‍රී ලංකා සංචාරක, වෙළඳ, ආහාර පිසීම් සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කරන ලදී. ශ්‍රී ලංකා තානාපතිවරයා "Noah Spa" හි හිමිකරු හමුවී ශ්‍රී ලංකාව සියල්ල සමන්විත රටක් ලෙස බ්‍රසීලියාවේ වෛද්‍ය වෘත්තිකයන් අතර ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලාංකේය සම්ප්‍රදාය, ආහාර වර්ග, ලංකා තේ ආදිය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළේය.

බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ Goias හි භාණ්ඩ, සේවා සහ සංචාරක වෙළෙඳ සම්මේලනය වෙළෙඳ, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධන සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීමට එකඟ වී ඇත. මැණික් සහ ස්වර්ණාභරණ, කුළුබඩු, කෝපි, ක්‍රීඩා ඇඳුම් සහ විවේක ඇඳුම් සම්බන්ධ ශ්‍රී ලාංකේය සමාගම් සඳහා වෙළඳපොළ ප්‍රවේශය පහසු කිරීම සඳහා EDB සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වැනි ශ්‍රී ලංකාවේ නියෝජිතායතන සහ වෙළඳ ප්‍රවර්ධන ආයතන සමඟ ද දූත මණ්ඩලය සම්බන්ධීකරණය කරන ලදී. 2023 වසරේ පැවති AnuFood 2023 Brazil සහ APAS Brazil සඳහා සහභාගී වීමට තානාපති කාර්යාලය

විසින් ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට පහසුකම් සලසා දෙන ලදී. තවද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ සහයෝගයෙන්, තානාපති කාර්යාලය ශ්‍රී ලාංකික තේ අපනයන සමාගම් 12 ක සහභාගීත්වයෙන් 'ශ්‍රී ලංකා මණ්ඩපයක්' 2023 සැප්තැම්බර් මාසයේදී චිලි හි සන්තියාගෝ නුවර පැවති Espacio Food Service EXPO හි සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාව සහ සාඕ පාලෝ අතර ද්විපාර්ශ්වික ආර්ථික සහයෝගීතා සබඳතා ශක්තිමත් කිරීම සඳහා සාඕ පාලෝ ප්‍රාන්ත රජයේ ජාත්‍යන්තර කටයුතු ලේකම්වරයා සමඟ සාකච්ඡා කරන ලදී. තානාපතිවරයා සාඕ පාලෝ සුපිරි වෙළඳසැල් සංගමයේ ප්‍රධාන විධායක නිලධාරී සහ බ්‍රසීලියානු සුපිරි වෙළඳසැල් සංගමයේ විකුණුම් සහ අලෙවි උප සභාපති සාඕ පවුලෝ සහ බ්‍රසීලයේ සුපිරි වෙළඳසැල් වෙත ඇතුළුවීම පිළිබඳව සාකච්ඡා කළේය.

ශ්‍රී ලංකා භූ විද්‍යා කාර්යාංශය සමඟ සහයෝගීතාව ඇති කර ගැනීම සඳහා තානාපතිවරයා බ්‍රසීල භූ විද්‍යා සමීක්ෂණ ආයතනයේ නිලධාරීන් ද හමු විය. තානාපති කාර්යාලය Museu de Art de Brasilia හි පැවති ආසියානු සහ ඕෂනියා රටවල වාර්ෂික Bazar de Comida e Cultura International 2023 (International Food and Cultural Bazar 2023) වෙළඳ ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා සංචාරක, ආහාරපාන සහ ලංකා තේ ප්‍රවර්ධනය සඳහා සහභාගී විය. තවද, Goias ප්‍රාන්තයේ නගරාධිපතිවරයා සහ තානාපතිවරයා අතර පැවති හමුවකදී, Goiania මහ නගර සභාව සහ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ මහ නගර සභාවක් අතර "Sister City" ව්‍යාපෘතියකට ඇතුළු වීමේ යෝජනාව පිළිගත්තේය. තවද, බ්‍රසීලයේ සුප්‍රසිද්ධ රූපවාහිනී ඉදිරිපත් කරන්නෙකු සමඟ විලියම් මොන්ඩෝ හිදී 'ලතින් ඇමරිකාවේ ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම' යන තේමාව යටතේ මාධ්‍ය සම්මුඛ සාකච්ඡාවක් ද දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

ලතින් ඇමරිකානු සහ කැරිබියන් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකාවේ බ්‍රසීලයේ සහ කියුබාවේ තානාපතිවරුන් සමඟ දෙරට අතර පවතින ගිවිසුම් මෙන්ම අවබෝධතා ගිවිසුම්වල ප්‍රගතිය සාකච්ඡා කළ අතර තාක්ෂණික සහයෝගීතාව සඳහා බ්‍රසීලියානු සහයෝගිතා ඒජන්සිය (ABC) සහ බ්‍රසීලියානු කෘෂිකාර්මික පර්යේෂණ සමාගම පොල් කර්මාන්තයේ සහ සෞඛ්‍ය හා ඖෂධ ක්ෂේත්‍රයේ සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට පහසුකම් සැලසීම පිළිබඳ සාකච්ඡා කළහ.

2023 ජූනි මාසයේදී බ්‍රසීලියානු සහයෝගිතා ඒජන්සිය (ABC) ශ්‍රී ලංකාවේදී සිදුකල සංචාරයේදී එම ආයතනය ෆෙඩරල් විශ්ව විද්‍යාලය, Vicosa ෆෙඩරල් විශ්ව විද්‍යාලය, Sao Carlos ෆෙඩරල් විශ්ව විද්‍යාලය, කොළඹ බ්‍රසීලියානු තානාපති කාර්යාලය සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය / බ්‍රසීලියා සමඟ සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ කිරි සහ සීනි කර්මාන්ත අංශ ශක්තිමත් කිරීම සඳහා මෙම සංචාරයේදී සාකච්ඡා සිදු කෙරුණු අතර කෙටුම්පත් ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමට පාර්ශවකරුවන් සමඟ රැස්වීමක් පැවැත්වීය. ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සහ බ්‍රසීල විදේශ කටයුතු අමාත්‍යාංශයේ Rio Branco රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (IRBr) අතර රාජ්‍ය තාන්ත්‍රික පුහුණුව පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම පිළිබඳව එකඟතාවයකට පැමිණ ඇත. එය ආයතන දෙක මගින් එම ගිවිසුම 2024 දී බ්‍රසීලියා හි අත්සන් කිරීමට නියමිතය.

තානාපති කාර්යාලය බ්‍රසීලයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් හා සමගාමීව පිළිගත් රටවල අදාළ තානාපතිවරුන්/ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ කාන්තා තත්ත්වය පිළිබඳ කොමිෂන් සභාවේ (CSW) සහ සියලුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ කමිටුවේ (CMW) ශ්‍රී ලංකා අපේක්ෂකත්වයට ඔවුන්ගේ සහය ලබා ගැනීම සඳහා ඵලදායී සාකච්ඡා පැවැත්විය. චිලී, ආර්ජන්ටිනාව, බොලිවියාව සහ පැරගුවේ තානාපතිවරුන් සමඟ ජිනීවා හි එළඹෙන (53 වැනි) මානව හිමිකම් කවුන්සිල සැසිවාරයේදී ඵලදායී මැදිහත්වීමක් ඉල්ලා සිටි අතර, 2023 නොවැම්බර් මාසයේ පැරිසියේ පැවති යුනෙස්කෝ හි විධායක මණ්ඩලයේ 2023-2027 ධුර කාලය සඳහා ශ්‍රී ලංකා අපේක්ෂකත්වය සඳහා ඒකපාර්ශ්වික හෝ අන්‍යෝන්‍ය සහයෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

වොෂින්ටනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ මෙක්සිකානු බලධාරීහු අදාළ විදේශ අමාත්‍යාංශ අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන ස්ථාපිත කිරීම පිළිබඳ ගිවිසුම කඩිනම් කිරීමට එකඟ වූ අතර, එමගින්

විස්තීර්ණ සාකච්ඡා, අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ක්‍රියාකාරකම්, වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ අනුව, 2023 ඔක්තෝබර් 19 වන දින වොෂින්ටන්හි මෙක්සිකෝවේ තානාපති සහ වොෂින්ටනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා අතර මෙම ගිවිසුම අත්සන් කරන ලදී. වොෂින්ටනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා 2023 ඔක්තෝම්බර් මාසයේදී මෙක්සිකානු ව්‍යාපාරික කවුන්සිලය සමඟ කුරුඳු, තේ, පෝසිලේන් සහ ඇඟලුම් වැනි ක්ෂේත්‍රවල වැඩිදියුණු කළ වෙළඳ සබඳතා සහ හවුල් ව්‍යාපාර සඳහා ඇති අවස්ථා පිළිබඳව සාකච්ඡා කළේය.

කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, 2023 දී ඩොමිනිකන් ජනරජයේ සහ පැනමාවේ නිර්වේතනික කොන්සල්වරුන් දෙදෙනෙකු පත් කරන ලදී. එල් සැල්වදෝරය සහ හොන්ඩුරාස් සඳහා නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. ඩොමිනිකන් ජනරජයේ සේවකයින්ගේ වීසා ගැටළුව තානාපති කාර්යාලය විසින් විසඳා ඇත. 2023 වර්ෂයේදී කියුබානු සහ තුර්කි බලධාරීන්ගේ සහයෝගය ඇතිව කැරිබියන් කලාපයේ ශ්‍රී ලාංකික සේවකයින් 40 කට ආසන්න පිරිසකට සංක්‍රමණ පහසුකම් සැලසීමට එය කටයුතු කරන ලදී. කියුබාවේ තානාපතිවරයා කැමගුවේ විශ්වවිද්‍යාලයට ගොස් අදාළ නිලධාරීන් සහ ශ්‍රී ලාංකික ශිෂ්‍ය ප්‍රජාව හමුවී සාකච්ඡා කළේය. කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කියුබානු බෞද්ධ සංගමයේ අනුග්‍රහය ඇතිව ජූලි මාසයේදී තානාපති කාර්යාලයේ බෞද්ධ වැඩසටහනක් සඳහා පහසුකම් සලසන ලදී. මීට අමතරව, ජැමෙයිකාවේ ශ්‍රී ලංකා පොල් ආශ්‍රිත කර්මාන්ත වල ආයෝජන අවස්ථා සඳහා සම්බන්ධ කර ගත හැකි අදාළ බලධාරීන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් හඳුනාගෙන ඇත.

අතිගරු ශ්‍රී ලංකා ජනාධිපතිවරයා කියුබානු සංචාරයක නිරත වූ අතර කියුබානු ජනාධිපතිවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක නිරත විය, එහිදී දෙරට අතර සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සහයෝගීතාව ඉහළ නැංවීමට තීරණය විය. පුහුණු කිරීම්, දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය මගින් කියුබාවේ පොල් ආශ්‍රිත කර්මාන්ත වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකාවේ සහය ලබා දීමට අතිගරු ජනාධිපතිතුමා එකඟ වී ඇත. මෙම අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ශ්‍රී ලංකාවේ කියුබානු තානාපතිවරයා එහි පියවරක් ලෙස 2023 නොවැම්බර් මස ලුණුවිල පොල් පර්යේෂණායතනයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අතර කියුබානු පාර්ශවයට ඔවුන්ගේ පොල් කර්මාන්තය දියුණු කිරීම සඳහා පොල් බීජ පරිත්‍යාග කිරීමේ වැඩසටහනකට සහ කෙටි සාකච්ඡාවකට සහභාගී විය. කියුබාවට ශ්‍රී ලංකාව ලබා දෙන ආධාරයක් ලෙස පොල්තෙල් නිෂ්පාදන යන්ත්‍ර දෙකක් කියුබානු පාර්ශවයට පරිත්‍යාග කිරීමට ශ්‍රී ලංකා රජය ගත් තීරණය පිළිබඳව අදාළ අමාත්‍යාංශය වෙත සන්නිවේදනය කර ඇත.

කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පැනමා නගරයේ සිටින නිර්වේතනික කොන්සල්වරයා හරහා යුරෝ ඒෂියා තේ සමාගම පැනමා වෙළෙඳපොළට සම්බන්ධ කළේය. මීට අමතරව, කියුබාවේ තානාපති කාර්යාලය ජාත්‍යන්තර සංසදවලදී සහ UNHRC හි කියුබාවේ සහ පිළිගත් රටවල සහයෝගය සාර්ථකව ලබාගෙන ඇත.

### 2.5.4. මැද පෙරදිග අංශය

මැදපෙරදිග අංශය මැදපෙරදිග කලාපයට අදාළ සියලුම ද්විපාර්ශ්වික දේශපාලන, ආර්ථික සහ බහුපාර්ශ්වික ගැටලු ආවරණය කර සම්බන්ධීකරණය කරයි.

**ප්‍රගතිය සහ අනාගත දැක්ම:** ගරු විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා 2023 ජනවාරි 22 සිට 27 දක්වා සෞදි අරාබිය වෙත ගොස් ඔහුගේ පාර්ශවකරු සමඟ ඵලදායී හමුවක් පැවැත්වීය. සෞදි අරාබිය සමඟ ද්විත්ව බදු පැනවීමෙන් වැළැකීම පිළිබඳ ගිවිසුමට විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරයේදී අත්සන් කරන ලදී. ගරු ආචාර්ය හුසේන් අමීර් අබ්දුල්ලාහියන් මැතිතුමා විසින් කරන ලද ආරාධනයකට අනුව අමාත්‍යවරයා 2023 අගෝස්තු 04 සිට 08 දක්වා ඉරාන ඉස්ලාමීය ජනරජයේ නිල සංචාරයක නිරත විය. සංචාරය අතරතුර, ඔහු ඉරාන ජනාධිපති සහ ඉරානයේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය ගරු ඊබ්‍රහිම් රයිසි මැතිතුමා හමුවිය. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා සහ දූත පිරිසක් 2023 මැයි 21 සිට 24 දක්වා සෞදි

අරාබිය වෙත ගොස් සෞදි අරාබිය සමඟ 1 වන ඒකාබද්ධ කොමිසම පැවැත්වූ අතර සහයෝගීතාව සඳහා කාණ්ඩ 20 ක් හඳුනා ගන්නා ලදී. මෙම සංචාරයේදී දේශපාලන උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබිණි.

ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන්, 2023 අප්‍රේල් 11 වැනි දින විදේශ අමාත්‍යාංශ මට්ටමින් ශ්‍රී ලංකාව සහ ඕමානය අතර දේශපාලන උපදේශනවල 3 වැනි වටය සාර්ථකව පවත්වන ලදී.

සෞදි අරාබියෙහි ටකාමෝල් සහ ශ්‍රී ලංකා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට පහසුකම් සලසා දුන් අතර, එමගින් සෞදි අරාබියෙහි අර්ධ පුහුණු සහ පුහුණු ශ්‍රමිකයින් සඳහා වැඩි රැකියා අවස්ථා සඳහා පහසුකම් සැලසීය. තවද, ශ්‍රී ලංකාව සහ ජෝර්දානය අතර දේශපාලන උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකාව සහ ඕමානය අතර සංචාරක ව්‍යාපාරය පිළිබඳ අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකාව සහ ඕමානය අතර කෘෂිකර්මය පිළිබඳ අවබෝධතා ගිවිසුම, කුවේට් සමඟ ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම, එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර ගුවන් සේවා සඳහා වූ ගිවිසුම සහ ශ්‍රී ලංකාව සහ සෞදි අරාබිය අතර සිරකරුවන් මාරු කිරීම සඳහාවූ ගිවිසුම අත්සන් කිරීමට පහසුකම් සපයන ලදී.

### 2.5.5 යුරෝපා සහ උතුරු ඇමරිකානු අංශය

#### 2.5.5.1. දේශපාලන රාජ්‍යතාන්ත්‍රිකභාවය

**මෙම වසරේ ජනවාරි මාසයේ සිට රටවල් අටක් සමඟ ද්විපාර්ශ්වික උපදේශන සාර්ථක ලෙස අවසන් කිරීම:** විදේශ, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ සංවර්ධන කාර්යාලයෙහි සමාරම්භක ශ්‍රී ලංකා-එක්සත් රාජධානියේ උපාය මාර්ගික සංවාදය 2023 අප්‍රේල් 18 වන දින ලන්ඩන් නුවරදී පැවැත්විණි. එහි ප්‍රධානත්වය විදේශ කටයුතු ලේකම් අරුණි විජේවර්ධන මහත්මිය සහ විදේශ, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ සංවර්ධන කාර්යාලයෙහි නිත්‍ය උප ලේකම් ශ්‍රීමත් පිලිප් බාර්ටන් මහතා විසින් දරන ලදී. ශ්‍රී ලංකාව සහ ජෝර්ජියාව අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල 02 වැනි වටය 2023 ජුනි 19 වැනි දින ජෝර්ජියාවේ ටිබිලිසි හිදී සාර්ථකව පවත්වන ලදී. එහිදී ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා ශ්‍රී ලංකා දූත පිරිසට නායකත්වය දුන්නේය. ශ්‍රී ලංකාව සහ පෝලන්තය අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල තුන්වන වටය 2023 ජුනි 14 වන දින වෝර්සෝ හි විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය සහ පෝලන්තයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය උප ලේකම් ගරු පවෙල් යබුචොයිස්කි යන මහත්වරුන් එහි ප්‍රධානත්වය දැරූහ. ශ්‍රී ලංකාව සහ රුමේනියාව අතර දේශපාලන උපදේශනවල 05 වැනි වටය 2023 ජුනි 26 වැනි දින කොළඹදී පවත්වන ලද අතර එහි නායකත්වය දැරුවේ ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා විසිනි. ශ්‍රී ලංකාව සහ කැනඩාව අතර ද්විපාර්ශ්වික දේශපාලන සමාරම්භක උපදේශනයි 2023 ජූලි 05 වැනි දින කොළඹදී පැවැත්විණි. එහිදී යුරෝපානු සහ උතුරු ඇමරිකානු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා පාර්ශවයට නායකත්වය දුන් අතර කැනඩාවේ දකුණු ආසියානු අංශයේ සහ ගෝලීය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් කැනේඩියානු පාර්ශවයේ මුලසුන දැරීය. ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර සංක්‍රමණ හවුල්කාරිත්වය පිළිබඳ 02 වැනි විශේෂඥ මට්ටමේ රැස්වීම 2023 මැයි 16 වැනි දින අමාත්‍යාංශයේදී අවසන් කරන ලදී. ශ්‍රී ලංකා දූත පිරිස යුරෝපයේ සහ උතුරු ඇමරිකාවේ අධ්‍යක්ෂ ජනරාල් ශෝභිණි ගුණසේකර මහත්මිය විසින් මෙහෙයවන ලද අතර ස්විට්සර්ලන්ත නියෝජිත පිරිස මෙහෙයවනු ලැබුවේ ජාත්‍යන්තර සහයෝගිතා අධ්‍යක්ෂ, ස්විට්සර්ලන්තයේ ෆෙඩරල් අධිකරණ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ (FDJP) සංක්‍රමණ පිළිබඳ රාජ්‍ය ලේකම් (SEM) තානාපති වින්සේන්සෝ මැසියෝලි මහතා විසිනි. අතිරේක ලේකම්/ද්විපාර්ශ්වික (බටහිර) සහ ස්වීඩන විදේශ අමාත්‍යාංශයේ ආසියා, පැසිෆික් කලාපය සහ ලතින් අමෙරිකානු දෙපාර්තමේන්තු ප්‍රධානී ඔස්කාර් ෂ්ලිටර් මහතාගේ සම සභාපතිත්වයෙන් යුත් ශ්‍රී ලංකාව සහ ස්වීඩනය අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල පළමු වටය 2023 නොවැම්බර් 09 වැනි දින පැවැත්විණි. ශ්‍රී ලංකාව සහ ප්‍රංශය අතර

ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල පළමු වටය 2023 ඔක්තෝබර් 25 වැනි දින කොළඹදී කැඳවන ලදී. යුරෝපානු සහ උතුරු ඇමරිකානු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා පාර්ශවයට නායකත්වය දුන් අතර ප්‍රංශයේ යුරෝපය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආසියා සහ ඕෂනියා අධ්‍යක්ෂ බෙනුවා ගයිදේ මහතා විසින් ප්‍රංශ පාර්ශ්වයට නායකත්වය දෙන ලදී.

**2.5.5.2. ඉහළ මට්ටමේ අභ්‍යන්තර සහ බාහිර සංචාර සඳහා පහසුකම් සැලසීම - සංක්ෂිප්ත/ආදාන සැපයීම සහ සැපයුම් විධිවිධාන සකස් කිරීම මගින් බාහිර/අභ්‍යන්තර සංචාර සඳහා පහසුකම් සැලසීම.**

**බාහිර සංචාර:** ජනාධිපති සංචාර: ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් මහතාගේ ආරාධනයෙන් නව ගෝලීය මූල්‍ය ගිවිසුමක් සඳහා වන සමුළුවට සහභාගී වීමට 2023 ජූනි 22 - 23 දිනවල පැරිස් වෙත ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සංචාරය කළේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ජාත්‍යන්තර මූල්‍ය හා මූල්‍ය කමිටුවේ (IMFC) සභාපතිනිය සහ ස්පාඤ්ඤයේ උප සභාපති නාඩියා කැල්විනෝ මහත්මිය විසින් මෙහෙයවන ලද "Debt and SDR Channelling" පිළිබඳ ඉහළ මට්ටමේ සාකච්ඡාවකට 2023 ජූනි 22 වැනි දින ජනාධිපතිවරයා සහභාගී විය. ජනාධිපති වික්‍රමසිංහ මහතා සමුළුවට සමගාමීව ඉහළ මට්ටමේ ද්විපාර්ශ්වික කටයුතු කිහිපයක ද නිරත විය. මීට අමතරව 2023 මැයි 4-6 දක්වා එක්සත් රාජධානියේ III වන චාල්ස් රජුගේ රාජාභිෂේකයට සහභාගී වීම සහ පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම්, ඝානා ජනරජයේ සභාපති, රුවන්ඩා ජනරජයේ ජනාධිපති සමඟ රැස්වීම් පැවැත්වීම; 2023 සැප්තැම්බර් 27-30 දක්වා බර්ලිනයේ නිල සංචාරය සහ බර්ලින් ගෝලීය සංවාදයට සහභාගී වීම සහ ජර්මානු චාන්සලර්, ලෝක ආර්ථික සංසදයේ සභාපති, ෆෙඩ්රික්-ඊබට් පදනම (FES), යුරෝපීය කවුන්සිලයේ සභාපති, කසකස්තාන ජනාධිපති, දකුණු ආසියානු පාර්ලිමේන්තු සහ ජර්මානු පාර්ලිමේන්තුවේ (Bundestag) කණ්ඩායම, ජර්මානු වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සංගමය (DHIK), Friedrich Naumann Foundation (FNF) හි අනෙකුත් මන්ත්‍රීවරු සමඟ රැස්වීම් පැවැත්වීම ආදී කටයුතු සඳහා ද දායකත්වය ලබා දෙන ලදී.

අමාත්‍ය මට්ටමේ සහ අනෙකුත් සංචාර;

ගරු විදේශ කටයුතු අමාත්‍ය එම්.යූ.එම්. අලි සබ්රි මහතා සිදුකළ සංචාර -

අ) 2023 මැයි මාසයේදී වසර හයකට පසු ශ්‍රී ලංකාවේ සිට ස්වීඩනයට ප්‍රභූ සංචාරයක් සනිටුහන් කරමින් 2 වන යුරෝපා සංගම්-ඉන්දු පැසිෆික් විදේශ අමාත්‍යවරුන්ගේ සංසදයට සහභාගී වූ අතර එහිදී ස්වීඩනයේ විදේශ අමාත්‍ය ගරු ටෝබියස් බිල්ස්ට්‍රොම් , ලක්සම්බර්ග් විදේශ අමාත්‍ය ගරු ජීන් අසේල්බෝර්න්, ප්‍රංශ විදේශ අමාත්‍යතුමිය ගරු කැතරින් කොලොන්නා, ඔස්ට්‍රියාවේ විදේශ අමාත්‍ය ගරු ඇලෙක්සැන්ඩර් ෂැලන්බර්ග්, නෙදර්ලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ගරු වොප්කේ හෙස්ට්‍රා, යුරෝපා සංගමයේ ඉහළ නියෝජිත ගරු ජෝසප් බොරෙල් ෆොන්ටෙලස්, ස්වීඩන් පාර්ලිමේන්තුවේ කථානායක ගරු ඇන්ද්‍රියාස් නොර්ලෙන් සහ ලක්සම්බර්ග් හි ආගමන හා සරණාගත අමාත්‍ය ගරු ජීන් ඇසෙල්බර්න් යන මහත්ම මහත්මීන් සමඟ සාකච්ඡා පැවැත්විය.

විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු තාරක බාලසූරිය මහතා සිදුකළ සංචාර -

අ) 2023 ජූනි 16 සිට 17 දක්වා දූත පිරිසක් සමඟ රුමේනියාවේ සංචාරය කිරීම සහ රුමේනියාවේ කම්කරු හා සමාජ සහයෝගිතා රාජ්‍ය ලේකම් සහ රුමේනියාවේ ටෙක් වෙන්චර් බැංකුව සමඟ සාකච්ඡා පැවැත්වීම.

ආ) 2023 ජූනි 14 සිට 15 දක්වා පෝලන්තය ආර්ථික සංවර්ධන හා තාක්ෂණ අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් ගරු පවේල් ජබ්ලොන්ස්කි, පෝලන්තයේ ආර්ථික සංවර්ධන තාක්ෂණය පිළිබඳ රාජ්‍ය ලේකම් ගරු සේගොෂ් පිහොවියක් යන මහත්වරුන් සහ Lot Polish Airlines ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීම.

ඇ) දේශපාලන උපදේශනය සඳහා 2023 ජූනි 19 දින ජෝර්ජියාව වෙත සිදුකළ සංචාරය. මෙම සංචාරයේදී ගරු රාජ්‍ය අමාත්‍යවරයා ජෝර්ජියාවේ අධ්‍යාපන හා විද්‍යා නියෝජ්‍ය අමාත්‍ය ගෙලා ගෙලඩ්සේ මහතා, ජෝර්ජියාවේ නවෝත්පාදන තාක්ෂණ නියෝජිතායතනය (GITA) සහ ජාතික සංචාරක පරිපාලනය සමඟ

සාකච්ඡා කළ අතර අති නවීන කෝපි නිෂ්පාදන කම්හලක් ද නිරීක්ෂණය කළේය.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා 2023 ජූනි 03 වන දින පැවති තුර්කියේ ජනාධිපති පදවිප්‍රාප්ති උත්සවයේදී ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා නියෝජනය කළේය.

ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා, 2023 පෙබරවාරි 23-24 දිනවල ස්විට්සර්ලන්තයේ මොන්ට්‍රෝ හි පැවැති 2023 රෝගීන්ගේ ආරක්ෂාව පිළිබඳ 05 වන ගෝලීය අමාත්‍ය සමුළුවට සහභාගීවිය.

2023 මාර්තු 01 වැනි දින ඉතාලියේ පැවැති අධිකරණ අමාත්‍යවරුන්ගේ 13 වැනි ජාත්‍යන්තර සම්මේලනයට ගරු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා සහභාගී වූ අතර සංචාරක රාජ්‍ය අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී ඩයනා ගමගේ මහත්මිය, පාර්ලිමේන්තු මන්ත්‍රී අංගජන් රාමනාදන් මහතා, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කාරක සභා සභාපති සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තු මහලේකම් කුෂානි අනුෂා රෝහණදීර මහත්මිය ඇතුළු පාර්ලිමේන්තු නියෝජිත පිරිසක් 2023 මාර්තු 13-17 දක්වා පැවති 71 වැනි එක්සත් රාජධානියේ වෙස්ට්මිනිස්ටර් සම්මන්ත්‍රණයට සහභාගි වූහ. ගරු අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත් මහතා 2023 මැයි 06 සිට 11 දක්වා එක්සත් රාජධානියේ පැවැති ‘අධ්‍යාපන ලෝක සංසදයට’ සහභාගී විය. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මහතා, 2023 මැයි 19 වැනි දින ඉතාලියේ පැවැති ජාත්‍යන්තර තේ දිනයට සහභාගී විය. ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා, 2023 ජූලි 17-26 දක්වා ඉතාලියේ රෝමයේ ආහාර සහ කෘෂිකර්ම සංවිධාන මූලස්ථානයේ (FAO) පැවති ජාන සම්පත් පිළිබඳ කොමිසමේ 19 වැනි නිත්‍ය සැසිවාරයට සහ එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති තොග ගබඩා කිරීමේ රැස්වීමට සහභාගී විය. 2023 ජූලි 25 සිට 28 දක්වා තුර්කියේ ඉස්තාන්බුල් හි පැවැති 16 වන ජාත්‍යන්තර ආරක්ෂක කර්මාන්ත ප්‍රදර්ශනයට (IDEF) ශ්‍රී ලංකාවේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා සහභාගී විය. ගරු විදේශ රැකියා රාජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මහතා 2023 ජූලි 26 සිට අගෝස්තු 1 දක්වා ඉතාලියේ සංචාරයක නිරත විය . කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා, 2023 සැප්තැම්බර් 26-30 දක්වා ඉතාලියේ GAMC පිළිබඳ FAO ගෝලීය සමුළුවට සහභාගී විය. අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත් මහතා ඉතාලියේ ගරු අධ්‍යාපන අමාත්‍ය සහ ලෝක ආහාර වැඩසටහනේ විධායක අධ්‍යක්ෂවරයා 2023 ඔක්තෝම්බර් 20 සිට 23 දක්වා ඉතාලියේ නිරත වූ සංචාරයකදී හමු විය. ජර්මානු මුදල් අමාත්‍යාංශය විසින් 2023 නොවැම්බර් 21 වන දින බර්ලිනයේ සංවිධානය කරන ලද “උද්ධමනය ප්‍රජාතන්ත්‍රවාදය මරා දමයි” කතිකාවතට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා සහභාගී වූ අතර එහිදී ඔහු ප්‍රධාන දේශනයක් පැවැත්වීය. එසේම, ඔහු යුරෝපීය ප්‍රතිපත්ති, ජාත්‍යන්තර මූල්‍ය ප්‍රතිපත්ති සහ මූල්‍ය වෙළෙඳපොළ ප්‍රතිපත්ති භාර මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් හයිකෝ තොමස් මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක් පැවැත්වූ අතර ජර්මානු මුදල් අමාත්‍ය ක්‍රිස්ටියන් ලින්ඩ්නාර් මහතා, මහ බැංකුවේ සභාපති ක්‍රිස්ටීන් ලගාර්ඩ් මහත්මිය, රාජ්‍ය ලේකම් හෙයිකෝ තොමස් මහතා සහ ජර්මානු මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ ඉහළ මට්ටමේ නිල රාත්‍රී භෝජන සංග්‍රහයකට ද සහභාගී විය.

**අභ්‍යන්තර සංචාර:**

ප්‍රංශය:

අ) ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මැක්‍රොන් 2023 ජූලි 28 වැනි දින ශ්‍රී ලංකාවට පැමිණි අතර, ප්‍රංශ ජනාධිපතිවරයකු මෙරටට පැමිණි පළමු සංචාරය සනිටුහන් කළේය. පැය කිහිපයක කෙටි සංචාරයේදී දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික සබඳතා, ඉන්දියානු සාගර සහ සමුද්‍ර සහයෝගීතාව, කලාපීය භූ දේශපාලනය සහ ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සහ පැරිස් සමාජයේ සහාය යන ද්විපාර්ශ්වික ගැටලු රාශියක් ආවරණය කරමින් ශ්‍රී ලංකා සහ ප්‍රංශ ජනාධිපතිවරුන් අතර පුළුල් හා දීර්ඝ ද්විපාර්ශ්වික හමුවක් සිදු විය.

ආ) යුරෝපා සහ ප්‍රංශ විදේශ කටයුතු අමාත්‍යාංශයේ තානාපති සහ ඉන්දියානු සාගර කලාපයේ කලාපීය සහයෝගීතාව සඳහා වන විශේෂ නියෝජිත ජීන් ක්ලෝඩ් බෲනෙට් මහතා 2023 ඔක්තෝබර් 10-12 දක්වා

අයෝරා අමාත්‍ය මණ්ඩල රැස්වීමට සහභාගී වීම සඳහා පැමිණි අතර ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ සාකච්ඡාවකටද එක් විය.

එක්සත් රාජධානිය:

අ) 2023 ජනවාරි 17 වන දින එක්සත් රාජධානියේ විදේශ, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ සංවර්ධන කාර්යාලයේ ස්ථිර උපලේකම් ශ්‍රීමත් පිලිප් බාර්ටන් මහතාගේ සංචාරය අතරතුරදී විදේශ කටයුතු ලේකම් සමඟ රැස්වීමක් පවත්වන ලදි.

ආ) 2023 මැයි 25 වන දින එක්සත් රාජධානියේ විදේශ, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ ඉන්දියාවේ සහ ඉන්දු පැසිෆික් සාගර සංවර්ධන කාර්යාලයේ අධ්‍යක්ෂක කාර්යාලයේ අධ්‍යක්ෂ බෙන් මෙලර් මහතාගේ සංචාරය අතරතුරදී විදේශ කටයුතු ලේකම් සමඟ රැස්වීමක් පවත්වන ලදි;

ඇ) 2023 අගෝස්තු 21-22 දිනවල ෆ්ලෙමින් අරමුදල පිළිබඳ සාකච්ඡා සඳහා එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සමාජ සත්කාර දෙපාර්තමේන්තුවේ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියේය.

ඇ) විදේශ, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ සංවර්ධන කාර්යාල නායක ප්‍රධානී ගර්හාඩ් වීලර් මහතාගේ නායකත්වයෙන් යුත් UK Irregular Migration Scoping කණ්ඩායමක සංචාරය 2023 සැප්තැම්බර් 4-16 දක්වා සිදු විය.

ඊ) 2023 ඔක්තෝම්බර් 10-12 දක්වා IORA අමාත්‍ය මණ්ඩලයේ රැස්වීමට සහභාගී වීමට විදේශ, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ සංවර්ධන කාර්යාලයේ ඉන්දු-පැසිෆික් අමාත්‍යවරිය වන ගරු ඈන් මාරි ට්‍රෙවේලියන් මහත්මියගේ පැමිණීම. ඇය ජනාධිපතිවරයා සහ විදේශ අමාත්‍යවරයා සමඟ ඉහළ මට්ටමේ රැස්වීම් වලට සහභාගී වූ අතර යාපනයේ සංචාරයක ද නිරත විය.

ඇමරිකා එක්සත් ජනපදය:

අ) 2023 අගෝස්තු මාසයේදී එක්සත් ජනපද සෙනෙට් සභික ක්‍රිස් වැන් හොලන් මහතාගේ සංචාරය. සෙනෙට් සභික වැන් හොලන් මහතා අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ කටයුතු අමත්‍යවරයා හමු විය.

ආ) 2023 පෙබරවාරි මාසයේදී එක්සත් ජනපද දේශපාලන කටයුතු පිළිබඳ උප ලේකම් වික්ටෝරියා නුලන්ඩ් මහත්මියගේ පැමිණීම. උප ලේකම් නුලන්ඩ් මහත්මිය අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ කටයුතු අමත්‍යවරයා හමු විය.

ඇ) 2023 ජනවාරි මාසයේදී දකුණු ආසියාව හා ධවල මන්දිර ජාතික ආරක්ෂක කවුන්සිලය සඳහා ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ රියර් අද්මිරාල් අයිලීන් ලෝබාචර්ගේ සංචාරය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ලවුබාචර් මහතා අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ කටයුතු අමත්‍යවරයා හමු විය.

ඇ) 2023 මැයි මාසයේදී දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ ප්‍රධාන නියෝජ්‍ය සහකාර රාජ්‍ය ලේකම් එලිසබෙත් හෝස්ට් මහත්මියගේ පැමිණීම.

ඊ) 2023 අගෝස්තු මාසයේදී ගෝලීය දූෂණයට එරෙහි එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකාරක රිචඩ් නෙෆිව්ගේ පැමිණීම.

කැනඩාව:

2023 ජූලි 05 වන දින කොළඹදී පැවති ශ්‍රී ලංකාව සහ කැනඩාව අතර සමාරම්භක ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන කටයුතු සඳහා කැනඩාවේ දකුණු ආසියානු අංශයේ/ගෝලීය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් මාරි හැනන් මහත්මිය ශ්‍රී ලංකාවට පැමිණියාය.

ජර්මනිය:

අ) ජර්මානු බුන්ඩස්ටැග් හි විදේශ කටයුතු කමිටුවේ සාමාජික (ශ්‍රී ලංකාව සමඟ ද්විපාර්ශ්වික සබඳතා භාර) ආචාර්ය පීටර් රැම්සෝවර් මහතා 2023 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියේය. ආචාර්ය රැම්සෝවර් මහතා අතිගරු ජනාධිපතිතුමා, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා හමු විය.

ආ) ජර්මානු ෆෙඩරල් විදේශ කාර්යාලයේ ඉන්දු පැසිෆික් ප්‍රතිපත්ති අධ්‍යක්ෂ එරික් කුර්ස්වේල් මහතා 2023 මාර්තු 22 සිට 25 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම.

ඇ) රියා ස්කොඩර් මහත්මිය බුන්ඩස්ටැග් හි දකුණු ආසියාව සඳහා වූ පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ සාමාජිකාවක් වන අතර 2023 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණ අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා හමු විය.

නෙදර්ලන්තය:

ගරු නෙදර්ලන්තයේ සංස්කෘතික හා මාධ්‍ය රාජ්‍ය ලේකම් ගුණේ උස්ලු මහතා 2023 අගෝස්තු 27-31 දක්වා ශ්‍රී ලංකාවට පැමිණ සංස්කෘතික කෞතුක භාණ්ඩ 06ක අයිතිය පැවරීමේ නීතිමය ගිවිසුම් දෙකකට අත්සන් කළේය. රජය විසින් කරන ලද ඉල්ලීමකට අනුව ලන්දේසි රජය විසින් ලන්දේසි යටත් විජිත පාලන සමයේදී මෙරටින් රැගෙන ගිය පුරාවස්තු 06 ක් ශ්‍රී ලංකාවට ආපසු ලබා දෙන ලදී. භාරදීමේ උත්සවය 2023 දෙසැම්බර් 05 වන දින කොළඹදී පැවැත්විණි.

තුර්කිය:

අ) 2023 ජූලි 27 වන දින තුර්කියේ මධ්‍යධරණී කලාපයේ (අදානා) ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල් බෙෂිර් උගුර් මහතා ශ්‍රී ලංකාවට පැමිණීම.

ආ) 2023 අප්‍රේල් 10-11 දක්වා සිදුවූ තුර්කියේ සහයෝගිතා හා සම්බන්ධීකරණ නියෝජිතායතනයේ කලාපීය සම්බන්ධීකාරක මර්ට් බරිස් මහතාගේ සංචාරය. ඔහු ශ්‍රී ලංකාවට පැමිණ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජිතවරු හමුවිය.

තුර්කියේ සහයෝගිතා හා සම්බන්ධීකරණ නියෝජිතායතනයේ මර්ට් බරිස් මහතා 2023 දෙසැම්බර් 04 වැනි දින ශ්‍රී ලංකාවේ පසු විපරම් සංචාරයක් අවසන් කළ අතර කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය/ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව/ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය/ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟ රැස්වීම් පැවැත්විය.

ස්විට්සර්ලන්තය:

2023 මැයි 14 දින සිදුවූ තානාපති සහ ජාත්‍යන්තර සහයෝගිතා, ෆෙඩරල් අධිකරණ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ සංක්‍රමණ සඳහා රාජ්‍ය ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වින්සේන්සෝ මයිඕලි ප්‍රමුඛ ස්විට්සර්ලන්ත සංක්‍රමණ හවුල්කාරිත්ව කණ්ඩායමේ සංචාරය.

පොදුරාජ්‍ය මණ්ඩලය:

2023 පෙබරවාරි 04 වැනි දින 75 වැනි ජාතික දින උත්සවය සැමරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් (CWSG) අතිගරු පැට්‍රිශියා ස්කොට්ලන්ඩ් මහත්මිය ශ්‍රී ලංකාවට පැමිණියාය. ඇය සංචාරය අතරතුර ගරු අග්‍රාමාත්‍යවරයා, විදේශ කටයුතු අමාත්‍යවරයා, අධිකරණ අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකයා හමු වුවාය. ගරු ජනාධිපතිවරයාගේ ආරාධනය මත ඇය භූ දේශපාලනය පිළිබඳ ආරාධිත

දේශනයක් ද පැවැත්වීය. ඇය 2023 පෙබරවාරි 11 වැනි දින විකාශය වූ "Diplomatic Faces" සම්මුඛ සාකච්ඡා මාලාව යටතේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් පවත්වන ලද රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකට ද පෙනී සිටියාය.

ඔස්ට්‍රියාව:

2023 ජනවාරි 13 දින විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හමුවූ ඔස්ට්‍රියා ජනරජයේ විදේශ කටයුතු පිළිබඳ මහලේකම්වරයාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක ස්වෙන් වැග්නර් මහතාගේ සංචාරය ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන ආරම්භ කිරීමට දෙපාර්ශවයේම උනන්දුව යලි අවධාරණය කරන ලදී. ගරු ඔස්ට්‍රියානු පාර්ලිමේන්තු මන්ත්‍රී යානික් ෂෙට්ටි මහතාගේ සංචාරය 2023 ජූනි 07 දින සිදු විය. ෂෙට්ටි මහතා දකුණු ආසියානු කලාපය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන ප්‍රමුඛ යුරෝපීය කටයුතු විශේෂඥයෙකි.

මොස්කව්: රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක ලේකම් නිකොලයි පැට්රුෂේව් මහතා 2023 දෙසැම්බර් 06-08 දක්වා ආරක්ෂාව සම්බන්ධ සාකච්ඡාවල නිරත වීම සඳහා නියෝජිත පිරිසක් සමඟ ශ්‍රී ලංකාවට පැමිණි අතර ආරක්ෂාව සම්බන්ධ රේඛීය නියෝජිතායතන සමඟ හමුවීම්වල නිරත විය.

යුරෝපා සංගමය:

ශ්‍රී ලංකාව සහ දකුණු ආසියාවේ රටවල් සමඟ සබඳතා සඳහා වූ යුරෝපා පාර්ලිමේන්තු නියෝජිත පිරිස (DSAS) 2023 ඔක්තෝබර් 31 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පරිශ්‍රයේදී කැඳවන ලද 11 වැනි අන්තර් පාර්ලිමේන්තු උපදේශන සඳහා සහභාගී විය.

**ඉහළ මට්ටමේ රැස්වීම්/අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සැලසීම**: අතිගරු ජනාධිපති, විදේශ කටයුතු අමාත්‍ය සහ විදේශ ලේකම් ඔවුන්ගේ පාර්ශවකරුවන් සඳහා නිව් යෝර්ක් හි 78 වන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සමගාමීව සහ අනෙකුත් ප්‍රධාන සම්මන්ත්‍රණ / රැස්වීම්වල ප්‍රධාන නියැලීම්/අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සලසන ලදි. මෙම අන්තර්ක්‍රියා ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීමේ නව මාවතකට පිවිසීමකි.

නිව්යෝර්ක් හි 78 වන එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට සමගාමීව, අතිගරු ජනාධිපතිවරයා එක්සත් ජනපද ජනාධිපති, පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද නියෝජිතායතනය සමඟ සාකච්ඡා පැවැත්වීය. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා රුමේනියාව, බල්ගේරියාව, ජෝර්ජියාව රටවල සිය පාර්ශවකරුවන් සහ එක්සත් ජනපද දේශපාලන කටයුතු සඳහා වැඩබලන නියෝජ්‍ය රාජ්‍ය ලේකම් හමුවිය. විදේශ කටයුතු ලේකම්වරිය සංවර්ධන, ප්‍රංශ භාෂා ව්‍යාප්තිය සහ ජාත්‍යන්තර හවුල්කාරිත්වය පිළිබඳ ප්‍රංශ රාජ්‍ය අමාත්‍යවරයා හමුවිය.

විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතාගේ එක්සත් රාජධානි සංචාරය අතරතුර ලන්ඩනයේ මහ කොමසාරිස් කාර්යාලය විසින් ලංකා තේ උත්සවයක් පාර්ලිමේන්තුවේදී සංවිධානය කරන ලදී. ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය නයිජල් හඩ්ල්ස්ටන් මහතා, ශ්‍රී ලංකාව සඳහා වන සර්ව පාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායම් නියෝජිතයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

2023 මාර්තු 5-7 දක්වා දෝහා හි පැවැත්වෙන අවම සංවර්ධිත රටවල් පිළිබඳ 5 වන එක්සත් ජාතීන්ගේ සමුළුවට (LDC5) සමගාමීව විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය සහ පෘතුගාලයේ විදේශ කටයුතු සහ සහයෝගීතාව පිළිබඳ රාජ්‍ය ලේකම් ෆ්‍රැන්සිස්කෝ ඇන්ඩ්‍රේ යන මහත්වරුන් අතර හමුවක් පැවතියේය.

2023 මාර්තු 2-4 දිනවල නවදිල්ලියේ රයිසිනා සංවාදයට සමගාමීව ස්ලෝවේනියාවේ විදේශ හා යුරෝපීය කටයුතු අමාත්‍ය ටන්ජා ෆාජොන් මහතා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා අතර ද්විපාර්ශවික හමුවක් විය.

ලන්ඩනයේ මහ කොමසාරිස් කාර්යාලය විසින් 2023 අප්‍රේල් 18 වන දින එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් සමඟ විදේශ කටයුතු ලේකම් අරුණි විජේවර්ධන මහත්මිය සඳහා පිළිගැනීමක් සංවිධානය කරන ලදී.

2023 ජූනි 5 වන දින සර්බියාවේ නියෝජ්‍ය අගමැති සහ විදේශ කටයුතු අමාත්‍ය ඉවිට්සා දාසි සහ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා අතර දුරකථන සංවාදයකට පහසුකම් සලසන ලද අතර එහිදි ඔවුන් ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම පිළිබඳ අදහස් හුවමාරු කර ගන්නා ලදී.

විදේශ ලේකම් අරුණි විජේවර්ධන සහ ප්‍රංශ විදේශ අමාත්‍යාංශයේ මහලේකම් ඈන් මරී දෙස්කොතේස් යන මහත්මීන් අතර 2023 ජූනි මස ජනාධිපති සංචාරය අතරතුර 2023 ජූනි 22 වන දින පැරිසියේදී ඵලදායී හමුවක් පැවැත්විය.

ජාත්‍යන්තරය විසින් මතු කරන ලද ශ්‍රී ලංකාව සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරයන් ප්‍රකාශ කිරීම සහ සම්බන්ධීකරණය කිරීම;

- අමාත්‍යාංශය ඔටාවා හි මහ කොමසාරිස් කාර්යාලය සහ ටොරොන්ටෝ හි කොන්සල් කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් කැනඩාව තුළ ශ්‍රී ලංකාව සම්බන්ධ වැදගත් කරුණු කෙරෙහි සමීපව නිරීක්ෂණය කර ප්‍රතිචාර දැක්වූ අතර, විශේෂයෙන් 2023 ජූලි 23 දිනට යෙදී ඇති කළු ජූලි සංවත්සරයට සහ 2023 මැයි 18 වැනි දින ශ්‍රී ලංකාවේ ගැටුමට අදාළ ජන සංහාර පිළිබඳ ප්‍රකාශ අඩංගු දෙමළ ජන සංහාර අනුස්මරණ දිනයට සමගාමීව කැනේඩියානු අගමැති ජස්ටින් ටෘඩෝ විසින් නිකුත් කරන ලද ප්‍රකාශවලට අදාළව අවධානය යොමු කිරීම.

- මූලික වශයෙන් ප්‍රංශයේ ශ්‍රී ලංකා විරෝධී ඩයස්පෝරාවේ බලපෑම මත පාර්ලිමේන්තු සැසියේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අපහාසාත්මක අදහස් ප්‍රකාශ කළ මන්ත්‍රීවරුන් තිදෙනෙකු සම්බන්ධන්ධයෙන් නිසි පියවර ගැනීමට පැරීසියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට හැකි විය.

- පැරිසියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ශ්‍රී ලංකාවේ සාමය, සංහිඳියාව සහ සංවර්ධනය පිළිබඳ යාවත්කාලීන කිරීමක් ගරු ඔරෙලින් තගේ (ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් වාම පක්ෂය), ජාතික සභාවේ විදේශ කටයුතු කමිටුවේ සාමාජික; ගරු ජෝන් පෝල් ලෙකෝ (ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් වාම පක්ෂය), විදේශ කටයුතු කමිටුවේ උප සභාපති; සහ ගරු නදේජ් ඇබොමොන්ගොලි (La France Insoumise පක්ෂය), විදේශ කටයුතු කමිටුවේ ලේකම් වෙත සිදු කළේය.

**රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 75 වැනි සංවත්සරය සැමරීම:**

2023 වසර යුරෝපයේ සහ උතුරු ඇමරිකාවේ රටවල් කිහිපයක් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීමේ 75 වැනි සංවත්සරය ද සනිටුහන් කරයි. ප්‍රංශය, තුර්කිය, ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය සමඟ මෙම වැදගත් අවස්ථාව සැමරීම සඳහා අනෙකුත් ආයතන සහ අදාළ විදේශීය රජයන් සමඟ සම්බන්ධීකරණයෙන් අමාත්‍යාංශය විසින් වැඩ සටහන් මාලාවක් සංවිධානය කරන ලදී. ප්‍රංශය සමඟ ඒකාබද්ධ සමරු මුද්දරයක් 2023 ඔක්තෝම්බර් 27 වන දින නිකුත් කරන ලදී. ඉහළ මට්ටමේ නිල සංචාරයන් (2024 පළමු කාර්තුවේදී), දැනට සාකච්ඡා කරමින් පවතින අවබෝධතා ගිවිසුම් 04කට අත්සන් තැබීම, ව්‍යාපාර/ආයෝජන ඇතුළු ක්‍රියාකාරකම් මාලාවක් වසර පුරා සැලසුම් කර ඇත. මෙම අවස්ථාව සනිටුහන් කිරීම සඳහා ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සංදර්ශන, පිළිගැනීම්, සංස්කෘතික උත්සව සහ ප්‍රදර්ශන සංවිධානය කරන ලදී. 2023 දෙසැම්බර් 08 වන දින ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 75 වන සංවත්සරය සැමරීම සඳහා ඒකාබද්ධ සමරු මුද්දරයක් නිකුත් කරන ලදී. වොෂින්ටන් ඩීසී හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය විසින් තානාපති කාර්යාල පරිශ්‍රයේදී 2023 සැප්තැම්බර් 27 දින විදේශ අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් උත්සව මාලාවක් සංවිධානය කරන ලදී.

**ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්:** රැකියා අංශයේ සිට සේවා අංශ (සංචාරක සහ ගුවන් සේවා) ඉහළ නැංවීම, අධිකරණ අංශයේ සහයෝගීතාව, ශක්‍යතා වර්ධනය සහ පුහුණුව, සංස්කෘතික සහයෝගීතාව යනාදී ක්ෂේත්‍ර කිහිපයකින් යුරෝපයේ රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් 11ක් අත්සන් කිරීම සිදු කරන ලදී. එයින් ප්‍රධාන අවබෝධතා ගිවිසුම් දෙකකට නෙදර්ලන්තයේ සිට ශ්‍රී ලංකාවට සංස්කෘතික වස්තු හයක අයිතිය පැවරීම සහ

අදාළ ණය ගිවිසුම සම්බන්ධයෙන් අත්සන් කරන ලදී.

i. ශ්‍රී ලංකාවේ කුඩා රබර් වතු හිමියන්ගේ ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ප්‍රංශයේ සීමිත වගකීම් සමාගමක් වන KSAPA අතර අවබෝධතා ගිවිසුමක් 2023.01.05 දින ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

ii. 2023 ජනවාරි 11 සිට 12 දක්වා පැවති ජාත්‍යන්තර සමුළුවේදී 2023 ජනවාරි 11 වන දින අන්කාරා හි දී ශ්‍රී ලංකා පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය සහ ටර්කියේ ඔම්බුඩ්ස්මන් ආයතනය (කේඩීකේ) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

iii. ශ්‍රී ලංකාව සහ නෙදර්ලන්තය අතර ගුවන් සේවා ගිවිසුම 2023 පෙබරවාරි 22 දින නෙදර්ලන්තයේ හේග් නුවරදී අත්සන් කරන ලදී.

iv. 2023 අගෝස්තු 28 වන දින, ශ්‍රී ලංකාව සහ නෙදර්ලන්තය සංස්කෘතික වස්තු හයක හිමිකාරිත්වය පැවරීම සඳහා "මාරු කිරීම පිළිගැනීම" පිළිබඳ ගිවිසුමක් අත්සන් කරන ලදී. එදිනම ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සහ නෙදර්ලන්තයේ Rijksmuseum අතර ගිවිසුමක් ද අත්සන් කරන ලදී.

v. ද්විත්ව බදු ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ චෙක් ජනරජය අතර ගිවිසුම 2023 පෙබරවාරි 03 වැනි දින කොළඹදී අත්සන් කරන ලදී.

vi. චෙක් ජනරජය සහ ශ්‍රී ලංකාව අතර දණ්ඩනය නියම වූ පුද්ගලයන් මාරු කිරීම පිළිබඳ ගිවිසුම 2023 මාර්තු 10 දින  අත්සන් කරන ලදී.

vii. ශ්‍රී ලංකාව සහ ලක්සම්බර්ග් අතර ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම 2023 මැයි 13 දින ස්වීඩනයේ ස්ටොක්හෝම්හිදී අත්සන් කරන ලදී.

viii. ලන්ඩනයේ මහ කොමසාරිස් කාර්යාලය විසින් 2023 ජුනි 7 වන දින එක්සත් රාජධානියේ සත්කාරක සේවකයින් පුහුණු කිරීම සහ ස්ථානගත කිරීම පිළිබඳ Agincare International Limited සහ Pulse Academy අතර ගිවිසුමක් අත්සන් කිරීමට පහසුකම් සැලසීය.

ix. ජෝර්ජියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ Levan Mikeladze රාජ්‍යතාන්ත්‍රික පුහුණු හා පර්යේෂණ ආයතනය සහ ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) අතර අවබෝධතා ගිවිසුම 2023 සැප්තැම්බර් 27 වන දින ජෝර්ජියාවේ ටිබිලිසි හිදී අත්සන් කරන ලදී.

x. ශ්‍රී ලංකාව සහ ජෝර්ජියාව අතර සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම (MoU) 2023 සැප්තැම්බර් 27 වන දින ජෝර්ජියාවේ ටිබිලිසි හිදී අත්සන් කරන ලදී.

xi. ශ්‍රී ලංකාව සහ ලැට්වියාව අතර දඬුවම් නියම වූ පුද්ගලයන් මාරු කිරීමේ ගිවිසුම අත්සන් කිරීමට සූදානම් කර ඇත.

### 2.5.5.3. බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රිකභාවය

**පොදුරාජ්‍ය මණ්ඩලය:** අතිගරු ජනාධිපතිතුමාගේ ආරාධනය මත 2023 පෙබරවාරි 04 වන දින 75 වන නිදහස් සංවත්සර උත්සවයට සහභාගී වීමට, පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම්තුමා ශ්‍රී ලංකාවට පැමිණියේය.

ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ හවුල්කරුවන් වීමට දිරිගන්වමින් ඩයස්පෝරාව සමඟ සම්බන්ධ වීම වර්ධනය කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය සමඟ “Marlborough House Dialogue - Sri Lanka's Sustainable Development නමැති හමුව පවත්වන ලදී.

2023 මාර්තු 12 සිට 16 දක්වා ලන්ඩනයේ මාල්බරෝ හවුස් හි සහ 2023 සැප්තැම්බර් 21 දින නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී පවත්වන ලද 22 සහ 23 වැනි පොදුරාජ්‍ය මණ්ඩලීය විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ රැස්වීමට (CFAMM) ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා දූත පිරිස සහභාගී වූහ.

පොදුරාජ්‍ය මණ්ඩලීය තරුණ අමාත්‍යවරුන්ගේ රැස්වීම 2023 සැප්තැම්බර් 11 සිට 15 දක්වා ලන්ඩන් නුවරදී පැවැත්වුණු අතර, ගරු යෞවන හා ක්‍රීඩා අමාත්‍ය අමාත්‍යවරයා එයට සහභාගී විය.

පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සම්මේලනයේ 66 වැනි සැසිවාරය, 2023 සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 6 දක්වා, ඝානාවේ පැවති අතර ගරු කථානායකතුමා ශ්‍රී ලංකා නියෝජිත පිරිස සමඟ එයට සහභාගී විය. ගරු කථානායකවරයා ජිබ්‍රෝල්ටාර් සහ එක්සත් රාජධානියේ පැවති විධායක කමිටු රැස්වීම් වලටද සහභාගී විය.

2023 ජුනි 19 සිට 23 දක්වා CPA UK කාන්තා වෙළඳ වැඩමුළුවට පාර්ලිමේන්තු මන්ත්‍රී කෝකිලා ගුණවර්ධන සහ ආචාර්ය හරිනි නිරේකා අමරසූරිය මහත්මීන් ඇතුළු පාර්ලිමේන්තු නියෝජිත පිරිසක් සහභාගී වූහ.

2023 ජුනි 5 සිට 6 දක්වා පොදුරාජ්‍ය මණ්ඩලීය වෙළඳ අමාත්‍යවරුන්ගේ රැස්වීමට වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය ගරු නලින් ප්‍රනාන්දු මහතා සහභාගී විය.

පොදුරාජ්‍ය මණ්ඩලීය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ මූලපිරීම් සඳහා සහය ලබා දෙන ලදි. ජනාධිපති ආර්යා මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මහත්මිය විසින් ගැබ්ගෙල පිළිකා පිළිබඳ ෆයර්සයිඩ් සංවාදය ඇමතුවාය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, කාන්තා සවිබල ගැන්වීම සහ කාන්තාවන් සහ ගැහැණු ළමුන් සඳහා අධ්‍යාපනය සහ සෞඛ්‍ය ප්‍රමුඛතා ආමන්ත්‍රණය කිරීමේ සර්ව-පොදුරාජ්‍ය මණ්ඩලීය මූලපිරීමක් වන 'Says No More' වෙත මහලේකම්වරයාගේ ආරාධනය ද ඇය පිළිගෙන ඇත.

**යුරෝපා සංගමය:** ශ්‍රී ලංකාවේ වැදගත්කම කලාපීය සන්දර්භය තුළ ප්‍රක්ෂේපණය කිරීමට කදිම අවස්ථාවක් වූ යුරෝපා සංගමය සහ 'ඉන්දු-පැසිෆික්' රටවල් එකට එක් වූ EU-Indo Pacific Ministerial Forum සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිස සමඟ ගරු විදේශ අමාත්‍ය අලි සබ්රි මහතා සහභාගී විය. "වඩා තිරසාර සහ සියල්ලන් ඇතුළත් වර්ධනයක් ගොඩනැගීම" කෙරෙහි අවධානය යොමු කරමින් විදේශ අමාත්‍යවරයා ස්වීඩන් විදේශ අමාත්‍යවරයා සමඟ කතිකාවතකට සහභාගී විය. 2023 ඔක්තෝම්බර් මාසයේදී IORA සභාපතිත්වය ශ්‍රී ලංකාව භාරගත් බැවින් අමාත්‍යවරයාගේ මෙම සංචාරය වැදගත් විය.

යුරෝපා සංගමය - ශ්‍රී ලංකා වෙළඳ සහ ආර්ථික සබඳතා සහයෝගීතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම 2023 අප්‍රේල් 25 වැනි දින රැස්විය. යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකා සංවර්ධන සහයෝගීතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම 2023 මැයි 08 දින කැඳවන ලදී. යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ 25 වැනි සැසිවාරය 2023 මැයි 09 දින කැඳවන ලදී. එහිදී සංහිඳියාව, මානව හිමිකම්, වෙළඳාම, සංවර්ධන සහයෝගීතාව, දේශගුණික විපර්යාස සහ පරිසරය, ආංශික සහයෝගීතාව, ජාත්‍යන්තර ආරක්ෂක සහයෝගීතාව සහ බහුපාර්ශ්වික වේදිකාවල සහයෝගීතාවය දක්වා ද්විපාර්ශ්වික සබඳතා සමාලෝචනය කරන ලදී.

**අයෝරා අමාත්‍ය මණ්ඩලයේ රැස්වීම**: 2023 ඔක්තෝබර් 11 - 12 දිනවල කොළඹ පැවති 23 වැනි අයෝරා අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ඉහළ මට්ටමේ සහභාගිත්වයක් සම්බන්ධීකරණය කරන ලදී.

2023 ඔක්තෝම්බර් 9-10 දිනවල රැස් වූ 25 වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවේදී ශ්‍රී ලංකාවේ ප්‍රධානත්වයෙන් යුරෝපා සංගමය IORA සමඟ සංවාද හවුල්කාරිත්වයක් ලබා ගත්තේය. යුරෝපා සංගමය පිළිගැනීමේ ලිපිය නියමිත වේලාවට අත්සන් කරනු ඇත.

**2.5.5.4. ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය**

මෙම අංශයේ විෂය පථය යටතේ පවතින රටවල, ආර්ථික සහයෝගීතාවයට පහසුකම් සැලසීම සඳහා අදාළ දූත මණ්ඩල පහත සඳහන් මුලපිරීම් සිදු කර ඇත;

වෙළඳ සහන යාන්ත්‍රණ:

- එක්සත් රාජධානියේ නව සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය (DCTS) 2023 ජූනි මාසයේදී ක්‍රියාත්මක කරන ලදී. වෙළඳපල ප්‍රවේශය සඳහා තීරුබදු සීමා වලින් 92% ක් සමඟින් DCTS වැඩිදියුණු කළ මනාප යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව ප්‍රතිලාභ ලබයි. UKBT සමඟ ලන්ඩනයේ මහ කොමසාරිස් කාර්යාලයේ අඛණ්ඩ නියෝජනයන් සහ ශ්‍රී ලංකා බලධාරීන් සමඟ කටයුතු කිරීම මඟින් මෙය සාක්ෂාත් කර ගැනීමට හැකි විය. ශ්‍රී ලංකා අපනයනවලට බලපාන DCTS යටතේ ප්‍රභවය පිළිබඳ රීති නිර්ණායකයට අදාළ ගැටළු මතු කිරීම සඳහා එක්සත් රාජධානියේ බලධාරීන් සමඟ අඛණ්ඩව සම්බන්ධ වීම සිදුවිය.

- නව EU GSP රෙගුලාසි සම්මත කර ගැනීමේ ක්‍රියාවලිය අමාත්‍යාංශය අඛණ්ඩව අධීක්ෂණය කරයි. දැනට පවතින නඩු විභාග සාකච්ඡා ඇණහිටීම හේතුවෙන් එය 2027 දක්වා දීර්ඝ කිරීමට තීරණය කර ඇත.

- කැනේඩියානු මනාප තීරුබදු වැඩසටහනෙන් (GTP) ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඔටාවා හි දූත මණ්ඩලය බ්‍රැන්ඩික්ස් නියෝජිතයින්ට කැනඩාවේ ගෝලීය කටයුතු නිලධාරීන් සමඟ රැස්වීම් සඳහා පහසුකම් සලසා ඇත. ශ්‍රී ලංකා ඇඟලුම් සඳහා තවදුරටත් තීරු බදු අඩු කිරීම සඳහා ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

සම්බන්ධතාවය පුළුල් කිරීම:

- සෘජු ගුවන් ගමන් ආරම්භ කිරීම සඳහා ITA සහ NEOS ගුවන් සමාගම්, ASTOI හි සාමාන්‍යාධිකාරී සහ අධ්‍යක්ෂ ජනරාල්, ඉතාලි සංචාරක ක්‍රියාකරුවන්ගෙන් 90% කට අධික සංඛ්‍යාවක් නියෝජනය කරන ඉතාලියේ සංචාරක ක්‍රියාකරුවන්ගේ සංගමය හා ඉඩම් හා සංචාරක අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දු මහතා අතර හමුවීම් සිදු කරන ලදි. ඉතාලියේ සිට සංචාරක පැමිණීම් වැඩි කිරීම ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ විය.

- පෝලන්තය සමඟ 2023 ජූනි 14 වැනි දින අවසන් කරන ලද ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල තුන්වැනි සැසියේ එක් ප්‍රතිඵලයක් වන්නේ ශ්‍රී ලංකාවේ කොළඹ වරාය සහ පෝලන්තයේ Gdańsk/Gdynia වරාය අතර සෘජු නාවික සහ වරාය සහයෝගීතාව ඇති කිරීමයි. මෙම සහයෝගීතාවය පෝලන්තය සහ ශ්‍රී ලංකාව අතර බහාලුම් භාණ්ඩ මෙහෙයුම් ක්‍රමවත් කිරීම සහ සෘජු අපනයන සහ ආනයන උත්පාදනය වැඩි කිරීම සිදු කරනු ඇත. එවැනි සහයෝගීතාවයක් ශ්‍රී ලංකාවේ ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම සහ ශීත දාම සංවර්ධනය සඳහා පෝලන්ත ආයෝජන සඳහා ද හේතු වනු ඇත.

- අමාත්‍යාංශය සහ මොස්කව් දූත මණ්ඩලය, රුසියානු රජයේ ආයතන සමඟ සාකච්ඡා කර, රුසියාවේ සිට ශ්‍රී ලංකාවට සෘජු ගුවන් ගමන් වැඩි කිරීම සඳහා රුසියානු රජයේ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

- ස්ටොක්හෝම් හා ශ්‍රී ලංකාව අතර අඛණ්ඩව පවතින කේත හුවමාරුව සහ සංඛ්‍යාතය වැඩි කිරීම සඳහා FINNAIR සමඟ සම්බන්ධ වීම් සිදු කරන ලදී.

- ස්විට්සර්ලන්ත ගුවන් සමාගමක් වන Edelweiss ශීත සෘතු සංචාරක සමය සඳහා ශ්‍රී ලංකාවට සෘතුමය ගුවන් ගමන් ආරම්භ කළේය.

- චෙක් ජනරජයේ ප්‍රමුඛ පෙළේ සංචාරක සේවා සපයන්නෙකු වන Čedok හි සාමාන්‍ය අධ්‍යක්ෂ ස්ටනිස්ලව් සෙමන් මහතා සමඟ ශ්‍රී ලංකාව සහ බටහිර කලාපය අතර ගුවන් සම්බන්ධතා ශක්තිමත් කිරීම සඳහා ගත හැකි අනාගත ක්‍රමවේද පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඒ අනුව, 2023 ඔක්තෝම්බර් මාසයේ සිට ප්‍රාග්, කොළඹ, බ්‍රැටිස්ලාවා සහ කොළඹ අතර සෘජු ගුවන් ගමන් සමඟින් තම දිගු ගමනාන්තයන් පුළුල් කිරීමට Čedok සැලසුම් කරයි.

රැකියා අවස්ථා සඳහා මුල පිරීම්:

- ලන්ඩනයේ මහ කොමසාරිස් කාර්යාලය, එංගලන්තයේ කුඩා, මධ්‍යම සහ විශාල සත්කාරක සේවා සපයන්නන් සඳහා වන ප්‍රමුඛ නියෝජිත ආයතනයක් වන Care England ඇතුළු එක්සත් රාජධානියේ සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ නියෝජිතයන් සමඟ සමීපව සම්බන්ධ වී ශ්‍රී ලංකාව සෞඛ්‍ය සහ වැඩිහිටියන් සඳහා වන සත්කාරක සේවා සපයන රටක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික රෝහල, ලන්ඩනයේ මහ කොමසාරිස් කාර්යාලය, SLBFE සමඟ සහයෝගයෙන් එක්සත් රාජධානියේ සත්කාර අංශය සඳහා පමණක් නොව වෙනත් රටවල ටද සේවා සැපයීමට හැකි ශ්‍රම බලකායක් ගොඩ නැගීමට හැකි වන පරිද්දෙන් ශ්‍රී ලංකාව තුළ රැකවරණ පුහුණු වැඩසටහනක් හඳුන්වා දීමට පියවර ගන්නා ලදී.

- මොස්කව්හි දූත මණ්ඩලය රුසියානු සේවා යෝජකයින් දෙදෙනෙකු විසින් සෘජු රැකියා ගිවිසුම් යටතේ රුසියානු ඇඟලුම් කම්හල් වෙත ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් 58 දෙනෙකු බඳවා ගැනීමට පහසුකම් සලසා ඇත.

- එක්සත් රාජධානියේ වැඩිහිටි සත්කාර අංශයේ මානව සම්පත් අවශ්‍යතා හඳුනාගැනීම සඳහා සහ ශ්‍රී ලංකාවේ පුහුණුකරුවන්/වැඩිහිටි සෞඛ්‍ය සේවා සපයන්නන් සමඟ සම්බන්ධ කිරීම සඳහා, Agincare International Limited සහ Pulse Academy අතර සත්කාරක සේවකයන් පුහුණු කිරීම සහ ස්ථානගත කිරීම පිළිබඳ ගිවිසුමක් 2023 ජුනි 7 වන දින එක්සත් රාජධානියේ දී අත්සන් කිරීමට පහසුකම් සැලසීය.

- ලන්ඩනයේ මහ කොමසාරිස් කාර්යාලය සහ රියදුරු වාහන බලපත්‍ර නියෝජිතායතනය (DVLA) සමඟ ශ්‍රී ලංකාවේ රියදුරු බලපත්‍ර සඳහා එක්සත්රාජධානිය තුළ පිළිගැනීම ලබා ගැනීමට අඛණ්ඩව සාකච්ඡා කරමින් සිටියි. කාර් රථ, යතුරුපැදි සහ විශාල වාහන (බස් සහ ලොරි) පැදවීම සඳහා බලපත්‍ර සඳහා අන්‍යෝන්‍ය හුවමාරු ගිවිසුමක් අත්සන් කිරීම සඳහා DVLA සමඟ මෙහිදී සාකච්ඡා කරයි.

- ඉතාලිය සහ ශ්‍රී ලංකාව අතර රියදුරු බලපත්‍ර අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම සඳහා වූ ද්විපාර්ශ්වික ගිවිසුම අලුත් කිරීම පිළිබඳ අඛණ්ඩ සාකච්ඡා පවත්වා ඇත.

- ශ්‍රී ලංකාව සහ රුමේනියාව අතර කම්කරු සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම සංශෝධනය සඳහා ශ්‍රී ලංකාවේ නිරීක්ෂණ 2023 නොවැම්බර් 06 වැනි දින රුමේනියානු පාර්ශවය වෙත යවා ඇත.

**2.5.5.5. සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකභාවය සහ මානව සබඳතා:** ශ්‍රී ලාංකික විදේශගත ප්‍රජාව සහ ආගමික ආයතන විසින් සංවිධානය කරන ලද සංස්කෘතික හා ආගමික උත්සව සඳහා දූත මණ්ඩල නිලධාරීන් ක්‍රියාකාරීව සහභාගී වූහ. ප්‍රමුඛතා සහ හදිසි ජාතික අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම වැනි ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා එතෙර සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් උපරිම සහාය ලබා ගැනීම සඳහා දූත මණ්ඩල විසින් විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා වන කාර්යාලය (OOSLA) සමඟ ද සාකච්ඡා පැවැත්වීය.

**2.5.5.6. විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** වොෂින්ටන්හි දූත මණ්ඩලය, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සමඟ STEM සහ වෙනත් විශ්වවිද්‍යාල අටකට වඩා වැඩි ගණනක් සමඟ අධ්‍යාපනික හවුල්කාරිත්වයන් පිළිබඳව සාකච්ඡා කළේය. එය NSBM හරිත විශ්ව විද්‍යාලය සහ අනෙකුත් ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාල සහ

එක්සත් ජනපදයේ විශ්ව විද්‍යාල අතර සහයෝගීතාවන් ගොඩ නැගීමේ අරමුණින් සිදු කරන ලදි. කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මිචිගන් ප්‍රාන්ත විශ්ව විද්‍යාලය අතර ශ්‍රී ලංකාවේ එළවළු සහ පශු සම්පත් අංශ සංවර්ධනය පිළිබඳ යෝජිත සහයෝගීතා ව්‍යාපෘතිය පිළිබඳව ද දූත මණ්ඩලය සාකච්ඡා කළේය. එක්සත් ජනපදයේ ඉලිනොයිස් විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර පශු වෛද්‍ය විද්‍යා සහ කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික සම්භවයක් ඇති විද්වතුන්ගේ සහාය ඇතිව මූලික අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

කෘෂිකර්මය, මහජන සෞඛ්‍යය සහ ප්‍රජා සෞඛ්‍යය පිළිබඳ පර්යේෂණ සහයෝගීතාවය සඳහා මාර්ග ගවේෂණය කිරීම සඳහා ඔටාවා හි දූත මණ්ඩලය සස්කැච්වන් විශ්ව විද්‍යාලය සමඟ සාකච්ඡා කළේය. 2023 අගෝස්තු 30 දින, ශ්‍රී ලංකා ඩයස්පෝරා විද්වතුන්ගේ ජාත්‍යන්තර සංගමයේ කැනඩා පරිච්ඡේදය පිහිටුවන ලදී. මොස්කව් හි දූත මණ්ඩලය ශ්‍රී ලංකා සහ රුසියානු වෛද්‍ය හා අනුබද්ධ විද්‍යා විශ්ව විද්‍යාල සංගමය පිහිටුවීමේ ක්‍රියාවලියක යෙදී සිටී. රුසියානු විශ්වවිද්‍යාල සමඟ එක්ව ශ්‍රී ලංකාවේ රුසියානු භාෂා මධ්‍යස්ථාන 3ක් පිහිටුවීමට ද පහසුකම් සලසා ඇත.

### 2.5.6. දකුණු ආසියානු අංශය

සමාලෝචිත වර්ෂය තුළ දකුණු ආසියාතික රටවල් සමඟ වූ ශ්‍රී ලංකාවේ සබඳතාවයන් නැවුම් විය. මෙම කටයුතුවලට විදේශයන්ට සිදුවන සහ මෙරටට පැමිණෙන ඉහළ මට්ටමේ සංචාර, ඒකාබද්ධ කොමිසම්, ද්විපාර්ශ්වික මෙවලම් අත්සන් කිරීම් සහ මානව සබඳතා ඇතුළත් විය.

2023 වර්ෂය ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර මෙන්ම ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර කැපී පෙනෙන රාජ්‍යතාන්ත්‍රික කටයුතු සනිටුහන් කළේය. ගරු ජනාධිපතිතුමා ජූලි 20-21 දිනවල නවදිල්ලියේ නිල සංචාරයක නිරත වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ද්විපාර්ශ්වික ගිවිසුම් කිහිපයකට අත්සන් තැබීම සිදු විය. මෙම සංචාරයේ ප්‍රතිඵල ලේඛනය වන 'සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීම, සමෘද්ධිය උත්ප්‍රේරණය කිරීම: ඉන්දියා-ශ්‍රී ලංකා ආර්ථික හවුල්කාරිත්ව දැක්ම', දෙරට අතර වැඩි දියුණු කළ සම්බන්ධතාවයක් තුළින් අනාගත ඉන්දු-ලංකා සහයෝගීතාව සඳහා ශක්තිමත් පදනමක් සපයන ලදී. ඉන් අනතුරුව නොවැම්බර් 16 සිට 18 දක්වා ගරු ජනාධිපතිතුමා මාලදිවයිනේ සංචාරයක නිරත විය. ගරු කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් 17 දෙනෙකුගෙන් යුත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් පාර්ලිමේන්තු සබඳතා වර්ධනය කරමින් දෙසැම්බර් මාසයේදී ඉන්දියාවේ සංචාරයක නිරත විය. ගරු විදේශ කටයුතු අමාත්‍ය එම්.යූ.එම්. අලි සබ්රි මහතා මාර්තු 02-04 දක්වා නවදිල්ලියේ පැවති රයිසිනා සංවාදයේ 8 වන සංස්කරණයට සහභාගී වූ අතර, කලාපීය සංවාදය සහ සහයෝගීතාවය සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම ඉස්මතු කළේය.

2023 දී දකුණු ආසියාතික රටවලින් ශ්‍රී ලංකාවට ඉහළ පෙළේ සංචාර කිහිපයක් සිදු විය. ඉන්දීය මුදල් අමාත්‍ය, ගරු නිර්මලා සීතාරාමන් මහත්මිය නොවැම්බර් 01 සිට 03 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කළාය. එම කාලය තුළ ඉන්දීය මුදල් අමාත්‍යවරිය අනුරාධපුරය, මහනුවර, ත්‍රිකුණාමලය සහ යාපනය යන ප්‍රදේශවල සංචාරයක නිරත විය. ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය ගරු ජයිශංකර් මහතා ඔක්තෝබර් 11 වන දින කොළඹදී පැවති IORA සංගමයේ 23 වන අමාත්‍ය මණ්ඩල රැස්වීමට සහභාගී වූ අතර, බංග්ලාදේශ විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය ඒ.කේ. අබ්දුල් මොමන් මහතා ද එම අවස්ථාවට සහභාගී විය. තවදුරටත් ගරු බංග්ලාදේශ පාර්ලිමේන්තුවේ කථානායක ආචාර්ය ශිරින් ෂර්මින් චෞද්රි මහතා සැප්තැම්බර් 14 සිට 19 දක්වා ශ්‍රී ලංකාවට පැමිණියේය. සැලකිය යුතු කරුණක් වන්නේ පෙබරවාරි 4 වැනි දින ඉන්දියාවේ ගරු විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය වී. මුරලිදරන් මහතා සහ බංග්ලාදේශය, මාලදිවයින, නේපාලය, භූතානය සහ පකිස්ථානය යන රටවල නියෝජිතයින් 75 වැනි නිදහස් දිනය සැමරීම සඳහා ගෞරවනීය අමුත්තන් ලෙස ශ්‍රී ලංකාවට පැමිණිමයි. ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යවරයා ජනවාරි 19 සිට 20 දක්වා ශ්‍රී ලංකාවේ තවත් ද්විපාර්ශ්වික සංචාරයක නිරත විය.

ශ්‍රී ලංකා- මාලදිවයින් ඒකාබද්ධ කොමිසමේ 4 වැනි වටය ජූනි 06 සිට 07 දක්වා කොළඹදී පැවැත්වුණේ ගරු විදේශ කටයුතු අමාත්‍ය සහ මාලදිවයිනේ විදේශ කටයුතු අමාත්‍ය අබ්දුල්ලා ෂාහිඩ් මහතා ප්‍රමුඛ මාලදිවයිනේ

දූත පිරිසගේ ප්‍රධානත්වයෙනි. ඉන් අනතුරුව, ශ්‍රී ලංකා-නේපාල ඒකාබද්ධ කොමිසමේ අමාත්‍ය මට්ටමේ සමාරම්භක සැසිවාරය දෙසැම්බර් 21-22 දක්වා නේපාලයේ කත්මන්ඩු නුවරදී පැවැත්විණි. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ශ්‍රී ලංකා දූත පිරිසට නායකත්වය දුන් අතර ගරු නේපාල විදේශ අමාත්‍ය නාරායන් ප්‍රකාශ් සවුද් මහතා නේපාල නියෝජිත පිරිසට නායකත්වය දුන්නේය.

2023 දී ශ්‍රී ලංකාව සහ දකුණු ආසියාතික රටවල් අතර අවබෝධතා ගිවිසුම් 11ක් අත්සන් කරන ලදී. ඉන් හයක් ඉන්දියාව සමඟ ද, හතරක් මාලදිවයින සමඟ ද, එකක් නේපාලය සමඟ ද විය.

සමාලෝචිත කාලසීමාව තුළ, දකුණු ආසියාතික රටවලින් යුධ සහ අද්විතීය ගුවන් යානා දහයක්, නාවික නෞකා 14ක් සහ එක් නාවික සබ්මැරීනයක් ශ්‍රී ලංකාවට පැමිණි අතර, ඔවුන්ගේ රාජ්‍ය තාන්ත්‍රික නිෂ්කාශනය සඳහා දකුණු ආසියානු අංශය පහසුකම් සලසා දෙන ලදී.

### 2.5.7. අග්නිදිග සහ මධ්‍යම ආසියානු අංශය

**2.5.7.1. ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** පිළිගත් රටවල අනාගත ගැනුම්කරුවන්/ආයෝජකයින් සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික හවුල්කරුවන් අතර අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල හරහා ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සැලසීම.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/ බැංකොක්:** 2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකාව සහ තායිලන්තය නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳව සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදි. තායිලන්ත ජාත්‍යන්තර සහයෝගිතා අයතනය සහ ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාව සහ තායිලන්තය (2023-2024) සඳහා දෙවසරක මෙහෙයුම ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම කෙටුම්පත් කරන ලදී. එම වසර 02 ක සැලැස්ම යටතේ ව්‍යාපෘති 06ක් හඳුනාගෙන ඇත, එනම් පුත්තලම වතුපොල ගම්මානයේ ප්‍රජා පාදක සංචාරක ව්‍යාපෘතිය, OVOP සංවර්ධන ව්‍යාපෘතිය, සමුද්‍රීය විසිතුරු මත්ස්‍ය අභිජනනය පිළිබඳ පුහුණුව සහ විශේෂඥ සේවය, අලි ඇතුන් සුබසාධනය සහ පුනරුත්ථාපනය කිරීම, වාර්ෂික ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව සහ තායිලන්ත ජාත්‍යන්තර පශ්චාත් උපාධි වැඩසටහන එයට ඇතුලත් වේ. කෘෂිකාර්මික සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහ සනීපාරක්ෂාව හා ශාක යහපැවැත්ම පිළිබඳ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම පිළිබඳව ද සාකච්ඡා කෙරිණි. ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළෙඳ කටයුතු සම්බන්ධ කරුණු පිළිබඳ 05 වැනි අනු කමිටු රැස්වීම 2023.10.12 වැනි දින කොළඹදී පැවැත්විණි. 05 වන අනු කමිටු රැස්වීම සඳහා පැවති ආංශික රැස්වීම් සඳහා දූත මණ්ඩලය සහභාගී වූ අතර, මෙම රැස්වීම්වලදී දූත මණ්ඩලයේ නිරීක්ෂණ/ නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රේඛීය ආයතනවලින් ලැබුණු යෝජනා වෙළඳ සාකච්ඡා දෙපාර්තමේන්තුවට දූත මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාවේ ගරු මුදල් රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා 2023 නොවැම්බර් 01 සිට 03 දක්වා බැංකොක් නුවර UNESCAP හිදී සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, දරිද්‍රතාවය අවම කිරීම සහ සංවර්ධනය සඳහා මූල්‍ය පිළිබඳ කමිටුවේ 04 වැනි සැසිවාරයට ශ්‍රී ලංකා දූත පිරිසට නායකත්වය දුන්නේය. 2023 ලෝක හින්දු සම්මේලනයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර සෙන්තිල් තොණ්ඩමන් මහතා 2023 නොවැම්බර් 24 සිට 29 දක්වා බැංකොක් වෙත පැමිණීමට පහසුකම් සලසන ලදි. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය එම්.යූ.එම්. අලි සබ්රි, 2023 ජුනි 11 වන දින පැවති සමාරම්භක බිම්ස්ටෙක් විදේශ අමාත්‍යවරුන්ගේ විවේක සැසිය සඳහා සහභාගී විය. 2023.07.18 වන දින තායි කර්මාන්ත සම්මේලනයේ සහයෝගීතාවයෙන් දූත මණ්ඩලය විසින් තායි කර්මාන්ත ආයෝජන ප්‍රවර්ධන උත්සවයක් සංවිධානය කරන ලදී.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/ ජකර්තා:**
ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ ආර්ථික ස්ථායිකරණය, ප්‍රතිසංස්කරණය සහ වර්ධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක වන ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතාගේ නායකත්වයෙන් පසුගිය 2023 ජුනි මස 12 සහ 13 යන දිනවලදී ජකාර්තා නුවර සිදුකළ තත්ත්ව පරීක්ෂණ සංචාරයෙන් පසුව, ශ්‍රී ලංකාව කලාපීය ව්‍යාපාරික ආර්ථික සමීක්ෂණ ගිවිසුමට (RCEP) පිවිසීමට යෝජනා පත්‍රයක් 2023 ජුනි මස 28 වන දින ASEAN ලේකම්

කාර්යාලයට යොමු කරන ලදි. 2023 සැප්තැම්බර් මස 19 සිට 24 දක්වා කාලයේදී ශ්‍රී ලංකා තරුණ ව්‍යවසායකයින්ගේ සංසදයේ (COYLE) නියෝජිත පිරිසක් ආර්ථික හවුල්කාරිත්වයන් ගොඩ නැගීමේ කටයුතු සඳහා ජකාර්තා නුවරට සංචාරයක නිරත විය.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය/ ක්වාලාලම්පූර්:**

මැලේසියාවේ ෆෙඩරල් ඉඩම් සංවර්ධන අධිකාරියේ (FELDA) සභාපතිවරයා සමඟ ශ්‍රී ලාංකික වතුකර කම්කරුවන්ට මැලේසියාවේ රැකියා අවස්ථා සුරක්ෂිත කිරීම සඳහා දූත මණ්ඩලය ඵලදායී සාකච්ඡාවක් පැවැත්වූ අතර, ශ්‍රී ලංකාව සඳහා රැකියා කෝටාව 10,000කින් වැඩි කිරීමට මැලේසියාවේ මානව සම්පත් අමාත්‍යාංශය සමඟ නැවත සාකච්ඡා කරන ලදි. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සමාගම්වලට මැලේසියාවේ පැවැත්වෙන තොරතුරු තාක්ෂණ ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා පහසුකම් සැලසීමට සහ මැලේසියාවේ ව්‍යාපාර කිරීමට අවස්ථා නිර්මාණය කිරීමට දූත මණ්ඩලය විසින් ක්‍රියා කළේය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / යැන්ගුන් :**

2023 මැයි 12 වන දින, යැන්ගුන් සහ කොළඹ අතර සෘජු ගුවන් සම්බන්ධතා පිහිටුවීම සඳහා මියන්මාර ගුවන්සේවා අන්තර්ජාතික (MAI) සමාගමේ මහජන කළමනාකාර මණ්ඩලය සමඟ තානාපතිතුමා නිල හමුවක් පැවැත්විය. දූත මණ්ඩලය මියන්මාරයේ ආයෝජනය කිරීමට කැමති ශ්‍රී ලාංකිකයින් සඳහා ව්‍යාපාරික හමුවීම් කීපයක් ද සංවිධානය කළේය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / මැනිලා:**

පිලිපීනයේ වෙළඳපොළේ ප්‍රමුඛ ශ්‍රී ලාංකික සමාගම් සඳහා වෙළඳ සහ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට දූත මණ්ඩලය ක්‍රියාකළේ පාර්ශවකරුවන් වෙත තොරතුරු යොමුකරමින් සහ අන්තර්ජාල හමුවක් සංවිධානය කිරීමෙනි. පිලිපීනයේ වෙළඳ ප්‍රදර්ශන වලදී ශ්‍රී ලංකා අපනයන භාණ්ඩ ප්‍රවර්ධනය කරන ලදි. එසේම ශ්‍රී ලංකා ඇඟලුම් ප්‍රදර්ශනය (JAAFSL). ජාතික කාර්මික ප්‍රදර්ශනය 2023, FACETS 2024, ඩිජිටල් ආයෝජන ප්‍රදර්ශනය සහ ජාත්‍යන්තර පාෂාන හා පතල් ප්‍රදර්ශනය වැනි ශ්‍රී ලංකා ප්‍රදර්ශන ප්‍රවර්ධනය කරමින් පාර්ශවකරුවන් සහ පෞද්ගලික අංශ සමාගම් සඳහා අවස්ථා සෙවීමට සහ හැකියාවන් පරීක්ෂා කිරීමට අවස්ථා සකස් කරදෙන ලදි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය (SLTPB) සමඟ සම්බන්ධතා පවත්වමින් 2023 මාර්තු 29 සිට අප්රේල් 6 දක්වා පිලිපීන සංචාරක නියෝජිතයින් 9 ක් සඳහා ශ්‍රී ලංකාවට වූ සංචාරය සාර්ථකව නිම කරන ලදි.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය/සිංගප්පූරුව:**

සිංගප්පූරු ව්‍යාපාරික සම්මේලනය, සිංගප්පූරු ඉන්දියානු වාණිජ මණ්ඩලය, සිංගප්පූරු මැලේ වාණිජ මණ්ඩලය සහ සිංගප්පූරු ශ්‍රී ලංකා ව්‍යාපාරික සංගමයේ සාමාජිකයින් සමඟ *මාර්ගගත* සැසි සංවිධානය කිරීම මගින් ශ්‍රී ලංකා සිංගප්පූරු ව්‍යාපාරික කවුන්සිලයේ ව්‍යාපාරික නියෝජිත පිරිසකගේ සංචාරය සඳහා පහසුකම් සපයන ලදී. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ එක්ව 2023 සිංගප්පූරු ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවට සහභාගී වීමට පහසුකම් සැලසීය. ගරු වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා සිංගප්පූරු ආයෝජකයින් හමුවී සාකච්ඡා පැවැත්විය . මහ කොමසාරිස් කාර්යාලය සිංගප්පූරුවේ සිටින ශ්‍රී ලාංකික ව්‍යවසායකයකු සමඟ එක්ව "An Ode to Ceylon" සංචාරක, විලාසිතා සහ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කළේය. ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය චාමර සම්පත් දිසානායක මහතා සිංගප්පූරුවට ගොස් සිංගප්පූරුවේ වෙළෙඳ හා කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා, සිංගප්පූරු ස්වර්ණාභරණ සංගමයේ සභාපති, මැණික් වෙළෙඳුන්ගේ සංගමයේ සභාපති සහ සිංගප්පූරුවේ දියමන්ති හුවමාරු සභාපතිවරයා හමුවීම ඇතුළු *කර්තව්‍යන් කිහිපයක නිරත විය.* 2023 ජූලි මාසයේදී සිංගප්පූරු ව්‍යාපාරික කවුන්සිලයේ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා ව්‍යාපාර සහ ආයෝජන සංසදයක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාව 2023 ජනවාරි සිට නොවැම්බර් දක්වා සිංගප්පූරුවට ඇමෙරිකානු ඩොලර් මිලියන 112 ක භාණ්ඩ අපනයනය කළ අතර සිංගප්පූරුවේ සිට ශ්‍රී ලංකාවට 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සිදු වූ සෘජු විදේශ ආයෝජනවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 41.19ක් විය. 2023 වසරේ සිංගප්පූරු සංචාරකයින් 9,500ක් ශ්‍රී ලංකාවට පැමිණි අතර එය පෙර වසරට සාපේක්ෂව 150%ක වර්ධනයකි.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/ හැනෝයි :** 2023 මාර්තු 14 වන දින ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය (NCCSL) සමඟ එක්ව "වියට්නාමය සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආයෝජන" පිළිබඳ සාකච්ඡාවක් සංවිධානය කරන ලදී. තානාපති කාර්යාලය ප්‍රධානත්වයෙන්, වෙළඳ සංගම්, ගෝලීය සංසද, සෘජු විදේශ ආයෝජන සිදුකරන්නන් සහ විශාල සමාගම්වල අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ සැලකිය යුතු රැස්වීම් 50කට අධික සංඛ්‍යාවක් පැවැත්වීය. ශ්‍රී ලංකා සමාගම් *සඳහා* වියට්නාමයේ වෙළඳ සහ සංචාරක ප්‍රදර්ශන 20 කට ආසන්න ප්‍රමාණයක් සහ වෙළඳ ප්‍රවර්ධන සිදුවීම් ප්‍රවර්ධනය සඳහා සහය ලබා *දෙන* ලදී. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය පිළිබඳ මාධ්‍ය හමුවක් 2023 අප්‍රේල් 4 වන දින තානාපති කාර්යාලයේදී සංවිධානය කරන ලදී. වියට්නාම මාධ්‍යවේදීන් පස් දෙනෙකු සඳහා 2023 මැයි 7 සිට 14 දක්වා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමඟ මාධ්‍ය චාරිකාවක් සංවිධානය කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සමඟ සහයෝගයෙන් තානාපති කාර්යාලය විසින් 2023 දෙසැම්බර් 07 සිට 09 දක්වා හෝ චී මින් හි පැවති වියට්නාම් එක්ස්පෝ හි ශ්‍රී ලාංකික ව්‍යාපාරවල සහභාගීත්වය සංවිධානය කරන ලදී.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/මොස්කව් (කසකස්තානයට ප්‍රතීතනය කර ඇත):** එයාර් ඇස්තානා මගින් කසකස්තානයේ සිට ශ්‍රී ලංකාවට සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමට යෝජනා කර පහසුකම් සලසා ඇත. කසකස්තානයේ සංස්කෘතික හා ක්‍රීඩා, සංචාරක කර්මාන්ත අමාත්‍යාංශය භාර උප අමාත්‍ය යෙර්සාන් යෙර්කින්බයිව් මහතා සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගීතාව වර්ධනය කිරීම සම්බන්ධයෙන් තානාපති කාර්යාල නිලධාරීන් හමුවිය. සංචාරක, වෙළෙඳ, අධ්‍යාපන, සංස්කෘතිය, විද්‍යාව සහ උසස් තාක්ෂණ ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳව තානාපතිවරයා විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය කනාත් ටුම්යේෂ් මහතා හමුවිය.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය/ඉස්ලාමාබාද් (කිර්ගිස්තානය සහ ටජිකිස්තානය සඳහා ප්‍රතීතනය කර ඇත):** වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ මධ්‍යම ආසියානු රටවලට ලංකා තේ අපනයනය කිරීම සඳහා නව වෙළඳපොළක් සොයා ගැනීම සඳහා දූත මණ්ඩලය කිර්ගිස්තාන් ජනරජයේ ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරයා හමුවිය.

### 2.5.7.2. දේශපාලන රාජ්‍යතාන්ත්‍රිකභාවය

විදේශ රටවල් සමඟ වැඩිදියුණු කළ දේශපාලන උපදේශන හරහා ද්විපාර්ශ්වික සහයෝගීතාවය පුනර්ජීවනය කිරීම:
මැලේසියාව සමඟ විදේශ කාර්යාල උපදේශනවල පළමු වටය, වියට්නාමය සමඟ ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතා ඒකාබද්ධ කොමිසමේ 4 වැනි වටය සහ සිංගප්පූරුව සමඟ විදේශ කාර්යාල උපදේශනවල පළමු වටය පැවැත්වීමට සූදානම් වීම. තායිලන්තය සමඟ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල 05 වැනි වටය 2023 අගෝස්තු 28 වැනි දින විදේශ ලේකම් මට්ටමින් කොළඹදී සාර්ථකව පැවැත්විණි.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / බැංකොක්:** තායිලන්තයේ සංචාරයක නිරත වූ ගරු අග්‍රාමාත්‍යවරයා ICDV හි සභාපති මහාචාර්ය ආචාර්ය අතිපූජ්‍ය ෆ්‍රා බ්‍රහ්මපණ්ඩිත් නාහිමියන් බැහැදුටු අතර 2023.08.28 දින කොළඹදී විදේශ ලේකම් මට්ටමින් ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල 05 වැනි වටය සම්බන්ධීකරණය කරන ලදී.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / ජකර්තා:** ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා 2023 ජූලි 14 වන දින 30 වැනි ආසියාන් කලාපීය සංසදය (ARF) සඳහා ජකර්තා වෙත ගිය අතර, ARF සාමාජික රටවල්, ඉන්දුනීසියානු මුදල් අමාත්‍ය, ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමේ ජාතික නියෝජිතායතනයේ ප්‍රධානියා (BNPT) සහ ශ්‍රී ලංකා ව්‍යාපාරික ප්‍රජාවේ සාමාජිකයන් සමඟ ද්විපාර්ශ්වික හමුවීම් ඇතුළුව රැස්වීම් 14 ක් පැවැත්වීය. ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා 2023 ඔක්තෝබර් 10 වන දින ඉන්දුනීසියාවේ බාලි හි පැවති AIS සංසදයට සහභාගී විය.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / ක්වාලාලම්පූර්:**
මහ කොමසාරිස්වරයා මලාකා ප්‍රාන්තයේ ආණ්ඩුකාරවරයා හමුවෙමින් ශ්‍රී ලාංකිකයින් සඳහා මලාකා ප්‍රාන්තයේ රැකියා අවස්ථා වැඩි කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම රටවල් අතර සංචාරක, වෙළෙඳ සහ ආයෝජන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීමට ද දෙපාර්ශවය එකඟ විය. ආර්ථික සහයෝගීතාවය සඳහා පදනම සකස් කරමින්, RECEP සඳහා ශ්‍රී ලංකාවේ අයදුම්පත වෙනුවෙන් පෙනී සිටීම සඳහා මලාකා ආණ්ඩුකාරවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීමක් පවත්වන ලදී. 2023 ඔක්තෝම්බර් මාසයේදී මැලේසියානු විදේශ අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සාර්ථක නිල සංචාරය දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද අතර, එය අයෝරා සඳහා ක්‍රියාකාරී නියෝජනයක් සනිටුහන් කලේය. ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් යෝජිත මැලේසියාවේ රාජ්‍ය සංචාරය සම්බන්ධයෙන් මෙම දූත මණ්ඩලය අඛණ්ඩව කටයුතු කරමින් සිටින අතර විදේශ කාර්යාල උපදේශන ද පවත්වයි.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය /යන්ගුන්:** තානාපතිවරයා මධ්‍යම විදේශ කටයුතු අමාත්‍යවරයා/ නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරයා සහ ස්වදේශ කටයුතු පිළිබඳ මධ්‍යම අමාත්‍යවරයා/ මියන්මාරයේ සංක්‍රමණ සහ ජනගහන පිළිබඳ මධ්‍යම අමාත්‍යවරයා/ ශ්‍රී ලංකා රජය සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූ අතර, 2023 මැයි මාසයේදී MOCHA සුළි කුණාටුවෙහි බලපෑමට ලක් වූ ජනතාව සඳහා මානුෂීය ආධාර ලෙස ලංකා තේ මෙට්‍රික් ටොන් 1ක තොගයක් මියන්මාරයට පරිත්‍යාග කළේය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / මැනිලා:**. 2023 මාර්තු 21 සිට 24 දක්වා ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා සහ අමාත්‍ය දූත පිරිසේ චාරිකාවට පහසුකම් සැලසීය. ගරු සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා 2023 සැප්තැම්බර් 26 සිට සැප්තැම්බර් 29 දක්වා පිලිපීනයේ පැවැත්වූ ආසියා ශාන්තිකර සමාජ ආරක්ෂණ සතියට සහභාගී විය. 3 වන වටයේ දේශපාලන උපදේශන පැවැත්වීම සඳහා පිලිපීනය සමඟ සම්බන්ධීකරණය කිරීමට කටයුතු කරන ලදී. 2023 ජූලි 24 වැනි දින පිලිපීනයේ ජනාධිපති ෆර්ඩිනන්ඩ් ආර් මාකෝස් විසින් පශ්චාත් SONA පිලිපීන ආර්ථික සංක්ෂිප්තයේ සාරාංශ වාර්තාවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. 2023 දෙසැම්බර් 03 සිට 08 දක්වා මැනිලා හි පැවති 4 වන Asia Pacific Evaluation Association (APEA) සමුළුවට සහභාගී වීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සංචාරයට පහසුකම් සැලසීය.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / සිංගප්පූරුව:** මහ කොමසාරිස් කාර්යාලය විසින් ගරු ජනාධිපතිතුමාගේ 2023 මැයි 22 සිට 23 දක්වාත් 2023 අගෝස්තු 21 සිට 22 දක්වාත් සිංගප්පූරුවට සිදු කළ සංචාර සම්බන්ධීකරණය කර ඇත.
මැයි මාසයේ සංචාරය අතරතුර, ගරු ජනාධිපතිතුමා සිංගප්පූරුවේ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා සහ නීති අමාත්‍යවරයා සමඟ අදහස් හුවමාරු කර ගත්තේය. සංචාරයේදී ජනාධිපති වික්‍රමසිංහ මහතා සිංගප්පූරු ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා සහ සිංගප්පූරුවේ ආරක්ෂක අමාත්‍යවරයා සහ සිංගප්පූරුවේ තිරසාර හා පරිසර අමාත්‍යවරයා සමඟ ආර්ථික, ආරක්ෂක සහ පාරිසරික යන ක්ෂේත්‍රවලට ප්‍රමුඛත්වය දෙමින් ද්විපාර්ශ්වික සබඳතා වැඩි දියුණු කිරීම අරමුණු කර ගත් ද්විපාර්ශ්වික සාකච්ඡා රාශියක් පැවැත්වීය. ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර පැරිස් ගිවිසුමේ 06 වැනි වගන්තිය යටතේ දෙපාර්ශවයම අවබෝධතා ගිවිසුමක් හා සහයෝගීතාවයක් අත්සන් කළහ. මහ කොමසාරිස් කාර්යාලය 2024 දෙවන භාගයේදී විදේශ කාර්යාල උපදේශන 01 වැනි වටය උපලේඛනගත කිරීම පිළිබඳව සිංගප්පූරුවේ සහ ශ්‍රී ලංකාව පසු විපරම් කරමින් සිටී.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය /හැනොයි:** වියට්නාමයේ ජනාධිපති, විදේශ කටයුතු, මහජන ආරක්ෂාව, අධ්‍යාපන අමාත්‍යවරුන් සහ වියට්නාමයේ කොමියුනිස්ට් පක්ෂයේ නායකයින් මෙන්ම හැනොයි හි පිහිටි තෝරාගත් තානාපතිවරුන් ගණනාවක් සමඟ විස්තීරණ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්විණි.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/මොස්කව් (කසකස්තානයට ප්‍රතීතනය කර ඇත):** 2024 පළමු කාර්තුව තුළ ශ්‍රී ලංකාවේ සහ කසකස්තානයේ විදේශ අමාත්‍යවරුන් අතර දේශපාලන උපදේශන පැවැත්වීමේ හැකියාව සොයා බැලීමට තානාපති කාර්යාලය සාකච්ඡා ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ

සහ කසකස්තාන ජනාධිපති ගරු කස්යම් ජෝමර්ට් ටෝකායෙව් අතර සාකච්ඡා 2023 සැප්තැම්බර් 29 දින ජර්මනියේ Berlin Global Dialogue Forum ට සමගාමීව පැවැත්විණි.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/ටෙහෙරාන්:** තානාපති කාර්යාලය ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ටර්ක්මෙනිස්තානයේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර සහයෝගිතා වැඩසටහනේ කෙටුම්පත අවසන් කිරීමට උත්සාහ කර ඇති අතර එමගින් දෙරටට යෝජිත දේශපාලන උපදේශන මට්ටමින් පැවැත්වීමට හැකි වේ.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය/ ඉස්ලාමාබාද් (කිර්ගිස්තානය සහ ටජිකිස්තානයට ප්‍රතීතනය කර ඇත):** කිර්ගිස් ජනරජයේ සහ ටජිකිස්තාන් ජනරජයේ ශ්‍රී ලංකාව සඳහා නම් කරන ලද තානාපතිවරයා ශ්‍රී ලංකාව සමඟ සුහද ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමට සහ කලාපීය සංසදවලදී ඔවුන්ගේ සහයෝගය ලබා දීමට එකඟ වී ඇත.  තජිකිස්තාන් ජනරජයේ ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරයා සඳහා පුද්ගලයෙකු නම් කිරීම සඳහා සුදුසු පුද්ගලයින් නිර්දේශ කරන ලෙස ඉස්ලාමාබාද්හි තජිකිස්තාන් තානාපතිවරයා විසින් නම් කරන ලද තානාපතිවරයා විසින් ඉල්ලා ඇත. රැස්වීම අතරතුර, සහයෝගිතා ක්ෂේත්‍රවල ගිවිසුම් 12 ක කෙටුම්පත කඩිනම් කරන ලෙස කිර්ගිස්තාන් තානාපතිවරයා ඉල්ලා සිටියේය.

**2.5.7.3. බහුපාර්ශ්වික සබඳතා:** එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ASEAN, ARF, CPSC, UNESCAP, RCEP සහ RECAP සමඟ නිතර සම්බන්ධ වීම සහ රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට අනුපූරකව හවුල්කාරිත්වයන් ගොඩනැගීම.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/ බැංකොක්:** ගරු පරිසර අමාත්‍ය නසීර් අහමඩ් මහතා "ආසියාවේ සහ පැසිෆික් කලාපයේ කාබන් මධ්‍යස්ථභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා දේශීය, ජාතික සහ කලාපීය උපාය මාර්ග සම්බන්ධ කිරීමේ" වැඩ සටහනේ ප්‍රධාන දේශනය පැවැත්වූ අතර "දේශගුණික මූල්‍ය හා ආයෝජන උත්ප්‍රේරක" යන විශේෂ සැසියේදී ප්‍රකාශයක් සිදු කළේය. 79 වැනි සැසිවාරයේදී කලාපීය ආයතනයේ 2023-2026 කාලසීමාව සඳහා තාක්ෂණ හුවමාරුව සඳහා වූ ආසියා සහ පැසිෆික් මධ්‍යස්ථානයේ (APCTT) පාලන කවුන්සිලයේ මැතිවරණයේදී හෝ නැවත තේරී පත්වීමේදී ශ්‍රී ලංකාව අපේක්ෂකයින් දස දෙනාටම (10) සහාය දැක්විය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / ජකර්තා:** ඉන්දුනීසියානු රජය එක්සත් ජාතීන්ගේ කාන්තා තත්ත්වය පිළිබඳ කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා සාමාජිකත්වය සඳහා, (CWS), සියලුම සංක්‍රමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවේ 2024-2027 කාලය සඳහා සාමාජිකත්වය සඳහා සහ 2023-2027 කාලසීමාව සඳහා යුනෙස්කෝ විධායක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සඳහා සහාය දැක්විය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / මැනිලා:** පිලිපීන රජය 2023 සැප්තැම්බර් 11 වන දින මානව හිමිකම් කවුන්සිලයේ 54 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාවට සහය ලබා දුන් අතර සියලුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් සුරැකීමේ කමිටුවට (CMW) 2024-2027 කාලය සඳහා 2023 සැප්තැම්බර් 27 දින පැවති මැතිවරණයේදී අපේක්ෂකත්වය සඳහා සහය ලබා දුන්නේය.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / සිංගප්පූරුව:** මහ කොමසාරිස් කාර්යාලය සිංගප්පූරුවේ විදේශ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවී මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානයට අදාළව ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය සහ 51/1 යෝජනාව පිළිබඳ ශ්‍රී ලංකා රජයේ ස්ථාවරය පිළිබඳව ඔවුන් දැනුවත් කර මැදිහත්වීමක් කරන ලෙස ඉල්ලා සිටියේය. 2023 ජුනි 21 වැනි දින පැවැත්වීමට නියමිත මානව හිමිකම් කවුන්සිලයේ 53 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාව පිළිබඳ වාචික යාවත්කාලීන කිරීම අතරතුර, අභියෝගාත්මක තත්ත්වයන් යටතේ ශ්‍රී ලංකාව දරන උත්සාහයන් පිළිගත්තේය. ජිනීවා හි විශ්ව කාලාන්තර වාර්තා ක්‍රියාකාරී කණ්ඩායමේ අභියෝගාත්මක තත්ත්වයන් යටතේ ශ්‍රී ලංකාව ගන්නා උත්සාහයන් පිළිගනිමින් 42 වැනි සැසියේදී ශ්‍රී

ලංකාවේ 4 වැනි විශ්ව කාලාන්තර වාර්තාව සඳහා මැදිහත් වීමට සිංගප්පූරු විදේශ අමාත්‍යාංශයට මහ කොමසාරිස් කාර්යාලය බලපෑම් කළේය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය /හැනොයි:** මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට වියට්නාමයේ සහය ලබා ගැනීම සඳහා දූත මණ්ඩලය වියට්නාමයේ විදේශ කාර්යාලය සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ විය.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය /ඉස්ලාමාබාද් (කිර්ගිස්තානය සහ ටජිකිස්තානයට ප්‍රතීතනය කර ඇත):** ජිනීවා හි පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ වාර්ෂික සමාලෝචනයේදී කිර්ගිස්තානය සහ ටජිකිස්තානය ශ්‍රී ලංකාවට සිය සහයෝගය ලබා දුන් අතර 2024-2027 කාලසීමාව සඳහා සියලුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ (CMW) අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවට ප්‍රසාද් කාරියවසම් මහතාගේ අපේක්ෂකත්වය සඳහා කිර්ගිස්තානය සහ ටජිකිස්තානය යන දෙපාර්ශ්වයම තම සහයෝගය ප්‍රකාශ කළේය. 2023 නොවැම්බරයේ 42 වැනි මහා සමුළුව අතරතුර පැවති IV කාණ්ඩයේ සිට 2023-2027 කාලසීමාව සඳහා යුනෙස්කෝ විධායක මණ්ඩලයට ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සඳහා සහාය ලබා දීමට කිර්ගිස්තාන් ජනරජයේ සහ ටජිකිස්තාන් ජනරජයේ තානාපති කාර්යාල සමඟ සම්බන්ධීකරණය කර ඇත.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය /මොස්කව් (කසකස්තානයට ප්‍රතීතනය කර ඇත):** සහයෝගීතාවයේ ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා තානාපතිවරයා ආසියාවේ අන්තර් ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුවේ (CICA) නියෝජ්‍ය මහලේකම් චි ෆැන්ග් මහත්මිය හමුවිය.

**ප්‍රදූත රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ සංක්‍රමණික කම්කරු සුභසාධනය:**

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / බැංකොක්:** 04 වන කාර්තුව තුළ ශ්‍රී ලාංකිකයන් 07 දෙනෙකු තායිලන්තයෙන් පිටුවහල් කරන ලද අතර, 29 දෙනෙකු තායිලන්තයෙන් මේ වනවිට පිටුවහල් කරන ලද අතර ශ්‍රී ලාංකිකයන් 06 දෙනෙකු කාම්බෝජයෙන් පිටුවහල් කිරීමට පහසුකම් සලසා ඇත.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / යැන්ගුන්:** මියන්මාරයේ සිර දඬුවම් නියම වූ ශ්‍රී ලාංකික ධීවරයින් පස් දෙනෙකුට 2023 මාර්තු 28 වන දින මියන්මාර රජය විසින් සමාව දෙන ලදී. මිනිස් ජාවාරමට ගොදුරු වූවන් ලෙස සැලකෙන අතරමං වූ ශ්‍රී ලාංකිකයන් තිස් දෙදෙනෙකු දූත මණ්ඩලය විසින් බේරාගෙන / නිදහස් කර ආපසු ගෙන්වා ගන්නා ලදී.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / මැනිලා:** දූත මණ්ඩලය 2023 පෙබරවාරි 28 වන දින මිනිස් ජාවාරමට එරෙහි අන්තර් නියෝජිතායතන කවුන්සිලය (IACAT) හා එක්ව පිලිපීනයේ වාසය කරන ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ සහභාගීත්වයෙන් මිනිස් ජාවාරම පිළිබඳ මාර්ගගත දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / සිංගප්පූරුව:** මහ කොමසාරිස් කාර්යාලය සිංගප්පූරුවේ ගොඩනැගිලි ඉදිකිරීම් අධිකාරිය සමඟ කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකේය ජාතික වෘත්තීය සුදුසුකම් පිළිගැනීමට හැකි විය. මෙය සිංගප්පූරුව විසින් විදේශීය ඉදිකිරීම් සුදුසුකමක් සඳහා වූ පළමු පිළිගැනීම සනිටුහන් කළ අතර, මහ කොමසාරිස් කාර්යාලය විසින් සිංගප්පූරු රාජ්‍ය අංශයේ රෝහල් වෙත හෙදියන් යෙදවීමට කටයුතු කරන ලදී. හෙද හෙදියන් 36 දෙනෙකුගෙන් යුත් පළමු කණ්ඩායම සිංගප්පූරුවේ රාජ්‍ය අංශයේ රෝහල් වෙත සාර්ථකව යොදවා ඇත. මෙය සනිටුහන් වූයේ ප්‍රථම වරට සිංගප්පූරුවේදී ශ්‍රී ලාංකික හෙදියන් බඳවා ගැනීම ලෙසයි. 2023 දී, විශේෂයෙන්ම සිංගප්පූරුවේ ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින්ට රැකියා අවස්ථා සඳහා පහසුකම් සැලසීමේ දී කම්කරු අංශය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් 2,631ක් සිංගප්පූරුවට යොදවා ඇති අතර, එමගින් සිංගප්පූරු ඩොලර් 485,023.10 ක වාර්ෂික ආදායමක් උපයා ඇත.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/ හැනොයි:** තාවකාලික සංචාරක ලියකියවිලි (TTDs) නිකුත් කිරීම සහ Ba Ria Vung Tau පළාතේ සිට ශ්‍රී ලංකාවට අතරමං වූ සංක්‍රමණිකයන් 126 දෙනෙකු නැවත ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා වියට්නාමයේ සංක්‍රමණ සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) සමඟ සම්බන්ධීකරණය කරන ලද මෙහෙයුමක් සිදු කරන ලදි.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය /ඉස්ලාමාබාද් (කිර්ගිස්තානය සහ ටජිකිස්ථානයට ප්‍රතීතනය කර ඇත):** කිර්ගිස්තානයේ රෙදිපිළි අංශයේ රැකියා අවස්ථා හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් කිර්ගිස්තානයට යැවීමට ශ්‍රී ලංකාවේ බඳවා ගැනීමේ ආයතනවලට සහාය වනු ඇත. බඳවා ගැනීමේ ක්‍රියාවලිය 2023 ජූලි මාසයේදී Aspire International හරහා ආරම්භ විය. කිර්ගිස්තානයේ අතරමං වූ ශ්‍රී ලාංකිකයන් ඔවුන්ගේ සංක්‍රමණ/සංචාර අතරතුර මහ කොමසාරිස් කාර්යාලය වෙත පැමිණ ඇත. අතරමං වී සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා කොන්සියුලර් සේවාවන් දීර්ඝ කිරීම සඳහා මහ කොමසාරිස් කාර්යාලය බිෂ්කෙක් හි ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා සමඟ සම්බන්ධීකරණය කරයි.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/මොස්කව් (කසකස්තානයට ප්‍රතීතනය කර ඇත):** ප්‍රතීතනය ලත් රටවල (කසකස්තානය, උස්බෙකිස්තානය) අතරමංව සිටින/ රඳවාගෙන සිටින/ සිරගතව සිටින ශ්‍රී ලාංකිකයන්ට සහය වූ අතර ඔවුන්ට නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට පහසුකම් සැලසීය.

**2.5.7.4. සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය**

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / බැංකොක්:** ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් වෙසක් දිනය සඳහා වූ ජාත්‍යන්තර කවුන්සිලය විසින් පැවැත්වූ 18 වන එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම් උත්සවයේ ප්‍රධාන දේශනය 2023.06.01 දින සිදු කරන ලදී. ශ්‍රී ලංකා බෞද්ධ විහාරස්ථාන සහ ආසියාන් රටවල ප්‍රමුඛ බෞද්ධ විහාරස්ථාන අතර සම්බන්ධතා කෙරෙහි මෙහිදී අවධානය යොමු විය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / ජකර්තා:** සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ මානව සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සඳහා, තානාපති කාර්යාලය තරුණ ඉන්දුනීසියානුවන් පිරිසක් සඳහා Sahabat Sri Lanka වැඩසටහන් 2ක් සංවිධානය කළේය. තානාපතිවරයා ඉන්දුනීසියාවේ විශ්වවිද්‍යාල 7ක උපාධි අපේක්ෂකයින් සමඟ සාකච්ඡා කළේය.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / ක්වාලාලම්පූර්:** දූත මණ්ඩලය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මැලේසියාවේ ක්වාලාලම්පූර් හි පැවති වඩාත් වැදගත් සංස්කෘතික හා සංචාරක ප්‍රදර්ශනවලින් එකක් වන ජාත්‍යන්තර සංස්කෘතික හා ලෝක සමුළුවේ (ICWC) ශ්‍රී ලංකා සංචාරක, ලංකා තේ, කුළුබඩු සහ කජු ප්‍රදර්ශනය කළ අතර සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකත්වය ඉස්මතු කළේය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය/ යැන්ගුන්:** 2023 මාර්තු 05 වන දින මියන්මාර රජය විසින් ශ්‍රී ලාංකික බෞද්ධ භික්ෂූන් වහන්සේලා 6 දෙනෙකුට "අග්ග මහා පණ්ඩිත" සහ "අභිධජ මහා රත්ථ ගුරු" යන ගෞරව නාමයන් පිරිනමන ලදී. ශ්‍රී ලංකාවේ නිදහසේ 75 වන සංවත්සරය සමරමින්, 2023 පෙබරවාරි 03 වන දින රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීමෙන් අනතුරුව සංස්කෘතික සංදර්ශනයක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලාංකික බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දූත පිරිසක් 2023 අගෝස්තු 01 වන දින මියන්මාරයේ නේ පියි ටෝ හි ලොව උසම මාරවිජය බුද්ධ ප්‍රතිමාව අභිෂේක කිරීමේ උත්සවයට සහභාගී වූහ. සංස්කෘතික නියෝජිත පිරිසක් ශ්‍රී දළදා මාලිගාවේ ඇසළ පෙරහැර නැරඹීම සඳහා 2023 අගෝස්තු 25 සිට සැප්තැම්බර් 01 දක්වා ශ්‍රී ලංකාවට පැමිණීම සම්බන්ධීකරණය කරන ලදි.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / සිංගප්පූරුව:** මහ කොමසාරිස් කාර්යාලය, සිංගප්පූරුවේ ආසියානු චිත්‍රපට ලේඛනාගාරය සමඟ එක්ව, ශ්‍රී ලංකා චිත්‍රපට උළෙල පවත්වන ලද අතර, 2023 මාර්තු 10-11 දක්වා ජාත්‍යන්තරව පිළිගත් ශ්‍රී ලාංකේය චිත්‍රපට දෙකක් ප්‍රදර්ශනය කරන ලදී. ඒකාබද්ධ මුලපිරීමක් ලෙස

සිංගප්පූරුවේ ජාතික ගැලරියේදී 2023 නොවැම්බර් මස ආරම්භ වූ "නිවර්තන කලාපීය" යන මාතෘකාව යටතේ චිත්‍ර ප්‍රදර්ශනය කිරීමට මහ කොමසාරිස් කාර්යාලය සහාය විය. මෙම ප්‍රදර්ශනයේදී ශ්‍රී ලාංකික කලාකරුවන් දෙදෙනෙකුගේ (ලයනල් වෙන්ඩ්ට් සහ බාබරා සන්සෝනි) නිර්මාණ ප්‍රදර්ශනය කරන ලදී.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / හැනොයි:** දූත මණ්ඩලය, වියට්නාමයේ Bai Dinh Pagoda සමඟ සම්බන්ධීකරණයෙන්, අනුරාධපුරයෙන් පූජනීය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාකාවක් ගෙනවිත් 2023 මාර්තු 25 වන දින Bai Dinh Pagoda හි රෝපණය කළේය. දූත මණ්ඩලය 2023 මැයි 8 සිට 11 දක්වා ශ්‍රී ලංකාවට පැමිණි නාම් බෞද්ධ සංඝ (VBS) දූත පිරිසට සංචාරක පහසුකම් සලසා දුන්නේය. මෙම සංචාරය අතරතුර දූත පිරිස ශ්‍රී ලංකාවේ ඉහළ පෙළේ දේශපාලන ප්‍රභූවරුන් වන ගරු අග්‍රාමාත්‍යවරයා, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ගරු බුද්ධ ශාසන අමාත්‍යවරයා හමුවිය.

### 2.5.7.5.ආරක්ෂණ සහ ආරක්ෂක සහයෝගීතාව

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / බැංකොක්:** ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර බුද්ධි හුවමාරු ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සහ තායි සහ ශ්‍රී ලංකා බුද්ධි බලධාරීන් සමඟ මාර්ගගත සාකච්ඡාවක් සංවිධානය කරන ලෙස ඉල්ලා සිටියේය. ආරක්ෂක ආයතන අතර සහයෝගීතාව ඇති කිරීම/ අදාළ පිළිගත් ගමනාන්තයන් විසින් පිරිනමනු ලබන ශක්‍යතා සංවර්ධන වැඩසටහන් සඳහා හමුදා නිලධාරීන්ගේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම සහ 2023 සැප්තැම්බර් 04 සිට 13 දක්වා ආරක්ෂක සේවා නියෝජිත පිරිසක් විසින් අධ්‍යයන චාරිකාවක් සඳහා පහසුකම් සැලසීම සිදු කරන ලදී.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / ක්වාලාලම්පූර්:** ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා මාණ්ඩලික විද්‍යාලයේ සිසුන්ගේ මැලේසියා"විදේශ අධ්‍යයන චාරිකාව" සඳහා පහසුකම් සලසා ඇත.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / ජකර්තා:** ශ්‍රී ලංකා ආරක්ෂක සේවා සහ මාණ්ඩලික විද්‍යාලයේ (DSCSC) උපාධි අපේක්ෂකයින් 2023 සැප්තැම්බර් 04 සිට 14 දක්වා ඉන්දුනීසියාවේ 'ජාත්‍යන්තර සහයෝගීතා අධ්‍යයන චාරිකාව' සම්පූර්ණ කරන ලදී.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / මැනිලා**: ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ යෝජිත අවබෝධතා ගිවිසුම අවසන් කිරීමට පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / සිංගප්පූරුව:** 2023 මැයි 3 සිට 5 දක්වා සිංගප්පූරුවේ පැවති 13 වන ජාත්‍යන්තර සමුද්‍රීය ආරක්ෂක ප්‍රදර්ශනය සහ සමුළුව (IMDEX) Asia 2023 සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා මහතාගේ හා සාගල රත්නායක මහතාගේ සංචාරය සම්බන්ධීකරණය කරන ලදී. 2023 ජූනි 2 සිට 4 දක්වා සිංගප්පූරුවේ පැවති ආසියාවේ ප්‍රමුඛතම ආරක්ෂක සමුළුව වන 20 වැනි IISS Shangri-La Dialogue සඳහා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ජාතික ආරක්ෂක උපදේශක (NSA) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාද සහභාගී විය. Shangri-La Dialogue/NSA විසින් සිංගප්පූරු විදේශ අමාත්‍යවරයා, ඔස්ට්‍රේලියාවේ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේකම්, එක්සත් ජනපද ඉන්දු පැසිෆික් විධානයේ ආඥාපති, ඉන්දියාවේ නියෝජ්‍ය ජාතික ආරක්ෂක උපදේශක, සභාපති, ඒකාබද්ධ පකිස්ථාන සන්නද්ධ හමුදාවන්හි මාණ්ඩලික ප්‍රධානී කමිටුව සහ ICRC හි ආසියා සහ පැසිෆික් කලාපීය අධ්‍යක්ෂ හමු විය.

### 2.5.7.6. මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / බැංකොක්:** තායිලන්තයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය ස්ථිර ලේකම් බුසාදී සන්ටිපිටක මහතා විසින් දූත මණ්ඩලයේ නව වෙබ් අඩවිය 2023 දෙසැම්බර් 06 වන දින දියත් කරන ලදී.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / ජකර්තා:** දූත මණ්ඩලය, ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ සහයෝගයෙන්, ඉන්දුනීසියානු තරුණයින් සඳහා ඉෆ්තාර් සැමරුම, වෙසක් සහ පොසොන් සැමරුම්, පැදුරු සාදය සහ සහබාත් ශ්‍රී ලංකා වැඩසටහන සංවිධානය කළේය.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / මැනිලා:** තානාපති කාර්යාලය ශ්‍රී ලංකාවේ 75 වැනි නිදහස් දිනය 2023 පෙබරවාරි මස තානාපති නිල නිවසේ දී ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගීත්වයෙන් සමරන ලදී.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / සිංගප්පූරුව:** ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 50 වැනි සංවත්සරය සැමරීම සඳහා සිංගප්පූරු මහ කොමසාරිස් කාර්යාලය, සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ (NUS) දකුණු ආසියානු අධ්‍යයන ආයතනය (ISAS) සමඟ එක්ව දියත් කර ඇති ඒකාබද්ධ පර්යේෂණ ප්‍රකාශනය"50 වසරක සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව" 2023 සැප්තැම්බර් 29 වන දින සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයේදී (UNS) රාජ්‍ය තාන්ත්‍රික බළකාය, විද්වතුන් සහ ශ්‍රී ලාංකික විදේශගත ප්‍රජාව සහභාගීත්වයෙන් එළි දැක්විණ.

### 2.5.7.7. විද්‍යා හා තාක්ෂණ රාජ්‍යතාන්ත්‍රිකභාවය

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / බැංකොක්:** 2023.04.18 වන දින ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය සඳහා ආසියානු තාක්ෂණ ආයතනයේදී නවීන මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන අතරතුර AIT සභාපති මහාචාර්ය කසුඕ යමාමොටෝ සහ 2023 පෙබරවාරි මස ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු අලි සබ්රි යන මහත්වරුන්ගේ හමුව සිදුවිය. Chulabhorn උපාධි ආයතනය ශ්‍රී ලංකාවට ශිෂ්‍යත්ව 05 ක් පිරිනමා ඇත.

**ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය / මැනිලා:** පිලිපීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් Rotary Club of Makati Circle of Friends, Rotary Club of Colombo- Reconnections සහ CIE Global Colleges Inc එක්ව සංවිධානය කරන ලද තොරතුරු තාක්ෂණ ශිෂ්‍යත්ව වැඩසටහන මගින් ලාංකිකයන් පන්සියයක් (500) සඳහා පහසුකම් සලසා ඇත. පළමු සිසුන් කණ්ඩායම 2023 මාර්තු 6 වන දින ඔන්ලයින් ICT පාඨමාලාව ආරම්භ කරන ලදී.

**ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලය / සිංගප්පූරුව:** 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ තාක්ෂණික සහයෝගිතා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සම්බන්ධීකරණයෙන්, දේශගුණික විපර්යාස හමුවේ සංවර්ධනය, තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණය, ස්මාර්ට් නාගරීකරණය, ආබාධ සහිත පුද්ගලයින් සවිබල ගැන්වීම, නාගරික සෞඛ්‍ය ආරක්ෂාව, හරිත ආර්ථිකය, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සහ ව්‍යාපෘති මූල්‍ය පිළිබඳ ශිෂ්‍යත්ව/පුහුණු ව්‍යාපෘති ලබා ගැනීමට දූත මණ්ඩලය සමත් විය.

## 2.6. කාර්ය සාධන දළ විශ්ලේෂණය: මෙහෙයුම් අංශ

### 2.6.1. කොන්සියුලර් කටයුතු අංශය

කොන්සියුලර් කටයුතු අංශය 1981 අංක 04 දරන කොන්සියුලර් කාර්ය පනතට සහ 2006 අංක 18 දරන පනතේ පසු සංශෝධනවලට අනුකූලව මහජනතාවට සේවා සපයයි. මෙම අංශය යාපනයේ පිහිටි ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල (RCOs) සමඟ සම්බන්ධීකරණය කර සහයෝගීව කටයුතු කරයි. ඒ අනුව මාතර, මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල මෙන්ම විදේශයන්හි සියලුම ශ්‍රී ලංකා තානාපති කාර්යාල එකිනෙකට සම්බන්ධ වේ. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි මහජනතාවට සපයනු ලබන කොන්සියුලර් සේවාවන් ප්‍රධාන කොටස් පහකට ව්‍යුහගත කර ඇත: ලේඛන සත්‍යාපනය, නැවත මෙරටට ගෙන්වා ගැනීම, විදේශයන්හි වන්දි සම්බන්ධීකරණය, විදේශයන්හි සිදුවන මරණ සම්බන්ධීකරණය සහ විවිධ කොන්සියුලර්

කටයුතු.

කොන්සියුලර් අංශය සහ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල (RCOs) අනුරූප කාලපරිච්ඡේදය තුළ අයදුම්කරුවන් 277,308 සඳහා ලේඛන 615,352 සත්‍යාපනය කිරීමෙන් රුපියල් 673,391,000.00 ක මුළු ආදායම උත්පාදනය කරන ලදී. මෙම ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල අතර, යාපනය ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය අයදුම්කරුවන් 15,798 ක් සඳහා ලේඛන 31,977ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 38,946,600.00ක් උත්පාදනය කරන ලදී. මාතර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය අයදුම්කරුවන් 16,094ක් සඳහා ලියකියවිලි 23,533 ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 27,079,800.00ක් උත්පාදනය කර ඇත. මහනුවර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය අයදුම්කරුවන් 16,026ක් සඳහා ලියකියවිලි 25,102ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 29,353,800.00ක් උත්පාදනය කළ අතර, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය අයදුම්කරුවන් 15,022ක් සඳහා ලේඛන 15,022ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 17,485,200.00ක් උපයා ගන්නා ලදී. තවද, කුරුණෑගල ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය අයදුම්කරුවන් 20,570ක් සඳහා ලේඛන 32,872ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 38,674,800.00ක් රැස් කළේය.

කොන්සියුලර් කටයුතු අංශය, විභාග දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2023 අගෝස්තු මස සිට අ.පො.ස. සා.පෙළ සහ අ.පො.ස උ.පෙළ සහතික සඳහා මාර්ගගත සත්‍යාපන ක්‍රමයක් හඳුන්වා දී ඇත. මෙම නව ක්‍රමය මඟින් අයදුම්කරුවන්ට ඔවුන්ගේ අ.පො.ස. සා.පෙළ/ උ.පෙළ සහතික කොළඹ කොන්සියුලර් අංශයට පැමිණීමෙන් තොරව සත්‍යාපනය කර ගත හැක. මෙම මුලපිරීම කොන්සියුලර් අංශය විසින් මහජනතාවට ලබා දෙන ලේඛන සත්‍යාපනය කිරීමේ සේවාවන් ඩිජිටල්කරණය කිරීමේ වැදගත් පියවරක් සනිටුහන් කරයි. අ.පො.ස. සා/පෙළ සහ උ/පෙළ සහතික දිනපතා සත්‍යාපනය කරන ලද ලියකියවිලිවලින් බහුතරයක් වන අතර එය මුළු සංඛ්‍යාවෙන් 30-40% පමණ වේ. 2023 දෙසැම්බර් 31 වන දින වන විට සහතිකපත් 23,000කට අධික ප්‍රමාණයක් අංශය විසින් සත්‍යාපනය කර ඇත.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, ප්‍රාදේශීය විශ්වවිද්‍යාල ආදි අනෙකුත් ප්‍රධාන රාජ්‍ය ආයතන සමඟ පද්ධතිය ඒකාබද්ධ කිරීම සඳහා කොන්සියුලර් අංශය විසින් ඉලෙක්ට්‍රොනික ලේඛන සත්‍යාපන පද්ධතිය (e-DAS) තවදුරටත් වැඩිදියුණු කිරීම් ආරම්භ කරන ලදී. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු අංශය සමඟ ඒකාබද්ධ වීම තුලින් e-DAS හරහා උප්පැන්න, මරණ සහ විවාහ වාර්තා සඳහා මාර්ගගත සත්‍යාපනය සක්‍රීය කිරීම සඳහා ආරම්භ කර ඇති අතර, 2024 අප්‍රේල් මැද වන විට සම්පූර්ණ කිරීමට නියමිතයි. මෙම ප්‍රධාන රජයේ දෙපාර්තමේන්තු සමඟ ඒකාබද්ධ වීම සම්පූර්ණ වූ පසු, එය අංශය විසින් දෛනිකව සත්‍යාපනය කරන ලද ලේඛනවලින් 80% කට වැඩි ප්‍රමාණයක් මාර්ගගතව සැකසීමට අපේක්ෂා කෙරේ.

අමාත්‍ය මණ්ඩලය අනුමැතිය මත අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශය බත්තරමුල්ල, සුහුරුපාය වෙත ගෙන යන ලදී.

2023 වසර තුළ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ මරණ 635ක් වාර්තාවිය. මියගිය පුද්ගලයින් 369 දෙනෙකුගේ දේහයන් නැවත මෙරටට ගෙන්වා ගැනීමට මෙම අංශය සහාය වූ අතර, 205 දෙනෙකු විදේශ රටවල තැන්පත් කර ඇති අතර, 60 දෙනෙකු විදේශයන්හි ආදාහනය කරන ලදී. මිය ගිය ශ්‍රී ලාංකිකයන් විසින් කරන ලද කොන්සියුලර් මරණ සහතික ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම් 232 ක් මරණ අංශය විසින් සිදු කරන ලදී. එසේම, මියගිය ශ්‍රී ලාංකිකයන් 35 දෙනෙකුගේ පෞද්ගලික බඩු බාහිරාදිය අදාළ කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ගෙන්වා ඥාතීන් වෙත භාර දෙන ලදී.

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, වන්දි අංශය විසින් දළ වශයෙන් රුපියල් මිලියන හාරසිය හැට එකක වන්දි ලැබීම් සම්බන්ධීකරණය කරන ලදී. (මහභාරකාර අරමුදල හරහා රුපියල් 421,987,655.54 ලබා දීම හා සේවායෝජකයාගෙන් ඍජු ගෙවීම: රුපියල්. 39,348,226.54). විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා වන්දි මුදල් සහ වෙනත් විවිධ හිමිකම් ලබා දීම ඔවුන්ගේ වියෝවීම්, අනතුරු, තුවාල වීම් හා විශ්‍රාම

ප්‍රතිලාභ ලෙස අදාළ ක්‍රියා පටිපාටි සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම වන්දි මුදල් පවුලේ සාමාජිකයින් 138 දෙනෙකු සහ වින්දිතයින් අතර බෙදා දෙන ලදී. වැඩිම මුදල, රුපියල්. 6,217,330,206.00 (කුවේට් ඩිනාර් 58,455.053) කුවේට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා ලැබිණි.

තවද, අදාළ කාලපරිච්ඡේදය තුළදී, අංශයට නව වන්දි ඉල්ලීම් 358ක් ලැබී ඇති අතර, ඒවා සියල්ල සැකසීම සඳහා විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත යොමු කර ඇත. ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කාර්යාල මගින් වන්දි නඩු කළමනාකරණය පිළිබඳ විස්තර කෙරෙන සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) ද අංශය විසින් සකස් කර ඇත.

සමාලෝචන කාලසීමාව තුළ, නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අංශය විසින් බන්ධනාගාර නඩු 219 ක් සහ සම්මත නඩු 506 කින් සමන්විත ආපසු ගෙන්වා ගැනීමේ ඉල්ලීම් 725 ක් හසුරුවන ලදී. විවිධ හේතූන් මත විදේශ රටවල අතරමංව සිටි ශ්‍රී ලාංකිකයන් 1332 දෙනෙකු නැවත ගෙන්වා ගැනීමට මෙම අංශය සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීය. කලාපීය ව්‍යාප්තිය අනුව, මැදපෙරදිගින් ශ්‍රී ලාංකිකයන් 738 ක්, ආසියානු රටවලින් 256 ක්, යුරෝපයෙන් 154 ක් සහ අප්‍රිකානු කලාපයෙන් 28 ක් ආපසු ගෙන්වා ගන්නා ලදී. තවද, අදාළ කාලසීමාව තුළ BIOT වෙතින් 27 දෙනෙකු සහ Re-Union Island වෙතින් 129 දෙනෙකු ආපසු ගෙන්වා ගන්නා ලදී.

සමාලෝචිත කාලසීමාව තුළ අතරමං වූ ධීවර යාත්‍රා සම්බන්ධ නඩු 48ක් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අංශය විසින් හසුරුවන ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින් 163 දෙනෙකු සහ ධීවර යාත්‍රා 25 ක් ද එම අංශය විසින් ආපසු ගෙන්වා ගන්නා ලදී. විදේශ රටවල රඳවා සිටින හෝ සිරගත කර සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ යහපැවැත්ම සහතික කිරීමට සහ කොන්සියුලර් ආධාර සැපයීමට මඟ පෙන්වීම සඳහා ප්‍රමිති මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) ද අංශය විසින් සකස් කරන ලදී.

සමාලෝචන කාලසීමාව තුළදී, ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ධීවර කටයුතු පිළිබඳ විශේෂ කාර්ය බළකායේ නියමිත රැස්වීම්වලට මෙම අංශය නිතිපතා සහභාගි වූ අතර, ශ්‍රී ලාංකික ධීවරයන් සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් ක්‍රියාකාරීව කටයුතු කළේය.

2022 අප්‍රේල් 1 සිට 2023 ජනවාරි 21 දක්වා කාලසීමාව ආවරණය වන පරිදි 2023 එක්සත් ජනපද පුද්ගල ජාවාරම් පිළිබඳ අතුරු වාර්තාව සකස් කිරීම සඳහා තොරතුරු සම්පාදනය කරමින් ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකාය (NAHTTF) සමඟ කටයුතු කළේය.

කොන්සියුලර් අංශය විසින් ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර කොන්සියුලර් කටයුතු සඳහා වූ ඒකාබද්ධ කමිටුවේ පළමු සැසිවාරය 2023 පෙබරවාරි 22 දින අමාත්‍යාංශයේදී සංවිධානය කරන ලදී.

අනුරූප කාලසීමාව තුළ, ශ්‍රී ලංකාවෙන් පිටත උපන් පුද්ගලයින් සඳහා මුල් උප්පැන්න සහතික 534ක් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. තවද, පුරවැසි සහතික 23ක් නිකුත් කිරීමට පහසුකම් සැලසූ අතර විදේශ ගමන් බලපත්‍ර සම්බන්ධ කරුණු 207ක් හසුරුවා ඇත. විදේශ රටවල පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ පොලිස් නිෂ්කාශන සහතික 186ක් ලබා ගැනීම සම්බන්ධීකරණය කිරීම ද මෙම අංශය මගින් සිදු කරන ලදී. තවද, එය ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කාර්යාල සමඟ සම්බන්ධීකරණයෙන් රජයේ නිලධාරීන්ගේ විදේශීය උපාධි සහතික 100 ක් සත්‍යාපනය කළේය. අදාළ කාල සීමාව තුළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කාර්යාල මගින් කොන්සියුලර් ජංගම සේවා 32 ක් පැවැත්වීමට ද නිර්දේශ කර ඇත. තවද, අදාළ කාලසීමාව තුළ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකාවේ සංචාරක ලියකියවිලි සම්බන්ධ නඩු 169 ක් මෙම අංශය විසින් හසුරුවන ලදී.

ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට අවශ්‍ය පරිදි විවිධ පරීක්ෂණ සහ විමර්ශන සඳහා තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල සමඟ ද මෙම අංශය සම්බන්ධීකරණය කරයි. තවද,

එය ශ්‍රී ලංකාවේ තම පවුල් සමඟ සම්බන්ධතා අහිමි වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සිටින ස්ථාන සොයා ගැනීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය කරන ලදී. මෙම අංශය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) සමඟ එක්ව ශ්‍රම සම්බන්ධ ගැටළු විසඳීම සඳහා ද දායක විය.

2023 මැයි 26 සිට 27 දක්වා තමිල්නාඩුවේ සිට පැමිණ සිටින ත්‍රිකුණාමලයේ සහ මඩකලපුවේ පදිංචි ශ්‍රී ලාංකිකයන් වෙත කොන්සියුලර් සේවා සැපයීම සඳහා, අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ජංගම සේවා දෙකකට කොන්සියුලර් කටයුතු අංශය සහභාගී විය. යාපනයේ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය 2023 ජූලි 15-16 දක්වා යාපනයේ මුට්‍රවේලි හි පැවති GLOCAL Fair 2023 සඳහා දායකත්වය ලබා දෙන ලදී.

### 2.6.2. සාමාන්‍ය පරිපාලන අංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන අංශය පරිපාලන ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සියලුම මෙහෙයුම් සහ නඩත්තු කටයුතු, මානව සම්පත් සැලසුම් කිරීම සහ දීප ව්‍යාප්ත සේවාවල සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, ප්‍රාථමික සේවා, දෙපාර්තමේන්තු සේවා යන පුළුල් ක්ෂේත්‍රයන්හි වගකීම දරයි. එමෙන්ම, විදේශ කටයුතු ලේකම්වරයාගේ මගපෙන්වීම මත අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සහ පාර්ලිමේන්තු කාරක සභා සහ උපදේශක කාරක සභාවලට පිළිතුරු සකස් කිරීම, පරිපාලන අංශය විසින් සිදු කරනු ලබයි.

සාමාන්‍ය පරිපාලන අංශය (GAD) විසින් 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව සඳහා සාමාන්‍ය රාජකාරිවලට අමතරව සිදු කරන ලද විශේෂිත කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත පරිදි වේ;

**මානව සම්පත් කළමනාකරණය:** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සංවර්ධන නිලධාරී සේවක සංඛ්‍යාව තනතුරු 60 කින් වැඩි කර ගන්නා ලදී. මෙම අමාත්‍යාංශයේ සන්ධාන නිලධාරීන් සඳහා හදිසි සේවා අවශ්‍යතා සපුරාලීමට විධායක සහකාර (සන්ධාන) MN4 සඳහා තනතුරු 12 ක ආයතනික සේවක සංඛ්‍යාවක් නිර්මාණය කරන ලදී. තවද, සන්ධාන සහකාර (MN1) තනතුර සඳහා සේවක සංඛ්‍යාව 05 කින් වැඩි කරන ලදී.

ප්‍රමාණවත් තරම් ද්විතීයික මට්ටමේ කාර්ය මණ්ඩලයක් සමඟින් අංශවල රාජකාරි වඩාත් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා, සුදුසුකම් සමාලෝචන ක්‍රියාවලියක් මගින් අමාත්‍යාංශයේ සේවය කිරීමට සංවර්ධන නිලධාරී සේවයේ දක්ෂ නිලධාරීන් හඳුනාගෙන එම හඳුනා ගත් නිලධාරීන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ගේ සහය ඇතිව මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කිරීමට කටයුතු යොදන ලදී.

නීති උපදේශක සහ නීති නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට සංශෝධන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත.

අමාත්‍යාංශයේ මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා සේවක කාර්ය සාධනය ඉහළ නැංවීම සහ ඉංග්‍රීසි භාෂාව/ කථන ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. රියදුරු සේවයේ නිලධාරීන්ට ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සහ අපේක්ෂිත සේවාවන් වඩාත් වෘත්තීය මට්ටමින් ලබා දීම පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා ප්‍රභූ සේවා සහ අදාළ සන්ධාන පිළිබඳ නේවාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

**තොරතුරු තාක්ෂණයේ වර්ධනයන්:** වැඩි සේවා ලාභීන් පිරිසකට පහසුකම් සැපයීමේ අරමුණින් කොන්සියුලර් අංශයේ ඉලෙක්ට්‍රොනික ලේඛන සහතික කිරීමේ පද්ධති කවුන්ටර පුළුල් කිරීම.

**කොන්සියුලර්:** තොරතුරු තාක්ෂණ අංශය අභ්‍යන්තර අවශ්‍යතා සඳහා Google Workspace විසඳුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

අභ්‍යන්තර අවශ්‍යතා සඳහා අභ්‍යන්තර විවෘත මූලාශ්‍ර විසඳුම් යෙදවීමට තොරතුරු තාක්ෂණ අංශය මූලිකත්වය ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වත්කම් කළමනාකරණ පද්ධතිය, විද්‍යුත් තැපැල උපස්ථ විසඳුම සහ ලේඛන හඳුනාගැනීමේ විසඳුම ක්‍රියාත්මකවේ. තොරතුරු තාක්ෂණ අංශය නිරන්තරයෙන් ඉහළ මට්ටමේ මාර්ගගත සහ දෙමුහුන් රැස්වීම් සඳහා තාක්ෂණික සහාය ලබා දී ඇත. 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ, අමාත්‍යාංශය තුළ පවත්වන ලද මාර්ගගත රැස්වීම් 300කට අධික සංඛ්‍යාවක් සඳහා මෙම අංශය තාක්ෂණික සහාය ලබා දුන්නේය.

**පාර්ලිමේන්තු කටයුතු:** කැබිනට් පත්‍රිකා 67ක් ඉදිරිපත් කිරීම සහ ගරු අමාත්‍ය මණ්ඩල සංදේශ රැසක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලය සමඟ කාර්යක්ෂමව සම්බන්ධීකරණය කරන ලදී. පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සහ අමාත්‍ය උපදේශක කාරක සභාව සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා ද සම්බන්ධීකරණය කරන ලදී.

**ප්‍රසම්පාදනය සහ නඩත්තුව:** අදාළ රෙගුලාසිවලට අනුව සියලුම ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කර ඇති අතර, එමඟින් මුළු ප්‍රසම්පාදන ප්‍රමාණය රු. මිලියන 12.5ක් ශ්‍රී ලංකා දූත මණ්ඩලවල අවශ්‍යතා සඳහා වෙන් කර ඇති අතර තවත් රුපියල් මිලියන 94.2 ක් 2023 දෙසැම්බර් 31 දක්වා දේශීය අවශ්‍යතා මිලදී ගැනීම් සඳහා වැය කරන ලදි.

ජනරජ ගොඩනැගිල්ලේ පුරාවිද්‍යාත්මක වටිනාකම සහ අලංකාරය ආරක්ෂා කරමින් එහි විධිමත් නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරන ලද අතර, ඒ සඳහා 2023.12.31 දක්වා රුපියල් මිලියන 7.5ක් වැය විය. තවද, අමාත්‍ය මණ්ඩල කාර්යාලය භාවිතා කරන පරිශ්‍රය ද මෙම අමාත්‍යාංශයට පවරා දුන් අතර, පළමු මහලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු. මිලියන 6ක් වැය විය.

තවද, සෙලින්කෝ ගොඩනැගිල්ලේ 7 වන මහලේ පිහිටි කාර්යාල අවකාශය රුපියල් මිලියන 100 ක මුදලකට ප්‍රතිසංස්කරණය කරන ලදී.

මෙම වසරේ IORA සංගමයේ සභාපතිත්වය ශ්‍රී ලංකාවට පවරා ඇති බැවින් IORA සංගමය සඳහා ලේකම් කාර්යාලය පිහිටුවීමට සහ ඉදිරි වසර සඳහා එහි කටයුතු සම්බන්ධීකරණය කිරීමට රුපියල් මිලියන 9.5 ක් වෙන් කර ඇත.

මීට අමතරව, නිල නිවාස 27ක අදාළ අලුත්වැඩියා කිරීම් සඳහා රු. මිලියන 2.9ක් වැය විය.
අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කොන්සියුලර් කටයුතු අංශය සුහුරුපාය ගොඩනැගිල්ල වෙත ගෙන යාමේ ව්‍යාපෘතියේ පිරිසැලසුම් සකස් කිරීමට මූලික පියවර ගන්නා ලදී.

**ප්‍රවාහන සේවා:** වාහන වාර්තා සහ වාහන ආශ්‍රිත නඩත්තුව පවත්වාගෙන යාම සඳහා වත්කම් කළමනාකරණ පද්ධතිය (AMS) යටතේ සංරචකයක් සංවර්ධනය කර ඇත. සැලකිය හැකි රියදුරන් සංඛ්‍යාවක් සමඟින් වාහන 85 කින් යුත් රථ සමූහයක් කාර්යක්ෂමව භාවිතා කරන ලදී. වර්තමාන මූල්‍ය බාධාවන් සැලකිල්ලට ගනිමින්, නව වාහන මිලදී ගැනීම වෙනුවට දැනට පවතින වාහන සමූහය කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට අමාත්‍යාංශය සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.

**භාෂා පරිවර්තන ඒකකය:** භාෂා පරිවර්තන ඒකකය මගින් මාධ්‍ය නිවේදන, අවබෝධතා ගිවිසුම්, කැබිනට් සංදේශ සහ පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධ අනෙකුත් ලේඛන, ගැසට් නිවේදන, වාර්ෂික වාර්තා සහ අමාත්‍යාංශයේ විවිධ අංශවල ලිපි ඇතුළු තාක්ෂණික සහ නීතිමය නිල ලේඛන පරිවර්තනය කරයි.

**2.6.3.** **මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය**

මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයේ ප්‍රධාන වගකීම වන්නේ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට අවශ්‍ය ප්‍රමාණවත් මානව සම්පත් පහසුකම් නියමිත වේලාවට ලබා දීම සහතික කිරීමයි. තවද, විදේශයන්හි එක් එක් ශ්‍රී ලංකා දූත මණ්ඩලවල මානව සම්පත් සහ ඒ ආශ්‍රිත පරිපාලන අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා විදේශයන්හි සිටින සියලුම ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත අවශ්‍ය ප්‍රතිපත්තිමය උපදෙස් ලබාදීමට මෙම අංශයට බලය පැවරේ.

ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල හැට එකක - (61) විදේශ තනතුරුවල සංයුතිය පහත පරිදි වේ;

• මහ කොමසාරිස් කාර්යාල - 12
• තානාපති කාර්යාල - 35
• එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූත මණ්ඩල - 2
• නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල - 1
• කොන්සල් ජනරාල් කාර්යාල - 10
• නියෝජිත කාර්යාල - 1

**2.6.3.1.** **සැලකිය යුතු ජයග්‍රහණ**

**රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල පිහිටුවීම:** රුමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2023.09.03 දින පිහිටුවන ලදී. වෙලින්ටන්/නවසීලන්තය සහ ඇස්තානා/කසකස්තානය යන රටවල නේවාසික ශ්‍රී ලංකා දූත මණ්ඩල පිහිටුවීමට සහ බැග්ඩෑඩ්/ඉරාකය, නිකොසියා/සයිප්‍රසය සහ ෆ්‍රැන්ක්ෆර්ට්/ජර්මනි යන රටවල දූත මණ්ඩල/ කාර්යාල නැවත විවෘත කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

**නව දූත මණ්ඩල / කාර්යාල ප්‍රධානීන් පත් කිරීම:** විදේශ ලේකම්වරයාගේ නියෝග මත ඕස්ට්‍රේලියාවේ දූත මණ්ඩල ප්‍රධානීන් ඇතුළුව විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා දූත මණ්ඩල / කාර්යාල ප්‍රධානීන් විසිදෙදෙනකු (22) ඔස්ට්‍රියාව, බහරේනය, බංගලාදේශය, ඉතියෝපියාව, ප්‍රංශය, ජර්මනිය, ඉන්දුනීසියාව, ඊශ්‍රායලය, ඉතාලිය (මිලාන්), ජෝර්දානය, කුවේට්, ලෙබනනය, නේපාලය, නවදිල්ලි, පකිස්ථානය, පිලිපීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය (අබුඩාබි සහ ඩුබායි), එක්සත් රාජධානිය, වියට්නාමය සහ ස්විට්සර්ලන්තය (ජිනීවා) සඳහා පත් කිරීමට කටයුතු කර පහසුකම් සැලසීය.

ඔස්ට්‍රියාව, බංග්ලාදේශය, බහරේනය, බෙල්ජියම, චීනය, ඉන්දියාව, පකිස්ථානය, ඊශ්‍රායලය, කුවේට්, සිංගප්පූරුව සහ දකුණු අප්‍රිකාව යන රටවල තානාපති/මහ කොමසාරිස්/කොන්සල් ජනරාල් ඇතුළු දූත මණ්ඩල ප්‍රධානීන් එකොළොස් (11) දෙනෙකු සඳහා සිය ධූරකාල අවසාන කර ලංකාවට පැමිණීම සඳහා සහයෝගය ලබාදෙන ලදී.

**විදේශ සේවා නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්:** ශ්‍රී ලංකා විදේශ සේවයේ (SLFS) නිලධාරීන් දාහතක් (17) විදේශයන්හි තෝරාගත් ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත ශ්‍රී ලංකා විදේශ සේවයේ මාරුවීම් චක්‍ර දෙකක් (02) යටතේ, එනම් 2022/2023 ශ්‍රී ලංකා විදේශ සේවයේ මාරුවීම් මණ්ඩලය යටතේ මාරු කරන ලදී. මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය මගින් වෛද්‍ය සහ ආරක්ෂක නිෂ්කාශන ලබාගැනීම ඇතුළු විශේෂයෙන්ම ඔවුන්ගේ ගෘහ සහායකයන් සම්බන්ධ කරුණු, ස්ථිර සහ ප්‍රාදේශීය නිලයන්, තනතුරේ වැටුප් සහ දීමනා ආදිය සඳහා පහසුකම් සලසා ඇත.

**විදේශ සේවා නිලධාරීන් උසස් කිරීම සහ විශ්‍රාම ගැන්වීම:** මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය විසින් ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් විසි දෙනෙකු (20) මීළඟ ශ්‍රේණියට උසස් කිරීමට අදාළව අවශ්‍ය ක්‍රියා පටිපාටි මූලිකාංග සකස් කරන ලදී.

තවද, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් හය දෙනෙකුගේ (06) විශ්‍රාම ගැන්වීම් ක්‍රියාවලියට අදාළව අවශ්‍ය විධිවිධාන සිදු කර ඇත.

**ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම:** විදේශ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර ඇති විශ්‍රාමික ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ හිඟ වැටුප් ගෙවීමට අදාළ අයදුම්පත් අටක් (08) සකස් කර ඇත.

**රාජ්‍ය තාන්ත්‍රික තනතුරු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන රාජ්‍ය අංශයේ නිලධාරීන් පත් කිරීම:** රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන නිලධාරීන් විසිහතරක් (24): වාණිජ දෙපාර්තමේන්තුව නියෝජනය කරන (නිලධාරීන් 10), ආරක්ෂක අමාත්‍යාංශයේ (නිලධාරීන් 08), කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් (01), රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් (SLAS) නිලධාරීන් දෙදෙනෙක් (02), ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් (SLBFE) නිලධාරීන් දෙදෙනෙක් (02), ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් එක් නිලධාරියෙක් (01) විදේශයන්හි තෝරාගත් ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත පත් කර ඇත.

**අතිරේක ලේකම්වරුන් පත් කිරීම (SLFS):** සමාලෝචිත කාල සීමාව තුළ විදේශ කටයුතු අමාත්‍යාංශයට වැඩබලන අතිරේක ලේකම්වරුන් හය (06) දෙනෙකු පත් කිරීමට මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය කාලෝචිත පියවර ගන්නා ලදී.

**විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල තාක්ෂණික සහ පරිපාලන කාර්ය මණ්ඩලය:** උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින් කරන ලද මැදිහත්වීම් රාශියක් සැලකිල්ලට ගනිමින්, අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා නිලධාරීන් (MSO) සහ පුද්ගලික සහකාර සාමාජිකයින් විසින් කරන ලද අභියාචනයන් විසඳීමට මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය මූලිකත්වය ගන්නා ලදී. මීට පෙර විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා සේවය කළ කළමනාකරණ සේවා නිලධාරී (MSO) පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා එළඹෙන විවෘත තරඟ විභාගයට පෙනී සිටීමට නැවත වරක් අවසර ඉල්ලා සිටියි. ඒ අනුව එම යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව සම්පාදනය වන කටයුතු අවසන් අදියරේ පවතී.

**දේශීය කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් (HRC) කාර්ය මණ්ඩලය පත් කිරීම:** සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ විදේශයන්හි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත රියදුරන් දෙදෙනෙකු (02) සහ එක් (01) කාර්යාල කාර්ය සහයකයෙකු පත් කිරීම සඳහා මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය සම්බන්ධීකරණය සහ පහසුකම් සපයන ලදී.

එසේම, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල දේශීය කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් (HRC) සේවක කාණ්ඩයේ රියදුරන් සහ කාර්යාල කාර්ය සහයක පුරප්පාඩු පිරවීම සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලියක් සිදු කර ඇත. ඒ අනුව විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්යාල කාර්ය සහයක පුරප්පාඩු නවයක් (09) සහ රියදුරු තනතුරු පුරප්පාඩු දෙකක් (02) පුරවන ලදී.

**නිල සංචාර සඳහා පහසුකම් සැලසීම:** මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය 2023 දී නිල සංචාර 165 ක් සම්බන්ධීකරණය කර පහසුකම් සලසා ඇත.

**රාජ්‍ය වියදම් පාලනය කිරීම:** විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල කටයුතු කළමනාකරණය කිරීම සඳහා හඳුන්වා දුන් අමාත්‍යාංශයේ විවිධ මුලපිරීම් සඳහා මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය ද සහභාගී විය.

ඒ අනුව, විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය අනියම් පදනම මත දේශීයව බඳවා ගැනීම් සඳහා විශේෂ අවසර/අනුමත ලබා දෙන ලදී.

තවද, වසරේ පළමු භාගය සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුයුක්ත සියලුම රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා නියෝජිත දීමනාව (RA) අත්හිටුවන ලදී. කෙසේ වෙතත්, නියෝජන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, නියෝජිත දීමනාව ප්‍රතිෂ්ඨාපනය කරන ලදී.

**වාර්තා කිරීම සහ අධීක්ෂණ වගකීම්:** විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්ය මණ්ඩලය සහ දීමනා ගෙවීම සම්බන්ධ කරුණු පිළිබඳ වාර්තා සකස් කිරීම හා වියදම් පිළිබඳ කිසියම් පැහැදිලි කිරීමක් සමඟින් මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය නිවැරදිව හා කාලෝචිත ලෙස සියලු අවශ්‍යතා සපුරාලීමට සෑම උත්සාහයක්ම ගත්තේය.

ජනාධිපති ලේකම් කාර්යාලය, විගණකාධිපති, මහලේකම්/පාර්ලිමේන්තුව, ගරු නීතිපතිවරයා සහ ජනාධිපති කොමිෂන් සභා ඇතුළු ආයතනවල විමසීම් සඳහා ද අංශය පිළිතුරු සපයා ඇත.

තොරතුරු දැනගැනීමේ පනතට අදාල විමසීම්, පාර්ලිමේන්තු ප්‍රශ්න සහ විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුයුක්ත රාජ්‍ය තාන්ත්‍රික සහ රාජ්‍යතාන්ත්‍රික නොවන නිලධාරීන්ට එරෙහි පැමිණිලි සඳහා ප්‍රතිචාර අදාළ බලධාරීන් සහ දූත මණ්ඩල ප්‍රධානීන්/ කාර්යාල ප්‍රධානීන් සමඟ කාලෝචිත හා රහසිගතව සම්බන්ධීකරණය කරන ලදී.

මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයේ විෂය පථයට අයත් සියලුම අදාළ කරුණු සහ දැනට ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් විදේශ කටයුතු ලේකම්ගේ නියෝග අනුව ස්ථාපිත රෙගුලාසි/ක්‍රියා පටිපාටිවලට අනුකූලව සහ අදාළ බලධාරීන්ගේ කැමැත්ත/නිරීක්ෂණ/නිර්දේශ අනුව සිදු කරන ලදී.

සෑම අධීක්ෂණ නිලධාරියෙක්ම අදාළ බලධාරීන්/පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර ප්‍රමාණවත් ලෙස කරුණු විසඳීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගනිමින් විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ඵලදායී මානව සම්පත් කළමනාකරණය සහතික කිරීම සඳහා මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය යටතේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිතිපතා ඇගයීමට ලක් කළේය.

### 2.6.4. අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය

මෙම අංශයේ ප්‍රධාන වගකීම වන්නේ අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාල සහ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති අනෙකුත් ආයතනවල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය අධීක්ෂණය කිරීම සහ ඇගයීම සහ සමස්ත කාර්ය සාධනය සහ අනුකූලතාවය පිළිබඳ මාර්ගෝපදේශනය සමඟ උපාය මාර්ගික අනුකූලතා ලබා දීමයි.

- අංශය විසින් අමාත්‍යාංශය, එහි විෂය පථය යටතේ ඇති අනෙකුත් ආයතන, ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල සහ විදේශයන්හි දූත මණ්ඩල/තනතුරු සඳහා විගණන විමසුම් 20ක් ඉදිරිපත් කර ඇත.
- 2019 මාර්තු 6 වැනි දින පැවති COPA රැස්වීමේ දී සාකච්ඡා කරන ලද කරුණු සම්බන්ධයෙන් අදාළ අංශ සහ පක්ෂ සම්බන්ධීකරණයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන ඇත.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා කටයුතු කරන ලද අතර, එහි තීරණ සඳහා පසු විපරම් කටයුතු සිදු කරන ලදී.
- සාමාන්‍ය විගණන විමසුම් 16 න් 15 කට පිළිතුරු සම්පාදනය කිරීම සඳහා සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශය නියෝජනය කරමින් රෝම දූත මණ්ඩලයට අදාළ මහාධිකරණ නඩු දෙකක් සඳහා තොරතුරු සැපයීම.

### 2.6.5. නීති අංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශයේ මූලික කාර්යය වන්නේ අමාත්‍යාංශයේ ලේකම් හරහා අමාත්‍යවරයාට, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනෙකුත් අංශවලට, විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවලට මෙන්ම විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට ජාත්‍යන්තර නීතිය සම්බන්ධ නීති උපදෙස් ලබා දීමයි. නීති අංශය සතුව ශ්‍රී ලංකා රජයේ ගිවිසුම් පිළිබඳ සියලු තොරතුරු පවතී. සියලුම ප්‍රතිපත්ති තීරණ වල නීතිමය අංශ, විශේෂයෙන් භෞමික හිමිකම් සහ සීමා මායිම්, ත්‍රස්තවාදය හා සම්බන්ධ ගැටළු, ගිවිසුම් සබඳතා පිළිගැනීම, රාජ්‍ය තාන්ත්‍රික මුක්තිය සහ වරප්‍රසාද, එක්සත් ජාතීන්ගේ ඒකපාර්ශ්වික තන්ත්‍රය සහ සම්බාධක වැනි ජාත්‍යන්තර ගැටළු පිළිබඳව නීති අංශය උපදෙස් දෙයි. විවිධ විද්වත් කමිටු තුළ නීති අංශයේ නිලධාරීන් ද අමාත්‍යාංශය නියෝජනය කරති. 2023.01.01-2023.12.31 කාල රාමුව තුළ, නීති අංශය විසින් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක: PS/SP/SB/06/2019 ප්‍රකාරව අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් 290කට ආසන්න ප්‍රමාණයක් සඳහා නීතිමය නිරීක්ෂණ/නීතිමය නිෂ්කාශන ලබා දී ඇත. ඉහත කරුණු වලට අමතරව, නීති අංශය විසින් පහත සඳහන් වැදගත් ප්‍රධාන කාර්ය සාධනයන් සිදු කර ඇත.

**සමුද්‍ර නීතිය:** ජාතික සාගර කටයුතු කමිටුවේ (NOAC) කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ නීති අංශය විසිනි. ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටාකයේ සීමාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභාව විසින් පත් කරන ලද උප කොමිෂන් සභාව (UNCLCS) ශ්‍රී ලංකාවේ මහාද්වීපික ආන්තිකය ස්ථාපිත කිරීමට අවශ්‍ය නිර්ණායක හතර ශ්‍රී ලංකාව සපුරා ඇති බව පිළිගත්තේය.

එහිදී ඉන්දියාව විසින් ඉදිරිපත් කරන ලද විරෝධතාව මත අනුකමිටුව විසින් ඉදිරිපත් කිරීම සලකා බැලීම අත්හිටුවා ඇත.ඒ පිළිබඳව ද්විපාර්ශ්වික සාකච්ඡා සඳහා දින ඉන්දියාවෙන් ඉල්ලා තිබේ.

ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය නාවික යාත්‍රා සඳහා රාජ්‍ය තාන්ත්‍රික නිෂ්කාශන ලබා දීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SoP), ශ්‍රී ලංකාවට ක්‍රියාත්මක වන විදේශ හමුදා හෝ රාජ්‍ය ගුවන් යානා සහ ශ්‍රී ලංකා භූමිය ඉක්මවා පියාසර කිරීම සහ VVIP/VIP සංචාරයකදී ආයුධ, පතොරම් සහ සන්නිවේදන උපකරණ සඳහා නිෂ්කාශනය, ජාතික බුද්ධි ප්‍රධානියාගේ කාර්යාලය සමඟ සම්බන්ධවී සිදු කරනු ලබයි.

**නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) සාකච්ඡා කිරීම:** නීති අංශය නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා කිරීමට සම්බන්ධ වන අතර නිදහස් වෙළඳ ගිවිසුම් ආයෝජන, නෛතික සහ වෙළඳ ප්‍රතිකර්ම සාකච්ඡා කරන ක්‍රියාකාරී කණ්ඩායම්වලට ද සහභාගී වෙයි. තායිලන්තය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කිරීමට පෙර නීති අංශය විසින් නිදහස් වෙළඳ ගිවිසුම් පරිච්ඡේද දහහතර (14) නීත්‍යානුකූලව පරීක්ෂා කර ඇත. ඉන්දියාව සමඟ ETCA සාකච්ඡා සිදුවෙමින් පවතින අතර, නීති අංශය ආයෝජන පිළිබඳ පරිච්ඡේදය පිළිබඳව සාකච්ඡා කිරීමට සම්බන්ධ වේ.

තවද, පහත සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡා සඳහා ඉදිරි මාවත සැකසීම සම්බන්ධයෙන් නීති අංශය ජාතික වෙළඳ සාකච්ඡා කමිටුව සමඟ ද සම්බන්ධ වේ.
1. චීනය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම්
2. සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සමාලෝචනය

**ආයෝජන:** එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ IPPA හි ඇතැම් ලිපි නැවත සාකච්ඡා කරමින් පවතී. නිදහස් වෙළඳ ගිවිසුමේ ආයෝජන පරිච්ඡේද පිළිබඳ දැනට පවතින සාකච්ඡා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ නව ආයෝජන ආකෘතිය සමාලෝචනය කෙරේ.

**ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත:** ත්‍රස්තවාදයට එරෙහි විස්තීරණ නීති කෙටුම්පත් කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නීති අංශය අමාත්‍යාංශය නියෝජනය කරන අතර පනත් කෙටුම්පත පිළිබඳ ජාත්‍යන්තර උත්සුකයන්

බොහෝමයක් විසඳීමට සහාය වූ අතර එය නියමිත වේලාවට පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**ජාතික අධිකරණ බල ප්‍රදේශවලින් ඔබ්බට සමුද්‍ර ජෛව විවිධත්වය පිළිබඳ යෝජිත ජාත්‍යන්තර වශයෙන් නීත්‍යානුකූල මෙවලම පිළිබඳ අන්තර්-රාජ්‍ය සාකච්ඡා (BBNJ)**: එම සාකච්ඡාවලදී නීති අංශය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ මේ පිළිබඳ උනන්දුව තහවුරු කළේය.
නීති අංශය BBNJ ගිවිසුම අත්සන් කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රියා පටිපාටි සම්පූර්ණ කරමින් සිටී.

**මුක්තිය සහ වරප්‍රසාද:** රාජ්‍ය තාන්ත්‍රික වරප්‍රසාද පනතට අනුව පහත සඳහන් සංවිධානවලට ලබා දී ඇති මුක්ති සහ වරප්‍රසාද ගැසට් කිරීමටත් ඒවා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටත් කටයුතු කර ඇත.
1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනතේ කොන්දේසි.
Global Green Growth Institute (GGGI)
Argo Forestry පිළිබඳ පර්යේෂණ සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF)

**මුදල් විශුද්ධිකරණ විරෝධී සහ ත්‍රස්තවාදී මූල්‍යකරණයට එරෙහිව සටන් කිරීම (AML/CFT) පිළිබඳ ආසියා පැසිෆික් සමූහය (APG):** මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) විසින් ශ්‍රී ලංකාව පිළිබඳ අන්‍යෝන්‍ය ඇගයීම 2025 මාර්තු මාසයේදී ආයතනික වශයෙන් කාලානුරූපී ක්‍රියාමාර්ග සැලැස්ම විදේශ අමාත්‍යාංශයට ලබාදෙනු ඇත. APG ඇගයීම සඳහා සූදානම් වීමට නීති අංශය FIU සමඟ කටයුතු කරයි.

නීති අංශය දැනට ප්‍රධාන ක්‍රියාකාරී කරුණු ඉටු කිරීමට සම්බන්ධ වේ, එනම් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ යෝජනා 1373, 1267, 1540 සහ ඉරානය සහ DPRK පිළිබඳ නියාමනය කරන ලද අදාළ UNSC යෝජනා සහ විදේශ ත්‍රස්තවාදී සටන්කරුවන් පිළිබඳ UNSCRs ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ පවතින රෙගුලාසි සංශෝධනය කිරීමට UNODC වෙතින් තාක්ෂණික සහාය ඉල්ලා සිටි.

නීති අංශය ආරක්ෂක ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් TFS කමිටුවට සක්‍රියව සහභාගී වන අතර මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට සහ ව්‍යාප්තියට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය සහ මූල්‍ය බුද්ධි අංශය සමඟ සම්බන්ධ වේ.
**නැවත ඇතුලත් කිරීම**: Benelux වෙනුවෙන් ඉතාලිය, ප්‍රංශය සහ නෙදර්ලන්තය සමඟ යුරෝපා සංගමය වෙත නැවත ඇතුලත් කිරීම පිළිබඳ සාකච්ඡා පවත්වන ලද අතර අත්සන් කිරීම සඳහා එකඟතාවන් ක්‍රියාත්මක කළ හැකිය. අත්සන් කිරීමට එකඟතාවන් සඳහා දැනට නෙදර්ලන්තය සහ ප්‍රංශය සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී. 2018 දී ජෝර්ජියාව සමඟ නැවත ඇතුලත් කරගැනීමේ ගිවිසුමක් පිළිබඳ සාකච්ඡා සිදු කල අතර අත්සන් කිරීමට නියමිත නිශ්චිත ප්‍රතිසංස්කරණ විධිවිධාන පිළිබඳව තවමත් එකඟ වී නොමැත. රුසියාව සමඟ නැවත ඇතුලත් කරගැනීමේ ගිවිසුම අත්සන් කිරීම සඳහා ඉක්මනින් සාකච්ඡා සිදු කිරීමට නියමිතය.

**ද්විත්ව බදු වැළැක්වීම පිළිබඳ ගිවිසුම්:** නීති අංශය ඔස්ට්‍රියාව සමඟ යෝජිත ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම (DTAA) ක්‍රියාකාරීව සාකච්ඡා කළ අතර, DTAA සහ එහි ගිවිසුම සෞදි අරාබිය සමඟ 2023 ජනවාරි මාසයේදී අත්සන් කරන ලදී. මාලදිවයින සමඟ DTAA පිළිබඳ දෙවන සාකච්ඡා වටය 2023 පෙබරවාරි මාසයේදී නීති අංශයේ සහභාගීත්වය ඇතිව පැවැත්විණි.

**ජාත්‍යන්තර මානුෂීය නීතියට අදාල කරුණු**

- ජාතික ජාත්‍යන්තර මානුෂීය නීති කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් ජාත්‍යන්තර මානුෂීය නීති කමිටු රැස්වීම් දෙකක් කැඳවන ලදී.
- මෙම අමාත්‍යාංශය, ICRC සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකාවේ 12 වැනි දකුණු ආසියානු සමුළුවට සම සත්කාරකත්වය ලබා දුන් අතර ජාතික ජාත්‍යන්තර මානුෂීය නීති කමිටුවේ සභාපතිවරයා ලෙස නීති අංශය, දේශීයත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානුෂීය නීති

- ක්‍රියාත්මක කිරීම ජාතික අත්දැකීම් බෙදාහදා ගැනීම පිළිබඳ සමුළුවට ක්‍රියාකාරීව සහභාගී විය.
- අධිකරණ අමාත්‍යාංශය විසින් 2020 අංක. 03 දරන පුද්ගලික බිම්බෝම්බ තහනම් කිරීමේ පනත ICRC හි තාක්ෂණික සහාය ඇතිව ජාතික ජාත්‍යන්තර මානුෂීය නීති කමිටු සාමාජිකයින් විසින් කෙටුම්පත් කරන ලදී.
- ජාතික ජාත්‍යන්තර මානුෂීය නීති කමිටුව ලෙස, ආරක්ෂක අමාත්‍යාංශය සමඟ පොකුරු බෝම්බ පිළිබඳ දේශීය නීති සම්පාදනය (ඔස්ලෝ සම්මුතිය) සම්බන්ධීකරණය කිරීම සහ පසු විපරම් කිරීම.

**ගුවන් සේවා ගිවිසුම්**

- නීති අංශය ගුවන් සේවා සඳහා රජයේ ද්විපාර්ශ්වික සාකච්ඡා කණ්ඩායමේ සාමාජිකයෙකි.
- නෙදර්ලන්තය සමඟ ගුවන් සේවා ගිවිසුම අත්සන් කර ඇති අතර, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය සමඟ ගුවන් සේවා ගිවිසුම බලාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
- ඊශ්‍රායලය සමඟ ගුවන් සේවා ගිවිසුම සම්පාදනය කර ඇති අතර අත්සන් කිරීමට සූදානම්ය.
- ඉන්දුනීසියාවේ ජාතික සෙවුම් සහ මුදාගැනීමේ නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අතර සෙවීම් සහ මුදාගැනීමේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම අලුත් කිරීම සඳහා නීති අංශය විසින් කටයුතු ආරම්භ කර ඇත.
- Aeronautical Search and Rescue Services පිළිබඳ සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකා සහ ඉන්දීය රජයන් අතර ගිවිසුම සම්පාදනය වෙමින් පවතී.
- ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා බලධාරීන් විසින් ඉල්ලා සිටින පරිදි, නීති අංශය විසින් ඉල්ලුම් කරන ලද රටවල් (කුවේට්, බංග්ලාදේශය, නේපාලය, පකිස්ථානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සෞදි අරාබිය, බහරේන්, මැලේසියාව, තායිලන්තය, ඉන්දුනීසියාව සහ සිංගප්පූරුව) යන රටවල් සමඟ ඉල්ලීම ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
- දකුණු අප්‍රිකාව සහ ඊශ්‍රායල රටවල් සඳහා FITS ගුවන් සේවය නම් කිරීමට පහසුකම් සැලසීම සම්බන්ධීකරණය කර ඇත.
- රජයේ ද්විපාර්ශ්වික සාමාජිකයෙකු ලෙස දෙරට අතර ගුවන් සේවා සහ නීති අංශය අතර ගුවන් සේවා සඳහා නියාමන රාමුව තවදුරටත් වර්ධනය කිරීම සඳහා ගුවන් සේවා සබඳතා සමාලෝචනය කිරීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යය (UAE) සමඟ ගුවන් සේවා සාකච්ඡා සැප්තැම්බර් 04 සහ 05 යන දිනවල කොළඹදී පැවැත්විණි.

**බිම්ස්ටෙක්**

- 2022 බිම්ස්ටෙක් සමුළුව අතරතුර කොළඹදී අත්සන් කරන ලද පහත සඳහන් බිම්ස්ටෙක් ගිවිසුම්/ලේඛන ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.
- බිම්ස්ටෙක් ප්‍රඥප්තිය 2023 පෙබරවාරි 28 දින අපරානුමත කරන ලද අතර, එම ප්‍රඥප්තිය බිම්ස්ටෙක් ලේකම් කාර්යාලයට යැවීමට අවශ්‍ය උපදෙස් ආර්ථික කටයුතු අංශය වෙත ලබා දෙන ලදී.
- සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහය පිළිබඳ බිම්ස්ටෙක් සම්මුතිය 2023 ජනවාරි 28 දින අනුමත කරන ලද අතර, එය බිම්ස්ටෙක් ලේකම් කාර්යාලයට යැවීමට ආර්ථික කටයුතු අංශයට උපදෙස් දෙන ලදී.
- බිම්ස්ටෙක් තාක්ෂණ හුවමාරු පහසුකම ස්ථාපිත කිරීම සඳහා වූ සංගමයේ සංදේශය 2023 පෙබරවාරි 28 දින අනුමත කරන ලද අතර එය බිම්ස්ටෙක් ලේකම් කාර්යාලයට යැවීමට ආර්ථික කටයුතු අංශයට උපදෙස් දෙන ලදී.
- 2023 මාර්තු 08 සහ 09 යන දිනවල බැංකොක්/තායිලන්තයේ පැවැත්වුණු බිම්ස්ටෙක් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ (SOM) 23 වැනි සැසිවාරයට සහ 19 වැනි බිම්ස්ටෙක් අමාත්‍ය මණ්ඩල රැස්වීමට (MM) නීති අංශය සහභාගි විය. නීති අංශය විසින් එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය (UNOPS) සහ බිම්ස්ටෙක් ලේකම් කාර්යාලය අතර සටහන සහ යෝජිත අවබෝධතා ගිවිසුම නිරීක්ෂණය කරන ලදී.

- IORA සංගමය සහ බිම්ස්ටෙක් සඳහා වන යෝජිත අවබෝධතා ගිවිසුම් පිළිබඳ නිරීක්ෂණ ලබා දෙන ලදී.
- පුද්ගලයන් ජාවාරමට එරෙහි බිම්ස්ටෙක් සම්මුතියේ කෙටුම්පත නීති අංශය විසින් නිෂ්කාශනය කර ඇත.

IAEA **කරුණු:** 2023 අගෝස්තු 28 සිට සැප්තැම්බර් 01 දක්වා ඔස්ට්‍රියාවේ වියානා හි පැවති කුඩා මොඩියුල ප්‍රතික්‍රියාකාරක (SMRs) සඳහා වන ජාත්‍යන්තර සහ ජාතික නීති රාමු පිළිබඳ IAEA අන්තර් කලාපීය වැඩමුළුවේදී නීති අංශය ශ්‍රී ලංකාව නියෝජනය කළේය. හුදකලා කිරීම සඳහා ජාතික නීති රාමු සකස් කිරීම සඳහා පිහිටුවා ඇති කමිටුවේ නීති අංශය ද අමාත්‍යාංශය නියෝජනය කරයි.

**අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ:** ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ කැබිනට් නිරීක්ෂණ එකසිය හයක් (106) 2023.01.01 සිට 2023.12.31 දක්වා නීති අංශය විසින් සකස් කරන ලදී.

**සම්පූර්ණ බලතල:** නීති අංශය විසින් සම්පූර්ණ බල මෙවලම් හතළිස් නවයක් (49) සකස් කර ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා 2023.01.01 සිට 2023.12.31 දක්වා යවා ඇත**.**

**විදේශීය කැඳවීම්**

- අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, අදාළ අධිකරණ සහ විදේශ දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් විදේශ රටවල කැඳවීම් 387 ක් සඳහා නීති අංශය පහසුකම් සලසා ඇත.
- අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ 2015 අංක 4 දරන 2017 අංක 27 දරන සංශෝධිත පනතට සහාය වීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධ කිරීම හරහා විදේශගතව සිටින අදාළ පාර්ශ්වයන්ගෙන් සාක්ෂි ලබා ගැනීමට නීති අංශය අධිකරණ නඩු 20කට පහසුකම් සලසා ඇත.
- නීති අංශය විසින් විදේශ රටවලින් ශ්‍රී ලංකාවට කැඳවීම් භාරදීම සඳහා ඉල්ලීම් 170 කට පහසුකම් සලසා ඇත.

**අක්තපත්‍ර:** එක්සත් ජාතීන්ගේ අංශය විසින් කෙටුම්පත් කරන ලද සියලුම අක්තපත්‍ර නිෂ්කාශන නීති අංශය විසින් ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කරයි.

අන්‍යෝන්‍ය නෛතික සහය (MLA), පිටුවහල් කිරීම සහ මාරු කිරීම සහ වැරදිකරුවන් මාරු කිරීම (PTA) සඳහා ඉල්ලීම්: අන්‍යෝන්‍ය නෛතික සහය ඉල්ලීම් 38 ක්, පිටුවහල් කිරීමේ ඉල්ලීම් 19 ක් සහ වැරදිකරුවන් මාරු කිරීමේ ඉල්ලීම් 12 ක් 2023 ජනවාරි 1 සිට 31 දක්වා කාලය තුළ පහසුකම් සපයන ලදී.
ලැට්වියාව සහ සෞදි අරාබිය සමඟ PTA පිළිබඳ මාර්ගගත සාකච්ඡා සිදුකරන ලදී. අන්‍යෝන්‍ය නෛතික සහය පිළිබඳ සාකච්ඡා පිලිපීනය සහ සෞදි අරාබිය සමඟ කැඳවනු ඇත.

**අත්සන් කරන ලද ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්:** 2023 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 36ක් අත්සන් කර නීති අංශයේ තබා ඇත.

**නීතිමය අදහස් ලබා දීම:** විදේශ ලේකම්වරියට, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනෙකුත් අංශවලට, විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවලට, ත්‍රස්ත විරෝධී නීති සම්පාදනය කිරීමේ කමිටුව සහ කාරක සභා වලට නීතිමය අදහස් 250කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇති අතර, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන පහත සඳහන් කමිටු වල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

- ජාතික සාගර කටයුතු කමිටුව.
- විස්තීර්ණ ප්‍රතිත්‍රස්තවාදී නීති පද්ධතියේ කමිටුව
- උපායමාර්ගික වෙළඳ පාලනය පිළිබඳ නීති කමිටුව (STC). STC පිළිබඳ නීති කෙටුම්පත් අවසන් කරමින් සිටී.

- මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායම (APG) සහ මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) සම්බන්ධ සියලුම අමාත්‍යාංශ කටයුතු මූල්‍ය බුද්ධි අංශය සහ ජාතික සම්බන්ධීකරණ කමිටුව විසින් සිදු කරයි.
- APG අන්‍යෝන්‍ය ඇගයීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් පවත්වනු ලබන ජාතික අවදානම් තක්සේරු කමිටුව
- ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් ඉලක්කගත මූල්‍ය සම්බාධක (TFS) කමිටුව.
- 1373 (රෙගුලාසි අංක:1 2012) ලැයිස්තුගත කිරීමේ කමිටුව.
- 2014 අංක 40 දරන දැනට පවතින පරමාණුක බලශක්ති පනත සංශෝධනය කිරීම සඳහා ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකාය.
- 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත අහෝසි කිරීමේ කමිටුව
- න්‍යෂ්ටික නීති පිළිබඳ ජාතික නීති සම්පාදනය කිරීම සඳහා අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුව.
- CDS හි සභාපතිත්වය දරන සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව.
- ජාතික ජලවිද්‍යාත්මක සභාව පිළිබඳ කමිටුව
- නව න්‍යෂ්ටික පනත් සමාලෝචන කමිටුව

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීම් සහ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්:** තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ගැටළු-2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධ පනත යටතේ 2023 ජනවාරි 1 සිට 2023 දෙසැම්බර් 31 දක්වා RTI ඉල්ලීම් 46 ක් ලැබී ඇත. ඉල්ලීම් 46න් ඉල්ලීම් 32කට පිළිතුරු සපයා ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනා දෙකක් ඉදිරිපත් කරන ලද අතර, එකක් කොමිසමට ලිඛිතව ඉදිරිපත් කිරීමෙන් පසුව විසඳන ලදී.

එක් අභියාචනයක් අර්ධ වශයෙන් විසඳන ලද අතර, ඉතිරි කොටස ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරන ලදී.
2023 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ නීති අංශය ආසන්න වශයෙන් ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 650ක් නිෂ්කාශනය කර ඇත: උසස් අධ්‍යාපන හා පර්යේෂණ ක්ෂේත්‍රයේ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 24ක් සඳහා නීති අංශය විසින් නිරීක්ෂණ ලබා දී ඇත.

නීති අංශයේ ගිවිසුම් ලේඛනවලට අනුව, ආරක්ෂක සහයෝගීතාව, සංවර්ධන සහයෝගීතාව, ද්විත්ව බදුකරණය, වීසා නිදහස් කිරීම්, රාජ්‍යතාන්ත්‍රික සබඳතා, සංස්කෘතික සහයෝගිතාව, සංචාරක, සෞඛ්‍යය ආරක්ෂණ, අධ්‍යාපන සහ විනෝදාස්වාදය යන ක්ෂේත්‍රවල ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 25ක් තැන්පත් කර ඇත.

### 2.6.6. විදේශීය වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය

බුකාරෙස්ට්/රුමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පිහිටුවීම, කාර්යාලීය උපකරණ සැපයීම, චාන්සරි සහ නිවාස වෙත පරිපාලනමය සහ ප්‍රවාහන සහය ලබා දීම සම්බන්ධව බුකාරෙස්ට්/රොමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පිහිටුවීමේදී විදේශීය වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

මීට අමතරව, නව දිල්ලිය, ජිනීවා, පැරිස් සහ කයිරෝ හි පිහිටි ශ්‍රී ලංකා රජය සතු දේපල කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම අංශය විසින් අධීක්ෂණය කරන ලදී. තවද, මෙම අංශය විසින් කැන්බරා හි නිල නිවස සඳහා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව දේශීය උපදේශන නියෝජිතයා ලෙස තෝරාගෙන ඒ ආශ්‍රිත ක්‍රියාවලින් දැනට

ක්‍රියාත්මක කරමින් පවතී.

කාර්යාල සහ ගෘහ උපකරණ මිලදී ගැනීම අනුමත කිරීම, වාහන සහ ගොඩනැගිලි රක්ෂණය ලබා ගැනීම සහ අලුත් කිරීම, සියරට පේරුවේ කාර්ය මණ්ඩල වල නිවාස සඳහා කොන්ත්‍රාත්තු සහ කුලී ගිවිසුම් වලට එළඹීම සහ ඒවා අළුත් කිරීම වැනි වගකීම් ද අංශය යටතේ පවතී. රජයේ වියදම් අවම කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව විදේශයන්හි දූත මණ්ඩල / කාර්යාල සඳහා වන වියදම් පාලනය කිරීමට පියවර ගන්නා ලදී.

ඊට සමගාමීව, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත පත් කරන ලද නිලධාරීන් සඳහා රාජ්‍ය තාන්ත්‍රික/නිල ගමන් බලපත්‍ර, වීසා බලපත්‍ර සහ බර ගමන් මලු ඇතුළු ගුවන් ගමන් ලබා ගැනීමට මෙම අංශය පහසුකම් සපයයි. මීට අමතරව, දූත මණ්ඩලවලින් ආපසු පැමිණෙන නිලධාරීන් සඳහා වාහන බලපත්‍ර ලබා ගැනීමට ද සහාය වේ.

### 2.6.7. සන්ධාන අංශය

සන්ධාන අංශයේ කාර්යය වන්නේ, විධිමත් උත්සව අවස්ථා සම්බන්ධීකරණය කිරීම, විදේශ රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ශ්‍රී ලංකාවට ප්‍රතීතනය කර ඇති එහි විශේෂිත ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන වෙත ලබා දී ඇති රාජ්‍යතාන්ත්‍රික මුක්තිය සහ වරප්‍රසාද පහසු කිරීම සහ අධීක්ෂණය කිරීම, ශ්‍රී ලංකාවට ප්‍රතීතනය ලත් දූත මණ්ඩල ප්‍රධානීන් (කොළඹ පදනම් කරගෙන සහ අනෙකුත් දූත මණ්ඩලවල සමගාමී ප්‍රතීතන) සඳහා පහසුකම් සැලසීම ලෙස වර්ග කළ හැකිය. ලංකාව සහ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා සැපයුම් සහ සන්ධාන විධිවිධාන සඳහා පහසුකම් සැලසීමද මෙම අංශයෙන් සිදු කෙරේ.

**විධිමත් කෘත්‍යයන් : අභ්‍යන්තර චාරිකා:** රාජ්‍ය නායකයින්ගේ සංචාර හතර (4), විදේශ අමාත්‍යවරුන්ගේ සංචාර දාහතර (14), කථානායකවරුන්ගේ සහ අනෙකුත් අමාත්‍යවරුන්ගේ සංචාර 20, අනෙකුත් විදේශීය සම්භාවනීය අමුත්තන්ගේ සම්මන්ත්‍රණ දාහත (17) ඇතුළත් අභ්‍යන්තර සංචාර පනස් පහක් (55) සඳහා වාර්තාකරණ කාලය තුළ මෙම අංශය විසින් පහසුකම් සැලසීය. සමාලෝචිත කාල සීමාව තුළ **බාහිර සංචාර:** එක්සත් රාජධානිය, ජපානය/මැලේසියාව/සිංගප්පූරුව, ප්‍රංශය, ඉන්දියාව, සිංගප්පූරුව, කියුබාව, ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය, චීනය, මාලදිවයින සහ ඩුබායි යන රටවල ජනාධිපතිගේ සංචාර දොළහක් ගරු. අග්‍රාමාත්‍යවරයාගේ තායිලන්ත සංචාරය, විදේශ අමාත්‍යවරයාගේ සංචාර දහසය (16) සහ ගරු විදේශ රාජ්‍ය අමාත්‍යවරයාගේ සංචාර පහ (5) සඳහා වාර්තාකරණ කාලය තුළ මෙම අංශය මගින් පහසුකම් සපයන ලදී.

සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ IORA හි 3 වන රැස්වීම, 14 වන ASEAN කලාපීය සංසදය, සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ IORA ක්‍රියාකාරී කණ්ඩායමේ 3 වන රැස්වීම, න්‍යෂ්ටික ප්‍රගුණනය සහ විචාර බුද්ධිය පිළිබඳ 14 වන ASEAN කලාපීය සංසද මැදිහත්වීමේ රැස්වීම සහ IORA අමාත්‍ය සමුළුව වෙත s- 2,000 සහතික නිකුත් කරන ලදී. විදේශ දූත මණ්ඩල (සහතික 50 ක් අඩංගු පොත් 40 ක්) සහ ජාත්‍යන්තර සංවිධාන වෙත සහතික 400 ක් නිකුත් කරන ලදී (සහතික 50 ක් අඩංගු පොත් 8 ක්) **රේගු පහසුකම් – ආනයන:** (විදේශීය දූත මණ්ඩල සඳහා 1740 සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සඳහා 320) **රේගු පහසුකම් – අපනයන**: (160-විදේශ දූත මණ්ඩල සඳහා සහ 30-අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සඳහා) **වාහන (DPL / UN සහ වෙනත් සංවිධාන):** වාහන විකිණීම -429, වාහන ලියාපදිංචිය-95, ආදායම් බලපත්‍ර නිකුත් කිරීම-798, රියදුරු බලපත්‍ර නිකුත් කිරීම-234, පෙට්‍රල් කූපන් පොත් නිකුත් කිරීම-320. **වීසා:** විදේශ දූත මණ්ඩල සඳහා වීසා - 980, විදේශ දූත මණ්ඩල සඳහා වීසා - පදිංචි වීසා- 1460, ජාත්‍යන්තර සංවිධාන සඳහා වීසා - 143 ප්‍රවේශ වීසා සහ නේවාසික වීසා-515. ගුවන් තොටුපළ බලපත්‍ර: ස්ථිර බලපත්‍ර 60 ක් සහ තාවකාලික බලපත්‍ර 21 ක් නිකුත් කරන ලදී, ස්ථිර අවසර පත්‍ර 163 ක් අලුත් කරන ලදී, සහ තාවකාලික අවසර පත්‍ර 20 ක් අලුත් කරන ලදී. **VIP විවේකාගාරය** විදේශීය මගීන් 3,400 ක් සහ දේශීය මගීන් 3,800 ක් සඳහා අවසර ලබා දෙන ලදී. **රාජ්‍ය තාන්ත්‍රික නිෂ්කාශන**: විදේශීය ගුවන් යානා සහ නැව් සඳහා අනුමැතීන් 165 (මිලිටරි සහ රජය සතු), විදේශ නැව් සඳහා 36 (මිලිටරි සහ පර්යේෂණ), හමුදා අභ්‍යාස 05 ක් සහ ආයුධ නිෂ්කාශන 21 ක්. හැඳුනුම්පත් (DPL

/ UN සහ අනෙකුත් සංවිධාන): ගුවන් තොටුපළ අවසරපත් 680, ජාතික දින සුබ පැතුම් පණිවිඩ 181 සහ ජාතික දින පිළිගැනීම් 31.

**දූත මණ්ඩල ප්‍රධානීන්/නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම්:** ශ්‍රී ලංකාවට ප්‍රතීතනය කර ඇති විදේශ තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන් සඳහා අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව සංවිධානය කිරීම සහ ශ්‍රී ලංකාව නේවාසික දූත මණ්ඩල පිහිටුවා ඇති රටවලට පත් කර ඇති ශ්‍රී ලංකා තානාපතිවරුන්/ මහ කොමසාරිස්වරුන් සඳහා ගිවිසුම් ලබා ගැනීම සන්ධාන අංශයේ වගකීම වේ. ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම් සහ ශ්‍රී ලංකාවේ වෙනත් රටවල නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම් සම්බන්ධයෙන්ද සන්ධාන අංශය වගකීම දරයි. ඒ අනුව අක්තපත්‍ර ප්‍රදානෝත්සව හයක්, ශ්‍රී ලංකාවට විදේශ දූත මණ්ඩල ප්‍රධානීන් පත්කිරීම් 40ක් සහ විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් පත්කිරීම් 24ක් වාර්තා කිරීමේ කාලසීමාව තුළදී මෙම අංශය මගින් පහසුකම් සපයන ලදී. ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් 4 දෙනෙකුට අමතරව ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීම් 21 ක් සහ සේවා කාලය දීර්ඝ කිරීම් 32 ක් සඳහා පහසුකම් සපයන ලදී.

**රැස්වීම් සංවිධානය කිරීම:** අතිගරු ජනාධිපති සඳහා රැස්වීම් 46, ගරු අගමැති සඳහා රැස්වීම් 45, ගරු විදේශ කටයුතු අමාත්‍ය සඳහා රැස්වීම් 83, ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය 38, ලේකම්/විදේශ කටයුතු 43 සහ අනෙකුත් අමාත්‍යවරුන් 63 සඳහා සුහද හමු නිල දිවා ආහාර 22 සහ රාත්‍රී ආහාර 34ක් සංවිධානය කිරීම.

## 2.7. 2023 වසරේ සුවිශේෂී අවස්ථා



ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා සිය කියුබානු සංචාරයේදී කියුබානු ජනාධිපති මිගෙල් ඩයස් කැනෙල් බර්මියුඩෙස් මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය.




ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා 2023 සැප්තැම්බර් මාසයේදී කියුබාවේ හවානා හි පැවති G77 සහ චීනයේ රාජ්‍ය නායකයින්ගේ සහ රජයේ නායකයින්ගේ සමුළුව ඇමතීය.



ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා 2023 ජූලි 20-21 දිනවල නවදිල්ලියේ නිල සංචාරයක නිරත විය



ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා UNGA අමතමින් කළ දේශනය: විශ්වාසය සහ ගෝලීය සහයෝගීතාව යළි ගොඩනැගීමෙහිලා ශ්‍රී ලංකාවේ ගමන් මග



බංග්ලාදේශයේ ගරු විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය ඒ.කේ. අබ්දුල් මොමන් මහතා 2023.02.04 වන දින 75 වන නිදහස් දින සැමරුම් උත්සවයට සහභාගී වනු වස් නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය.



භූතානයේ රාජකීය රජයේ අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන ගරු අමාත්‍ය ජයි බිර් රායි මහතා, 2023.02.04 වන දින 75 වන නිදහස් දින සැමරුම් උත්සවයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය.



මාලදිවයිනේ ගරු විදේශ කටයුතු අමාත්‍ය අබ්දුල්ලා ෂාහිඩ් මහතා 2023 ජූනි 06-07 දක්වා කොළඹදී පැවති ශ්‍රී ලංකා-මාලදිවයින ඒකාබද්ධ කොමිසමේ 4 වැනි වටයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය.



2023.02.04 වන දින 75 වන නිදහස් දින සැමරුම් උත්සවයට සහභාගී වීම සඳහා පාකිස්ථානයේ ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය හිනා රබ්බානි බාර් මහත්මිය ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය.



2023 දෙසැම්බර් 21 සිට 22 දක්වා නේපාලයේ කත්මණ්ඩු නුවරදී පැවති අමාත්‍ය මට්ටමේ ශ්‍රී ලංකා-නේපාල ඒකාබද්ධ කොමිසමේ සමාරම්භක සැසිවාරයට සහභාගී වීමට ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා නේපාලයේ නිල සංචාරයක නිරත විය.



ශ්‍රී ලංකාව න්‍යෂ්ටික අවි තහනම් කිරීමේ ගිවිසුමට (TPNW) එකඟ වෙයි.



මැලේසියාවේ විදේශ කටයුතු අමාත්‍ය ඩේටෝ සේරි ඩිරාජ සැම්බ්‍රි අද් කදිර් මහතා 2023 ඔක්තෝබර් 08 සිට 12 දක්වා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය.



තුර්කියෙහි භූමිකම්පාවෙන් විපතට පත් වූවන් සඳහා ශ්‍රී ලංකාව ඇඟලුම් තොගයක් පරිත්‍යාග කරයි




2023 මැයි 21 සිට 24 දක්වා පැවති ඒකාබද්ධ කමිටුවේ පළමු සැසියේදී ශ්‍රී ලංකාව සහ සෞදි අරාබිය අතර දේශපාලන උපදේශනය පිළිබඳ අවබෝධතා ගිවිසුමට විදේශ කටයුතු ගරු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා අත්සන් තැබීය.




පොදු අභියෝගවලට මුහුණ දීමෙහිලා සාමූහික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා අසර්බයිජානයේ පැවති NAM අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී යළි තහවුරු කරයි



විදේශ ලේකම් අරුණි විජේවර්ධන මහත්මිය විසින් වියානා හි පැවති විස්තීරණ පරීක්ෂණ තහනම් ගිවිසුමේ (CTBTO) 3 වැනි විද්‍යා රාජ්‍යතාන්ත්‍රික සම්මන්ත්‍රණයේ ඉහළ මට්ටමේ කොටසේ ප්‍රධාන දේශනය පවත්වයි.




IORA ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවේ (CSO) 25 වැනි රැස්වීම, 2023 ඔක්තෝබර් 9-10 කොළඹදී




මහජන සෞඛ්‍යය පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායම (EGPH) 2023 ජූලි 26-27 දින



අලුතින් පත් කරන ලද දූත මණ්ඩල ප්‍රධානීන් නව දෙනෙක් (9) විදේශ අමාත්‍ය අලි සබ්රි මහතා සහ විදේශ ලේකම් අරුණි විජේවර්ධන මහත්මිය සමඟ




SAARC-ADB කලාපීය ආර්ථික ඒකාබද්ධතා අධ්‍යයනය පිළිබඳ පස්වන විශේෂ රැස්වීම (II අදියර) 2023 ජූනි 5-6 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹදී



අප්‍රිකානු කලාපය සමඟ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික සබඳතා පුළුල් කිරීම පිළිබඳ සංසදය




ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ, UPR ක්‍රියාකාරී කණ්ඩායම, ජිනීවා හි සිව්වන විශ්ව කාලාන්තර සමාලෝචනය (UPR) අවසන් කරයි.




අමාත්‍ය මණ්ඩලයේ (COM) 23 වැනි IORA රැස්වීම, 2023 ඔක්තෝබර් 11 කොළඹදී



2023 මාර්තු 20 වැනි දින කොළඹදී පැවති සමුද්‍රීය ආරක්ෂාව සහ ආරක්ෂණය පිළිබඳ IORA ක්‍රියාකාරී කණ්ඩායමේ (IORA-WGMSS) 3 වැනි රැස්වීමේදී සාකච්ඡා



සමුද්‍රීය ආරක්ෂාව සහ ආරක්ෂණය පිළිබඳ IORA ක්‍රියාකාරී කණ්ඩායමේ (IORA-WGMSS) 3 වැනි රැස්වීමේ සමාරම්භක උත්සවය 2023 මාර්තු 20 වැනි දින කොළඹදී





SAARC සංස්කෘතික මධ්‍යස්ථානයේ (SCC) 13 වන පාලක මණ්ඩල (GB) රැස්වීම 2023 නොවැම්බර් 28-29 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹදී.

IORA සාමාජික රටවල සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) ක්‍රියාත්මක කිරීම පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනය පිළිබඳ වැඩමුළුවේ සමාරම්භක උත්සවය සහ නීතිය බලාත්මක කිරීම පිළිබඳ කලාපීය සමුද්‍ර සංවාදය 2023 ඔක්තෝම්බර් 30 වැනි දින මිරිස්සේදී





2023 දෙසැම්බර් 18-19 දක්වා නේපාලයේ කත්මන්ඩු නුවරදී දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ (SAU) 11වන පාලක මණ්ඩල (GB) රැස්වීම.

# 3 වැනි පරිච්ඡේදය: මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 (රු.) | | සටහන | සත්‍ය 2023 (රු.) | සත්‍ය 2022 (රු.) | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| **-** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **-** | **-** | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 12,159,815,907 | 11,508,887,742 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 2,427,994,748 | 2,104,922,230 | ඒසීඒ-4 |
| 35,000,000 | අත්තිකාරම් ගිණුම් | | 44,442,533 | 61,860,671 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | - | |
| **35,000,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **14,632,253,188** | **13,675,670,643** | |
| **35,000,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **14,632,253,188** | **13,675,670,643** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | | **339,634,673** | |
| **35,000,000** | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **14,632,253,188** | **13,336,035,970** | |
| | අඩුකළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | | | |
| 11,335,035,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 9,971,076,490 | 9,030,773,672 | ඒසීඒ-2(ii) |
| 5,907,335,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 5,503,599,005 | 4,834,536,272 | ඒසීඒ-2(ii) |
| 1,193,865,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,144,954,892 | 730,970,638 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 44,700,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 6,476,738 | 108,441,860 | ඒසීඒ-2(ii) |
| **18,480,935,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **16,626,107,125** | **14,704,722,442** | |
| | මූලධන වියදම් | | | | |
| 309,900,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 166,643,828 | 49,030,997 | ඒසීඒ-2(ii) |
| 179,165,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 169,098,076 | 42,215,696 | ඒසීඒ-2(ii) |
| 1,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 155,250 | 1,000,000 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 5,000,000 | ධාරිතා වර්ධනය | 14 | 3,437,760 | 1,202,050 | ඒසීඒ-2(ii) |
| 24,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 12,064,988 | 84,213 | ඒසීඒ-2(ii) |
| **519,065,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **351,399,902** | **93,532,956** | |
| | තැන්පතු ගෙවීම් | | 2,638,495,902 | 1,978,580,402 | ඒසීඒ-4 |
| 40,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 37,023,921 | 52,110,527 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | | |
| **40,000,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **2,675,519,823** | **2,030,690,929** | |
| **19,040,000,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **19,653,026,850** | **16,828,946,327** | |
| **(19,005,000,000)** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(5,020,773,662)** | **(3,492,910,357)** | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (6,031,263,080) | (5,179,573,718) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 1,010,489,418 | 1,686,663,361 | ඒසීඒ-3 |
| | | | (5,020,773,662) | (3,492,910,357) | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

### 2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තතය 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 13,519,280,038 | 12,734,553,377 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 93,951,036 | 101,349,648 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 1,010,489,418 | 1,686,663,361 |
| **මුළු වත්කම්** | | **14,623,720,492** | **14,522,566,386** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (196,940,663) | (400,043,205) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 13,519,280,038 | 12,734,553,377 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 290,891,699 | 501,392,853 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 1,010,489,418 | 1,686,663,361 |
| **මුළු වගකීම්** | | **14,623,720,492** | **14,522,566,386** |

පිටු අංක..**06**..සිට ..**65**.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..**66**.. සිට ..**139**.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2024.02.27 | දිනය : 2024.02.27 | දිනය : 2024.02.27 |
| Actg. Secretary/Foreign Affairs<br>Ministry of Foreign Affairs<br>Colombo | Actg. Secretary/Foreign Affairs<br>Ministry of Foreign Affairs<br>Colombo | P. D. L. Kularathna<br>Chief Financial Officer<br>Ministry of Foreign Affairs<br>Colombo 1. |

02

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | |
|---|---|---|
| | **2023 (රු.)** | **2022 (රු.)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 6,519,490,799 | 5,300,032,911 |
| අග්‍රිම ලැබීම් | 10,473,152,543 | 10,499,585,815 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 54,186,998 | 69,985,852 |
| තැන්පතු ලැබීම් | 2,427,994,748 | 2,104,196,970 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **19,474,825,088** | **17,973,801,548** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 15,467,347,531 | 13,947,288,855 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,144,954,892 | 730,970,638 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 522,091,493 | 208,262,003 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 339,634,673 |
| අත්තිකාරම් ගෙවීම් | 37,554,192 | 58,604,194 |
| තැන්පතු ගෙවීම් | 2,638,495,902 | 1,978,566,577 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **19,810,444,010** | **17,263,326,940** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **(335,618,922)** | **710,474,608** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| සීමිත ද්‍රව්‍යමය ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 10,844,881 | 9,102,522 |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **10,844,881** | **9,102,522** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වියදම් | 351,399,902 | 42,215,696 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **351,399,902** | **42,215,696** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(340,555,021)** | **(33,113,174)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)** | **(676,173,943)** | **677,361,434** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | **(676,173,943)** | **677,361,434** |
| 2023 ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | 1,686,663,361 | 1,009,301,927 |
| 2023 දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | 1,010,489,418 | 1,686,663,361 |
| | | 03 |

## 3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**වාර්තාකිරීමේ පදනම**

1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි .

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත .

3) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා , මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) **මුදල් හා මුදල් සමාන දෑ**

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ .

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක .

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

ශ්‍රී ලංකා රුපියල් **000’**

| ආදායම් කේතය | ආදායම් කේත විස්තරය | ආදායම් ඇස්තමේන්තුව 2023 | | එකතු කළ ආදායම (2023 දෙසැම්බර් 31 වන විට) | |
|---|---|---|---|---|---|
| | | මූලික | අවසාන | මුදල (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස (%) |
| 2002-01-01 | රජයේ ගොඩනැඟිල්ල සහ නිවාස සඳහා කුලියට | 3,000 | 3,000 | 4,066 | 136% |
| 2002-02-99 | වෙනත් ආදායම් | 8,500 | 4,000 | 7,355 | 184% |
| 2003-02-07 | විදේශ ගමන් බලපත්‍ර, වීසා සහ ද්විත්ව පුරවැසිභාවය සඳහා ගාස්තු | 3,200,000 | 3,900,000 | 3,809,454 | 98% |
| 2003-02-13 | විභාග සහ අනෙකුත් ගාස්තු | 40 | 65 | 48 | 74% |
| 2003-02-14 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 26,000 | 31,000 | 32,112 | 104% |
| 2003-02-99 | කොන්සියුලර් ගාස්තු | 1,200,000 | 2,000,000 | 2,257,648 | 113% |
| 2003-99-00 | වෙනත් ලැබීම් | 215,000 | 325,000 | 373,215 | 115% |
| 2004-01-00 | සමාජ ආරක්ෂණ දායකත්වය - (මධ්‍යම රජය) | 30,000 | 34,000 | 34,962 | 103% |
| 2004-02-00 | සමාජ ආරක්ෂණ දායකත්ව - (පළාත් සභා) | 600 | 675 | 631 | 93% |
| 2006-02-01 | ප්‍රාග්ධන වත්කම් විකිණීම (වාහන) | 6,000 | 6,000 | 10,630 | 177% |
| 2006-02-02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්) | 200 | 200 | 215 | 107% |
| **එකතුව** | | **4,689,340** | **6,303,940** | **6,530,336** | **104%** |

**3.6. ප්‍රතිපාදන වෙන්කිරීම් භාවිතයේ කාර්ය සාධනය**

ශ්‍රී ලංකා රුපියල් **000’**

| ප්‍රතිපාදන වර්ගය | 2023 වසර සඳහා ප්‍රතිපාදන | | තථ්‍ය වියදම් (2023 දෙසැම්බර් 31 වන විට) | ප්‍රතිපාදන භාවිතය අවසාන ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස (2023 දෙසැම්බර් 30 වන විට) |
|---|---|---|---|---|
| | මූලික | අවසාන | | |
| පුනරාවර්තන | 18,600,000 | 18,480,935 | 16,626,107 | 90% |
| ප්‍රාග්ධන | 400,000 | 519,065 | 351,400 | 68% |
| **එකතුව** | **19,000,000** | **19,000,000** | **16,977,507** | **89%** |

### 3.7 මු.රෙ. 208 (F.R 208) ප්‍රකාරව අමාත්‍යාංශයට වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම

ශ්‍රී ලංකා රුපියල් 000’

| අනුක්‍රමික අංකය (ශීර්ෂ අංකය) | ප්‍රතිපාදනය ප්‍රදානය කල අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය වෙන් කල හේතුව | ප්‍රතිපාදනය වෙන් කිරීම | | සත්‍ය වියදම | ප්‍රතිපාදන උපයෝගීතාවය අවසාන වෙන් කිරීමේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | සත්‍ය | අවසන් වෙන්කිරීම | | |
| 001 | ජනාධිපති ලේකම් කාර්යාලය | VVIP සංචාර | 384,853 | 384,853 | 373,809 | 97% |
| 002 | අගමැති කාර්යාලය | VVIP සංචාර | 114 | 114 | 113 | 99% |
| 101 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | දුටුගැමුණු විශ්‍රාම යාමේ වියදම් | 2,789 | 2,789 | 2,704 | 97% |
| 102 | මුදල් අමාත්‍යාංශය | නේපාලයේ ලුම්බිණි විහාරයේ ශාලාව සහ ආගමික කටයුතු | 1,160 | 1,160 | 1,160 | 100% |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | VVIP පැමිණීම් සඳහා වෙන් කිරීම | 1,988 | 1,988 | 1,908 | 96% |
| 110 | අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ආරක්ෂක අනුයුක්ත වියදම් | 2,930 | 2,930 | 2,938 | 100% |
| 116 | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | VVIP පැමිණීම් සඳහා වෙන් කිරීම | 619 | 619 | 619 | 100% |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | පොදුරාජ්‍ය මණ්ඩලීය වෙළඳ අමාත්‍යවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ වෙළඳ නිලධාරීන්ගේ රැස්වීම | 3 | 3 | 4 | 112% |
| 111 | සෞඛ්‍ය අමාත්‍යාංශය | FAO සඳහා වාර්ෂික දායකත්වය ගෙවීම | 742 | 742 | 330 | 44% |
| | | 5 වන ගෝලීය අමාත්‍ය සමුළුව | 1,186 | 1,186 | 1,199 | 101% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | UNESCO සහ ICCROM වෙත වාර්ෂික දායක මුදල් ගෙවීම, කියුබාවේ ඉගෙනුම ලබන සිසුන් සඳහා අධ්‍යාපන දීමනා සහ දිලූම් ගුණවර්ධන මහත්මියට වන්දි ගෙවීම. | 66,001 | 66,001 | 65,609 | 99% |
| 194 | යෞවන හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය | පොදුරාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩසටහන සඳහා දායක මුදල් ගෙවීම | 24,523 | 24,523 | 24,470 | 100% |
| 222 | ශ්‍රී ලංකා යුද හමුදාව | අතිරික්ත ගමන්මළු මුහුදෙන් ප්‍රවාහනය කිරීම සහ හමුදා ආරක්ෂක අනුයුක්තක වෙත නිල වාහන වෙන් කිරීම | 14,452 | 14,452 | 12,256 | 85% |
| 223 | නාවික හමුදා මූලස්ථානය | ගෙවීම් පියවීම සඳහා නිදහස් කිරීම් වෙන් කිරීම | 2,016 | 2,016 | 2,016 | 100% |
| 225 | පොලිස් මූලස්ථානය | වාර්ෂික මූල්‍ය දායකත්වය - INTERPOL මහලේකම් කාර්යාලය | 22,823 | 22,823 | 22,823 | 100% |
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව | වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් | 9,064 | 9,064 | 8,115 | 90% |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

ශ්‍රී ලංකා රුපියල් 000'

| වත්කම් කේතය | කේත විස්තරය | 2023 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ වාර්තා කමිටුවට අනුව ශේෂය | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය | තව දුරටත් ගිණුම්ගත කිරීමට ඇති | වාර්තාකරණ ප්‍රගතිය ප්‍රතිශතයක් (%) ක් ලෙස |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහය | | 10,555,257 | | සමීක්ෂණය |
| 9152 | යන්ත්‍ර සහ උපකරණ | | 1,906,120 | | 100% |
| 9153 | ඉඩම් | | 1,010,362 | | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | 47,540 | | 100% |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | - |
| 9160 | නොනිමි වැඩ | | - | | |
| 9180 | කල්බදු වත්කම් | | - | | - |

**3.9 2023** වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

ශ්‍රී ලංකා රුපියල් 000'

| වර්ගය | 2023 ඇස්තමේන්තුගත | තථ්‍ය (2023.12.31 දිනට) | හිඟය / අතිරික්තය | *විචල්‍යතාවයන් සඳහා ඉවහල් වන ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම (අදාළ නම්) | **6,303,940** | **6,530,336** | | 01.කොන්සියුලර් ගාස්තු ආදායම වැඩිවීම<br>02. ප්‍රාග්ධන වත්කම් (වාහන) විකිණීමෙන් ලැබෙන ආදායම වැඩි වීම |

| | | | | |
|---|---|---|---|---|
| මුළු වියදම | **19,000,000** | **16,977,507** | | |
| පුනරාවර්තන | 18,480,935 | 16,626,107 | | භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති උපදෙස් අනුව වියදම් පාලනය කෙරේ. |
| ප්‍රාග්ධන | 519,065 | 351,400 | | 01. විදේශ දූත මණ්ඩලවල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අපේක්ෂිත වියදම් සිදු නොවීම<br>02. වියදම් පාලනය වන පරිදි. භාණ්ඩාගාරය විසින් ලබා දෙන උපදෙස් |

*ආදායම් සහ වියදම්වල සැලකිය යුතු විචලනයන් සඳහා ප්‍රධාන හේතු මෙහි කෙටියෙන් දක්වා ඇත.

**3.10 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | PAF/A/FM/02/2023/14 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024 මැයි 30 දින |

ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

**ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, මූලධන වැය විෂයන් 08 ක රු.153,106,068ක් හා පුනරාවර්තන වැය විෂයන් 04 ක රු.45,575,069 ක් ලෙස සියයට 58 ක සිට සියයට 99 ක් දක්වා පරාසයකින් ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති රීති, රෙගුලාසි හෝ විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය හා 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ IX පරිච්ඡේදය | (i) ආයතන සංග්‍රහය අනුව පත්කිරීමක් හෝ උසස් කිරීමක් කළ හැක්කේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරකට පමණි. කාර්ය පරිපාටික රීති සංග්‍රහය |

අනුව කිසියම් තනතුරක වැඩබැලීම සඳහා හෝ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කිරීමක් කිරීමේ බලය ඇත්තේ පත්කිරීම් බලධරයා පමණි. එසේ වුවද , විදේශ සේවයේ අනුමත අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සංඛ්‍යාව 09 ක් වුවද වැඩ බැලීම සඳහා පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරු 08 දෙනෙක් ඇතුළුව තථ්‍ය ප්‍රමාණය 17 ක් විය. තවද වැඩබලන අතිරේක ලේකම්වරු 05 දෙනෙකු පත්කිරීම සඳහා පත්කිරීම් බලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 136 වගන්තිය අනුව කිසියම් තනතුරකට නිල වශයෙන් හිමි දීමනා හා වරප්‍රසාද එම තනතුරෙහි වැඩ බලන හෝ රාජකාරී ඉටුකරන නිලධරයාට එම වැඩ බලන හෝ රාජකාරී ඉටු කරන හෝ කාලය තුළදී භුක්ති විදිය හැකි වුවත් අනුමත තනතුරක් හා පත් කිරීම් බලධරයාගේ අනුමැතිය නොමැතිව පත්කරන ලද වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරු 08 දෙනෙකු වෙනුවෙන් නිල වාහන වෙන් කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.3,650,191ක් ඉන්ධන දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 156(i) (අ) | සේවයෙන් ඉවත්ව ගොස් සිටී නිලධාරිනියකට වැටුප් වශයෙන් රු.558,471ක් වැඩිපුර ගෙවීමෙන් සිදු වූ පාඩුව ප්‍රතිපූරණය කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 880 | ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තබා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2015 ජූලි 23 දිනැති අංක 07/ 2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 08 vii ඡේදය | එක් එක් මාසයේ දායක මුදල් ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ලැබීමට සැලැස්විය යුතු වුවත් 2023 පෙබරවාරි සිට නොවැම්බර් දක්වා රු. 874,014 ක දායක මුදල් එසේ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට යවා නොතිබුණි. |

## 2.3. තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම.

### (අ) 7002-0-0-35-13 දරන අග්‍රිම ගිණුම

(i) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. 50,970,216 ක් වූ අතර එය 2013 හා ඊට පෙර වර්ෂවලට අදාළ නොපියවූ අත්තිකාරම්වලින් සමන්විත වී තිබුණි.මෙම ශේෂය තුළ විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශගත වූ කාර්යය මණ්ඩලයට ලබාදෙන ලද භාවිතයට නොගන්නා නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 103 කට අදාළ රු.32,474,452 ක් හා අතුරු අග්‍රිම රු. 18,495,764 ක් පැවතුණි.

(ii) භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු වටිනාකමින් රු.3,602,632 ක් වර්ෂ 20 ඉක්මවා තිබුණු අතර රු.28,871,820 ක් වර්ෂ 10 ත් 20 ත් අතර කාලපාරාසයකට අයත්ව තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් 2009 සැප්තැම්බර් 01 දිනැති හා අංක 250 දරන අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව එම තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ෆ්‍රන්ක්ෆර්ට් දූත මණ්ඩලය වසා දමා තිබුණද නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු.2, 234, 933 ක් නිරවුල් කර නොතිබුණි.

(iv) මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් අවස්ථා 69කදී ලබාදී තිබුණු රු.18,495,764 ක් අග්‍රිම ගිණුම් ශේෂය තුළ පැවතුණි. මෙම තත්කාර්ය අතුරු අග්‍රිම ශේෂය තුළ රු.1,585,560 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබුණු අතර රු.16,910,769 ක් වර්ෂ 10 ත් වර්ෂ 20 ත් අතර කාලපාරාසයකට අයත්ව තිබුණි.

(ආ) **7002-0-0-35-23 අග්‍රිම ගිණුම**

(i) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.959,519,202ක් වූ අග්‍රිම ගිණුම් ශේෂය තුළ රු.56,629,614ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 134කට අදාළ වී තිබුණි. එම වටිනාකමින් රු.2,486,516 ක් වර්ෂ 20ක් හා රු.10,177,716 ක් වර්ෂ 10 ඉක්ම වූ තැන්පතු වටිනාකම් වී තිබූ අතර රු.27,754,083 ක් වර්ෂ 05 ක් සහ වර්ෂ 10ත් අතර කාලපාරාසයකට අයත්ව තිබුණි.

(ii) වසා දමන ලද දූත මණ්ඩල තුනකට අදාළ නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු.9,199,873 ක් නිරවුල් කර නොතිබුණි.

(iii) නිවාස කුලී ගෙවීම්වලට අදාළ 1967 පෙබරවාරි 26 දිනැති අංක X – 301 දරන අමාත්‍යාංශ චක්‍රලේඛ විධිවිධාන අනුව විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන ලද ආරක්ෂිත තැන්පතු/ කුලී අත්තිකාරම් මුදල් සඳහා අදාළ නිලධාරියා පෞද්ගලිකවම වගකිවයුතු බව දක්වා තිබුණි. එසේ වුවද නිවාස සඳහා සිදු වී තිබුණු අලාභ හානි හේතුවෙන් නිවාස හිමියන් විසින් ආපසු නොගෙවන ලද අත්තිකාරම් මුදල් වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග නොගෙන රු.6,009,786ක් රජයේ වියදම් සේ කපා හැර තිබුණි.

(iv) මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් තුළ රු.5,619,509ක තත්කාර්යය අතුරු අග්‍රිම පැවතුණි. මෙම වටිනාකම තුළ වර්ෂ 10 ඉක්මවූ අතුරු අග්‍රිම රු.446,388ක්ද වර්ෂ 05 ඉක්මවූ අතුරු අග්‍රිම රු.1,724,058ක්ද විය.

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) ලන්ඩන් දූත මණ්ඩලයට අදාළව තැන්පත් කර තිබූ ස්ටර්ලින් පවුම් 8786 ක් වාර්තාවේ දින වන විටත් උපලබ්ධි වී නොතිබුණු අතර විදේශ දූත මණ්ඩල 05 ක 2016 සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළ චෙක්පත් 10ක් හඳුනා නොගත් හර ලෙස පැවතුණි.

(ආ) විදේශ දූත මණ්ඩල 16ක 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බැංකු ගිණුමට සෘජුව කරන ලද ලැබීම් චෙක්පත් 47ක් හා අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා බැංකු ගිණුමට සෘජුව කරන ලද ලැබීම් රු.501,006 ක් වූ චෙක්පත් 17ක් හඳුනා ගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) 2022 සැප්තැම්බර් 21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 06/2022 හි සඳහන් පරිදි අහෝසි වී ගිය වැය ශීර්ෂවලට අදාළ අක්‍රීය නිළ බැංකු ගිණුම් වසා දැමිය යුතු වුවත් වසා දමන ලද විදේශ දූත මණ්ඩල 06ක බැංකු ගිණුම් 08 ක් වාර්තාවේ දින වන විට අක්‍රියව පැවතිණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටුනොකිරීම

(අ) 2010 හා ඊට පෙර වර්ෂයන්හිදී කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා ගොස්, අනතුරු හේතුවෙන් මිය ගිය ශ්‍රී ලාංකිකයන් 06 දෙනෙකුගේ වන්දි ලබා ගැනීම් ලිපිගොනු කාල ප්‍රමාදයන් හේතුවෙන් වසා දැමීමට කම්කරු අධිකරණය තීරණය කර තිබුණි. මෙහිදී ඉල්ලුම්කරුවන් නිසි පරිදි ලියවිලි කාලීනව ඉදිරිපත් කර තිබියදී කටාර් තානාපති කාර්යාලයේ නිලධාරීන් නියමිත කාලයේදි වන්දි ලබාගැනීමට වගකිව යුතු අන්දමින් කටයුතු සිදු නොකිරීම මත වන්දි හා දීමනා ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා විදේශ ගත වූ තැනැත්තෙකු හදිසි අනතුරකින් 2012 සැප්තැම්බර් 10 වන දින මිය ගොස් තිබුණු අතර කොන්සියුලර් අංශය මෙම සිද්ධියට අදාළ වන්දි ඉල්ලීම් තොරතුරු 2013 පෙබරවාරි 06 දින තානාපති කාර්යාලයට දන්වා තිබුණි. කටාර් ප්‍රාථමික අධිකරණය වන්දි වශයෙන් (Blood money) කටාර් රියාල් 200,000ක් ළඟම ඥාතියාට (NOK) ගෙවන ලෙස නියම කර තිබුණද එම මුදල් නොගෙවීම හේතුවෙන් නඩුව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා බලය පවරමින් නෛතික ලියවිලි 2013 නොවැම්බර් 25 දින තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබූ නමුත් එදින සිට වසර 04ක් ගතවන තුරු නඩුවට අදාළ කිසිදු ලියවිල්ලක් ලිපි ගොනුවෙහි ඇතුළත්ව නොතිබුණි. මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට බලය පවරමින් නැවතත් නෛතික ලියවිලි 2019 පෙබරවාරි 18 දින තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණද වන්දි අයකර ගැනීම සම්බන්ධ තොරතුරු ගොනුවෙහි නොතිබුණි.

(ඇ) කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා විදේශ ගත වූ තැනැත්තෙකු 2012 ඔක්තෝම්බර් 21 දින හදිසි අනතුරකින් මිය ගොස් තිබුණු අතර 2012 නොවැම්බර් 06 දින අදාළ වන්දි ඉල්ලීම සිදු කර තිබුණි. වන්දි ඉල්ලීමට අදාළ නඩුව ගොනු කිරීමට අවශ්‍ය නීතිමය ලියවිලි 2013 අගෝස්තු 22 දින තානාපති කාර්යාලයට ඉදිරිපත් කර තිබූ නමුත් වසර 04 ක් ගතවීමෙන් පසු එනම් 2017 නොවැම්බර් 20 දින Asma Ali Advocates & Legal Consultants ආයතනය තෝරාගැනීමට අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලුම් කර තිබුණි. එසේ වුවද 2018 සැප්තැම්බර් 26 දින මෙම වන්දි

මුදල් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා Fahid Al Dosary Law Firm ආයතනය පත්කර තිබුණු අතර වන්දි ලබා ගැනීම සඳහා මෙම නීති ආයතනයට බලය පැවරීමට අදාළ ලියවිලි, ඥාතියා (NOK) විසින් සම්පූර්ණ කර 2018 නොවැම්බර් 19 දින කටාර් තානාපති කාර්යාලයට ඉදිරිපත් කර තිබුණි. මෙම නඩුව නීති ආයතනයට පැවරීම පිළිබඳ හා නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ලිපිගොනුවෙහි ඇතුළත්ව නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් පහත සඳහන් වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් කරුණු නිරීක්ෂණය කළද එම නිරීක්ෂණයන් සම්බන්ධයෙන් 2024 මැයි 30 දිනය වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(i) සෞදි අරාබියේ රැකියාවක් සඳහා ගොස් තිබුණු පුද්ගලයෙකු දින 24 ඔක්තෝබර් 2012 අනතුරකටභාජනය වී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම.

(ii) කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් සඳහා දින විදේශ 19 දෙසැම්බර් 2009 දින මිය 29 ජනවාරි 2012 ගත වූ තැනැත්තියක්යාම.

(iii) වර්ෂ 17ක පමණ කාලයක් කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවයේ යෙදී සිටි තැනැත්තියක් අසනීප වී සුරක්ෂාගාරයට පැමිණීම හා ඒ තුළදී මියයාම.

(iv) ජෙද්දාහීදි 2011වර්ෂයේදී මරණයට පත්වූ පුද්ගලයෙකු සියදිවි නසා ගැනීමක්ද මරණයට පත් වීමක් ද යන්න සනාථ කර ගැනීම හා වන්දි ලබා ගැනීම.

(ඉ) විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් මහජනතාවට සලසනු ලබන සේවාවන් අතර අ.පො.ස (සා/පෙ.), අ.පො.ස (උ/පෙ.) විභාග සහතික සහ උප්පැන්න, විවාහ, මරණ සහතික කාර්යක්ෂමව සත්‍යාපනය කිරීම පහසු කිරීම සඳහා විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e - DAS) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීමට සැලසුම් කර තිබුණ ද එය ඉටු කර නොතිබුණි.

### 3.2 ප්‍රසම්පාදනයන්

(අ) පැරිස් තානාපති නිල නිවාසය සඳහා රු. 3,378,829 ක් වූ සෝෆා කට්ටලයක් මිලදී ගැනීම.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 කොන්ත්‍රාත්තු සඳහා අත්තිකාරම් ගෙවීමට අදාළව 2016 ජනවාරි 25 දින නිකුත් කරන ලද අතිරේක අංක 29 අනුව ණයවර ලිපියේ වටිනාකමින් සියයට 30කට වැඩි නොවන මුදලක් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමට වන නමුත් මෙම ප්‍රසම්පාදනයේදී

සෝෆා කට්ටලයේ වටිනාකමින් සියයට 90ක් එනම් රු 1,238,040ක් අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි.

(ii) මෙම ප්‍රසම්පාදනයට අදාළ ලංසු කැඳවීමේ ලේඛන, සැපයුම්කරුවන්ගේ මිල ගණන් ඉදිරිපත් කිරීමේ තොරතුරු හා දෙපාර්ශවය අතර එළඹි ගිවිසුම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) 2023 ඔක්තෝබර් 27 දින මෙම සෝෆා කට්ටලය පැරිස් තානාපති කාර්යාලයට ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා නැව් සංස්ථාව වෙත භාරදී තිබුණ ද එම භාණ්ඩ නියමිත පරිදි නිමකර ඇති බවට පරීක්ෂා කර ලංකාවේදී භාර ගැනීමක් සිදුකර නොතිබුණි. විධිමත් ඇසුරුම් නොමැති වීම හේතුවෙන් අදාළ සෝෆා කට්ටලයට හානි වීම් සිදු වී ඇති බවත් මේ පිළිබඳ පරීක්ෂා කරන ලෙසත් දූත මණ්ඩලය මගින් 2023 දෙසැම්බර් 16 දින අමාත්‍යාංශයට වාර්තා කර තිබුණ ද අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

(අ) අමාත්‍යාංශය විසින් මිලදී ගෙන ඇති කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 17 ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගෙන නොතිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරය හරහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබූ කල්බදු කාලය අවසන් වාහන 08 ක අයිතිය පවරාගෙන නොතිබුණි.

(ඇ) කැන්බරා මහකොමසාරිස් කාර්යාලයේ 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබූ ජංගම දුරකථන තථ්‍ය ශේෂය 86ක් වුවද ලෙජරය අනුව ශේෂය 117ක් වූයෙන් දුරකථන 31ක හිඟයක් පැවතුණු අතර පැවති දුරකථන 86ද නිශ්කාර්යව පැවතුණි.

### 3.4 පාඩු හා හානි

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව විදේශ දූත මණ්ඩල දෙකක 2002 හා 2009 වර්ෂවලට අදාළ අයථා මුදල් පරිහරණය කිරීම් හා මුදල් තැන්පත් නොකිරීම් සම්බන්ධ සිද්ධීන් 2කට අදාළව රු.16,176,674ක පාඩු දක්වා තිබුණි. මුදල් රෙගුලාසි 106 ප්‍රකාර නැති වූ මුදල වහාම පූර්ණය කළ යුතු වුවත් මෙම පාඩු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 3.5 කළමනාකරණ දුර්වලතා

(අ) විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් මරණයට පත්වීම, රැකියා අහිමි වීම, අර්ධ හෝ පූර්ණ වශයෙන් ආබාධිත තත්ත්වයට පත්වීම හේතුවෙන් අදාළ පාර්ශවයන්ට ගෙවීම සඳහා වන්දි, රක්ෂණ, සේවය අවසන් කිරීමේ වැටුප් යනාදි වශයෙන් විදේශයන්ගෙන් ලද රු.56,919,349ක් වර්ෂ 01 සිට 03 දක්වා කාලයක සිට අදාළ පුද්ගලයන්ට ගෙවීමට කටයුතු නොකර අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) විදේශ දූත මණ්ඩල පවතින ඕස්ට්‍රේලියාව, ස්වීඩනය හා කෙන්යාව යන රටවල ශ්‍රී ලංකා රජයට අයත් ගොඩනැගිලි පැවතියද ඒවා නඩත්තු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නිල නිවාස කුලී වශයෙන් රු. 173,537,875ක් ගෙවා තිබුණි.

(ඇ) 2019 මාර්තු 06 දින ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 14 අනුව විදේශයන් සමඟ අත්සන් කල ගිවිසුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අදාළ වර්තමාන අමාත්‍යාංශ අනුව වර්ගීකරණයක් සිදුකර මෙම ගිවිසුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය හා වර්තමාන තත්ත්වයද, ගිවිසුම් නීති කඩකිරීම් සිදු වී ඇත්නම් එසේ වීමට හේතුද සඳහන් වාර්තාවක් ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කළයුතු වුවත් එම කාර්යය මේ වන විටද සිදු කර නොතිබුණි.

(ඈ) මියගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් වර්ෂ 05කට වැඩි කාලයක සිට පැවත එන රු.472,532 ක ණය ශේෂයක් ද, සේවය හැර ගොස් ඇති නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,367,830ක ණය ශේෂයකින් වර්ෂ 5 ට වැඩි ශේෂය රු.662,946ක් ද, සේවය අවසන් කළ නිලධාරීන් 9 දෙනෙකුගෙන් රු.339,955ක ණය ශේෂයකින් වර්ෂ 5 ට වැඩි ශේෂය රු.299,955ක් ද අයවිය යුතුව පැවතුණි. තවද වර්ෂ 05 ට වැඩි කාලයක සිට පැවත එන නිලධාරීන් 14 දෙනෙකුගේ රු.1,499,176ක හඳුනාගත නොහැකි ණය ශේෂයක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණ අතර විදේශ දූත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් 21 දෙනෙකුගෙන් රු.1,117,255ක ණය ශේෂවලින් කිසිදු වාරිකයක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන නොතිබුණි.

(ඉ) 2012 ජනවාරි 27 දිනැති අංක 209 දරන අමාත්‍යාංශ උපදෙස් මාලාවේ 02 (ආ) ඡේදයට අනුව නියෝජන දීමනා හිමි නිලධාරියෙකු කිසියම් මාසයක හෝ මාස කිහිපයක ඉතිරි වූ ශේෂයක් වෙතොත් සිය මාසික හිමිකම් ප්‍රමාණයෙන් සියයට 250 ක සීමාවකට යටත්ව සිය පත්වීම් කාලසීමාව අවසන් වීමට මාස දෙකක කාලය තුළදී සමුගැනීමේ සාදයට වැය කිරීමට ඉඩදිය හැකිය. එසේවුවද, ඩුබායි විදේශ දූත මණ්ඩලයේ කොන්සල් ජනරාල් 2023 මාර්තු මස සිය සමුගැනීමේ සාදය වෙනුවෙන් 2023 ජනවාරි සහ පෙබරවාරි මාසවල ඔහුට හිමි නියෝජන දීමනාවෙහි ඉතිරිවීම් නොතිබියදී (AED) 1600ක් ගෙවා තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1. අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 690 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 613 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 97 ක් හා අතිරික්ත තනතුරු 20 ක් විය. දූත මණ්ඩලවල සියරට ජේරුව අනුමත කාර්ය මණ්ඩලය 500 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 356 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 144 ක් විය. තවද දූත මණ්ඩලවල ස්ථානීය නොවන කාර්ය මණ්ඩලය 548 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 446 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 102 ක් විය.

කේ.ආර්.ටී. මැණිකේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් - 01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

## 4 වැනි පරිච්ඡේදය: ප්‍රධාන කාර්ය සාධන දර්ශක

### 4.1. අමාත්‍යාංශයේ සමස්ත ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සාක්ෂාත් කර ගැනීම

ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික බැඳීම් හරහා විදේශයන්හි ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම-2023 මත පදනම්ව අමාත්‍යාංශය විසින් භාවිතා කරන ප්‍රධාන කාර්ය සාධක දර්ශකවල (KPI) ප්‍රතිදානයේ සාරාංශය මෙම පරිච්ඡේදය විස්තර කරයි.

2023 දී අමාත්‍යාංශයේ කාර්ය සාධනය අවධානය යොමු කළේ පසුකාලීනව ඇති වූ ගෝලීය අර්බුදවලින් අහිතකර ලෙස බලපා ඇති ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම කෙරෙහි ය. මෙම සන්දර්භය තුළ, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල ඔවුන්ගේ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික කටයුතු හරහා ශ්‍රී ලංකා සංචාරක, රැකියා, වෙළඳාම සහ ආයෝජන පුළුල් ලෙස ප්‍රවර්ධනය කරන ලදී. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල පහත සඳහන් ප්‍රමුඛතා ක්ෂේත්‍ර කෙරෙහි නිසි අවධානයක් යොමු කරමින් ඔවුන්ගේ රාජකාරි සහ කාර්යයන් ඉටු කළහ.

- ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)
- දේශපාලන රාජ්‍යතාන්ත්‍රිකභාවය (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)
- බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රිකභාවය
- සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ මානව සබඳතා
- ආරක්ෂක සහ ආරක්ෂණ සහයෝගිතාව
- මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය
- කොන්සියුලර් ආධාර සහ සංක්‍රමණික කම්කරු සුබසාධනය
- විද්‍යා රාජ්‍යතාන්ත්‍රිකභාවය
- මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය
- වෙනත්

ක්‍රියාකාරී සැලැස්ම-2023 මත පදනම්ව එහි KPIs හරහා අමාත්‍යාංශයේ සමස්ත කාර්ය සාධනය පහත වගුව-IV හි පෙන්වා ඇත.

**වගුව IV- ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| # | ප්‍රමුඛතා ක්ෂේත්‍ර /ප්‍රධාන කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානයන් | | |
|---|---|---|---|---|
| | | 100-70 % | 70-40 % | 40 % ට අඩු |
| 1. | බහුපාර්ශ්වික සංසදයේ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | | | |
| 2. | කලාපීය සංවිධාන සමඟ සම්බන්ධ වීම | | | |
| 3. | ඉහළ මට්ටමේ සංචාර ගණන | | | |
| 4. | ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන/ඒකාබද්ධ කමිටු/ රැස්වීම්/ සාකච්ඡා ගණන | | | |
| 5. | විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සමඟ සම්බන්ධවීම | | | |
| 6. | සෞඛ්‍ය රාජ්‍යතාන්ත්‍රිකභාවය යටතේ සහයෝගිතාව | | | |
| 7. | අමාත්‍යාංශයේ උපාය මාර්ගික සන්නිවේදන ප්‍රවේශය | | | |

| | | | | |
|---|---|---|---|---|
| | යටතේ මුල පිරීම් ගණන | | | |
| 8. | ආරම්භ කරන ලද/අවසන් කරන ලද ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් ගණන | | | |
| 9. | මාධ්‍ය සමඟ සම්බන්ධවීම් (විදේශය තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා  රාජ්‍යතාන්ත්‍රිකභාවය සඵලතාව) | | | |
| 10. | වෙළඳ ප්‍රවර්ධන සිදුවීම් ගණන | | | |
| ලේඛන සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ එය සත්‍යාපනය කළ ලේඛනවල සත්‍යතාව සහතික කිරීම සඳහා මෙම අංශය රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ බලධාරීන් සමඟ පද්ධති ඒකාබද්ධ කිරීම යෝජනා කළේය.<br><br>e-DAS පද්ධති ඒකාබද්ධ කිරීම හරහා අදාළ ලේඛන නිකුත් කිරීමේ අධිකාරීන් සමඟ ඍජුවම සම්බන්ධ වේ. තුන්වන පාර්ශ්වයේ මැදිහත්වීම ඉවත් කරමින් අවම මිනිස් මැදිහත්වීමකින් ලේඛන අන්තර්ජාලය හරහා පද්ධතියට සම්ප්‍රේෂණය කෙරේ.<br><br>පද්ධති ඒකාබද්ධතාවයේ මූලික පරමාර්ථය වන්නේ අයදුම්කරුවන්ට ලේඛන සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම මාර්ගගතව සම්පූර්ණ කිරීමට පහසුකම් සැලසීමයි. මෙය අයදුම්කරුවන්ට ඩිජිටල් වේදිකාවක් හරහා අයදුම් කිරීමට සහ ඔවුන් වෙත ඍජුවම සත්‍යාපනය කළ ලේඛන යොමු කිරීමට ඉඩ සලසයි. | 2023 වර්ෂයේදී e-DAS තුළ අදාළ විශේෂාංග ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමත් සමඟ ඒකාබද්ධ කිරීම ආරම්භ විය. |
| පද්ධතිය හරහා සත්‍යාපනය කරන ලද සියලුම ලේඛන විගණනය කිරීමට සහ සමාලෝචනය කිරීමට e-DAS හි විගණන යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත. | ක්‍රියාත්මක කර මෙහෙයවා ඇත |
| 2023 අගෝස්තු මාසයේදී විභාග දෙපාර්තමේන්තුව සමඟ එක්ව අ.පො.ස. සා/පෙළ සහ අ.පො.ස. උ/පෙළ සහතික සත්‍යාපනය කිරීම සඳහා පද්ධති ඒකාබද්ධ කිරීම සහ මාර්ගගත ස්ථාපිත කර සාර්ථකව දියත් කරන ලදී. | එය 2023 අගෝස්තු මාසයේදී නිම කරන ලද අතර එය මේ මොහොතේ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීම, වෛද්‍ය සභාව, ශ්‍රී ලංකා පොලිසිය, ප්‍රාදේශීය විශ්වවිද්‍යාල ආදිය ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ පද්ධති ඒකාබද්ධ කිරීම පහසු කිරීම සඳහා e-DAS තුළ ශාඛා මොඩියුලය සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී. | 2024 දෙවන කාර්තුව තුළ නිම කිරීමට සැලසුම් කර ඇත |

| | |
|---|---|
| කොන්සියුලර් කටයුතු අංශය හරහා උප්පැන්න, විවාහ සහ මරණ සහතික සහතික කිරීම සඳහා අයදුම් කිරීමට අයදුම්කරුවන්ට මාර්ගගත ප්‍රවේශය සක්‍රීය කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ පද්ධති ඒකාබද්ධ කිරීම ආරම්භ කරන ලදී. | 2024 අප්‍රේල් මැද වන විට නිම කිරීමට සැලසුම් කර ඇත |
| පත්වීම් ක්‍රමය විධිමත් කිරීම සඳහා e-DAS හරහා නව හමුවීම් ක්‍රමයක් හඳුන්වා දීම | 2024 අප්‍රේල් මස අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර ඇත |
| අමාත්‍යාංශයේ ප්‍රධාන අන්තර්ජාල පද්ධතිය තුළ කොන්සියුලර් කටයුතු අංශය සඳහා වෙන්වූ වෙබ් පිටුවක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී | 2024 දෙවන කාර්තුව තුළ නිම කිරීමට සැලසුම් කර ඇත |
| **කොන්සියුලර් සේවා සැපයීම විමධ්‍යගත කිරීම** | |
| බදුල්ල සහ අනුරාධපුර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල දෙකක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිව තිබේ. | 2024 දෙවන කාර්තුව තුළ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත |
| **විවිධ කොන්සියුලර් ක්‍රියාකාරකම්** | |
| විදේශ උප්පැන්න ලියාපදිංචි කිරීමේදී පුද්ගලයන් සම්බන්ධීකරණය කිරීම සහ සහාය වීම, ශ්‍රී ලංකා උප්පැන්න සහතික නිකුත් කිරීමෙන් පසු අදාළ ලබන්නන් වෙත ලබා දීම සහ දූත මණ්ඩල/කාර්යාල මගින් අංශය වෙත යැවීම.<br><br>සංචාරක ලියකියවිලි, පුරවැසි සහතික, විවාහ සහතික, රියදුරු බලපත්‍ර සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන්ට සහාය වීම<br><br>විදේශ රටවලින් පොලිස් නිෂ්කාශන සහතික ලබා ගැනීමට සහ විදේශ උපාධි සහතික තහවුරු කිරීමට අයදුම්කරුවන්ට පහසුකම් සැලසීම සහ සහාය වීම<br><br>ඔවුන්ගේ අතුරුදහන් වූ ඥාතීන් සිටින ස්ථානය සොයා ගැනීමට සමීපතමයාට සහාය වීම | එක් එක් සිද්ධිය අනුව සම්පූර්ණ කර ඇත |

**4.4.2.** සාමාන්‍ය පරිපාලන අංශය

| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
|---|---|---|---|
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **විදේශ දූත මණ්ඩල /කාර්යාල සඳහා පොදු වෙබ් අඩවි හඳුන්වා දීම**<br>• ඩොමේන් URL gov.lk ලෙස වෙනස් කළ වෙබ් අඩවි ගණන<br>● පොදු වෙබ් වේදිකාවට අනුගත වන වෙබ් අඩවි ගණන | | | 30% |

| | | | |
|---|---|---|---|
| **ක්‍රියාවලීන් කඩිනම් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දැනුම යෙදීමේ හැකියාව වැඩි දියුණු කිරීම**<br>• පවත්වන ලද වීඩියෝ පුහුණු සැසි ගණන<br>• සහභාගිවන්නන් සංඛ්‍යාව<br>• පවත්වනු ලබන පුහුණු වැඩසටහන් ගණන<br>• සහභාගිවන්නන් සංඛ්‍යාව | 100% | | |
| **කොන්සියුලර් අංශයේ ඉලෙක්ට්‍රොනික ලේඛන සහතික කිරීමේ පද්ධතියට (SAS) පද්ධති වැඩිදියුණු කිරීම්**<br>• පාරිභෝගික පොරොත්තු කාලය අඩු කිරීම<br>• කොන්සියුලර් වෙත පාරිභෝගික පැමිණීම් ගණන අඩු කිරීම<br>• එක් එක් පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය අනුව බෙදීම<br>• දෛනික සේවා පාරිභෝගිකයන් වැඩි දියුණු කිරීම | | 75% | |
| **වත්කම් කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම**<br>• පද්ධතියට එකතු කළ වත්කම් ගණන<br>• පද්ධතියට ඇතුළත් කර ඇති කොට්ඨාශ ගණන | | 70% | |
| අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබා දීම<br>• පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් ගණන | 90% | | |
| අමාත්‍යාංශය එකම ගොඩනැගිල්ලක් යටතට ගෙන ඒම<br>• ඉඩම් අත්පත් කර ගැනීම<br>• ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කිරීම (UDA විසින්)<br>• ගොඩනැගිලි ව්‍යුහය සැලසුම් කිරීම (UDA විසින්) | යෝජිත ඉඩම් වෙනස් කිරීම නිසා සැලසුම් කළ කටයුතු සිදු නොවීය. එබැවින් මෙම ප්‍රමුඛතා ක්ෂේත්‍රය 2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම වෙත ගෙන යන ලදී. | | |

### **4.4.3.** මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය

| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
|---|---|---|---|
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| A. මානව සම්පත් කාර්යයන් පරිපාලනය කිරීම | | | |
| 1. ශ්‍රී ලංකා විදේශ සේවයේ (SLFS) නිලධාරීන් කළමනාකරණය | 95% | | |
| 2. පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම | 95% | | |
| 3. SLFS නිලධාරීන්ගේ අභ්‍යන්තර මාරුවීම් පාලනය කිරීම | 100% | | |
| 4. විදේශ මාරුවීම් ක්‍රියාත්මක කිරීම | 95% | | |
| 5. දූත මණ්ඩල ප්‍රධානීන් පත් කිරීම | 100% | | |
| 6. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලය පත් කිරීම | 95% | | |
| 7. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යයන් සඳහා රාජ්‍ය තාන්ත්‍රික නොවන කාර්ය මණ්ඩලය/ සහාය සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය පත් කිරීම | 90% | | |

| | | | |
|---|---|---|---|
| කළමනාකරණ කාර්යයන් පැවැත්වීම | | | |
| 1. ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම | 95% | | |
| 2. අමාත්‍යාංශ උපදෙස් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම | 100% | | |
| 3. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්ය මණ්ඩල ප්‍රතිපාදන කළමනාකරණය කිරීම | 95% | | |
| 4. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුයුක්ත කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ අදාළ දීමනා කළමනාකරණය කිරීම | 100% | | |
| 5. දූත මණ්ඩල කාර්ය මණ්ඩලය විසින් දේශීය සහ ජාත්‍යන්තර සංචාර කළමනාකරණය | 100% | | |
| 6. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුයුක්ත රාජ්‍යතාන්ත්‍රික සහ රාජ්‍යතාන්ත්‍රික නොවන කාර්ය මණ්ඩලවල විදේශ නිවාඩු කළමනාකරණය | 100% | | |
| 7. විගණන විමසුම් කළමනාකරණය සහ ප්‍රතිපත්ති විධාන ක්‍රියාත්මක කිරීම | 95% | | |
| 8. පාර්ලිමේන්තු ප්‍රශ්න කළමනාකරණය කිරීම | 100% | | |
| 9. විදේශයන්හි නව ශ්‍රී ලංකා දූත මණ්ඩල පිහිටුවීම කළමනාකරණය කිරීම සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල තාවකාලිකව වසා දැමීම | 90% | | |
| C අභ්‍යන්තර කළමනාකරණ කාර්යයන්<br>1. මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයේ මාණ්ඩලික සාමාජිකයින් කළමනාකරණය කිරීම | 100% | | |

### 4.4.4. අභ්‍යන්තර විගණන අංශය

| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
|---|---|---|---|
| | **100% -90%** | **89% -75%** | **74% - 50%** |
| පාර්ලිමේන්තුවට වගකියන රාජ්‍ය ආයතනයක් ලෙස අමාත්‍යාංශයේ සහ එහි දූත මණ්ඩල/කාර්යාලවල කාර්ය සාධනය අධීක්ෂණය සහ ඇගයීම.<br>- අභ්‍යන්තර පාලන අඩුපාඩු හෙළිදරව් කිරීම සහ නිවැරදි කිරීම සඳහා නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා ගණන | | | 52% |

### 4.4.5. නීති අංශය

| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
|---|---|---|---|
| | 100% - 90% | 89% - 75% | 74% - 50% |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය** | | | |
| **වෙළඳාම සහ ආයෝජන**<br>- නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළුව හැකි සියලුම සගයන් සහ දේශීය පාර්ශවකරුවන් සමඟ ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් සාකච්ඡා කිරීම සහ තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ලෙබනනය, බෙලරුස් සහ ඕමානය සමඟ ද්විපාර්ශ්වික ආයෝජන ප්‍රවර්ධන සහ ආරක්ෂණ ගිවිසුම් අවසන් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීම | | | 60% |
| **ගුවන් සේවා ගිවිසුම්**<br>කොරියානු ජනරජය (ROK), කැනඩාව, හංගේරියාව, ඊශ්‍රායලය, නෙදර්ලන්තය, ඇෆ්ගනිස්ථානය සහ ඕමානය සමඟ ගුවන් සේවා ගිවිසුම් අවසන් කිරීම.<br>- අනෙකුත් සගයන් සමඟ නව ගුවන් සේවා ගිවිසුම් සාකච්ඡා කිරීමේ හැකියාව ගවේෂණය කිරීම<br>- වෙළඳ සහ ආර්ථික සංවර්ධනය සඳහා රටවල් අතර වෙළඳ සහ මගීන්ගේ වේගවත් හා පහසු සංචලනය පුළුල් කිරීම සඳහා කොරියානු ජනරජය (ROK), ඕමාන් සහ කැනඩාව, ඊශ්‍රායලය, නෙදර්ලන්තය සහ ඇෆ්ගනිස්ථානය සමඟ ගුවන් සේවා ගිවිසුම් ගණන.<br>2023 දී අත්සන් කිරීමට නියමිත ගුවන් සේවා ගිවිසුම් ගණන | 90% | | |
| **ද්විත්ව බදුකරණයෙන් වැළකීම**<br>-සයිප්‍රසය, හංගේරියාව සහ මෝල්ටාව සමඟ ද්විත්ව බදුකරණය (DTAA) වළක්වා ගැනීම පිළිබඳ ගිවිසුම් වලට එළඹීම සහ යුක්‍රේනය, චෙක් ජනරජය, ඩෙන්මාර්කය සහ ඉන්දියාව සමඟ DTAA සඳහා නීතිපති අවසරය ලබා ගැනීම.<br>- වෙනත් සගයන් සමඟ නව DTAAs සාකච්ඡා කිරීමේ හැකියාව ගවේෂණය කිරීම<br>- සයිප්‍රසය, හංගේරියාව සහ මෝල්ටාව සමඟ ඇතිකර ගත් DTAA ගණන.<br>යුක්රේනය, චෙක් ජනරජය, ඩෙන්මාර්කය සහ ඉන්දියාව සමඟ DTAA සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලබාගෙන ඇත.<br>- ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ගත යුතු පසු විපරම් ක්‍රියාමාර්ග | 95% | | |
| **වීසා නිදහස් කිරීමේ ගිවිසුම්**<br>බහරේනය, මාලදිවයින, ඉන්දුනීසියාව, ආර්මේනියාව සහ ලෙබනනය සමඟ වීසා නිදහස් කිරීමේ ගිවිසුම් ඇතිකර ගැනීම.<br>- අනෙකුත් සගයන් සමඟ නව වීසා නිදහස් කිරීමේ ගිවිසුම් සාකච්ඡා කිරීමේ හැකියාව ගවේෂණය කිරීම | | 85% | |
| **ජාත්‍යන්තර වෙළඳාම සහ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ** | | | |

| | | | |
|---|---|---|---|
| **කොමිසම (UNCITRAL) ක්‍රියාකාරී කණ්ඩායම III යටතේ අපක්ෂපාතී සහ සාධාරණ ආයෝජක-රාජ්‍ය ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.**<br>-ආයෝජක-රාජ්‍ය ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය ( ISDS) සමාලෝචනය කිරීමෙන් අපක්ෂපාතී සහ සාධාරණ යාන්ත්‍රණයක් ගෙන ඒම සඳහා ඇති විභවතාව<br>- මේ පිළිබඳව පවත්වන ලද රුස්වීම් ගණන | | | 60% |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රිකභාවය (ද්විපාර්ශ්වික/ බහුපාර්ශ්වික)** | | | |
| **ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් පිළිබඳ සවිස්තරාත්මක නිරීක්ෂණ සැපයීම**<br>-අදාළ දේශපාලන මේස සහ රේඛීය අමාත්‍යාංශවලින් ප්‍රතිපත්ති ඉදිරිදර්ශන ලබා ගැනීම සහ ගිවිසුම්, ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් පිළිබඳ පුළුල් නීතිමය නිරීක්ෂණ සැපයීම.<br>- 2023 දී වඩාත් වැදගත් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අත්සන් කිරීම සඳහා ගිවිසුම්, ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් කිහිපයක් සඳහා එළඹීම. | 90% | | |
| **බහුපාර්ශ්වික ගිවිසුම්, සම්මුතීන් සහ ගිවිසුම්**<br>(විශේෂිත ජාත්‍යන්තර සම්මුතියේ/ගිවිසුම්/ගිවිසුමක අනුමත කිරීම්/ප්‍රවේශවීම්/අත්සන් කිරීම් ශ්‍රී ලංකාවට වාසිදායකද යන්න සහ ගිවිසුම/සම්මුතිය/ගිවිසුම අපරානුමත කිරීමට ප්‍රමාණවත් නීති සම්පාදනයක් තිබේද යන්න පරීක්ෂා කිරීම) | 90% | | |
| **ආරක්ෂක සහ ආරක්ෂණ සහයෝගීතාව** | | | |
| **අන්‍යෝන්‍ය නෛතික සහය**<br>**-** ROK, මාලදිවයින, කුවේට්, සෞදි අරාබිය, ඊජිප්තුව සහ ලෙබනනය සමඟ අන්‍යෝන්‍ය නෛතික සහය පිළිබඳ ගිවිසුම් ගතවීම.<br>- ජාත්‍යන්තර අපරාධ මැඩලීම සඳහා ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා හඳුනාගත් රටවල් සමඟ ගිවිසුම් ගතවීම සඳහා පැවැත්වීමට නියමිත රුස්වීම් ගණන | | | 70% |
| **දඬුවම් නියම වූ පුද්ගලයන් මාරු කිරීම**<br>**-** කොරියානු ජනරජය, ඊජිප්තුව සහ ලෙබනනය සමඟ ගිවිසුම් ගතවීම<br>- ඇෆ්ගනිස්ථානය සමඟ ගිවිසුම්වලට එළඹීම.<br>සිරකරුවන් මාරු කිරීම පහසු කිරීම සඳහා කොරියානු ජනරජය, ඊජිප්තුව සහ ලෙබනනය සමඟ ගිවිසුම් වලට එළඹීම සඳහා සාකච්ඡා කිහිපයක් පවත්වනු ඇත.<br>- වෙනත් සගයන් සමඟ නව ගිවිසුම් සාකච්ඡා කිරීමේ හැකියාව ගවේෂණය කිරීම | | | 70% |
| **පිටුවහල් කිරීම**<br>ROK, ඊජිප්තුව, ඉතාලිය, ලෙබනනය, මාලදිවයින සහ UAE සමඟ පිටුවහල් කිරීමේ ගිවිසුම් වලට එළඹීම.<br>- වෙනත් රටවල් සමඟ නව පිටුවහල් කිරීමේ ගිවිසුම් සාකච්ඡා කිරීමේ හැකියාව ගවේෂණය කිරීම<br>ROK, ඊජිප්තුව, ඉතාලිය, ලෙබනනය, මාලදිවයින සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ ගිවිසුම් වලට එළඹීම සඳහා | | | 60% |

| | | | |
|---|---|---|---|
| වූ සාකච්ඡා ගණන.<br>- ජාත්‍යන්තර අපරාධ මැඩලීම සඳහා ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා හඳුනාගත් රටවල් සමඟ පැවැත්වීමට නියමිත සාකච්ඡා ගණන | | | |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රිකභාවය** | | | |
| **නැවත ඇතුළත් කිරීම**<br>ප්‍රංශයේ Benelux රටවල් වෙනුවෙන් EU/SL නැවත කියවීමේ ප්‍රොටෝකෝල/ගිවිසුම්දැනටමත් නෙදර්ලන්තය සමඟ එලඹීම.<br><br>- දෙරටේම පුරවැසියන් (අසාර්ථක සරණාගතයින් සහ වීසා ඉක්මවා රැඳී සිටින්නන්) ඔවුන්ගේ උපන් රටට ආරක්ෂිතව සහ ක්‍රමානුකූලව ආපසු පැමිණීම සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා වූ සාකච්ඡා සංඛ්‍යාව | | | 50% |
| **කම්කරු/සේවක ගිවිසුම්**<br>- බහරේන්, ලෙබනනය, පිලිපීනය, සීෂෙල්ස්, ලක්සම්බර්ග්, රුමේනියාව සමඟ කම්කරු/සංක්‍රමණික සේවක ගිවිසුම් අවසන් කිරීම සහ කොරියානු ජනරජය සමඟ අලුත් කිරීමේ ගිවිසුම<br>- සංක්‍රමණ ක්‍රියාවලීන් පාලනය කිරීම සහ සංක්‍රමණික කම්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා විශාල ශ්‍රී ලාංකික විදේශගත ප්‍රජාවන් සිටින රටවල් සමඟ කම්කරු/සේවක ගිවිසුම් සඳහා එළඹීම සඳහාවූ රැස්වීම් ගණන. | 90% | | |
| **වෙනත්** | | | |
| වරප්‍රසාද සහ විනිර්මුක්තීන්<br>- රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලට සහ ජාත්‍යන්තර සහ අන්තර් රාජ්‍ය ආයතනවලට අදාළ වන වරප්‍රසාද පිළිබඳ නීතිමය නිරීක්ෂණ/උපදෙස් සැපයීම.<br>- ශ්‍රී ලංකාව අදාළ වන වරප්‍රසාද පිළිබඳ කරුණු ගණනාවක් සමඟ කටයුතු කිරීම.<br>- ශ්‍රී ලංකාවේ වරප්‍රසාද සහ නීති පිළිබඳ ජාත්‍යන්තර නීති රාමුවට අනුකූලව ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවලට සහ ජාත්‍යන්තර සහ අන්තර් රාජ්‍ය සංවිධානවලට අදාළ වන වරප්‍රසාද සඳහා පහසුකම් සැලසීම. | 90% | | |
| **ශ්‍රී ලංකාවේ ගිවිසුම් දර්ශකය පවත්වාගෙන යාම**<br>- රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සහ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල සමඟ සම්බන්ධ වීමෙන් අත්සන් කරන ලද ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සමඟ ගිවිසුම් දර්ශකය යාවත්කාලීන කිරීම.<br>- ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සහ විදේශගත ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත අත්සන් කරන ලද ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර සැපයීම.<br>ශ්‍රී ලංකාවේ ආර්ථික, ආරක්ෂාව, ආයෝජන, තාක්ෂණික, | 95% | | |

| | | | |
|---|---|---|---|
| සංස්කෘතික හා සමාජීය සංවර්ධන යන ක්ෂේත්‍රවල අත්සන් කරන ලද ද්විපාර්ශ්වික/ බහුපාර්ශ්වික ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | | | |
| **UN සහ ජාත්‍යන්තර සංවිධානවලට අදාළ කරුණු**<br>එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය යටතේ අදාළ ජාත්‍යන්තර නීති සහ බැඳීම්වලට අනුකූලව කටයුතු කරන්නේ කෙසේද යන්න සාකච්ඡා කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව, ආරක්ෂක අමාත්‍යාංශය, මූල්‍ය බුද්ධි අංශය සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ රැස්වීම් කැඳවීම.<br>- විදේශීය ත්‍රස්තවාදී සටන්කාමීන් සහ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහි වීම පිළිබඳ අදාළ UNSC යෝජනාවලට අදාළ කෙටුම්පත් රෙගුලාසි අවසන් කිරීම සඳහා වූ රැස්වීම් ගණන.<br>-එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ පිළිබඳ කාර්යාලයේ හෝ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ යෝජනා කමිටුවේ සහය ඇතිව, ප්‍රතිපත්ති සලකා බැලීමෙන් පසුව, රටවල්වලට එරෙහිව අනෙකුත් සියලුම UNSCR සඳහා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා වන රැස්වීම් ගණන.<br><br>- ත්‍රස්තවාදී අරමුණු සඳහා මුදල් විශුද්ධිකරණය සහ මූල්‍යකරණය පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායමට අදාළ කටයුතු සම්බන්ධයෙන්, එනම් ආරක්ෂක අමාත්‍යාංශය, මූල්‍ය බුද්ධි අංශය සහ නීතිපති දෙපාර්තමේන්තුව, අදාළ පාර්ශවකරුවන් සමඟ සංවිධානය කිරීම සහ සම්බන්ධ කිරීම, මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය සහ ICRG සමාලෝචන ක්‍රියාවලිය.<br>- සාමාජිකයින්ගේ අදාළ අධිකරණ බලතල හරහා රටේ AML/CFT රාමුව තහවුරු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා පැවැත්වීමට නියමිත රැස්වීම් ගණන.<br><br>- උපායමාර්ගික වෙළඳ පාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික කමිටුවට සහභාගී වීම සහ සම්බන්ධීකරණය කිරීම<br>- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි අදාළ STC නීති ක්‍රියාත්මක කිරීම සඳහා STC පිළිබඳ කැබිනට් අනුමැතිය ලත් කමිටුව විසින් පැවැත්වීමට නියමිත සාකච්ඡා ගණන | | 80% | |
| **සාගර නීතිය**<br>ජාතික අධිකරණ බල ප්‍රදේශවලින් (BBNJ) ඔබ්බට සමුද්‍ර ජෛව විවිධත්වය සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය (UNCLOS) යටතේ ජාත්‍යන්තර නීතිමය මෙවලමක් සාකච්ඡා කිරීම.<br><br>2023 දී පැවැත්වූ නියමිත අන්තර් රාජ්‍ය සමුළු වලදී යෙදවුම්/නිරීක්ෂණ සැපයීම සහ ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.<br>- ශ්‍රී ලංකා ස්ථාවරය සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විසින් | | | |

| | | | |
|---|---|---|---|
| මතු කරන ලද උත්සුකයන් සලකා බැලීම සඳහා අන්තර් අමාත්‍යාංශ රැස්වීම් පැවැත්වීම.<br><br>- BBNJ සම්මුතියේ ජානමය සම්පත් සම්බන්ධ කටයුතු සඳහා පැවැත්වීමට නියමිත රැස්වීම් ගණන<br><br>මහාද්වීපික තටාකයේ සීමාවන් (CLCS) පිළිබඳ කොමිෂන් සභාව විසින් පත් කරන ලද අනුකොමිසම ඉදිරියේ ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටාකය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ආරක්ෂා කිරීම.<br>- චන්ද්‍රිකා ගුරුත්වාකර්ෂණ දත්ත භාවිතයෙන් අවසාදිත ඝනකම පිළිබඳ සිතියමක් සකස් කිරීම මගින් බෙංගාල බොක්ක ප්‍රදේශයේ අවසාදිත ඝනකම සම්බන්ධව අනුකම්ටුවට අවශ්‍ය තොරතුරු ලබා දීම.<br>- ශ්‍රී ලංකාව විසින් හිමිකම් කියන ප්‍රදේශය පිළිබඳ නිර්දේශ සහතික කිරීම සඳහා වූ සාකච්ඡා කිරීම්. | 90% | | |
| **ජාත්‍යන්තර මානුෂීය නීතිය (IHL)**<br><br>IHL කමිටු රැස්වීම් කැඳවීම සහ IHL කමිටු සාමාජිකයින් සමඟ සම්බන්ධ වීම, එනම් අධිකරණ අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ICRC සමඟ සම්බන්ධ වීම<br>- ජාතික IHL කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ජිනීවා සම්මුතියේ සිංහල සහ දෙමළ පරිවර්තනය සඳහා නිල අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ රේඛීය ආයතන සමඟ ගත යුතු පසු විපරම් ක්‍රියාමාර්ග ගණන.<br>- 2023 වන විට ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර IHL ගිවිසුම් බැඳීම් බලාත්මක කිරීම සඳහා දේශීය නීති සම්පාදනය | | 80% | |
| **උසාවි නඩු**<br><br>මූලික අයිතිවාසිකම් නඩු හා වෙනත් නඩු-<br>- නීතිපති දෙපාර්තමේන්තුව සහ අධිකරණ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.<br>- නඩු කටයුතු කඩිනම් කිරීම සහ අමාත්‍යාංශයේ ස්ථාවරය තහවුරු කිරීම සඳහා FR කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ලබාදිය යුතු නිරීක්ෂණ ලබා දීම.<br><br>**විදේශ සිතාසි**<br>- අධිකරණ කටයුතු පහසු කිරීම සඳහා අධිකරණ කැඳවීම් ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර විදේශ දූත මණ්ඩල සමඟ සම්බන්ධ වී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.<br>- විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා විදේශගත ශ්‍රී ලාංකිකයන්ට භාරදීමට නියමිත සිතාසි ගණන. | 100% | | |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ අදාළ අධිකරණ නිසි ලෙස දැනුවත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලද සිතාසි සේවා වාර්තා ගණන. | | | |
| **තොරතුරු දැනගැනීමේ අයිතිය**<br><br>-2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ඉල්ලා ඇති තොරතුරු අමාත්‍යාංශයේ අදාළ අංශ සමඟ සම්බන්ධ කර ගැනීම.<br>- 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ නියමිත කාල සීමාව තුළ ඉල්ලීම් පහසු කිරීම | 90% | | |

**4.4.6 විදේශීය වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය**

| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
|---|---|---|---|
| | **100% -90%** | **89% -75%** | **74% - 50%** |
| බුකාරෙස්ට් / රුමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පිහිටුවීම | 100% | | |
| රජය සතු දේපළ නඩත්තු කිරීම.<br>i) නව දිල්ලිය<br>ii) ජිනීවා<br>iii) පැරිස් | 100% | | |
| කැන්බරා හි පැරණි නිල නිවාසයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | | | 10% |

**4.4.7 සන්ධාන අංශය**

| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
|---|---|---|---|
| | **100% - 90%** | **89% - 75%** | **74% - 50%** |
| **කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව.**<br>• මානව සම්පත් අංශය සමඟ එක්ව සන්ධාන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් පැවැත්වීම. | | 85% | |
| විදේශීය සම්භාවනීය අමුත්තන්ට රාජ්‍ය සහ නිල සංචාර සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් පවතින ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.<br>• වත්මන් ප්‍රතිපත්ති සමාලෝචනය වෙමින් පවතී | 100% | | |
| **අංශයේ ලේඛන ක්‍රියාවලිය ඩිජිටල්කරණය.**<br>• ලේඛනගත කිරීම සඳහා ඩිජිටල්කරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය සමඟ කටයුතු කිරීම<br>• කඩදාසි මත පදනම් වූ පරිපාලන ක්‍රමයේ භාවිතය අවම කරමින් කොළඹ පදනම් වූ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවල කටයුතු මාර්ගගත කිරීමට හැකි වන පරිදි ඩිජිටල්කරණය වූ පද්ධතියක් සංවර්ධනය කිරීමට ICTA සමඟ එක්ව කටයුතු කිරීම. | | | 40% |

| | | | |
|---|---|---|---|
| **සන්ධාන අංශයේ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම.**<br>• සේවාලාභීන්ගේ පුළුල් භාවිතය සඳහා සන්ධාන අංශයේ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම<br>• කොළඹ පදනම් වූ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ ඩිජිටල්කරණය කළ රාජ්‍යතාන්ත්‍රික හැඳුනුම්පත් ජාලගත කිරීම.<br>• ගුවන් තොටුපළ, රේගු, ආගමන, බදු දෙපාර්තමේන්තුව, සංචාරක මණ්ඩලය, ආදිය සමඟ ජාල ගත වීම. | 100% | | |
| **රාජ්‍යතාන්ත්‍රික ප්‍රාන්තයක් පිහිටුවීම.**<br>• යෝජිත රාජ්‍යතාන්ත්‍රික ප්‍රාන්තයක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ කටයුතු කිරීම.<br>• අදියර 1 යටතේ UDA විසින් ඉඩම් හඳුනාගෙන ඇත.<br>• කාණ්ඩ ගතකිරීම් සමීක්ෂණ සැලැස්ම නිර්මාණය කිරීම | | | 30% |
| සන්ධාන අත්පොත යාවත්කාලීන කිරීම.<br>• වත්මන්සන්ධාන අත්පොත සමාලෝචනය වෙමින් පවතී | 95% | | |
| විදේශ රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීම සඳහා දින සොයා ගැනීම<br>දේශපාලන මණ්ඩල, රාජ්‍ය ආයතන, විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සහ කොළඹ පිහිටි රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සමඟ කටයුතු කිරීම | 100% | | |
| අලුතින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාවට අනුව නව සන්ධාන සහකාර නිලධාරීන් බඳවා ගැනීම.<br>• සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුව ඇත | 95% | | |
| සන්ධාන අංශය ප්‍රතිව්‍යුහගත කිරීම.<br>• සන්ධාන අංශයේ වත්මන් පෙනුම වෙනස් කිරීම | | 80% | |
| සන්ධාන අංශයේ ලේඛනාගාරය නව ස්ථානයකට මාරු කිරීම සහ ප්‍රතිසංවිධානය කිරීම.<br>• ලේඛන පහසුවෙන් ලබා ගැනීම සඳහා යොමු සටහන් සහිතව ලේඛනාගාරය නැවත සකස් කිරීම | 100% | | |
| කොඩි කාමරය ප්‍රතිසංවිධානය කිරීම.<br>• වත්මන් කොඩි සංචිතය සංවිධානය කළ යුතුය | 100% | | |

## 5 වැනි පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය

### 5.1 තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත මගින් ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම, අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීම සඳහා අනිවාර්ය කර ඇති තිරසාර සංවර්ධන කවුන්සිලය පිහිටුවන ලදී.

2021 ගෝලීය තිරසාර සංවර්ධන වාර්තාවට අනුව තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී ශ්‍රී ලංකාවේ කාර්ය සාධනය ප්‍රගතිශීලී මට්ටමකට ළඟා වී ඇත. SDG ඉලක්ක 1, 4, 7 සහ 13 හි දිගටම ප්‍රගතියක් ලබන අතර, ශ්‍රී ලංකාව දැනට රටවල් 166ක් අතර 83 වැනි ස්ථානයේ සිටී. ශ්‍රී ලංකාවට හිමිව ඇති ලකුණු ප්‍රමාණය 69.4 දක්වා ඉහළ ගොස් ඇති අතර එය කලාපීය සාමාන්‍ය 67.2 ට වඩා බෙහෙවින් වැඩි ය.

ශ්‍රී ලංකාව ගුණාත්මක අධ්‍යාපනයේ (ඉලක්ක 4) සහ දේශගුණික ක්‍රියාකාරීත්වයේ (ඉලක්ක 13) ස්ථාවර ප්‍රගතියක් පවත්වාගෙන යයි. මීට අමතරව, වයස අවුරුදු 30-70 අතර වැඩිහිටියන්ගේ බෝ නොවන රෝග හේතුවෙන් සිදුවන මරණ අනුපාතය අඩු කිරීම (යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම පිළිබඳ ඉලක්ක 3 යටතේ කාර්ය සාධනයට දායක වීම), ස්ථිර වනාන්තර විනාශය අඩු කිරීම (ඉලක්ක 15 යටතේ කාර්ය සාධනයට දායක වීම.) සහ ටයිම්ස් උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල ශ්‍රී ලංකාව විශ්වවිද්‍යාල වල ස්ථාන ඉහළ යාම (තිරසර නගර සහ ප්‍රජාවන් පිළිබඳ ඉලක්ක 11 යටතේ ක්‍රියාකාරීත්වයට දායක වීම) ආදිය වාර්තාකරණ කාල සීමාව තුළ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද කැපී පෙනෙන වැඩිදියුණු කිරීම් කිහිපයකි.

සිවිල් සමාජය සහ ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සමඟ කළ පුළුල් උපදේශනයෙන් පසුව ශ්‍රී ලංකාවේ දෙවන ස්වේච්ඡා ජාතික සමාලෝචනය ECOSOC හි ඉහළ මට්ටමේ දේශපාලන සංසදයට 2022 ජූලි මාසයේදී ඉදිරිපත් කරන ලදී. මෙම සමාලෝචනය 2018 පළමු ස්වේච්ඡා ජාතික සමාලෝචනය සිට ජාතික ප්‍රතිපත්ති රාමුවට තිරසාර සංවර්ධන ඉලක්ක ඒකාබද්ධ කිරීමේ ප්‍රගතිය, සම්බන්ධීකරණය සහ තිරසාර සංවර්ධන අධීක්ෂණය සඳහා වැඩි දියුණු කළ ආයතනික හැකියාවන් ඉස්මතු කරයි.

2023 ජනවාරි මාසයේදී තිරසාර සංවර්ධන කවුන්සිලය විසින් සෑම අමාත්‍යාංශයක් සඳහාම ජාතික වශයෙන් සුදුසු තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණ වන්නේ ආර්ථික අභියෝග මධ්‍යයේ සියලුම රාජ්‍ය ආයතනවල සැලසුම් සහ සම්පත් තිරසාර සංවර්ධන ඉලක්ක වෙත යොමු කිරීම සහ ශක්තිමත් ජාතික මට්ටමේ නිරීක්ෂණ සහ ප්‍රගති ඇගයීම සහතික කිරීමයි.

ඒ අනුව, අමාත්‍යාංශ 21ක් විසින් 2030 වන විට සපුරා ගත යුතු ජාතික තිරසාර සංවර්ධන ඉලක්ක 157ක් සකසා ඇත. මෙම ජාතික තිරසාර සංවර්ධන ඉලක්ක ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අධීක්ෂණ සහ ඇගයීම් (M&E) රාමුවකට ඒකාබද්ධ කෙරේ.

UNESCAP විසින් කරන ලද නවතම විශ්ලේෂණයට අනුව, තිරසාර සංවර්ධන ඉලක්ක දත්ත ශක්තිමත් කිරීමේදී, තිරසාර සංවර්ධන දත්ත ලබා ගැනීමේ හැකියාව සඳහා ආසියා-පැසිෆික් කලාපයේ රටවල් 53 න් 13 වැනි ස්ථානයට ශ්‍රී ලංකාව පත්ව ඇත. මෙය අනාගතයේ දී තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ශ්‍රී ලංකාවට ඇති හැකියාව සක්‍රිය කරනු ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල දායකත්වය එක්සත් ජාතීන් සහ රජය අතර අත්සන් කර ඇති සමස්ත එකසත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව යටතේ රේඛීය අමාත්‍යාංශ වෙත යොමු කෙරේ. විවිධ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල සහයෝගීතා රාමු එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව සමඟ පෙලගැසී ඇත.

- **තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී පහත සඳහන් ව්‍යාපෘති/මුලපිරීම් සඳහා එක්සත් ජාතීනගේ නියෝජිතායතන තිරසාර සංවර්ධන කවුන්සිලය වෙත සහය වී ඇත:**

  - තිරසාර සංවර්ධන ඉලක්ක අයවැය කේතීකරණ සහ ටැග් කිරීමේ ක්‍රමයේ වර්ධනය ජාතික අයවැයට හඳුන්වා දීමට නියමිතය. (UNDP ශ්‍රී ලංකා)
  - තිරසාර සංවර්ධන ඉලක්ක ආයෝජක සිතියම සකස් කර SDGs සඳහා පුද්ගලික ප්‍රාග්ධනයේ නව මට්ටම් විවෘත කිරීමට නව වැඩසටහන්වල සැලසුම් ගොඩ නගන ලදි. (UNDP ශ්‍රී ලංකා)
  - තිරසාර සංවර්ධන ඉලක්ක කවුන්සිලය 2023 දී SDG දර්ශක 115 ක් සඳහා වඩාත් නිවැරදි සහ සාක්ෂි මත පදනම් වූ ප්‍රගති තක්සේරු කිරීම් සඳහා පිහිටුවා ඇති මූලික දත්ත මත පදනම්ව ජාතික තිරසාර සංවර්ධන ඉලක්ක අධීක්ෂණ සහ ඇගයීම් රාමුවක් සකස් කරන ලදී. (UNESCAP)
  - ජාතික තිරසාර සංවර්ධන ඉලක්ක අධීක්ෂණ සහ ඇගයීම් රාමුව සකස් කිරීම. (UNESCAP)
  - ශ්‍රී ලංකාවේ ඩිජිටල් රාජ්‍ය පරිවර්තනය වේගවත් කිරීම සඳහා ජාතික ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුවක් පැවැත්වීම. (UNDESAP)
  - ශ්‍රී ලංකාවේ පළමු ස්වෛරී හරිත බැඳුම්කර රාමුව (UNESCAP) සංවර්ධනය කිරීමේ තාක්ෂණික සහාය
  - තිරසාර මූල්‍යකරණය පිළිබඳ ප්‍රධාන කොටස්කරුවන්ගේ ධාරිතා ගොඩනැගීම (UNESCAP)
  - ස්වභාවධර්මය සඳහා ණය පිළිබඳ තාක්ෂණික සහාය/ දේශගුණික හුවමාරු (DFNS) (UNESCAP)
  - තිරසාර සංවර්ධන ඉලක්ක පරීක්ෂා කිරීම් සහ ඇගයුම් හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහාය (UNESCAP)
  - ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සියල්ලන්ම අන්තර්ගතකරන ලද සහ තිරසාර ව්‍යාපාර (ISBs) ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ගය 2024 ජනවාරි මස දියත් කරන ලදී (UNESCAP)

## 6 වැනි පරිච්ඡේදය – අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක මණ්ඩල කළමනාකරණය

### 6.1.1 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ (කොළඹ) කාර්ය මණ්ඩලය

| වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු /අතිරික්තය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 105 | 81 | 24 |
| තෘතියික | 09 | 05 | 04 |
| ද්විතියික | 448 | 397 | 51 |
| ප්‍රාථමික | 128 | 128 | - |

### 6.1.2. 2023 දෙසැම්බර් 31 දිනට දූත මණ්ඩලවල කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු /අතිරික්තය |
|---|---|---|---|
| **සියරට පේරුව** | | | |
| ජ්‍යෙෂ්ඨ/ තෘතියික [1] | 241 | 184 | 57 |
| ද්විතියික [2] | 250 | 166 | 84 |
| ප්‍රාථමික [3] | 9 | 6 | 3 |
| **ස්ථානීය නොවන** | | | |
| ද්විතියික [4] | 237 | 195 | 42 |
| ප්‍රාථමික [5] | 311 | 251 | 60 |

[1] දූත මණ්ඩල ප්‍රධානී, අමාත්‍ය උපදේශක, උපදේශක, පළමු ලේකම්, දෙවන ලේකම්, තුන්වන ලේකම්
[2]සංවර්ධන සහකාර, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්
[3]රියදුරන්, කාර්යාල කාර්ය සහායකයින්, සනීපාරක්ෂක කම්කරුවන් ඇතුළු නිලධාරීන්
[4]ලිපිකරුවන්, පිළිගැනීමේ නිලධාරීන්, ස්ටෙනෝග්‍රැපර්වරුන්, පරිවර්තකයින්, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු නිලධාරීන්
[5] කාර්යාල කාර්ය සහායකයින්, රියදුරන් සහ සනීපාරක්ෂක කම්කරුවන් ඇතුළු නිලධාරීන්

## 6.2. මානව සම්පත් සංවර්ධනය

**අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන්**

| # | වැඩසටහනේ නම | පුහුණු කාර්ය මණ්ඩල ගණන | කාල සීමාව | මුළු ආයෝජනය (රු. 000) | වැඩසටහනේ ස්වභාවය | ප්‍රතිඵල / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.) | (විදේශීය/ දේශීය) | |
| 1. | කාර්යාල කාර්ය සහායක (OES) සඳහා කථන ඉංග්‍රීසි පාඨමාලාව | 30 | පැය 100 යි | 751,744.07 | දේශීය | ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම වැඩි දියුණු කිරීම |
| 2. | කළමනාකරණ සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් සඳහා IHR හි කථන ඉංග්‍රීසි පාඨමාලාව | 06 | මාස 06 යි | 760,000.00 | දේශීය | ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම වැඩි දියුණු කිරීම |
| 3. | නේවාසික රියදුරු පුහුණුව | 30 | දින දහය යි (නේවාසික පුහුණුව) | 528,144.00<br>7,500.00 | දේශීය | |
| 4. | ජාලකරණය සමඟ පරිගණක දෘඩාංග | 02 | මාස 06 යි | 71000.00 | දේශීය | නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා නව දැනුම තැන්පත් කිරීම |
| 5. | සන්ධාන සහකාරවරුන් සහ කොන්සියුලර් සහකාරවරුන් සඳහා කෙටි සැසි | 06 | දින 02 යි | නොමිලේ | දේශීය | වගකීම භාර ගැනීමට සහ පැවරී ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීමට රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |
| 6. | සාමාන්‍ය හැසිරීම සහ විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව | 01 | දින 05 යි | නොමිලේ | දේශීය | වගකීම භාර ගැනීමට සහ පැවරී ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීමට රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |
| 7 | රාජ්‍ය වැටුප් ගෙවීම් පිළබද ලේඛන සකස් කිරීම | 03 | දින 03 යි | 54000.00 | දේශීය | වගකීම භාර ගැනීමට සහ පැවරී ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීමට රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |
| 8. | සේවා ආචාර විධි | 64 | දින 05 යි | 1,070,000.00 | දේශීය | වගකීම භාර ගැනීමට සහ පැවරී ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීමට රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | දියුණු කිරීම. |
| 9. | IOM සමඟ සම්බන්ධීකරණයෙන් මිනිස් ජාවාරම පිළිබඳ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන. | 138 | එක් දින | අදාළ නොවේ | දේශීය | ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා, අදාළ නිලධාරීන්ට ඔවුන්ගේ ක්ෂේත්‍රවල දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් (අවශ්‍ය විට) ලබා දෙන ලදී. |
| 10. | සයිබර් ආරක්ෂාව සහ සයිබර් වසම: ධාරිතා සංවර්ධනය පිළිබඳ තාක්ෂණික සහයෝගිතා වැඩමුළුව | 30 | එක් දින | අදාළ නොවේ | දේශීය | |
| 11. | "කුඩා රටක් ජාත්‍යන්තර අවකාශයේ පෙනී සිටින්නේ කෙසේද" මැයෙන් විශේෂ දේශනය. | 25 | පැය 2 | අදාළ නොවේ | දේශීය | |
| 12. | කාර්යාල සේවක සේවයේ පිළිගැනීමේ නිලධාරීන් සහ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 45 | එක් දින | අදාළ නොවේ | දේශීය | |
| 13. | කෘතිම බුද්ධිය (AI) සහ ChatGPT හඳුන්වාදීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 12 | පැය 2 | අදාළ නොවේ | දේශීය | |
| 14. | සංචාරක ප්‍රවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 15 | පැය 3 | අදාළ නොවේ | දේශීය | |
| 15. | "සාමකාමී ගමන් මග, ප්‍රවාහනය සහ සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ ආසියා පැසිෆික් කලාපයේ කාර්යභාරය" පිළිබඳ පුහුණු සැසිය. | 150 | එක් දින | අදාළ නොවේ | දේශීය | |
| 16. | ශ්‍රී ලංකා විදේශ සේවයේ II සහ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ලිවීමේ කුසලතා පිළිබඳ වැඩමුළුව | 60 | එක් දින | අදාළ නොවේ | දේශීය | |
| 17. | අමාත්‍යාංශයේ කාර්යයන් පිළිබඳව අලුතින් බඳවාගත් | 3 | එක් දින | අදාළ නොවේ | දේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පරිවර්තකයන් සඳහා කෙටි සැසිය | | | | | |
| 18. | ආයතනික ඩිජිටල් රාජ්‍ය පරිවර්තනය සඳහා ඒකාබද්ධ ධාරිතාව ගොඩනැගීමේ ප්‍රවේශය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය | 50 | සය දිනක් | අදාළ නොවේ | දේශීය | |
| 19. | ශ්‍රී ලංකා විදේශ සේවයේ II සහ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ලිවීමේ කුසලතා පිළිබඳ වැඩමුළුව | 48 | එක් දින | අදාළ නොවේ | දේශීය | |
| 20. | "පෞරුෂත්වය සහ රූපාලංකරණය" පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය | 55 | පැය 3 | අදාළ නොවේ | දේශීය | |
| 21. | නම් කරන ලද තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන් සඳහා දිශානති වැඩසටහන | 9 | දින 15 යි | අදාළ නොවේ | දේශීය | |
| 22. | Clingendael ඩිජිටල් පුහුණු නිල් ආර්ථිකය: සාගරවල තිරසාර ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීම | 1 | දින 12 යි | අදාළ නොවේ | මාර්ගගත ක්‍රමයට | |
| 23. | ජාත්‍යන්තර සංක්‍රමණ නීතිය පිළිබඳ 11 වැනි මාර්ගගත පාඨමාලාව - 2023 අප්‍රේල් 24 සිට මැයි 19 දක්වා | 1 | එක මාසයක් | අදාළ නොවේ | මාර්ගගත ක්‍රමයට | |
| 24. | පොදුරාජ්‍ය මණ්ඩලීය සිවිල් සේවකයන් සඳහා ශිෂ්‍යත්ව අවස්ථා-බෙන් ඩෙලෝ පොදුරාජ්‍ය මණ්ඩල නායකත්ව වැඩසටහන (ඔන්ලයින්) | 10 | 2024 පුරාවට, අයදුම් කරන පාඨමාලාව අනුව. | අදාළ නොවේ | මාර්ගගත ක්‍රමයට | |
| 25. | "ආසියාවේ සහ ලතින් ඇමරිකාවේ ඩිජිටල් වෙළඳ රෙගුලාසි හැඳින්වීම" පිළිබඳ මාර්ගගත පාඨමාලාව | 1 | දවස් හයක් | අදාළ නොවේ | මාර්ගගත ක්‍රමයට | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26. | තරුණ ආසියානු රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහන 2023 | 1 | දින 18 යි | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (ඇමරිකා එක්සත් ජනපදය) | |
| 27. | "COVID-19 වෙතින් සමාජ-ආර්ථික ප්‍රකෘතිය සඳහා ප්‍රවේශයන්" පිළිබඳ නේවාසික වැඩමුළුව | 1 | දින පහක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (ඉන්දියා) | |
| 28. | 2023 ගෝලීය නායකත්ව වැඩසටහන | 1 | මාස 1.5 යි | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ ( (කොරියා) | |
| 29. | විදේශ තානාපතිවරුන් සඳහා උසස් විදේශ සේවා වැඩසටහන - 2023 | 1 | දින 12 යි | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ ( (ඉන්දියා) | |
| 30. | චීනයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දකුණු-දකුණු සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | දින 12 යි | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (චීන) | |
| 31. | "අතීතය සමඟ ගනුදෙනු කිරීම" පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ වෘත්තිකයන් සඳහා වාර්ෂික උසස් පාඨමාලාව | 1 | දින හතක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (ස්විට්සර්ලන්තය) | |
| 32. | KOICA මාස්ටර් සහ ආචාර්ය උපාධි වැඩසටහන 2023 | 1 | මාස 1.5 යි | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (කොරියාව) | |
| 33. | කාන්තා සංක්‍රමණික කම්කරුවන් පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණය: ගාස්තු සඳහා උපකරණයක් ලෙස ද්විපාර්ශ්වික කම්කරු සංක්‍රමණ ගිවිසුම (BLMA) | 1 | දින දෙකක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (නේපාලය) | |
| 34. | 2023 නැගෙනහිර ආසියානු | 2 | මාස දෙකක් | සම්පූර්ණයෙන්ම | විදේශ (කොරියාව) | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන (EADP) | | | සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | | |
| 35. | 2023 ජාත්‍යන්තර නීති පිළිබඳ සෝල් ඇකඩමිය (SAIL) | 1 | දින දහයක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (කොරියාව) | |
| 36. | ජාත්‍යන්තර නීතිය පිළිබඳ චීන-AALCO හුවමාරු සහ පර්යේෂණ වැඩසටහනේ 6 වැනි පුහුණු සැසිය | 1 | දින දහයක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (චීනය) | |
| 37. | "තෙල් කාන්දු ප්‍රතිචාරය" පිළිබඳ වැඩමුළුව | 1 | දින පහක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (ඇමරිකා එක්සත් ජනපදය) | |
| 38. | ITEC: රාජ්‍ය ප්‍රතිපත්ති සහ පාලනය | 1 | දින 20 යි | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (ඉන්දියාව) | |
| 39. | 29 වන කනිෂ්ඨ රාජ්‍යතාන්ත්‍රික පාඨමාලාව | 1 | සති 5 යි | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (පකිස්ථානය) | |
| 40. | 2024 දී න්‍යෂ්ටික නිරායුධකරණය සහ ප්‍රගුණනය නොකිරීම පිළිබඳ UNITAR හිරෝෂිමා පුහුණු වැඩසටහන | 2 | දින පහක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (ජපානය) | |
| 41. | ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික AIBO පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 1 දින දෙකක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (චීනය) | |
| 42. | 4 වන නිරායුධකරණය සහ ජාත්‍යන්තර ආරක්ෂක කටයුතු සාමාජිකත්ව වැඩසටහන | 1 | 1 දින පහක් | සම්පූර්ණයෙන්ම සංවිධායක විසින් අරමුදල් සපයනු ලැබේ | විදේශ (ඉන්දියාව) | |

## 7 වැනි පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| # | අවශ්‍යතාව | තත්ත්වය අනුකූල වේ/ නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ගිණුම් නියමිත දිනට අදාළව ඉදිරිපත් කර ඇත.** | | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 1.3 | වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 1.6 | අනෙකුත් | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **පොත්පත් සහ ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.6 | චෙක්පත් සහ මුදල් ඇණවුම් සඳහා ලේඛනය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.7 | වට්ටෝරු භාණ්ඩ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.9 | හානි හා පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම (GA - N20) | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය (මු.රෙ. 135)** | | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 3.2 | මූලා‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් තිදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 3.4 | 2014 මැයි මස 11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනටඉදිරිපත් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **විගණන විමසුම්** | | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් ලබා දී ඇති දිනය අනුව සියලුම විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **අභ්‍යන්තර විගණන** | | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | ඇතැම් දූත මණ්ඩලවලට අදාළ කාලසීමාව තුළ පිළිතුරු ලැබී නොමැත | නියමිත කාලය තුළ දැනුම් දීමට සහ ප්‍රතිචාර දැක්වීමට |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |

| | | | | |
|---|---|---|---|---|
| | තිබීම | | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **විගණන සහ කළමනාකරණ කමිටු** | | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | රැස්වීම් තුනක් පැවැත්විණි. | සම්පූර්ණ අනුකූලතාව සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| **වත්කම් කළමනාකරණය** | | | | |
| 8.1 | 2017 අංක 01 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පර්ච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **වාහන කළමනාකරණය** | | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ | අනුකූල නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |

| | | | | |
|---|---|---|---|---|
| | 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | | | |
| **බැංකු ගිණුම් කළමනාකරණය** | | | | |
| 10.1 | බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීම සහ නියමිත දිනට ඒවා විගණනයට සූදානම් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වසරවල සිට පැවති අක්‍රිය ගිණුම් පියවීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශන මගින් හෙළිදරව් කරන ලද ශේෂයන් සම්බන්ධ මූල්‍ය රෙගුලාසි, ඒ සඳහා ගැලපීම් කළ යුතුව තිබූ අතර, එම ශේෂයන් මාසයක් ඇතුළත පියවා තිබේද යන්න සම්බන්ධයෙන් මෙම ක්‍රියාමාර්ගය ගෙන තිබුණි. | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **ප්‍රතිපාදන උපයෝජනය** | | | | |
| 11.1 | සීමාව නොඉක්මවන ප්‍රතිපාදන භාවිතා කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 11.2 | FR 94(1) ප්‍රකාරව වසර අවසානයේ ඉතිරිව ඇති ප්‍රතිපාදන නොඉක්මවන වගකීම් | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **රජයේ නිලධාරීන්ගේ ගිණුමට අත්තිකාරම්** | | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12.2 | හිඟ ණය පිළිබඳ කාල විශ්ලේෂණය | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12.3 | වසරකට වැඩි කාලයක් සඳහා හිඟ ණය ශේෂ පියවීම. | අනුකූල නොවේ | තොරතුරු සොයා ගැනීමේ අපහසුව | තොරතුරු සොයා ගැනීමට කටයුතු කරනු ලැබේ |
| **සාමාන්‍ය තැන්පතු ගිණුම** | | | | |
| 13.1 | FR 571 අනුව අවලංගු වූ තැන්පතු පිළිබඳ ක්‍රියා. | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 13.2 | සාමාන්‍ය තැන්පතු සඳහා පාලන ලේඛනය යාවත්කාලීන කර නඩත්තු කර ඇත. | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **අග්‍රිම ගිණුම** | | | | |
| 14.1 | TOD වෙත වසර අවසානයේ සමාලෝචනය කෙරෙන මුදල් පොතේ ශේෂය ප්‍රේෂණය කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 14.2 | කාර්යය සම්පූර්ණ කිරීමෙන් මාසයක් ඇතුළත FR 371 යටතේ නිකුත් කරන ලද තත් කාලීන අග්‍රිම පියවීම. | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 14.3 | FR371 විසින් අනුමත කරන ලද සීමාව නොඉක්මවා තාවකාලික උප-අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 14.4 | භාණ්ඩාගාර පොත් සමඟ අග්‍රිම ගිණුමේ ශේෂය මාසිකව | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිසන්ධානය කිරීම | | | |
| **ආදායම් ගිණුම** | | | | |
| 15.1 | එකතු කරන ලද ආදායම රෙගුලාසිවලට අනුව වියදම් කිරීම | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 15.2 | එකතු කරන ලද ආදායම තැන්පතු ගිණුමට බැර නොකර ආදායම් ගිණුමට බැර කිරීම | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 15.3 | FR 176 ප්‍රකාරව හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **මානව සම්පත් කළමනාකරණය** | | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩලය තුළ කාර්ය මණ්ඩලය නඩත්තු කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට රාජකාරි ලැයිස්තු නිකුත් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 16.3 | 2017 සැප්තැම්බර් 20 දිනැති අංක 4/2017 චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා DMS වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සහ එහි රෙගුලාසිවලට අනුව තොරතුරු නිලධාරියකු නම් කිරීම සහ තොරතුරු ලේඛනයක් පවත්වාගෙන යාම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 17.2 | අමාත්‍යාංශ වෙබ් අඩවිය හරහා හෝ වෙනත් ක්‍රමයක් හරහා ආයතනයට මහජනතාවගේ චෝදනා/ඇගයීම් ලබාගැනීමට පියවර ගැනීම. | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 17.3 | RTI පනතේ 8 සහ 10 වගන්ති අනුව ද්වි-වාර්ෂික සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | | |
| 18.1 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 05/2008 සහ 05/2018 (1) චක්‍රලේඛ අංක අනුව ආයතනයේ පුරවැසි ප්‍රඥප්තිය/පුරවැසි සේවාදායකයාගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 18.2 | චක්‍රලේඛයේ 2.3 ඡේදයට අනුව පුරවැසි ප්‍රඥප්තිය / පුරවැසි සේවාලාභියාගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදය සකස් කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **මානව සම්පත් සැලැස්ම සකස් කිරීම** | | | | |
| 19.1 | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |

| | | | | |
|---|---|---|---|---|
| | පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම -2 යටතේ ආකෘතිය අනුව මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම. | | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වසරකට පැය 12 කට නොඅඩු අවම පුහුණු අවස්ථා ලබා දීම සහතික කිරීම | අනුකූල නොවේ | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව අත්‍යවශ්‍ය පුහුණු ලබා දෙන ලදී | අදාළ නොවේ |
| 19.3 | ඉහත චක්‍රලේඛයේ ඇමුණුම-1 ආකෘතිය මත පදනම්ව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනුකූල විය | අදාළ නොවේ | අදාළ නොවේ |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ අංක 6.5 ඡේදය අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ වගකීම පවරමින් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම. | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| **විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම** | | | | |
| 20.1 | පසුගිය වසර සඳහා විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන ඡේදවල පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීම | අනුකූල වේ | අදාළ නොවේ | අදාළ නොවේ |